ELEANOR H PORTER

# POLLYANNA



# පොලියානා

පරිවර්තනය

කත්‍යානා අමරසිංහ

# 1

# පොලී මෙනෙවිය

sinhalaebooks.com

ජූනි මාසයේ එක් උදෑසනක පොලී හැරින්ටන් මෙනෙවිය ඉතා කලබලයකින් ඇගේ මුළුතැන්ගෙට ඇතුළු වුණාය. සාමාන්‍යයෙන් මෙසේ කලබලයෙන් කිසිවක් කිරීම ඇගේ සිරිත නොවීය. හැම දෙයක්ම ආචාරශීලීව කරන කෙනෙකු හැටියට ඇය ඇය ගැනම ආඩම්බරයකින් පසු වුණාය. එහෙත් අද නම් ඇය කඩිමුඩියකින්, ඇත්තෙන්ම විශාල කලබලයකින් සිටින්නීය.

නැන්සි මුළුතැන්ගෙයි පිඟන් සෝදමින් සිටි අතර, එහි කලබලයෙන් ඇතුළුවන හැරින්ටන් මෙනෙවිය දෙස පුදුමයෙන් හැරී බැලුවාය. ඇය පොලී මෙනෙවියගේ මුළුතැන්ගෙයි වැඩකටයුතු කර දෙන්නේ මාස දෙකක වේලේ පටන්ය. එහෙත් එදා මෙදා තුර කිසිදාක ඇය, ඇගේ නෝනා මහත්මිය මේ තරම් කලබලයකින් සිටිනු දැක නැත.

''නැන්සි''

''ඇයි මැඩම්'' යි නැන්සි උද්යෝගයෙන් උත්තර දුන් නමුත් අතේ තිබුණු ජෝගුව සේදීම නැවැත්තුවේ නැත.

''නැන්සි'' පොලී මෙනෙවිය කටහඬ මෙවර වඩා තියුණු ස්වරයක් ගෙන තිබුණි. ''මං හිතනවා - මං යමක් කියනකොට ඔයා වැඩ නවත්තලා ඒකට ඇහුංකන් දෙයි කියල...''

නැන්සි ඉතා අසරණ ලෙස රතුවී සිටියාය. ඇය එක්වරම පිස දමමින් සිටි ජෝගුව පහතට හෙලුවේ පිසිනකඩ ඒ තුළ තිබෙද්දීමය. ජෝගුව පහතට වැටෙන්නට ඔන්න මෙන්න කියා තිබිණි. එහෙත් ඒ වගක් ඇයට දැනෙන බව පෙනුණේ නැත.

''හා මැඩම්.... මං එහෙම කරන්නං මැඩම්'' ඇය ගොත ගසමින් කියා, ජෝගුව උස්සා හනික කෙලින් කළාය.

''මං මගේ වැඩේට ඇලිලයි හිටියෙ. මොකද අද උදෙන්ම මැඩම් කියල තිබුණනේ, මේ පිඟන් සෝදන වැඩේ ඉක්මනට අහවරක් කරන්න කියල....''

එහෙත් ඇගේ නෝනා මහත්මිය රවා ගත් ගමන්මය.

''ඒක නං එහෙම තමා නැන්සි. ඒත් මට ඔයාගෙ එය පල් හැලිවලින් වැඩක් නෑ. මට ඕනෑ, මං කියන දේට ඔයාගෙ අවදානය විතරයි.''

''ඔව් මැඩම්....'' නැන්සි සුසුමක් හෙලුවාය.

මේ ගැහැණිය කවදා සන්තෝසයට පත් කරන්න දැයි ඇය හිතමින් සිටියාය. නැන්සි මීට පෙර කිසි කෙනෙකුට මෙහෙකාරකම් කර නැත. හදිසියේම වැන්දඹුවී, ලෙඩ ඇඳට වැටුණු අම්මා නිසා එය කළ යුතුව තිබිණි. නැන්සිට වඩා බලා සොයුරියන් තුන් දෙනෙකු

සිටියෙන්, ඔවුන්ගේ බඩ වියත රකින්නට යමක් කළ යුතු යැයි ඈ සිතුවාය. ඒ නිසා කඳු මුදුනේ පිහිටි හැරින්ටන් මෙනෙවියගේ විශාල බංගලාවේ මුළුතැන්ගෙය බාර ගන්නට සිදුවීම ගැන ඇය මුලදී ඉතා කැමති වූවාය.

නැන්සි පැමිණ සිටියේ හැරින්ටන් බංගලාවට හැතැප්ම හයකටත් එහා සිටය. ඇය හැරින්ටන් මෙනෙවිය ගැන දැන සිටියේ ඒ පළාතේ වංශවත් පවුලක ඉපදුණු පැරණි හැරින්ටන් බංගලාවේ අයිතිකාරිය ලෙස පමණි. එහෙත් ඒ මාස දෙකකට ඉස්සරය. දැන් නම් ඇය හැරින්ටන් මෙනෙවිය යනු කවුදැයි හොඳටම දනී. ඇය තද හිතක් ඇති. බැරෑරුම් මුහුනකින් සිටින, පිහියක් බිම වැටුණත් - දොරක් දඩාස් ගා වැහුණත් රවා බලන, ඒ සියල්ලම කිසිම හැලහොල්මනක් නැතිව තිබුණත් කිසිදාක සිනාමුසු මුහුණක් ඇතිව සිටීමට නොසිතන ගැහැණියකි.

''ඔයා උදේ වරුවේ වැඩ ටික ඉවර කළාට පස්සේ නැන්සි,'' පොලී මෙනෙවිය කියමින් සිටියාය. ''අර අට්ටාලෙ උඩ පුංචි කාමරේ සුද්ධ කරන්න ඕනෑ. ඒක හොඳට අතුගාලා, ඒකේ තියෙන ට්‍රන්ක පෙට්ටිය එළියට ඇදල දාන්න ඕනෑ.''

sinhalaebooks.com

''හා මැඩම්. ඒත් මං ඒ කාමරෙන් අයින් කරන ලට්ට ලොට්ට කොහාටද දාන්නෙ.''

'ඉස්සරහ අට්ටාලෙට දාන්න.'' පොලී මෙනෙවිය මදක් සැකයෙන් කියා - දිගටම කතා කරගෙන යන්නට වූවාය. ''මං හිතනවා මං දැන් මේක ඔයාට කිව්වොත් හොඳයි. මගේ අක්කගෙ දූ, පොලියානා විටියර් අපි එක්ක ඉන්න එනවා. එයාට තාම අවුරුදු එකොළහයි. එයාට තමා ඔය ලෑස්ති කරන්න කිව්වේ...''

''පුංචි ගෑනු ළමයෙක් - මෙහෙ එනවා! අනේ මැඩම් ඒක මොනතරම් හොඳ දෙයක් වෙයිද!' නැන්සි කීවේ ඇගේ ගෙදරට එහි සිටින කුඩා නංගිලා නිසා ලැබුණු අලෝකය ගැන සිතමිනි.

''හොඳ.....!, - මං හිතන්නේ ඒකට පාවිච්චි කරන්න ඕන හරිම වචනය ඒක නෙමෙයි.'' යි පොලී මෙනෙවිය දරදඬු ලෙස කීවාය.

''කොහොම වුණත් මං මගේ වැඩේ කරනවා. මං හිතන්නෙ මං හොඳ ගෑණියක්. මගේ රාජකාරිය මොකක්ද කියල මං දන්නවා.''

නැන්සි යළි ප්‍රාණවත් වූවාය.

''ඇත්තටම මැඩම්, මම හිතුවෙ ඒ ළමයා එන එකෙන් මේ ගෙදරට මොන තරං එළියක් ලැබෙයිද කියල විතරයි - ඔයා වෙනුවෙන්...''

''ස්තුතියි.'' හැරින්ටන් මෙනෙවිය වියළි හඬකින් කීවාය. ''ඒත් මට කියන්න බෑ හදිස්සියේම එහෙම දෙයක් වෙන එකේ උවමනාවක් මට පේනවා කියලා....''

''ඒක ඇත්ත මැඩම්. ඒ උනාට ඔයාට - ඔයාට එයා ඕනැනේ එයා ඔයාගේ අක්කගෙ දරුවනේ...''

නැන්සි එසේ කීමට ඉදිරිපත් වුණේ, මේ අසරණ සිඟිති අමුත්තිය පිළි ගන්නට පොලී මෙනෙවිය මීට වඩා සූදානම් විය යුතුය යන සිහින් සිතුවිල්ලත් සමගය. පොලී මෙනෙවිය උඩඟු ලෙස මුහුණ ගැස්සුවාය.

''ඇත්තටම නැන්සි - මට සහෝදරියක් හිටපු පලියටම - එයා මෝඩ විදියට කසාද බැඳලා මෙච්චර මිනිස්සු පිරිලා ඉතිරිලා ඉන්න ලෝකෙට ඕන් නැති ළමයි වැදුව පලියට - මං නං හිත්නෙ නෑ මං එයාලට සලකන්න ඕනෑ කියල. කොහොම උණත් මං ඉස්සරවෙලා කිව්ව වගේ - මගෙ යුතුකම මොකද්ද කියල මං දන්නවා. ඔය අහුමුළු ටික අස්කරල දාන්න නැන්සි.'' ඉතා ඉක්මනටම කතාව හමාර කළ ඇය මුලුතැන් ගෙයින් පිටවී ගියාය.

''හා මැඩම්.'' සුසුමක් හෙළූ නැන්සි නැවත වරක් බාගෙට

පිසදමූ පෝගුව අතට ගත්තාය. එය නැවතත් තෙත්වී තිබුණු බැවින් යළිත් පිස දැමිය යුතු විය.

පොලී මෙනෙවිය ඇගේ නිදන කාමරයට වැදී දවස් දෙකකට පෙර ඇයට ලැබුණු ඒ ලියුම අතට ගත්තාය. එය ලැබී තිබුණේ ඉතා දුරින් පිහිටි බටහිර නගරයකිනි. පොලී මෙනෙවියට නම් ඒ ලියුම ගෙනාවේ අප්‍රසන්න හැඟීමකි. එහෙත් ඉන් ඇය පුදුමයට පත්වී සිටියාය. ලියුම නම්කොට තිබුණේ ''පොලී හැරින්ටන් මෙනෙවිය. බෙල්ඩින්ග්ස්විල්, වර්මොන්ට්'' ලෙසය.

ලියුමේ තිබුණේ මේ ආකාර දෙයකි.

*හිතවත් නෝනා මහත්මියනි,*

*මෙම ලිපිය ඔබට ලියන්නේ ජෝන් විටියර් පියනම දැනට සති දෙකකට උඩදී ස්වර්ගස්ථ වීමේ කණගාටු දායක ආරංචිය පැවසීමටයි. ඔහු මිය ගියේ අවුරුදු එකොළහක් වයසැති දූරියක් මෙලොව තනිකර දමායි. ඔබ දැනටමත් දන්නා පරිදි ඔහු කුඩා මීසමක පිහිටි දේවස්ථානයේ පාදිලිවරයා වූයෙන්, ලැබූයේ ඉතා කුඩා වැටුපකි. ඒ නිසා පොත් කිහිපයක් හැරෙන්නට, ඔහු මෙලොව ඉතිරි කර ගිය දමා දෙයක් නැත.*

*මා දන්නා ආකාරයට ඔහු ඔබේ මියගිය සහෝදරියගේ ස්වාමි පුරුෂයායි. එහෙත් ඔහු මට කියා තිබූ හැටියට ඔබලාගේ පවුල් අතර ඒ තරම් හොඳ සම්බන්ධයක් තිබී නැත. එහෙත් ඔබේ සහෝදරියගේ නාමයෙන් ඔබ මේ දරුවා ඔබේ බාරයට ගෙන, නැගෙනහිර පළාතේ ඇගේ නෑදෑයන් අතර හදා වඩා ගනු ඇතැයි ඔහු උදක්ම බලාපොරොත්තු වූයේය. මා මේ ලිපිය ඔබට ලියන්නේ ඒ ඉල්ලීම ඔහු වෙනුවෙන් කරන්නටය.*

*ඔබට මේ ලිපිය ලැබෙන විට විටියර් පියනම ගේ කුඩා දරුවා ඔබ වෙතට පැමිණීමට සූදානමින් සිටිනු ඇත. ඔබ ඒ අදහසට කැමති නම් ඒ බව අපට දන්වා එවන්නේ නම් ඉතා කෘතඥ වෙමු.*

sinhalaebooks.com

*එවිට සිය බිරිඳ සමඟ නැගෙනහිර පළාතට යාමට බලාපොරොත්තුවෙන් මෙහි සිටින පුද්ගලයකු අත ඇය බොස්ටන් නගරයට යවා එතැනින් බෙල්ඩින්ග්ස්විල් බලා යන දුම්රියට නැංවීමට අපට හැකිය. අදාල දිනයේදී පොලියානා භාර ගැනීමට දුම්රිය ස්ථානයට පැමිණීමට ඔබට සිදුවනු ඇත.*

*ඔබෙන් සතුටුදායක පිළිතුරක් බලාපොරොත්තුවෙන් නවතිමි.*

*ඔබේ,*
*විශ්වාසී,*
*ජෙරමියා ඕ. වයිට්.*

රැවුම් මුහුණෙන් යුතුව පොලී මෙනෙවිය ලියුම නවා කවරයට දැම්මාය. ඇය ඊට පෙර දිනයේදී පිළිතුරු ලිපියක් යවමින් දැරියව බාර ගැනීමට කැමති බව දන්වා තිබුණාය. කරන්නට යන දෙය ගැන හිතේ කිසිම කැමැත්තක් නැති මුත්, ඇගේ යුතුකම කුමක්දැයි ඇය හොඳින් දැන සිටියාය.

ලියුම අතේ තබාගෙන වාඩි ගත් ගමන්ම ඇගේ සිතිවිලි ඇගේ සොයුරිය වූ ජෙනී වෙත ගමන් කළේය. ඇය බාර ගන්නට යන දැරිවියගේ අම්මා පවුලේ දැඩි අකමැත්ත මත තරුණ දේවගැතිවරයකු සරණ පාවා ගැනීමට සටන් කළ හැටි ඇයට මතක් විය. ඒ කාලයේ පළාතේ සිටි වංශවතෙකු ඇගේ අත ගැනීමට කැමැත්තෙන් සිටි අතර ජෙනී ගේ පවුලේ උදවියද ඔහුට ඉතා කැමැත්තෙන් සිටියහ. එහෙත් ජෙනී ඔහුගේ අත ගැනීම ඉඳුරාම ප්‍රතික්ෂේප කළාය. ඒ වයසේ සිටි ඕනෑම තරුණියක මෙන්, මිළ මුදල් යහමින් ඇති වංශවතෙකුට වැඩියෙන්, හදවතේ ආදරය පුරවාගෙන, තරුණ සිතුවිලිවලින් ඔද වැඩී උන් දුප්පත් දේවගැතිවරයා වෙත ජෙනීගේ හිත තිරායාසයෙන්ම ඇදී යන්නට ඇත. අන්තිමේදී ඈ ඔහුගේ අත ගෙන මිෂනාරිවරයෙකුගේ බිරිඳක වීමට දකුණු පළාත බලා ගියාය.

ජෙනී සමඟ පවුලේ උදවියගේ සම්බන්ධය කැඩී ගියේ ඊට පසුවය. පොලී මෙනෙවියට එය ඉතා හොඳින් මතකයේ තිබිණි.

එවකට ඈ පවුලේ බාලම දූරිය වූවා - අවුරුදු පහලොවක තරුණියකව සිටියාය. ඇගේ පවුලේ උදවියට මිෂනාරිවරයකුගේ බිරියක සමග සම්බන්ධයක් පවත්වන්නට ඕනෑ වූයේ නැත. එහෙත් කාලයක් තිස්සේ ජෙනී විසින් එවන ලද ලියුම් ඔවුන්ට ලැබිණි. එක් වරක් ජෙනී ඔවුන්ට ලියමින් අගේ බාලම දූරියට ''පොලියානා'' ලෙස නම් තැබූ බව කිව්වාය. ඒ නම තබා තිබුණේ ජෙනීගේ සොයුරියන් දෙදෙනා වන ''පොලී'' යන ''ඇනා'' ගේ නම් දෙක එකට එකතු කිරීමෙනි. ජෙනීගේ ඉතිරි දරුවන් මිය ගිය බවත් ලිපියේ සඳහන් විය. ඒ ජෙනීගෙන් ලැබුණු අන්තිම ලියුම විය. ඊට අවුරුදු කිහිපයකට පසු ජෙනීගේ මරණය පිළිබඳව දන්වමින්, ඇගේ සැමියා විසින් දැඩි ශෝකයෙන් එවන ලද කෙටි ලිපියක් ඔවුන් වෙත ලැබිණි. ලියුම එවා තිබුණේ බටහිර පිහිටි කුඩා නගරයක සිටය.

එදා මෙදා තුර කඳු මුදුනේ පිහිටි සුවිසල් හැරින්ටන් බංගලාවේ සිටි උදවියගේ ජීවිතද කාලයට අවනතව ගලා ගොස් තිබුණි. පොලී මෙනෙවිය පහතින් සිටි ඉමක් නොපෙනෙන නිම්නය දෙස බලා සිටි අතරේ, ගතවූ අවුරුදු විසිපහ මුළුල්ලේ කාලය විසින් ඇගේ ජීවිතයට ගෙනා වෙනස්කම් ගැන සිතුවාය.

sinhalaebooks.com

දැන් අවුරුදු හතලිහක වයසේ සිටින ඇය තවමත් තනිකඩය. ඇගේ අම්මා, තාත්තා සහ සොයුරියන් සියලු දෙනාම සමාදානයේ සැතපී ඇති බැවින් ඇයට කියා කිසිවෙකු මේ ලෝකයේ ඉතිරිවී සිටියේ නැත. ඇගේ පියා විසින් ඉතිරි කොට තබා ගිය විශාල වත්කමකට හිමිකම් කී ඇය මහාගෙදර එකම ස්වාමිදූව බවට පත්ව සිටියාය. ඇගේ තනිවූ ජීවිතය ගැන අනුකම්පා කළ බොහෝ දෙනෙකු ඇගේ මිත්‍ර සමාගමය පතමින් හා වරෙක ඇගේ අත ගැනීමට කැමැත්ත පළ කරමින් සිටි අතර, පොලී මෙනෙවිය ඒ කිසිවෙකුගේ අනුකම්පාවට බඳුන් වීමට කැමති නොවූවාය. ඇය හැමවිටම කීවේ ඇය තනිවී නැති බවකි. තමන්ගේ නියම ස්වභාවයට අනුව ජීවත් වීමට ඇය කැමතිව සිටියාය. විශේෂයෙන්ම නිස්කලංකයේ සිටීමට. එත් දැන්....

පොලී මෙනෙවිය උන් තැනින් නැගිට්ටේ පුළුටු කරගත් මුහුණෙනි. ඇගේ දෙතොල් එකිනෙක තදවී තිබුණි. ඇත්තෙන්ම හොඳ ගැහැණියක වීමට ලැබීම ගැන ඇය සතුටින් සිටි අතර, ඇය මේ කාරියේදී තම යුතුකම ගැන දැන සිටීමෙන් නොනැවතී එය ඉටු කිරීම සඳහා අවශ්‍ය ශක්තියෙන්ද පිරිපුන් බව දැන සිටියාය.

ඒත් පොලියානා ! - ඇත්තෙන්ම එය කොයිතරම් අමුතු නමක්ද?

සිංහල EBOOKS

සිංහල නවකතා 1000කට අධික ප්‍රමාණයක් නොමිලේ
Ebook ආකාරයෙන් කියවන්න...
දැන්ම www.sinhalaebooks.com වෙත පිවිසෙන්න..

# 2

# ටොම් සීයා සහ නැන්සි

sinhalaebooks.com

නැන්සි අට්ටාලයේ තිබුණු කාමරය හොඳින් සුද්ධකොට අතු ගා දැම්මාය. විශේෂයෙන්ම ඇය සැලකිලිමත් වුණේ අහුමුළු ගැනය. සමහර වේලාවලදී ඇය මෙවැනි කාරියක් කිරීමට මහන්සි වන්නේ කුණු ඉවත් කර දැමීමකටත් වඩා ඇගේ සිතුවිලිවලට යහපතක් ලබා දෙනු පිණිසය. දැන් පොලී මෙනෙවිය කෙරෙහි වූ බයාදු කීකරුකම වෙනුවට ඇය තුළ පැවතියේ නොඉවසිලිමත් හැඟීමකි.

''අනේ ඇත්තටම මට එයැයිගෙ හිතේ අහුමුළුවලට එබිලා බලන්න පුළුවන්නම්,'' නැන්සි උල්වූ කොසු මිටෙන් පොළවට අතිමින් වරින්වර නැවතෙමින් පහත් හඬින් කෙඳිරුවාය. දැනටමත් - දැනටමත් මෙහෙ කොයිතරම් සුද්දකරන්න තියෙනවාද? අර අසරණ ළමයට අර තරම් දුර ඉඳලා ඇවිත් මේ පෝරණුවක් වගේ කාමරයක ඉන්නවෙන එක; ඇරත් සීත කාලෙට උඳුනකුත් නැති කාමරේ.

ඇරත් මෙච්චර ලොකු ගෙයක් තියෙද්දීත් මේකම තෝරා ගත්ත එක. ලෝකෙට ඕන් නැති ළමයි....."හ්ම්....." හඬ නැගූ නැන්සිගේ ඇඟිලි රෙදි කඩමාල්ල මිරිකාගෙන සිටීම නිසා වේදනාවෙන් ඇදුම් දෙමින් තිබිණි.

"දැනට තියෙන විදිහට නම් මට හිතෙන්නෙ මෙහාට ඕනෑ නැතිම දේ ළමයි නෙමෙයි." ටික වෙලාවක් තිස්සේ ඈ නිහඬව වැඩ කළාය. අගේ කාරිය අහවර වූ පසුව නැගී සිටි ඈ, හිස් කාමරය දෙස නොපහන් හැඟීමකින් බලා සිටියාය.

"හොඳයි - කොහොම හරි මගේ කොටස නම් ඉවරයි." ඇය සුසුමක් හෙළුවාය.

"දැන් නම් මෙතන කුණු නෑ. තියෙනවා නම් බොහොම පොඩ්ඩයි. අනේ අසරණ එකී; ගෙදර ඇතුලේම හැදිච්ච, තනිවෙලා ඉන්න පොඩි එකෙක්ව දාන්න හොඳ කාමරේ තමයි මේ." වැඩ හමාර කළ ඇය දඩාස් ගා දොර වසාගෙන පිටවී ආවාය.

"අනේ." හදිසියේ හඬනැගූ ඇය තොල විකා ගත්තාය. ඊට පසු ස්ථිර හඬකින් "හොඳයි මං ගණන් ගන්නේ නෑ. මං හිතන්නේ එයාට ඇහෙන්න ඇති හයියෙන් දොර වැහෙනව. ඒකනං එහෙමම තමයි.....!" යි තමාටම කියා ගත්තාය.

එදා හවස් වරුවේදී නැන්සිට ගෙවත්තේ වැඩ කරමින් සිටි ටොම් සීයා හමුවිය. ටොම් අවුරුදු බොහෝ ගණනක සිටම හැරින්ටන් බංගලාවේ ගෙවත්තේ වල්පැල ගලවමින්, අඩි පාරවල් සවල් කරමින් වැඩපල කර දෙන්නෙකි.

"ටොම් මාමේ " නැන්සි කතාව පටන් ගත්තේ තමන් දෙස කිසිවෙකු බලා සිටිනවාදැයි හිස කරකවා උරහිසට උඩින් ආපිට බැලීමෙන් පසුවයි.

"ඔයා දන්නවද මිස් පොලී එක්ක ඉන්න පොඩි ගෑනු ළමයෙක්

මෙහෙ එනවැයි කියල....''

''මොකක්,'' කුදුවූ කොන්ද අමාරුවෙන් කෙලින් කර ගැනීමට තතනමින් මහලු මිනිසා ඇසුවේය.

''පුංචි ගෑනු ළමයෙක් මිස් පොලී එක්ක ඉන්න එනවා.''

''වෙන මොකක් හරි විහිළුවක් කීවොතින් හොඳ නැද්ද?'' ටොම් නොසැලකිල්ලෙන් කීවේය. ''ඇයි උඹ මට කියන්නැත්තේ හෙට ඉර බහින්නේ නැගෙනහිරින්ය කියලා.''

''ඒත් ඒක ඇත්ත, මිස් පොලීමයි මට කිව්වේ.'' නැන්සි කියාගෙන ගියාය. ''ඒ එන්නේ එයාගේ අක්කගෙ දුව. එයාට තාම අවුරුදු එකොළහයි.''

මහලු මිනිසාගේ කට වැසිණි.

''හෝ.... මට මතකයි නොවෙන්නං.'' මිමිනූ ඔහුගේ මලානික දෑසට ආලෝකයක් වැටිණි.

sinhalaebooks.com

''එයා ජෙනී නෝනගෙ පුංචි කෙලි පොඩිත්ති වෙන්ඩෝනෑ. අනිත් කවුරුවත් කසාද බැන්දෙ නෑ නෙව. ඇයි නැන්සියේ ඒ ජෙනී නෝනගෙ පුංචි කෙල්ල - දෙයියන්ට ස්තුති වේවා! මගේ නාකි ඇස් දෙකට මේක දකින්න පුළුවන් වෙච්ච එක ගැන....''

''කවුද ජෙනී නෝනා කියන්නෙ.''

''එයා සුරලෝකෙන් බැහැපු සුරදූතිකාවක්.''මහළු මිනිසා අමාරුවෙන් හුස්මක් ඇද ගත්තේය. ''එයා ලොකු නෝනගෙයි මහත්තයගෙයි ලොකුම දූ. එයා කසාද බැඳලා මෙහෙන් යනකොට අවුරුදු විස්සක් ඉතිර ඇති. ඒ හුඟාක් කාලෙකට ඉස්සර නොවැ. මයෙ හිතේ ජෙනී නෝනගෙ අනිත් ළමයි සේරොම මැරුනා. ඔය මෙහාට එනවැයි කියන්නේ බාලම ළමයා වෙන්ඩැ.''

''එයාට අවුරුදු එකොලහයි.''

'' වෙන්ඩැති'' මහල්ලා ඔලුව වැනුවේය.

''දන්නවද, එයාට නිදාගන්න දීල තියෙන්නෙ අර අට්ටාලෙ උඩ කාමරේ. ලැජ්ජාවක හැටි.''නැවත බංගලාව දෙස හැරී බලමින් නැන්සි අවලාද නැගුවාය.

ටොම් සීයාගේ මුහුණෙන්ද බැරෑරුම් ස්වභාවයක් පල විණි. එහෙත් ඊළඟ මොහොතේ ඔහු විහිළු හිනාවක් මුවට නගා ගත්තේය.

''මට නම් හිතාගන්න බෑ. පොලී නෝනා ඔය ළමයත් එක්ක මොනවා කරයිද කියලා.'' ඔහු කීවේය.

''හ්ම් මං නම් හිතන්නෙ පොඩි ළමයෙක් පොලී නෝනත් එක්ක මොනව කරයිද කියල.'' නැන්සි හඬ නැගුවාය.

මහළු මිනිසා හිනාවෙන්නට පටන් ගත්තේය.

''මට පේන්නෙ ඔය ළමය පොලී නෝනට ඒ හැටි කැමැත්තක් නෑ වගේ.'' ඔහු විරිත්තුවේය.

''හරියට අනිත් හැමෝම එයාට කැමතියි වගේ.'' නැන්සි කඩා පැන්නාය.

මහලු ටොම්ගේ මුහුණේ අමුතු හිනාවක් ඇඳිණි. ඔහු පහතට නැමී යළි වැඩ කරන්නට පටන් ගත්තේය.

''මං හිතන්නෙ ඔය ළමයා දන්නැතිව ඇති පොලී නෝනගෙ ආදර සම්බන්දෙ ගැන...'' යි ඔහු හෙමිහිට කීවේය.

''ආදර සම්බන්ධයක්...එයාට! නෑ... මං නං හිතන්නෙ නෑ.... කිසි කෙනෙක් එයා එක්ක එහෙම දෙයක් තියා ගත්ත කියල..''

''නෑ එහෙම අය හිටිය....'' මහලු මිනිසා ඔලුව වැනුවේය.

''එහෙම හිටපු කෙනෙක් මේ ටවුමෙම - අදත් ඉන්නවා නෙව....''

''කවුද ඒ....''

''මං ඒක කියන්ඩ යන්නෙ නෑ. එහෙම කරන එක හොඳත් නෑ නෙව....'' මහලු මිනිසා නැවතත් කෙළින් වී සිට ගත්තේය. බංගලාව දෙසට මුහුණ හරවා ගෙන සිටින ඔහුගේ මලානික නිල් පැහැ දෑස්වල ඇඳී තිබුණේ, ජීවිත කාලයක් තිස්සේ මේ ගෙදර වෙසෙන මිනිසුන්ට සේවය කළ, ආදරය කළ, අවංක සේවකයෙකු තුළ ඇතිවන ආඩම්බර හැඟීමය.

''මට නං ඒක හිතන්නත් අමාරු දෙයක්. එයයි - එයාගේ ආදරවන්තයයි....! නැන්සි තවමත් සිටින්නේ ඇගේ මතයේ ම ය.

ටොම් සීයා ඔලුව දෙපසට වැනුවේය.

sinhalaebooks.com

''ළමයා, මම පොලී නෝනා ගැන දන්න තරං උඹ දන්නෑ....'' යි ඔහු වාද කළේය. ''එයා ඇත්තටම ලස්සන හොඳ හිතක් තියෙන නෝනා කෙනෙක් වෙලා හිටිය. දැන් උනත් එහෙම තමා, එයා එයා විදිහටම ඉන්නවා නං...''

''ලස්සන! මිස් පොලී....!''

''ඔව් එයා ඉස්සර හිටි විදිහටම. ඔය තදේට බැඳගෙන ඉන්න කොණ්ඩේ ලිහා දමලා, ලස්සන මල් ගහපු තොප්පියක් හෙම දාගෙන, ලේස් අල්ලාපු සුදු ඇඳුමක් කාරිය ඇඳගෙන උන්නා නං, එයාට කොයි තරං හොඳ රූප සොබාවක් තියෙනවාද කියල උඹට පෙනෙයි. පොලී නෝනට ඒ හැටි වයසකුත් නෑ නෙව....''

''හැබෑටම? හොඳයි... ඒත් යස අගේට ඒකෙ අතික් පැත්තයි අපට පේන්නෙ....''යි නැන්සි හුස්මක් ඉහළට ඇද ගත්තාය.

''ඔව් ඒකනං ඇත්තයි. ඔය සේරෝම පටන් ගත්තේ එයාගේ ආදරවන්තයා එක්ක ඇයි හොඳයි කං අතෑරිය වෙලේ හිටං නොවැ'' යි මහලු ටොම් හිස සැලුවේය. ''එදා හිටං දාහට අරන් සීයට දුන්නා වගේ නොවැ ජීවත් වෙන්නෙ. ආස්සරේ කරන අයටත් කටු අත්තක් වගේ නපුරු උණා...''

''ඒක නං හැබෑම තමා...''නැන්සි තිර හඬින් එය අනුමත කළාය. ''ඔය කොච්චර ඕවා කිව්වත්, මට නං එයාගෙ කිසිම හොඳක් පේන්නෙ නෑ. මගේ පඩියයි මේ ගෙදර ඉන්න අනිත් ඇයොයි නැත්නං මං මොහොතකටවත් මේ ගෙදර හිටින්නේ නැහැ. ඒත් කවදහරි - කවදහරි මාත් මගේ තරහ පිට කරනවා. එදාට ඉන්නෙ අද මේ ඉන්න නැන්සි නෙමේ. ඔන්න මං කිව්වා කියල හිතා ගන්න!''

මහලු ටොම් හිස දෙපසට වැනුවේය.

''මට තේරෙනවා කෙල්ලෙ. ඔහොම හිතෙන එක සොබාවිකයි. ඒත් ළමයා ඕක ඒතරං හොඳ හිතුවිල්ලක් නෙමෙයි. කොහොමටත් නෑ....'' යි කී ඔහු යළිත් වරක් හිස බිමට හරවා ගෙන වැඩෙහි යෙදෙන්නට පටන් ගත්තේය.

''නැන්සී!'' තියුණු කටහඬක් ඈතින් ඇසිණි.

''ඔ-ඔව් මැඩම්. මේ එනවා.'' යි ගොත ගැසූ නැන්සි හනික බංගලාව දෙසට දිව ගියාය.

# 3

# පොලියානාගේ පැමිණීම

sinhalaebooks.com

මේ අතර වාරයේ, ජූනි මස විසි අට වෙනිදා හවස හතරට පොලියානා දැරිය බෙල්ඩින්ග්ස්විල් බලා එන බව දන්වමින් විදුලි පණිවුඩයක් ලැබුණි. පොලී මෙනෙවිය එය කියවා, මුහුණ පුළුටු කරගෙන අට්ටාලයට යන පඩිපෙළ දිගේ නැංගාය. අට්ටාලයේ කාමරයට ඇතුලු වී වටපිට බලන අතරේත් අගේ මුහුණ මඳකින්වත් වෙනස් වූයේ නැත.

කාමරයේ තිබුණේ පිළිවෙලට සකසන ලද කුඩා ඇඳක්, පුටු දෙකක්, මුහුණ දොවන බේසමක්, කණ්නාඩියක් රහිත ලියන මේසයක් සහ තවත් කුඩා මේසයක් පමණි. කාමරයේ ජනේල ආවරණය කරමින් ජනෙල් තිර දමා තිබුණේ නැති අතර, බිත්තිවල පින්තූර කිසිවක් තිබුණේද නැත. මුළු දවස තිස්සේම වහලයෙන් හිරු රැස් කාමරය තුළට පෙරී ආ බැවින් එය ගිනි උඳුනක් මෙන්

උණුසුම් විය. තිර දමා නොතිබුණෙන් ජනෙල් ඇරිය නොහැකි විය. ලොකු මැස්සෙක් ජනේලය ළඟට වී ඉහල පහල පියාඹමින් පිටතට යා නොහැකිව හඬ නැගුවේය.

පොලී මෙනෙවිය මැස්සා මරා, ජනේල රාමුව මදක් ඇර, පිටතට විසි කළාය. කාමරයේ තිබූ පුටුවක් කෙලින් කොට, ඔරවා ගත් ගමන්ම කාමරයෙන් පිටවී ගියාය.

''නැන්සි.'' මිනිත්තු කිහිපයකට පසු මුළුතැන්ගෙයි දොර අසලදී හඬ ගෑ ඇය ''උඩ තට්ටුවේ මිස් පොලියානාගේ කාමරේ මැස්සෙක් හිටියා. ජනෙල් ටික වෙලාවක් ඇරලා තියන්න ඕනෑ. මං දැනටමත් තිර වගයක් ඕඩර් කරලයි තියෙන්නෙ. ඒත් ඒවා ලැබෙනකං ජනෙල් හරියට වහල තියෙනවද කියලා ඔයා බලන්න ඕනෑ. පොලියානා හෙට හතර වෙනකොට එයි. මං හිතාගෙන ඉන්නේ එයාව බාරගන්න ඔයාව ස්ටේසමට යවන්න. තිමති ඔයාව බක්කි කරත්තේ එක්කං යයි. ටෙලිග්‍රෑම් එකේ කියල තිබුණෙ නං දුඹුරු පාට කොණ්ඩයක් තියෙන, රතු පාට කොටු වැටිච්ච ගවුමක් ඇඳගත්ත, පිදුරු තොප්පියක් දාපු ළමයෙක් කියලයි. එයා ගැන මං දන්නෙ නං ඒච්චරයි. ඒ වුණාට එයාව අඳුනගන්න වැඩේට ඒ හරිය මදැයි....''යි කීවාය.

''ඒකනං ඇත්ත මැඩම්- ඒත් - මැඩම්....''

නැන්සි ගිලගත් දේ පොලී මෙනෙවිය දත් බව පෙනුණි. රවා බැලූ ඇය මදක් තදින් ''නෑ.... මං යන්නෙ නෑ. මං යන එක අවශ්‍යම නෑනෙ. එච්චරයි'' යි කියාගෙන ආපිට හැරුණාය. පොලියානාගේ පැමිණීම වෙනුවෙන් පොලී මෙනෙවියගේ ලකලෑස්ති වීම් එතැනින් අහවර විය.

මුළුතැන්ගෙයි සිටි නැන්සි රත්වූ ස්ත්‍රික්කය දීසි පිසදමන තෙත්වූ රෙදිකඩ උඩින් යවමින් කල්පනාවේ ගිලුණාය.

''දුඹුරු කෙස් - රතු කොටු ගවුම - පිදුරු තොප්පිය- ඇත්තෙන්ම එයා දන්නෙ එච්චරයි. මම එයා නං ඇත්තටම..... ඇත්තටම මං

ඒගැන ලැජ්ජා වෙනවා. ඇරත් ගව්ගානක් දුර ගෙවාගෙන එන්නෙ මගෙ එකම ලේලි නං....''

ඊළඟ දවසේ හවස් වරුවේ, හතරට විනාඩි විස්සක් තබා නැන්සි සහ තිමති බක්කි කරත්තයේ නැගී අමුත්තිය පිළිගැනීමට ගියහ. තිමති ටොම් සීයාගේ පුතාය. අහල පහළ මිනිස්සු කිව්වේ, ටොම් සීයා පොලී මෙනෙවියගේ දකුණු අත නම් තිමති ඇගේ වමත බවයි.

තිමති කඩවසම් පෙනුමෙන් යුතු ප්‍රසන්න තරුණයෙකි. නැන්සි බංගලාවට පැමිණ කෙටි කාලයක් වූ නමුත් මේ වන විට දෙදෙනාම හොඳ මිතුරන්ව සිටියහ. වෙනදාට කටකාර නැන්සි අද බොහෝ නිශ්ශබ්දතාවයෙන් බක්කි කරත්තයේ ගමන් කළේ ඇයට පැවරුණු වැඩය ගැන සිතමිනි. ඇය ස්ටේෂමට පැමිණ දුම්රිය එනතුරු බලා සිටින්නට වූවා - නිතරම, දුඹුරු කොණ්ඩය - රතු කොටු ගවුම - පිදුරු තොප්පිය, යි තනිවම කියා ගන්නට වූවාය. ඒ කාලය මුළුල්ලේම ඇය සිතමින් සිටියේ පොලියානා කුමන විදිහක ගැහැණු ළමයෙක් වේද කියායය.

sinhalaebooks.com

''දෙයියන්ගෙ නාමෙට එයා නිස්සද්ද - හිතල බලල වැඩ කරන - කඩිකුලප්පුවක් නැති ළමයෙක් වෙන්ඩ ඕනෑ....'' ඇය සුසුමක් හෙලා තමන් දෙසට අලස ගමනින් එන තිමති දෙස බැලුවාය.

''හොඳයි - එයා එහෙම නොවුණොත්, අපිට මොනව වෙයිද කියලා දෙයියො තමා දන්නෙ,'' තිමති විරිත්තුවේය. ''ටිකක් හිතල බලන්න පොලී නෝනයි - කෑගහන ළමයෙකුයි! ඔන්න කෝච්චිය හූ කියන සද්දෙ ඇහෙනවා...''

''අනේ තිමති...ඒ කියන්නෙ මට දූන් ඉස්සරහට යන්ඩ වෙයි...'' යි තිගැස්සුණු නැන්සි කීවාය. ඇය හැරී, කුඩා දුම්රියපොළට පැමිණ දුම්රියෙන් බසින මගීන් දෙස වඩා හොඳින් බැලිය හැකි තැනකට ඉක්මන් ගමනින් ගියාය.

වැඩි වේලා නොගොස්ම නැන්සි ඇයව දැක්කාය. ඒ, පිට දිගට ගෙතූ කොණ්ඩ කරල් දෙකක් සහිතව, රතු කොටු ගවුමකින් සැරසුණු හීන්දෑරි ගැහැනු ළමයෙකි. ඇය හිසට දමාගෙන සිටි පිදුරු තොප්පියට යටින් වූ දුඹුරු පාට ලප වැටුණු කුඩා මුහුණ නොඉවසිල්ලෙන්, කාවදෝ සොයමින් එහෙ මෙහෙ හැරුණි.

නැන්සි එක්වරම ඈ හැඳිනගත් නමුත්, වෙව්ලන දෙපා සහිතව ඈ වෙත යාමට මදක් වේලා ගත්තාය. අන්තිමේදී නැන්සි කුඩා ගැහැනු ළමයා ළඟට යනවිට ඇය නිසලව උන් තැනම හිටගෙන සිටියාය.

''ඔයා මිස්-පොලියානා ද?''නැන්සි මද සැකයෙන් ඇසුවාය. ඊළඟ මොහොතේ කපු රෙද්දෙන් වැසුණු අත් දෙකකට තමන් සිරවී සිටිනු ඇයට දැනිණි.

''අනේ මට හරිම සතුටුයි - සතුටුයි - ඇත්තටම ඔයාව දකින්න ලැබුණු එක ගැන සතුටුයි.'' නොඉවසිල්ලෙන් කෑගැසූ හඬක් ඇගේ කන අසලින් ඇසුණි.

''අනේ ඔව්..... මං පොලියානා තමයි. ඔයා මාව හම්බවෙන්න ආවට මට හරි සතුටුයි. ඔයාටත් එහෙම වෙන්නැති.''

''ඔයා හිතන්නේ එහෙමද?'' යි ගොතගැසූ නැන්සි පොලියානා තමන් ගැන දැන ගත්තේ කෙසේද, මේ තරම් ඇඟෑලුම්කමකින් කතා කරන්නේ මක්නිසාද යන්න ගැන සිතමින් සිටියාය.

''ඔයා හිතන්නේ එහෙමද?'' නැන්සි නැවත වරක් ඇසුවේ ඇගේ තොප්පිය කෙලින් කර ගනිමිනි.

''අනේ ඔව්, මං මෙහාට එනකල්ම හිත හිතා ආවේ ඔයා කොයි විදිය වෙයිද කියල?'' ගැහැනු ළමයා කෑගැවාය. ඇය නැන්සිගේ හිසේ සිට දෙපතුල දක්වා දෑස් යවමින් ඇඟිලිවලින් ඉස්සී එහෙට මෙහෙට වැනුනාය. ''ඒත් මං දැන් දන්නවා. මට හරි සන්තෝසයි.

ඔයා මං හිතපු විදියම වුණ එක ගැන....''

නැන්සිට අස්වැසිල්ලක් ලැබුණේ තිමති ඔවුන් දෙසට එනු දුටු විටය. තවමත් ඇයට පොලියානා කියන වචන අගක් මුලක් නැතිවාක් මෙන් පෙනුණි.

''මේ තමයි තිමති. සමහර විට ඔයාට ට්‍රන්ක පෙට්ටියක් ඇති මගේ හිතේ....''ඇය නැවත වචන ගැට ගැසුවාය.

''ඔව් තියෙනවා.''යි හිස සලමින් පොලියානා කිව්වාය. ''මට තියෙන්නේ අලුත්ම අලුත් එකක්. අර ''කාන්තා සරණ'' සංගමේ* කට්ටිය තමයි මට එකක් ඇරන් දුන්නෙ. ඇත්තටම ඒගොල්ලො කොයිතරම් හොඳද නේද? ඒගොල්ලන්ට කාපට් එකකුත් ඕනවෙලා තියෙන කොට! අනේ මන්දා - ට්‍රන්ක පෙට්ටියක් ගන්න සල්ලිවලින් රතු කාපට් කොච්චර ගන්න පුළුවන්ද කියලා. ඒත් ඒක ඒගොල්ලො කොහොම හරි ගන්න ඕනෑ - අඩුගානෙ පල්ලියෙන් බාගෙකටවත්. ඔයා එහෙම හිතන්නේ නැද්ද? ආ ! මගෙ බෑග් එකේ පොඩි බඩුවකුත් තියෙනවා. මිස්ට ග්‍රේ කිව්වේ ඒක චෙක් එකක් කියලයි. ට්‍රන්ක පෙට්ටිය ගන්න කලින් මං ඒක ඔයාට දෙන්නං. මිස්ට ග්‍රේ තමයි ග්‍රේ නෝනගේ මහත්තයා. ඒ ගොල්ලෝ ඩීකන් කාර්ගෙ නෝනගෙ ඥාති සහෝදරයා. මං මෙහාට ආවෙ එයාල එක්ක. එයාල හරි හොඳයි -මෙන්න ඒක තියෙනවා.'' පොලියානා කියවිල්ල නවතා බෑගය බොහෝ වේලා ඇවිස්සීමෙන් එළියට ගත් චෙක්පත නැන්සි වෙත පෑවාය.

නැන්සි දිග හුස්මක් ගත්තාය. ඒ කතාවෙන් පස්සේ නැන්සිට දැනුනේ තමන්ද කුමක් හෝ කිව යුතු බවයි. ඉතින් ඇය තිමති දෙස බැලුවාය. තිමතිගේ දෑස් පරීක්ෂාකාරී ලෙස ඉවත හැරිණි.

තුන්දෙනාම ආපසු යන්නට පිටත් වූහ. ට්‍රන්ක පෙට්ටිය

*කාන්තා සරණ සංගමය යැයි මෙහිදී පොලියානා කියන්නේ දේවස්ථානය ආශ්‍රිතව ගොඩනැඟුණු මහිලා සමිතියකටය. ඇගේ පියා දේවගැතිවරයකු වූයෙන්, මව නැති ඇය බලා කියා ගත්තේ එහි සාමාජිකාවන් විසිනි. - පරිවර්තක.

sinhalaebooks.com

කරත්තයේ පසුපස තබා තිබූ අතර පොලියානා තිමතිට හා නැන්සිට මැදි වී සැප පහසුවට ඉඳගෙන සිටියාය. ගමන පටන්ගත් වේලේ සිටම පොලියානාගේ අතොරක් නැති දෙඩවීම ඇසුණු අතර ඈ සමඟ හුස්මක් කටක් ගැනීමටවත් ඉඩ නොලැබෙන බව අන්දමන්ද වී සිටි නැන්සිට තේරී තිබිණි.

"ඔන්න ඇත්තටම මේ ගමන කොයිතරම් හොඳද? තව දුරද? මං හිතුවා එහෙම වෙයි කියලා. මං නං අස්ස කරත්තයේ යන්න ආසයි." කරත්ත රෝද හැරවෙන විට පොලියානා සුසුමක් හෙලුවාය.

"ඇත්තටම මට එහෙට ඉක්මනට යන්න ඕනෑ තමයි. ඒත් තව දුර යන්න තියෙනවා නම් ඒකත් කමක් නෑ. අනේ කොයිතරං ලස්සන වීදියක්ද? මම දැනගෙන හිටියා මෙහේ එහෙම තමයි කියලා. තාත්තා මට කිව්වා."

කෙටි හුස්මක් ඇද ගැනීමට නැවතෙමින් ඇය කිව්වාය. ඇය දෙස හොඳින් බලා සිටි නැන්සිට පොලියානාගේ නිකට වෙව්ලන බවත් ඇගේ දෑස් කඳුලින් පිරී තිබෙන බවත් දැක ගන්නට හැකි විය. ඊළඟ මොහොතේ පොලියානා හිතට දිරිය ගෙන හිස ඔසවා කතාව කරගෙන ගියාය.

"තාත්තා මට ඔක්කොම කිව්වා. එයාට ඒ ගැන හොඳට මතක තිබුණා. මට ඔයගොල්ලන්ට මේ ගැන කලින් කියන්න තිබුණා. දවසක් දා මිසිස් ග්‍රේ මා එක්කලා කතා කළා, මේ රතු කොටු ගවුම ගැනයි - ඇයි මම කළු ඇඳගෙන ඉන්නෙ නැත්තේ කියලයි. එයා කිව්වා ඔයගොල්ලො ඒ ගැන මොනවා හරි හිතයි කියලා. ඒත් පසුගිය අවුරුද්දේ අපට හම්බුවෙච්ච මිෂනරි තෑගි පෙට්ටියේ* කළුපාට රෙදි කිසිම දෙයක් තිබුණේ නෑනේ. ඒකේ තිබුණ වෙල්වට් ඇඳුම මට කොහොමටවත් ගැලපෙන්නේනෑ කියලා ඩීකන් කාර්ගේ නෝනා කිව්වා. ඒ මදිවට ඒක ගෙවිලා ගිහින්. වැලමිට ළඟයි -

***මිෂනරි තෑගි පෙට්ටි යැයි පොලියානා මෙහිදී කියන්නේ දේවස්ථානය ආශ්‍රිත මීසමේ දූප්පතුන්ට ආධාර වශයෙන් ලැබෙන දේවල්වලටය- පරිවර්තක.***

තවත් සමහර තැන්වලයි සුදු පාට පැල්ලම්. කාන්තා සරණ සංගමයේ කට්ටියට නම් මට කළු ගවුමකුයි තොප්පියකුයි අරන් දෙන්න ඕන වුණා. ඒත් අනික් අය කිව්වා පල්ලියට ඕන වෙලා තිබුණු කාපට් එක ගන්න සල්ලි තියාගන්න ඕනෙ කියලා. වයිට් නෝනත් කිව්වා ඒක හොඳයි කියලා - එයා කළු ඇඳගෙන ඉන්න ළමයින්ට කැමති නැනෙ. ඒ කියන්නෙ එයා ළමයින්ට කැමති නෑ කියන එක නෙමේ. එයා කළු පාටට කැමති නෑ...."

පොලියානා සුසුමක් ගැනීමට නැවතුණාය. නැන්සි යාන්තම් වචන ගැට ගැසුවාය.

"හොඳයි. ඒක එහෙම තමයි කියල මමත් හිතනවා. ඒකට කමක් නෑ.....!"

"මට සතුටුයි ඔයා එහෙම හිතපු එක ගැන. මාත් එහෙම තමා හිතන්නෙ...." හිස සැලූ පොලියානා නැවතත් හුස්මක් ඇද ගත්තාය.

"ඇත්තටම කළු ඇඳගෙන, ඒක ගැන සතුටු වෙන එක ටිකක් අමාරු වැඩක්....."

sinhalaebooks.com

"සතුටු.....?"' නැන්සි බාධා කරමින් කට අයා ගත්තාය.

"ඔව්.... තාත්තා ස්වර්ගෙට ගියෙ අම්මයි, පවුලෙ අනික් අයයි එක්ක එකතු වෙන්න. එයා කිව්වා එහෙම වුණොත් මං ඒක ගැන සන්තෝස වෙන්න ඕන කියල. ඒත් ඒක කරන්න හරි අමාරුයි. මේ රතු කපු ගවුම ඇඳගෙන උණත් මට - මට එයාව ඕන. ඇරත් අම්මටයි අනිත් කට්ටියටයි නං දෙවියන් වහන්සෙයි, සුරදූතිකාවොයි ඉන්න කොට, මට කාන්තා සරණ සංගමේ කට්ටිය ඇරෙන්න වෙන කාත් කවුරුවත් නැති කොට, තාත්තා මං ළඟ ඉන්නම තිබුණා කියල හිතන එක නවත්තගන්න මට බැරි වුණා. ඒත් මට දැං හිතෙනවා ඒක නොහිත ඉන්න පුලුවං වෙයි කියලා පොලී පුංචි අම්මේ - මට ඔයා ඉන්න නිසා. මට හරිම සතුටුයි ඔයා ළඟට එන්න ලැබිච්ච එක ගැන...."

මේ අසරණ කෙලි පොඩිත්තිය වෙනුවෙන් නැන්සිගේ හිත් ඇදෙමින් තිබූ අනුකම්පාව සහගත වේදනාව යට කරමින් එක්වරම භයානක හැඟීමක් මතු විය.

''අනේ ඒත් - එත් ඔයාට ලොකු වැරදීමක් වෙලා පැටියෝ....'' යි ඇය කීවාය.''මම නැන්සි. මම ඔයාගේ පොලී පුංචි අම්මා නෙමේ.''

''ඔයා - ඔයා එයා නෙමෙයිද?'' විස්මයට පත් කුඩා දරිය තැතනුවාය.

''නෑ. මං නැන්සි... මං කවදාවත් හිතුවේ නෑ එයා වෙනුවෙන් ඔයාව බාර ගන්න මට එන්ඩ වෙයි කියලා. අපි දෙන්නා කොහොමටවත් එක වගේ නෙමේ - කොහොමටවත් - කොහොමටවත් නෑ.....''

තිමති හෙමිහිට හිකි හිකි ගෑවේය. ඔහුගේ දෑසේ වූ ප්‍රීතිමත් බැල්මට පිළිතුරු දීමට නොහැකි තරම් නැන්සි කළබල වී සිටියාය.

''ඒත් ඔයා කවුද?'' යි පොලියානා ඇසුවාය.

''ඔයා චුට්ටක්වත්, කාන්තා සරණ සංගමේ එක්කෙනෙක් වගේ නෙමෙයිනෙ.....''

තිමතිගේ සිනහව මහ හඬින් එළියට පැන්නේය.

'මං හැරින්ටන් බංගලාවේ වැඩට ඉන්න එක්කෙනා. රෙදි සෝදන එකයි, ඇඳුම් මදින එකයි ඇරෙන්න ඒ ගෙදර ඔක්කොම වැඩ කරන්නෙ මං තමයි - රෙදි හෝදන මදින වැඩේ කරන්නෙ මිස් ඩර්ජින් කියල කෙනෙක්.''

''ඒත්, පොලී පුංචි අම්මා කියලා කෙනෙක් ඇත්තටම එහේ ඉන්නව ද?'' දැරිය කුතුහලයෙන් විමසුවාය.

''දෙයියම්පල්ල එහෙම කෙනෙක් ඉන්නවා....'' තිමති මැද්දට පැන්නේය.

පොලියානා සැනසුම් සුසුමක් හෙලනු පෙනුණි.

''අම්මේ... එහෙනං කමක් නෑ.....''

මොහොතක නිශ්ශබ්දතාවයකි. ඊළඟ මොහොතේ ඇය ප්‍රාණවත් ලෙස, ''ඉතිං ඔයාල දන්නවද? මට දූන් සතුටුයි. අන්තිමේදී එයා මාව බාර ගන්න නාවත් - දූන් මම ඔය දෙන්නත් එක්ක එයාව බලන්නයි යන්නෙ....''

නැන්සිගේ මුහුණ රතු විය. තිමති ඈ දෙස බලා සමච්චල් හිනාවක් පෑවේය.

''මං හිතන්නෙ නං ඒක අගේ ඇති කියමනක්'' ඔහු කීවේය - ''ඇයි ඔයා මේ පුංචි නෝනට ස්තුති කරන් නැත්තෙ?''

sinhalaebooks.com

''මම - මම මේ හිතන්නෙ පොලී මැඩම් ගැන...'' නැන්සි පැකිලෙමින් කීවාය.

පොලියානාද සුසුමක් හෙලුවාය.

''මාත් එහෙමයි. මම හුඟාක් කැමැත්තෙං ඉන්නෙ එයාට. ඔයාල දෙන්නවනේ එයා මට ඉන්න එකම නෑයා කියල. කොයි තරං කාලයක් මං ඒ බව නොදැන හිටියද? අන්තිමේදී තාත්තා තමයි එයා ගැන කිව්වේ. තාත්තා කිව්වේ එයා ඉන්නෙ කන්දක් උඩ තියෙන ලස්සන විසාල බංගලාවක කියල....''

''ඔව්. ඔයාට ඒ බව දූං බලාගන්ඩ පුළුවන්....'' නැන්සි කීවාය. ''අර ඈත පේන කොලපාට තීරුවේ තියෙන සුදු බංගලාව....''

''අනේ ! කොච්චර ලස්සනද ? අම්මෝ ඒක වටේ තියෙන

කොළ පාට ගස්... තණකොළ ගොඩ! මං කවදාවත් එච්චර විසාල තණකොළ යායක් දැකලා නෑ. අපේ පුංචි අම්ම පෝසත් ද නැන්සි...''

''ඔව් මිස්....''

''මට හරි සතුටුයි. සල්ලි ගොඩක් තියෙන එක ඇත්තටම කොච්චර හොඳ ඇතිද? එහෙම පෝසත් කිසි කෙනෙක් මං දන්නෙ නෑ - වයිට් පවුල ඇරෙන්න. ඒ ගොල්ලොත් ඒ හැටි පෝසත් නැති උනාට, එයාලගෙ ගෙදර හැම කාමරේටම කාපට් තිබුණා. එහෙ හැම ඉරිදටම අයිස්ක්‍රීමුත් තිබුණා. පොලී පුංචි අම්මාත් හැම ඉරිදටම අයිස්ක්‍රීම් දෙනවද?''

නැන්සි ඔලුව දෙපසට වැනුවාය. ඇගේ දෙතොල් එකිනෙක තදවී තිබුනි. ඇය හිනා යන්නට ඔන්න මෙන්න බැල්මකින් තිමති දෙස බැලුවාය.

''නෑ මිස්. ඔයාගෙ පුංචි අම්ම අයිස්ක්‍රීම්වලට කැමති නෑ - මං හිතන විදිහට. කොටින් කියනවා නං මං කවමදාවත් එයාගෙ කෑම මේසෙට අයිස්ක්‍රීම් තියෙනව දැකල නෑ....''

පොලියානාගේ මුහුණ එල්ලා වැටිණි.

''අනේ එහෙමද? ඒ ගැන නං මට දුකයි. මට නං තේරෙන්නේ නෑ එයා අයිස්ක්‍රීම් වලට කැමති කරවගන්නෙ කොහොමද කියල. ඒත් - කොහොම හරි මං හිතනව මට ඒ ගැනත් සතුටු වෙන්න පුළුවන් කියල. ඒ මොකද මිසිස් වයිට්ට එක පාරක් වුණා වගේ අයිස්ක්‍රීම් කෑවම බඩ රිදෙන හින්ද. මම වයිට්ලගේ ගෙදරදී නං ගොඩක් අයිස්ක්‍රීම් කාල තියෙනවා. කමක් නෑ. ඒක නැති උනත්, මං හිතන්නෙ පොලී පුංචි අම්මගෙ ගෙදර කාපට් නං ඇති....''

''ඔව්... ඒවා නං තියෙනවා තමා....''

'හැම කාමරේටම....?''

''ඔව් - හැම කාමරේකටම වගේ....'' යි නැන්සි උත්තර දුන්නේ, කාපට් කිසිවක් නැති අට්ටාලයේ හිස්, පුංචි කාමරය ගැන හදිසියේ මතක් වීමෙන් ඇති වූ අඳුරු මුහුණෙනි.

''අනේ... මට හරි සන්තෝසයි....'' පොලියානා කීවාය - මං කාපට්වලට හරි ආසයි. අපේ ගෙදර කවදාවත් හොඳ කාපට් තිබුණෙ නෑනෙ - හැමදාම අර මිෂනරි තෑගි පෙට්ටියේ එන කඩමළු දෙක ඇරෙන්න. ඒවායින් එකකත් තීන්ත පැල්ලං තිබුණා. මිසිස් වයිට්ලගෙ ගෙදර නං බිත්තිවල පින්තූරත් ගහල. ඒවා නං හරිම ලස්සනයි. රෝසමල්, පුංචි ගෑනු ළමයි. පූසි පැටවුයි, බැටලු පැටවුයි සිංහයොයි. උන් ඔක්කොම එකම පින්තූරෙ නෙමෙයි ඉන්නෙ. වෙන වෙනම පින්තූරවල හොඳද? ඔයා පින්තූරවලට ආස නැද්ද?

''මං - මං දන්නෙ නෑ....'' යි නැන්සි උත්තර දුන්නේ බාගෙට හිරවුණු කටහඬකිනි.

''මං නං කැමතියි. අපේ ගෙදර පින්තූර තිබුණෙත් නෑනෙ. මිෂනාරි තෑගි පෙට්ටිවල ඒවා තිබුණෙත් නෑ. එක පාරක් නං ඒවයේ පින්තූර දෙකකුත් තිබුණා. එයින් එකක් ගොඩක් වටින හින්දා තාත්තා ඒක සල්ලිවලට වික්කා. එයා ඒ සල්ලිවලිං මට සපත්තු දෙකක් අරන් දුන්නා. අනිත් පින්තූරෙ අපි බිත්තියෙ එල්ලපු ගමන්ම වැටිලා කෑලිවලට කැඩුනා. ඔයාට කිව්වම මොකෝ - ඒකෙ වීදුරුව එහෙම පිටින්ම කැඩිලා ගියානෙ. එදා නං මම හෙඳටෝම ඇඬුවා. ඒක අතකට ඒවගේ දේවල් අපට තිබුණෙ නැති එක ගැන මම දැන් සන්තෝස වෙනවා. අපි ඒවාට පුරුදු වෙලා හිටියෙ නෑනෙ. ඒ හින්දා, ඔය පොලී පුංචි අම්මාගේ දේවල්වලට කැමති වෙන්න මට පුළුවං වෙයි. හරියට ඒක අපට පාට දියවෙලා ගිය දුඹුරු පාට වෙච්ච රිබන් හැමදාම ලැබිලා, එක පාරටම ලස්සන රිබන් හම්බ වුණා වගේ. අම්මේ ! මේක නං කොයි තරං ලස්සන ගෙයක්ද?'' යි එක්වරම කතාව වෙනතක හරවමින් පොලියානා කීවාය. ඔවුහු ඒවනවිට බංගලාව දෙසට දිවෙන පළල් පාරට වැටී සිටියහ. තිමති කරත්තයෙන් බැස ට්‍රන්ක පෙට්ටිය බිමට බාන අතරේ නැන්සි ඔහුගේ කනට ලංවී කොඳුරන්නට වූවාය.

''ආයෙ නං කවදාවත් මෙහෙං යන එක ගැන කතා කරන්න එපා තිමති ඩර්ජින්.....''

''යන්ඩ....! මං එහෙම කියන එකක් නං නෑ තමා. මාව මෙහෙං යවන්ඩ පුළුවං වෙන එකක් නෑ මගෙ හිතේ. දැං ඉඳල මෙහෙ බොහොම විනෝදෙට තියේවි, පුංචි ළමයෙකුත් එක්ක....''

''විනෝදෙ තමා....!'' යි නැන්සි කීවාය.

''මම හිතන්නෙ නං දෙන්නත් එක්ක ඉන්න ගියාම අර අසරණ කෙල්ලට විනෝදෙට වඩා යමක් තියෙයි. මේ ළමයට උදව් ඉල්ලල කන්දක් උඩට නැගලා පියාඹන්නයි වෙන්නෙ, තිමති. ඔන්න මම තමයි ඒ කන්ද වෙන්ඩ යන්නෙ. මං එහෙම වෙනවා.... වෙනවාමයි....'' යි දිවුරා කියමින් ඉවතට හැරුණු නැන්සි පොලියානා කැඳවාගෙන දුරින් අඩි තබමින් යන්නට වූවාය.

# 4

# අට්ටාලයේ කුඩා කාමරය

පොලී හැරින්ටන් මෙනෙවිය ඇගේ ලේලිය පිළිගන්නට පුටුවෙන් නොනැංගාය. ඇත්තෙන්ම නැන්සි සහ කුඩා දැරිය විසිත්ත කාමරයෙන් ඇතුලට එනවිට ඇය කියවමින් සිටි පොතෙන් දෑස් ඉවතට ගෙන හිස එසෙව්වාය. ඊට පසු භාර දූර වැඩකට මිස වෙන කිසිවකුට නොනැමෙන ඇගේ අත හැඟීම් විරහිතවම, පොලියානා වෙත දිගු කළාය.

''කොහොමද පොලියානා..... මම.....'' ඇට ඊට වඩා යමක් කීමට ඉඩ ලැබුණේ නැත. කාමරය හරහා ඇය වෙත දිව ආ පොලියානා, ඇගේ පුංචි අම්මාගේ කිසිම මෙලෙකක් නැති තුරුලට පැන්නාය.

''අනේ පුංචි අම්මෙ.... පුංචි අම්මෙ.... අනේ මට තේරෙන්නෙ

sinhalaebooks.com

නෑ මාව ඔයා ළඟට ගෙනාවට මං කොහොම සන්තෝස වෙන්නද කියල....'' යි ඇය කඳුලු සැලුවාය.

''අර කාන්තා සරණ සංගමේ කට්ටිය එක්ක විතරක් ඉඳල, ඔයයි, නැන්සියි, මේ හැම දේමයි ලැබුණ එක කොච්චර හොඳද කියල ඔයා දන්නෙ නෑ...''

''ඒක නං එහෙම තමා- මං ඔය කාන්තා සරණ සංගමේ කට්ටිය අඳුරන්නේ නැති උනත්.....'' යි පොලී මෙනෙවිය කීවේ කිසිම සුහදශීලී හඬකින් නොවේ. ඒ කියන අතරේ ඇය දොරකඩ සිටගෙන සිටි නැන්සි දෙස රවා බලමින්, ඇයව තදින් වැළඳගෙන හුන් පොලියානාගේ කුඩා ඇඟිලිවල ග්‍රහණයෙන් මිදෙන්නට උත්සාහ කළාය.

''නැන්සි - ඔයාට දැන් ගියැකි. පොලියානා - කරුණාකරලා හොඳ ළමයෙක් වගේ පිළිවෙලකට කෙලින් හිටගන්න. මං තාම ඔයා කොයි වගේද කියලා හරියට දැක්කෙවත් නෑ....''

පොලියානා ඉද්දක් මෙන් කෙලින් වී සිට ගත්තේ සිනාව නවතාගත නොහැකිවය.

''නෑ... මං හිතන්නේ ඔයා එහෙම නොකර ඉන්න එක හොඳයි. මගේ මූනේ තියෙන දුඹුරු පාට ලප ඇරෙන්න මගේ බලන්න තරං දෙයක් තියෙනවා කියලා මං හිතන්නේ නෑ. අනේ... මං හිතෙන්නෙ මං ඇඳගෙන ඉන්න ඇඳුං ගැන විස්තර කරන්න වෙයි ඔයාට. මම නැන්සිට කිව්වා, තාත්තා මට... කියපු...''

''ඔව්.... හොඳයි.... ඔයාගෙ තාත්තා මොනව කිව්වත් කමක් නෑ...'' යි බාධා කළ පොලී මෙනෙවිය තදින් කීවාය.

''ඔයාට ට්‍රන්ක පෙට්ටියක් ඇති - මගෙ හිතේ....''

''අනේ ඔව්... ඇත්තටම පොලී පුංචි අම්මෙ. අර කාන්තා සරණ

සංගමෙන් මට ලස්සන ට්‍රන්ක පෙට්ටියක් අරන් දුන්නනෙ. මට ඒකෙ දාන්න ගොඩක් දේවල් නෑ - මං කිව්වෙ මගේම කියල දේවල් නෑ. අපිට අන්තිමට හම්බවුණු මිෂනරි තෑගි පෙට්ටිවල පුංචි ගෑනු ළමයින්ට ඇඳුම් තිබුණේ නෑ. ඒ වුණාට තාත්තට ගොඩක් පොත් නං තිබුණා. මිසිස් වයිට් නං කීවේ මං ඒවා අරගන්න ඕන කියල. ඔයා දන්නවනෙ තාත්තා...."

"පොලියානා...." ඇගේ පුංචි අම්මා තියුණු හඬින් කීවාය. "ඔයා එක දෙයක් ගැන නං හොඳට තේරුං ගන්ඩ ඕන. ඒ තමයි, ඔයා ඔයාගෙ තාත්තා ගැන ඔය හැටි කියවන එකට මං කැමති නෑ කියන එක..."

දැරිය අමාරුවෙන් හුස්මක් ඇද ගත්තාය.

"ඇයි පුංචි අම්මෙ, ඔයා - ඔයා කියන්න හදන්නෙ...." යි ඇය තැතනුවාය. ඇගේ පුංචි අම්මා ඉතිරි අඩ කියන්නට ඉඩ දුන්නේ නැත.

sinhalaebooks.com

"අපි උඩ තට්ටුවේ ඔයාගෙ කාමරේට යං - ඔයාගෙ ට්‍රන්ක පෙට්ටියත් එතන තියල ඇති. මං හිතන්නෙ මං තිමතිට කිව්වා ඒක උඩට අරන් යන්න කියල. මගෙ පස්සෙන් එන්න පොලියානා....."

කතාවක් නැතිවම පොලියානාද ඇගේ පුංචි අම්මා පස්සෙන් වැටුණාය. ඇගේ දෑස් කඳුලින් පිරී තිබුණු නමුත් ඇය හිතට දිරිය ගෙන මුහුණ කෙලින් තබාගෙන උන්නාය.

"අන්තිමේදී මම - මම හිතන්නෙ එයා තාත්තා ගැන කතා කරනවට අකමැති එක ගැන මට සතුටු වෙන්න පුළුවං..." යි පොලියානා තනිවම සිතමින් සිටියාය. "මං හිතන්නෙ මට තාත්තා ගැන කතා කතානොකර ඉන්න එක පහසුවක් වෙන්ඩ පුළුවන්. සමහරවිට එයා මට තාත්තා ගැන කතා කරන්ඩ එපා කිව්වෙත් ඒ හින්ද වෙන්නැති..." සිතූ පොලියානා, පුංචි අම්මාගේ කරුණාව ගැන තේරුම් ගැනීමෙන් පසු කඳුළු පිස දාගෙන ඇය දෙස ආදරෙන්

බලන්නට වූවාය.

ඇය දූන් පඩිපෙළ දිගේ නගිමින් සිටී. ඇය ඉදිරියෙන් පුංචි අම්මාගේ කලුපාට සිල්ක් ගවොම සර සර ගාමින් ඉහළට ඇදෙයි. ඇයට පිටුපසින් බිමට බුමුතුරුනු එලා ඇති, සෙටින් රෙද්දෙන් වැසූ කුෂන් සහිත පුටු තබා තිබූ කාමරයක් ඇරුණු දොරකින් පෙණිනි. ඇගේ දෙපා යටින් තිබුණේ ද අනර්ඝ බුමුතුරුනකි. එය උඩින් ඇවිදිද්දී හරියටම පාසි පැළැටි ගොඩකට දෙපා තද වෙන්නාක් මෙන් දැනුණි. බැලූ බැලූ හැම තැනම රන් පැහැති පින්තූර රාමු මෙන්ම, රන් පැහැ හිරු කිරණ පෙරී එන ලේස් තිර රෙදි පොලියානාගේ දෑස් ඉදිරිපිට දිස්න දුන්නේය.

''අනේ පුංචි අම්මේ....'' යි කුඩා දැරිය විස්මයෙන් හුස්මක් ඉහළට ඇද්දාය. ''අනේ කොයිතරං ලස්සන -ලස්සන ගෙයක්ද ! මෙච්චර පෝසත් වෙච්ච එක ගැන ඔයා මොන තරං සන්තෝසෙන් ඇතිද?''

''පොලියානා !'' පඩිපෙල උඩටම සේන්දු වෙමින් සිටි ඇගේ පුංචි අම්මා ඇය වෙතට හැරෙමින් කඩා පැන්නාය. ''මට ඔයා ගැන පුදුමත් හිතෙනවා - ඔය තාලෙට මට කතා කරන එක ගැන...!''

''ඇයි පුංචි අම්මෙ... ඔයත් එහෙමනෙ...?'' යි පුදුමයට පත් පොලියානා අවංක හඬින් ඇසුවාය.

''ඇත්තෙන්ම නෑ පොලියානා... මට දෙවියන් වහන්සේ ලබා දීපු වටිනා දේවල් ගැන අමතක කරන්න පුළුවං කමක් නෑ මගෙ හිතේ...'' යි ස්ථිර හඬින් කී පොලී මෙනෙවිය ''ඇත්තටම පෝසත් අයට ඔහොම ගති නෑ...'' කීවාය.

පොලී මෙනෙවිය හැරී, සාලාව දිගේ ඇවිදගෙන ගොස් අට්ටාලයට යන තරප්පු පෙළට ළඟා වූවාය. පොලියානාව අට්ටාලයේ කුඩා කාමරයට දැමීම ගැන දැන් ඇය සතුටු වෙමින් සිටී. එහිදී ඇගේ පළමු අරමුණ වූයේ පොලියානා හැකි තරම් දුරට

තමාගෙන් ඈත් කොට තැබීමය. අනෙක එවිට ඇගේ දඟකාරකම්වලින් ගෙදර වටිනා බඩුමුට්ටුවලට හානියක් සිදු නොවනු ඇත. දැන් සිදුවන මේ සියළු දෙයින්ම පෙනී යන්නේ පොලියානා වෙනුවෙන් පිළියෙල කරන ලද චාම් කාමරය තමාගේ කල්පනාකාරී තේරීමක් නොවේ දැයි පොලී මෙනෙවිය සිතුවාය.

පොලියානාගේ කුඩා දෙපා පුංචි අම්මාගේ පසු පසින් ආසාවෙන් ඇදී යමින් තිබුණි. ඇගේ නිල් පැහැති විශාල ඇස්, හැම පැත්තක්ම එකවර බලාගන්නට මෙන් ඒ මේ අත හැරවිණි. මේ පුදුමාකාර ලස්සන ගෙදර කිසිම දෙයක් දෙස නොබලා, එය පසුවී යන්නට දෙන්ට බැරිය. ඒ අතර පොලියානාගේ හිතේ ඇය ආසාවෙන් විසඳා ගන්නට බලා සිටින එක ප්‍රශ්නයක්ද තිබිණි. ඒ, ඇය මේ පසුකරගෙන යන කාමරවලින්, ඇය වෙනුවෙන් පිළියෙල වී ඇත්තේ කුමන එකදැයි දැන ගන්නටය. සමහර විටෙක එය උණුසුම්, ඉතා ලස්සන, ජනෙල් තිර එල්ලා ඇති, බුමුතුරුණු සහ පින්තූර ඇති කාමරයක් වනු ඇත. එහෙත් එක්වරම ඇගේ සිතිවිල්ලට බාධා කරමින් පුංචි අම්මා දොරක් ඇරගෙන තවත් තරප්පු පෙළක් ළඟට ළඟා වූවාය.

sinhalaebooks.com

එහි බලන්නට තරම් දෙයක් තිබුණේ නැත. දෙපැත්තෙන්ම හිස් බිත්ති නැඟී සිටියේය. තරප්පු පෙළ මුදුනේ වූ අඳුරු අවකාශයක් ගෙබිමටම ගෑවෙන පරිදි වහලය පහත්වූ ඈත මුල්ලක් කරා විහිදී ගියේය. එහි ගණන් කළ නොහැකි තරම් ට්‍රන්ක පෙට්ටි සහ වෙනත් ලට්ට ලොට්ට ගොඩ ගසා තිබුණි. එය ඉතා රස්නය සහිත, සහ හුස්ම ගැනීමට පවා අමාරු තැනක් විය. නොදැනුවත්වම පොලියානාගේ හිස තවත් ඉහළට එසවිණි. ඇත්තෙන්ම මෙහි හුස්ම ගැනීම අමාරුය. ඊට පසුව ඇය පුංචි අම්මා දකුණත පැත්තෙ වූ දොරක් හරිනු දුටුවාය.

''ඔන්න පොලියානා - මේක තමයි ඔයාගෙ කාමරේ. මෙන්න - ඔයාගෙ ට්‍රන්ක පෙට්ටියත් මෙතන. ඔයාට යතුරක් තියෙනවද?''

පොලියානා හිස සැලුවාය. ඇගේ දෑස් ලොකු වී, බියපත්ව තිබුණි. ඇගේ පුංචි අම්මා රවා බැලුවාය.

''මං ප්‍රශ්ණයක් ඇහුවාම පොලියානා - ටිකක් කට ඇරල උත්තර දෙන්වට මං කැමතියි - නිකං ඔලුව විතරක් හොලවන්නෙ නැතුව...''

''හා පුංචි අම්මෙ....''

''බොහොම හොඳයි. එහෙම තමයි ඉන්න ඕන. මං හිතනවා, මෙතන ඔයාට ඕන කරන හැම දේම ඇති කියල...'' යි ඇය වචන එකතු කළේ කාමරයේ තිබූ ඇඳුම් රාක්කය සහ හොඳින් පුරවා තිබූ වතුර ජෝගුව දෙස බැල්මක් හෙලමිනි.

''මං නැන්සිව එවන්නං, ඔයාගෙ බඩු ටික අස්පස් කරගන්න. රෑ කෑම හැන්දෑවෙ හයට...'' යි කියා හමාර කළ ඇය දොරින් පිටව ගොස් තරප්පු පෙළ දිගේ පහළට බැස්සාය.

ඇය පිටවී ගියාට පසුවත් පොලියානා උන් තැනම නිහඬව හිටගෙන මොහොතක් ඇය දෙස බලා සිටියාය. ඊට පසු ඇය කාමරයේ හිස් බිත්ති දෙසත්. හිස් පොළව දෙසත්, තිර කිසිවක් නැති ජනේල දෙසත් විසල් කරගත් දෑසින් බැලුවාය. ඇගේ දෑස් අන්තිමට නතර වුණේ මීට පැය ගණනකට පෙර බටහිර නගරයක පිහිටි ඇගේ කුඩා කාමරයේ තබා තිබූ, දැන් අට්ටාලයේ පිහිටි කාමරයේ තිබෙන ඇගේ ට්‍රන්ක පෙට්ටියෙනි. ඊළඟ මොහොතේ ඇගේ දෙපා ඉබේටම ඒ දෙසට ඇදිනි. ඈ ට්‍රන්ක පෙට්ටිය පැත්තකින් දන ගසාගෙන දෑතින් මුහුණ වසා ගත්තාය.

ඊට මොහොතකට පසු එහි පැමිණි නැන්සි කුඩා දැරියව දුටුවාය.

''අනේ - අනේ - පුංචි පැටියෝ....'' යි ඈ බිමට නැමී දැරියගේ දෑතින් අල්ලා ඉහළට එසවූවාය.

''මං කොච්චර බය වුණාද, ඔයා මෙහෙම ඉන්නවා දකිනකොට....''

පොලියානා හිස දෙපසට වැනුවා පමණය.

''ඒත් - මං හරිම නරකයි, නපුරුයි - හරිම නරකයි....'' යි ඇය ඉකිබින්දාය.

'' මට තවමත් හිත හදාගන්න බැරි වුණා - මට වඩා මගේ තාත්තව දෙවියන් වහන්සෙටයි, සුර දූතිකාවන්ටයි ඕන උනේ කොහොමද කියල...''

''මීට පස්සෙ එයාව ඕන වෙන එකක් නෑ - කාටවත්...'' නැන්සි ස්ථිර හඬින් කීවාය.

''අ-අනේ නැන්සි'' යි භ්‍රාන්ත වූ පොලියානාගේ දෑස්වල කඳුළු වියළී ගියේය.

ලැජ්ජාශීලී සිනහවක් නඟා ගත් නැන්සි, ඇගේ දෑස් තදින් ඇතිල්ලුවාය.

sinhalaebooks.com

''ඔන්න -ඔන්න ළමයෝ. මං ඒක හිතලා කිව්වෙ නෑ ඇත්තටම....'' යි ඇය හනික කීවාය.

''එන්න, අපි යතුර අරගෙන ට්‍රන්ක පෙට්ටිය ඇරල ඉක්මනට- ඉක්මනට ඔයාගෙ ඇඳුම් ටික එළියට ගනිමු....''

කඳුළු පිරි දෑසින් යුතුව පොලියානා යතුර දිගු කළාය.

''ඕක ඇතුලෙ ඒ තරං දෙයක් නෑ...'' යි ඈ වචන ගැට ගැසුවාය.

''එහෙනං ඒවා ඉක්මනට අස්කරගන්ඩ පුළුවං වෙයි.'' ඊළඟට නැන්සි කීවාය. පොලියානා එක්වරම දීප්තිමත් සිනහවක් පෑවාය.

''ඔන්න ඉතිං - මට දැන් ඒ ගැන *සන්තෝස* වෙන්න පුළුවං - නැද්ද මං අහන්නෙ....'' යි ඇය කෑගැවාය. නැන්සි දෑස් විදහා

බැලුවාය.

"ඇයි ? - ආ ! ඔව් නේන්නං...." ඇය මද සැකයෙන් යුතුව කීවාය.

නැන්සි ඇගේ කඩිසර අත් දෙකෙන් ට්‍රන්ක පෙට්ටියේ අසුරා තිබූ පොත්, අණ්ඩ දමන ලද යට ඇඳුම් සහ කිසිම ලස්සනක් නැති ගවොම් කිහිපයක් එළියට ඇද්දාය. පොලියානා, දැන් උද්යෝගිමත් ලෙස සිනහ වෙමින් කාමරය පුරා දුව පනිමින් ඇඳුම් රාක්කයෙහි ඇඳුම් එල්ලමින්ද, මේසය උඩින් පොත් අහුරා තබමින්ද, යට ඇඳුම් ලාච්චුවල දමා වසමින්ද සිටියාය.

"මට හොඳටම විස්වාසයි මේක නං දැන් ලස්සන කාමරයක් වෙන්ඩයි යන්නෙ. ඔයාට එහෙම හිතේන නැද්ද?" මද වේලාවකට පසු ඇය වචන ගැට ගැසුවාය.

ඊට පිළිතුරක් ලැබුණේ නැත. නැන්සි ට්‍රන්ක පෙට්ටියේ ඔලුව ඔබාගෙන, ඉතා කඩිසරව වැඩෙහි යෙදෙමින් සිටියාය. පොලියානා මේසය ඉදිරියේ සිටගෙන, ඊට ඉදිරියෙන් ඇති හිස් බිත්තිය දෙස බලාගත්වනම සිටියාය.

"මට මෙතන කණ්නාඩියක් නැති එක ගැනත් සන්තෝස වෙන්ඩ පුළුවං. ඒ මොකද කණ්නාඩියක් නැති හින්ද මට මූණෙ තියෙන දුඹුරු ලප පේන්නෙත් නෑ...."

නැන්සි එක්වරම සිහින් හඬක් නැගුවාය. එහෙත් පොලියානා හැරී බලන විට ඇය නැවතත් ට්‍රන්ක පෙට්ටියට එබීගෙන සිටියාය.

මිනිත්තු කීපයකට පසු ජනේලයක් ළඟ සිටි පොලියානා අත්පුඩි ගසමින් ප්‍රීතියෙන් කෑගසනු ඇසිණි.

"අනේ නැන්සි මං මීට කලින් මේක දැක්කෙ නෑනෙ..." යි ඇය හුස්මක් අල්ලා ගනිමින් කීවාය.

"බලන්න - අර ඈත ගෙවලුයි, ගසුයි, පල්ලියෙ ලස්සන කොතයි පේන හැටි. අනේ අර ගඟේ වතුර රිදී පාටට දිලිසෙනව. මේ කාමරේට පින්තූර නං ඕන් නෑ නැන්සි. අනේ මං කොච්චර සන්තෝස වෙනවද මේ කාමරේ මට ලැබුණු එකට....!''

එහෙත් පොලියානා විස්මයට පත්කරමින් නැන්සි එක්වරම හඬා වැටුණාය. පොලියානා ඉක්මනින් ඇය වෙත දිව ගියාය.

''නැන්සි-නැන්සි, ඇයි-මොකද මේ....'' යි ඇය කෑගැසුවාය. ඊළඟට තරමක් බියෙන් මෙන් ''මේ ඔයාගේ කාමරේ නෙමෙයි නේද?'' යි ඇසුවාය.

''මගේ කාමරේ!'' යි සංවේගයෙන් ඇසූ නැන්සිට කඳුළු නවතා ගන්නට බැරිවිය.

''ඔයා දිව්ය ලෝකෙන් බැහැපු පුංචි සුරංගනාවියක් නොවුණා නං - සමහර අය මීට කලින් නරක විදිහට හැසිරුනේ නැත්නං - දෙයියනේ ඔන්න අරයාගේ බෙල් එක....'' නැන්සි කියමින් සිටි පුදුමාකාර කතාව නවතා දමා, උන් තැනින් නැගිට වහා කාමරයෙන් එළියට දිවගොස්, තරප්පු පෙළ බැසගෙන බැසගෙන ගියාය.

කාමරයේ තනිවූ පොලියානා ඇය මනසින් මවාගෙන සිටි පින්තූරය හෙවත් ජනේලයෙන් පිටත ඇති අලංකාර දසුන බලන්නට ගියාය. ටික වෙලාවකට පසුව ඇය ජනේලයේ පියනට අත තැබුවේ නිකමට වාගේ ය. තවදුරටත් කාමරයේ රස්නය ඈට දරාගන්නට නොහැකිවිය. පුදුමයකි ! ඇගේ ඇඟිලිවලට යටින් ජනෙල් පියන එක්වරම ඇරී ගියේය. ඊළඟ මොහොතේ ජනේලය මුළුමනින්ම ඇරී තිබුණු අතර පොලියානා ජනේලයෙන් ඔලුව එළියට දමාගෙන පිටත ඇති පිරිසිදු, නැවුම් වාතයේ මිහිර විඳිමින් සිටියාය.

ඇය ඊළඟ ජනේලය වෙතටත් දිව ගියාය. එය ද අතේ ඇඟිලිවලට යටින් එක්වරම පිටතට ඇරුණි. ලොකු මැස්සෙක් ඇගේ නහයට උඩින් පියාඹමින් හඬ නගමින් කාමරය තුළට වැදුණි.

sinhalaebooks.com

ඊළඟට තව එකෙක් ආ අතර - ඒ පස්සේ තව එකෙක්ද ආයේය. එහෙත් පොලියානා එය ගානකටවත් ගත්තේ නැත. ඒ අතරේ ඇය පුදුමසහගත සොයා ගැනීමක් කර තිබුණි. ඒ, ජනේලය අසල අතුපතර විහිදමින් නැගී සිටි විශාල ගසක් ඇති බවය. පොලියානාට පෙනුණේ ඒ ගස තමන් වෙතට එන ලෙස ඉල්ලමින් දෑත් විදහාගෙන සිටින්නාක් මෙනි.

එක්වරම ඇයට හයියෙන්ම සිනහ ගියේය.

'මට හිතෙනව ඒක කරන්න පුලුවන් කියල'' යි ඇය තනිවම සිනහසුනාය. ඊළග මොහොතේ ඇය කඩිසර ව ජනෙල් පඩිය උඩට නැංගාය. එහි සිට ළගම අත්තට පැනීම පහසුය. පොලියානා වඳුරෙකු මෙන් ගස් අතුවල එල්ලී පියවරෙන් පියවර පහතම අත්ත තෙක් පහළට බැස්සාය. ගස් නැගීම කොයි තරම් පුරුදු දෙයක් වුවත් , පොලියානාට පහතම අත්තේ සිට බිමට පැනීම තරමක් බිය ගෙන දෙන්නක් විය. කොහොමටත් තදින් හුස්මක් අල්ලා ගත් ඇය , ඇගේ සවිමත් කුඩා දෑත් වනමින් හතර ගාතෙන් ම පහත ඇති සිනිදු තණකොළ ගොඩ උඩට පැන්නාය. ඊට පසු වටපිට බලන්නට පටන් ගත්තාය.

ඇය සිටියේ නිවසේ පිටුපස පැත්තේය. ඇයට ඉදිරියෙන් කුදුවූ මහලු මිනිසෙකු වැඩ කරමින් සිටින ගෙවත්ත ය. ඊට එහායින් කන්දක් මුදුනට දිවයන අඩිපාරක් සහිත විවෘත තැනිතලාවකි. කන්ද මුදුනේ තනි පයින්* ගසක් එහි තිබූ විශාල ගල්කුලකට තනි රකින්නට මෙන් ඉහළට නැගී සිටී. පොලියානාට නම් මේ මොහොතේ ඒ ගල්කුල පෙනුණේ, ලෝකයේ යාමට ඇති එකම හොඳ තැන විදිහටය. ඉතින් පොලියානා දිවගොස්, ඉතා දක්ෂ ලෙස මහලු මිනිසා පිටුපසින් පැන ගත්තාය. කොල පාට ගස් පේළි අතරින් හුස්ම නාල්ලාම අඩි තබමින් ගිය ඇය අන්තිමේදී කඳු මුදුනට දිවෙන තැනිතලාවේ අඩිපාරට වැටුණාය. ඊට පසුව හිතට දිරිය ගත් ඇය කන්ද මුදුනට නගින්න පටන් ගත්තාය. ඒ වනවිටත් ඇය සිතමින් සිටියේ

* *Pine* - ගස්වර්ගයක්

ජනේලයෙන් බලනවිට ඉතා ළඟ මෙන් පෙණුනු නමුත්, අර ගල් කුල වෙත යන්නට කොයිතරම් දුර ඇවිදිය යුතුද කියායි.

විනාඩි පහළොවකට පසුව හැරින්ටන් බංගලාවේ මහ ඔරලෝසුවේ හය වැදිණි. ඔරලෝසුවේ බට්ටා හරියටම අන්තිම වරට හඬ නගන විට, නැන්සි රාත්‍රී භෝජනය සඳහා සීනුව හැඬෙව්වාය.

මිනිත්තු එකක්, දෙකක්, තුනක් පසුවිය. පොලී මෙනෙවිය මූණ පුළුටු කරගෙන, පයේ පැලඳ සිටි සෙරෙප්පුවෙන් බිමට තට්ටු කරමින් සිටියාය. ටික වේලාවකින් ගස්සාගෙන නැඟී සිටි ඈ ශාලාව ඇතුලට ගොස් තරප්පු පෙළ දෙස නොඉවසිල්ලෙන් බලා සිටියාය. මිනිත්තුවක් පමණ වෙලා එතැන සිටි ඇය ඉන්පසු හැරී කෑම කාමරය වෙතට වේගයෙන් ගියාය.

''නැන්සි'' ඇය තීරණාත්මකව කීවේ, තරුණ මෙහෙකාරියව දකින විටමය. ''මගේ ලේලි පරක්කුයි - නැහැ - ඔයා කතා කරන්න ඕන නෑ එයාට'' යි පොලී මෙනෙවිය ශාලාවේ දොරටුව වෙත යන විට තදින්ම කීවාය. ''මං එයාට කියල තියෙන්නෙ රෑ කෑම කීයටද කියල. දැං එයාට ඒක මතක තියා ගත්තෙ නැති එකේ විපාක විඳින්ඩ වෙයි. එයා මේ වෙනකොට වෙලාවට වැඩ කරන්න පුරුදු වෙලා තියෙන්න ඕන. එයා දැන් පහළට ආවොත්, එයාට රෑ කෑමට පාන් කන්න වෙන්නෙ කුස්සියේ ඉඳගෙන...''

''හා මැඩම්....'' ඒ වෙලාවේ පොලී මෙනෙවිය නැන්සිගේ මුහුන දෙස නොබැලීම හොඳට ගියේය.

රෑ කෑම අහවර වූ ඇසිල්ලේම නැන්සි අට්ටාලය වෙත දිව ගියාය.

''පාතුයි - කිරියි! ඇත්තටම ඒකෙත් හැටි. තනියම නිදා ගන්ඩ යද්දි වත් අඬන්නෙ නැති ළමයෙකුට...! යි ඇය තනිවම මුමුනමින් අට්ටාලයේ කුඩා කාමරයේ දොර සෙමෙන් තල්ලු කළාය. ඊළඟ

මොහොතේ ඇය හොඳටම බියපත් ව මහ හයියෙන් කෑගෑවාය.

''කොහෙද ඔයා ගියේ ? කොහෙද ඔයා ගියේ....'' බියපත්වූ නැන්සි ඇඳුම් රාක්කය පිටුපස, ඇඳ යට, වෙතු එකක් තබා ට්‍රන්ක පෙට්ටිය ඇතුළතත් එබී එබී බැලුවාය. ඉන්පසු ඇය පහත මාලයට ඉගිලී ගොස් ගෙවත්තේ සිටි මහලු ටොම්ට හඬ ගෑවාය.

''ටොම් මාමෙ- ටොම් මාමෙ...'' අර අසරණ ළමයා ගිහිල්ලනෙ... ඇය වැලපුණාය. ''එයා ආපු දිව්‍යලෝකෙටම ආපහු ගිහින්ද කොහෙද. අනේ අසරණී. මැඩම් මට කියලයි තිබුණෙ එයාට කුස්සියට අඬගහල පානුයි කිරියි දෙන්ට කියල. එයා මේ වෙලාවෙ දිව්‍ය ලෝකෙ ඉඳගෙන දිව්‍ය භෝජනයක් ගන්නවා ඇති. මට සහතිකයි. මට සහතිකයි.''

මහලු මිනිසා ඔලුව ඔසවා බැලුවේය. ''ගිහින් - දිව්‍ය ලෝකෙට....'' යි ඔහු කවට කමට මෙන් ප්‍රතිරාවය කළේය. නොදැනුවත්වම ඔහු හිරු බැස යමින් සිටි දීප්තිමත් අහස දෙස බලමින් උන්නේය. එක්වරම ඉන් දෙනෙත් ඉවතට ගත් ඔහු නැන්සි දෙස මොහොතක් බලා සිට විරිත්තමින් ආපිට හැරුණේය.

''හොඳයි නැන්සි- මටනං පේන විදිහට එයැයි යන්න ඇත්තෙ ළඟම තියෙන දිව්‍ය ලෝකෙකට...'' කියමින් ඔහු වක ගැසුණු ඇඟිල්ල ඈතට දිගු කළේය.

ඒ ඇඟිල්ල කෙළින්ම බැලූ විට, ඉර බැස යන සැන්දෑ අහස පසුබිමේ, ඈත තිබුණු ගල්කුලක් මත නැගී සිටි හීන්දෑරි රුවක් ඉතා පැහැදිලිව පෙනුණි.

''හොඳයි - එයා අද ඒ පාරෙන් දිව්‍ය ලෝකෙට යන්ඩ නැතුව ඇති - මං කියපු එක හිත්ද නොවුණත්....'' යි දැඩිව කී නැන්සි - ''තෝන ඇහුවොත් කියන්න, මං ටිකක් ඇවිදින්න ගියේ දීසි හෝදන වැඩේ අමතක කරල නෙමේ කියල....'' යි පවසා විවෘත තැනිතලාව හරහා වැටුණු අඩි පාර දිගේ දුවන්නට වූවාය.

# 5

# සෙල්ලම

"දෙයියන්ගෙ නාමෙට මිස් පොලියානා ඔයා මාව කොයි තරං බය කළාද?" යි හති දමමින් කියන අතරේ නැන්සි ගල් කුල වෙත ඉක්මන් ගමනින් නැංගාය. පොලියානා කණගාටුවෙන් මෙන් පහළට ලිස්සා ආවාය.

"බය වුණාද? අනේ මට සමාවෙන්න. ඒත් මං ගැන කවදාවත් බය වෙන්න එපා නැන්සි. තාත්තයි, කාන්තා සරණ සංගමේ කට්ටියයි උණත් මං ගැන ඔහොම බය වුණා හැම තිස්සෙම- ඒත් මං ඒ හැම වෙලාවෙම මොනවත් කරදරේක වැටෙන් නැතුව එනව කියල දැනගන්නකං විතරයි."

"ඒත් ඔයා මෙහෙම ආව කියල මංවත් දන්නෙ නෑනෙ...." යි කෑගැසූ නැන්සි කුඩා දැරියගේ දෑතින් අල්ලාගෙන කන්ද බසින්නට

පටන් ගත්තාය.

"ඔයා යනවා මමවත්, අනික් කවුරුවත් දැක්කෙ නෑ. මං දන්නවා ඔයා වහලෙ ඉඳන් ඉගිලෙන්න ඇති. මං දන්නවනෙ - මං දන්නවනෙ....."

පොලියානා සතුටින් උඩ පැන්නාය.

"ඒ වගේ දෙයක් තමා කළේ. උඩට ඉගිලෙන්නෙ නැතුව පහළට ඉගිලුනා. මං පහළට බැස්සෙ අර ගහේ අතුවල එල්ලිලා...."

නැන්සි මදකට නැවතුණාය.

"මොකක් කිව්වෙ....?"

"මගේ ජනේලෙ ළඟ තියෙන ගහ දිගේ පහළට ආවා...."

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ...." යි මුව අයාගත් නැන්සි නැවතත් පොලියානා ඇදගෙන පහලට බැස්සාය.

'මට හිතාගන්ඩ බෑ ඔයාගෙ පුංචි අම්ම ඕකට මොනව කියයිද කියල..."

"එහෙමද? හොඳයි මං එයාට කියන්නංකො. එතකොට ඔයාට බලාගත්තෑකි මොකද වෙන්නෙ කියල..." යි කුඩා දැරිය ප්‍රීතියෙන් ඉපිලෙමින් කීවාය.

"අනේ දෙයියනේ..." නැන්සි නැවතත් විස්මයෙන් කට අයා ගත්තාය.

"එපා - එපා.."

"ඇයි? ඔයා හිතන්නෙ එයා ඒක ගණන් ගන්නෙ නැතිවෙයි

කියලද?'' යි පොලියානා අවුල්සහගත සිතින් ඇසුවාය.

''නෑ-මේ-හා හොඳයි කමක් නෑ. එයා මොනව කියයිද කියල ඇත්තටම මට හිතාගන්ඩ බෑ...'' යි නැන්සි කීවේ වෙන කිසිවක් සිදුවූයේ නැතිනම් පොලී මෙනෙවියගේ බැන වැදීම ගැන ඇයට කිසිවක් නොකියා ඉඳීමට අදිටන් කරගනිමිනි.

''ඒත් - අපි ඉක්මන් කරන එක හොඳයි නේද? ඔයා දන්නවනෙ මට පිඟන් කෝප්ප හෝදන්ඩත් තියෙනව....''

''මං උදව් කරන්නං.....'' පොලියානා මහත් උනන්දුවෙන් පොරොන්දු වූවාය.

''අනේ - මිස් පොලියානා.....!'' නැන්සි විරුද්ධ වෙමින් කීවාය.

මොහොතක් දෙදෙනම නිහඬවම සිටියහ. රෑ අහස ඉක්මණින්ම කළුවර වෙලා ගත්තේය. පොලියානා ඇගේ මිතුරියගේ අත තවත් තදින් අල්ලා ගත්තාය.

sinhalaebooks.com

''මං හිතනව මට සතුටු වෙන්ඩ පුළුවන් කියල අන්තිමේදී - ඒ මොකද ඔයා බය වුණේ නැත්නං මාව හොයාගෙන එන්නෙ නෑනෙ'' යි සීතලෙන් වෙවුලමින් ඈ කීවාය.

''අනේ පැටියෝ. ඔයාට දූන් බඩගිනිත් ඇති නේද? මං හිතන්නෙ ඔයාට රෑ කෑමට පාන් කාල කිරි බොන්න වෙන්නෙ මාත් එක්ක කුස්සියේදී. ඔයා දන්නවෙන්. ඔයා රෑ කෑමට වෙලාවට ආවෙ නැති එකට ඔයාගෙ පුංචි අම්මගෙ හිත ඒ තරං හොඳ නෑ...''

''මට එන්න බැරි වුණේ මං මෙහෙ හිටිය හින්දනෙ....''

''ඔව්-ඒත් එයා ඒක දන්නෙ නෑනෙ...'' නැන්සි තනිවම සිනාසෙමින් කීවාය. ''මට හරි දුකයි ඔයාට රෑට කන්ඩ තියෙන්නෙ පාන්....''

''අනේ-මට නං දුක නෑ.. මට සතුටුය....''

''සතුටුයි? ඒ මොකටද?''

''ඇයි ? මං පාන් කන්නයි කිරි බොන්නයි ආසනෙ. අනික දැං මං ඒවා කන්න යන්නෙ ඔයා එක්කනෙ. මට නං පේන්නෙ නෑ ඒකට සතුටු වෙන එකේ වැරැද්දක් තියෙනව කියල....''

''ඔයාට ඉතිං හැමදේටම සතුටු වෙන එකේ වැරැද්දක් පේන්නෙත් නැනෙ....'' යි නැන්සි උත්තර දුන්නේ පොලියානා අර අට්ටාලයේ කුඩා කාමරය ගැනත් සතුටු වෙන්නට උත්සාහ කළ අන්දම ගැන මතක් වී තනිවම සිනහ සෙමිනි.

පොලියානා මෘදු ලෙස සිනාසුනාය.

''හොඳයි - ඔයා දන්නවද? ඒක සෙල්ලමක්...''

''සෙල්ලමක්....?''

''ඔව් ඒකට කියන්නෙ 'නිකම්ම සන්තෝස වෙන්න' සෙල්ලම කියල....''

''ඔයා මොනව කියනවද මන්ද....''

''ඇයි? ඒක සෙල්ලමක්නෙ. තාත්තා තමයි මට ඒක කියල දුන්නෙ. ඒක හරිම විනෝදයි....'' පොලියානා කීවාය. ''අපි හැමවෙලේම ඒ සෙල්ලම කළා - මං පුංචි පුංචි ළමයෙක් වෙලා හිටපු කාලෙ ඉඳන්ම. මං අර කාන්තා සරණ සංගමේ කට්ටියටත් ඒ ගැන කිව්ව. ඒගොල්ලන්ගෙන් සමහරුත් ඒ සෙල්ලම කළා....''

''ඒ මොකක්ද? මං නං දැං සෙල්ලං කරන වයසක නෙමේ ඉන්නෙ.....''

පොලියානා සිනාසුනාය. එහෙත් ඇය සුසුමක්ද හෙලුවාය. ඇගේ මුහුණට එකතු වූ ආලෝකය සමග මුහුණ වඩාත් සිහින් සහ වේදනාබර ලෙස පෙනුණි.

''ඔන්න - අපි ඒක පටං ගත්තෙ මිෂනරි තෑගි පෙට්ටියක කිහිලිකරු දෙකක් ආපු දවසෙ ඉඳං....''

''කිහිලිකරු....!''

''ඔව් - ඔයා දන්නවද මට ඕන වෙලා තිබුණෙ බෝනික්කෙක්. තාත්තා ඒ ගැන ඒගොල්ලන්ට දන්වලත් තිබුණා. ඒත් තෑගි පෙට්ටිය ආවම ඒ ගොල්ලා ලියල එවල තිබුණ බෝනික්කො ඒකෙ නෑ කියල. ඒ වෙනුවට පුංචි කිහිලිකරු දෙකක් තිබුණා. ඒගොල්ලං හිතුවට ඒක කාට හරි පුංචි ළමයෙකුට කවදක හරි ඕන වෙයි කියල. ඔන්න එතකොට තමා අපි සෙල්ලම පටන් ගත්තෙ....''

''මට නං පේන්නෙ නෑ ඒ ගැන කිසිම සෙල්ලමක් කරන්ඩ පුළුවං කියල''යි නැන්සි නොරුස්නා ස්වරයෙන් කීවාය.

sinhalaebooks.com

''අනේ-ඔව්. ඒත් අපේ සෙල්ලම තමා, හැම දේකම තියෙන මොකක් හරි සතුටු වෙන්ඩ පුළුවං දෙයක් හොයන එක - ඒක මොකක් උනත් කමක් නෑ....'' යි පොලියානා අවංක හඬින් කීවාය.

''ඒ හින්ද අපි - අපි සෙල්ලම කිහිලි කරුවලින්ම පටන් ගත්තා...''

අනේ දෙයියනේ - මං නං ඒක ගැන සන්තෝස වෙන්ඩ පුළුවං කිසිම දෙයක් පේන්නෙ නෑ. ඔයාට බෝනික්කෙක් ඕන වෙලා තියෙද්දී, කිහිලි කරු හම්බෙන කොට....''

පොලියානා අත්පුඩි ගැසුවාය.

''අන්න ඒක තමයි - ඒක තමයි.'' ඇය කෑගැසුවාය.

''මටත් ඒ වෙලාවෙ ඒක පෙනුනේ නෑ නැන්සි'' යි ඇය එකතු කළාය. ''තාත්තා තමයි මට ඒක කියල දුන්නෙ....''

''හොඳයි - එහෙනං මට කියල දෙන්න ඕන ඔයා....'' හොඳටම නොඉවසිල්ලෙන් සිටි නැන්සි කීවාය.

''අනේ දෙයියනේ - ඇයි, ඔයාට කිහිලිකරු ඕන නැති එක ගැන හිතලා සන්තෝස වෙන්නකෝ....'' යි ප්‍රීතියෙන් උදම් වෙමින් පොලියානා කීවාය.

''කොහොමද කරන්නෙ කියල දැන ගත්තාම, ඒක ඒ තරං ලේසියි....''

''අනේ මන්ද - හරිම අමුතුයි....'' යි නැන්සි විසල් කරගත් දෑසින් පොලියානා දෙස බලමින් කීවාය.

''අනේ - ඒක අමුතු නෑ. ඒක හරි විනෝදයි නෙ....''යි පොලියානා උද්යෝගයෙන් කියමින් උන්නාය. ''එදා ඉඳන් අපි හැමදාම ඔය සෙල්ලම කළා. හේතුවක් හොයාගන්න අමාරු වෙන තරමට ඒකෙ විනෝදෙත් වැඩී. ඒත් සමහරක් වෙලාවට විතරක් ඒක හරිම අමාරුයි - තාත්තා ස්වර්ගෙට ගිහින්, කාන්තා සරණ සංගමේ කට්ටිය විතරක් ඉතුරු වෙලා වෙන කවුරුත් නැති වෙනකොට වගේ වෙලාවට....''

''ඇයි - කන්දක් උඩ තියෙන ගෙදරක, කිසිම දෙයක් නැති පාලු කාමරේකට ඔයා දාන කොටත්....'' නැන්සි කේන්තියෙන් කීවාය. පොලියානා සුසුමක් හෙලනු පෙණුනි.

''ඒක ඇත්තටම මුලදී අමාරුයි තමයි....'' ඇය කීවාය. ''ඒ මොකද මං ඒ කාලෙ ගොඩාක් තනියෙන්, පාලුවෙන් හිටපු නිසා මට ඒ සෙල්ලම කරන්න හිතුණෙම නෑ. මට ඕන කළේ ම ලස්සන දේවල්. ඉතින්, ඒ වුණත් මට හිතෙන්න ගත්තා මගේ මූණෙ තියෙන දුඹුරු ලප කණ්නාඩියෙන් පේනවට මං කොච්චර අකමැති ද කියලා. ඊළඟට ජනේලෙන් එහා පැත්තෙ ලස්සන පින්තූරෙකුත් මට පේන්න

ගත්තා. ඔන්න ඉතිං මට එතකොට තමා සතුටු වෙන්න පුළුවං දේවල් තියනවා කියලා හිතුණෙ. ඔයා දන්නවද හැම දේකම තියන සතුටු වෙන්න පුළුවන් දේ ගැන හිතනකොට ඒකෙ නරක පැත්ත අමතක වෙනවා. හරියට මට බෝනික්ක ඕන වුණ වෙලාවෙ වගේ - තේරුණාද ඔයාට?''

''හ්ම්.'' නැන්සිට කිසිවක් කියා ගැනීමට බැරි විය. ඇගේ උගුරේ යමක් හිරවී ඇත්තාක් මෙන් දැනුණි.

''සාමාන්‍යයෙන් ඒකට ඒ හැටි කල් යන්නෙ නෑ....'' යි සුසුම් හෙලූ පොලියානා කිව්වාය.

''හුඟ වෙලාවට මට ඉබේටම වගේ ඒවා මතක් වෙනවා. ඔයා දන්නවද, මං ඒ තරමටම ඒකට පුරුදු වෙලා. ඒක හරිම ෂෝක් සෙල්ලමක්. තාත්තායි මමයි ඒකට හුඟක් ආස කළා...'' ඇයට වචන පැටලැවිණි. ''ඒත් මට දැන් හිතෙනවා - ඒක - ඒක කරන්න ටිකක් අමාරු වෙයි කියල. ඒ මොකද දැං මාත් එක්ක ඒ සෙල්ලම කරන්ඩ කවුරුවත් නැති හන්ද. සමහර විට පොලී පුංචි අම්ම ඒක කරන්න කැමති වෙයි.'' ටිකක් වේලා සිතීමෙන් පසුව ඇය කීවාය.

sinhalabooks.com

''අනේ දෙයියනේ....! නැන්සි හෙමිහිට කියා හුස්මක් ඇද ගත්තාය. ඉන්පසු තරමක් හඬ නඟා දිරිමත් ලෙස ''මේ බලන්න මිස් පොලියානා - මම කියන්නෙ නෑ මං ඔය සෙල්ලම හරියට කරයිද කියල. ඒක හරියට දන්නව කියලත් මං කියන්නෙ නෑ. ඒත් මං තිකමට වගේ ඔයා එක්ක ඒක සෙල්ලං කරන්නං - මං එහෙම කරනවාමයි'' යි කීවාය.

''අනේ නැන්සි....'' පුදුමයට සහ ප්‍රීතියට පත්වෙමින් කී පොලියානා හතික තදින් ඈ වැළඳ ගත්තාය.

''ඒක නං හරිම අපූරුයි. අපිට කොයිතරං විනෝදයක් තියෙයි ද නේද?''

''ම්...සමහරවිට.'' නැන්සි මද සැකයෙන් යුතුව කීවාය. ''ඔයා මං ගැන ඒ හැටි විස්වාසයක් තියන්න එපා. ඒ මොකද මං සෙල්ලං කරන කෙනෙක් නෙමෙයි හන්දා. ඒත් මම කවදාවත් නැති විදිහට උත්සහ කරල බලන්නං... ඒ කොහොම උනත් ඔයාට දැං සෙල්ලම කරන්න කවුරු හරි කෙනෙක් ඉන්නවා නෙ...'' යි කියා හමාර කළ ඇය මුළුතැන්ගෙට ඇතුලු වුණාය.

පොලියානා මුලුතැන් ගෙයි වාඩි වී පාන් කා කිරි බීවාය. ඉන්පසු නැන්සි කියා සිටි පරිදි, ඇය විසිත්ත කාමරයට ගොස්, වාඩි වී පොතක් කියවමින් සිටි ඇගේ පුංචි අම්මා හමුවුණාය.

පොලී මෙනෙවිය හැඟීම් විරහිතව ම හිස ඔසවා බැලුවාය.

''ඔයා රෑ කෑම ගත්තද පොලියානා?''

''ඔව් - පුංචි අම්මා....''

''මට හරිම කණගාටුයි පොලියානා, ඔයාව රෑ කෑම ගන්න කුස්සියට යවන්න වෙච්ච එක ගැන....''

''ඔයා එහෙම කරපු එක ගැන මං ඇත්තටම සන්තෝස වෙනව පුංචි අම්මෙ. මම පාන්වලටයි, කිරිවලටයි කැමතියි. ඒ වගේම නැන්සිටත් කැමතියි. ඔයා චුට්ටක්වත් ඒක නරකයි කියල හිතන්න එපා....''

පොලී මෙනෙවිය එක්වරම මදක් කෙලින් වී පුටුවේ හරි බරි ගැසුණාය.

''පොලියානා - ඔයාට ඇඳට යන්න වෙලාව හරි. ඔයාට අද මහන්සි ඇති නෙ. අපි හෙට ඔයා මොනවද කරන්න ඕන කියලයි, ඔයාගෙ ඇඳුං මොනවද කියලයි බලමු. නැන්සි ඔයාට ඉටිපන්දමක් දෙයි. පරිස්සමෙන් ඒක අල්ලගෙන යන්න. උදේ කෑම හත හමාරට. ඒකට ඔයා වෙලාවට පහළට එයි කියල මං හිතනවා. ගුඩ් නයිට්....''

පොලියානා කෙළින්ම ඇගේ පුංචි අම්මා ළඟට ගොස් ඇයට ආදරබර හාදුවක් දුන්නාය.

''මේ වෙනකං නං මං හොඳ දවසක් ගෙව්වා....'' යි ඇය ප්‍රීතියෙන් සුසුම් ලෑවාය. ''මං දන්නවා, මං ඔයත් එක්ක හරිම කැමැත්තෙං ඉන්ඩ යනවා කියලා. මෙහාට එන්න කලිනුත් මං එහෙම වෙයි කියල හිතුව. ගුඩ් නයිට්....'' විසිත්ත කාමරයෙන් එළියට දුවන අතරේ ඇය ප්‍රීතියෙන් කෑගෑවාය.

''හොඳයි - මගේ දෙයියනේ...!'' පොලී මෙනෙවිය මදක් උස් හඬින් කීවාය.

''මහ පුදුමාකාර ළමයෙක්....!'' ඊළඟට ඇය රවා බැලුවාය. ''මං දඬුවමක් දුන්නත් එයා සතුටු වෙනවා. පොඩ්ඩක්වත් නරකක් හිතන්නෙත් නෑ. ඒ මදිවට මාත් එක්ක ඉන්න ආසයිලු ! මගෙ දෙයියනේ....!'' නැවතත් විස්මයෙන් හඬ නැගූ පොලී මෙනෙවිය, පොතට දෙනෙත් හරවා ගත්තාය.

sinhalaebooks.com

විනාඩි පහළොවකට පසුව, අට්ටාලයේ කුඩා කාමරයේ දී ඇඳ ඇතිරිල්ල ඇඟිලිවලින් මිරිකා ගත් කුඩා දැරිය පාලුවෙන් ඉකිබිඳිමින් සිටියාය.

''මං දන්නව තාත්තේ - ඔයා සුරදූතිකාවො ළඟ. ඒත් මං මේ වෙලාවෙ නං අර සෙල්ලම චුට්ටක්වත් කරන්නෙ නෑ. චුට්ටක්වත් නෑ. මං හිතන්නෙ නෑ ඔයාට උනත් පුළුවං කියල මේ තරං දුර පිට තැනකට ඇවිත්, කරුවලේම මෙහෙම නිදාගන්න එක ගැන සතුටු වෙන්න පුලුවං දෙයක් හොයාගන්න, අඩුම තරමේ මං නැන්සි එක්ක හරි - පොලී පුංචි අම්ම එක්ක හරි - කාන්තා සරණ සංගමේ කෙනෙක් එක්ක හරි හිටියා නං - නිකමටවත් එහෙම දෙයක් හිතන්න තිබුණ....''

මේ අතරේ මුළුතැන්ගෙයි සිට අතපසු වූ වැඩපළ කරමින් සිටින නැන්සි, කිරි දමූ ජෝග්ගුව සෝදා පිස දමමින් තනිවම

මුමුනන්නට වූවාය.

"අර ළමයට පිහිටක් වෙන්ඩ නං - අර බෝනික්කෝ ඕන වෙලාවට කිහිලිකරු ලැබෙද්දි සන්තෝස වෙන, මෝඩම මෝඩ සෙල්ලම කරන්ඩ වෙයි මට. මං ඒක කරන්ඩයි යන්නෙ. කරන එක කරනවාමයි....!"

# 6

# රාජකාරී

හැරින්ටන් බංගලාවට පොලියානා පැමිණීමෙන් පසුව එළඹුණු පළමු දවසේ උදෑසන ඇය අවදිවන විට වේලාව පෙරවරු හතට ආසන්නව තිබුණි. කාමරයේ ජනේල දකුණට සහ බටහිරට මුහුණ ලා තිබුණු බැවින් ඇයට තවමත් නැග එන හිරු පෙනුණේ නැත. එහෙත් අහස ලා නිල් පැහැයක් ගෙන තිබූ අයුරු ඇය දුටුවාය. එය දවස හොඳ බවට පෙර නිමිත්තකි.

sinhalaebooks.com

කාමරය ඒ වන විට තරමක් සිසිල් විය. පිටත සිට පිරිසිදු නැවුම් වාතය ගලා ආවේය. ජනේලයෙන් පිටත කුරුල්ලන් ගී කියනු අසන්නට පොලියානා දිව ගියාය. එවිට ඇය ගෙවත්තේ රෝස මල් පඳුරු අතර සිටින ඇගේ පුංචි අම්මා දුටුවාය. කඩිමුඩියේම ඇඳ පැළඳගත් පොලියානා ඇය සමඟ එක්වීමට ගෙවත්තට දිව්වාය.

පොලියානා දිව ගියේ පහත අට්ටාලයේ දොරවල් දෙකම හැර

දමමිනි. විශාල ශාලාවේත්, ඊළඟට හමුවූ කාමරවලත් දොරවල් දඩාං ගා ඇරී ගියේය. ඒ ආකාරයෙන්ම ඉදිරිපස දොරද හැර දමූ පොලියානා ගෙවත්ත තෙක්ම එක හැල්මේ දිව ගියාය.

පොලී පුංචි අම්මා, කුදු ගැහුණු මහලු මිනිසෙකු සමග රෝස පඳුරු අතරේ නැමී සිටියාය. එවිට ම වාගේ ප්‍රීතියෙන් ඉපිලී යමින් පොලියානා ඇය වෙත ඉගිල්ලී ආවාය.

''අනේ පුංචි අම්මේ... පුංචි අම්මේ මට දැනෙන්නේ මම හරි සතුටෙන් කියල. මේ වගේ උදේක මේ වගේ ඉන්න....''

''පොලියානා!'' පොලී මෙනෙවිය සැරෙන් කියා මහ බරක් ගෙලේ පැටවී ඇති විටෙක මෙන් කෙලින් වීමට තැනුවාය.

''ඔයා ඔය ගුඩ් මෝනිං කියන විදියද?''

කුඩා දැරිය ඇඟිලි මත සිට ගෙන එහෙටත් මෙහෙටත් වැනුනාය.

''නෑ - මං හුඟක් ආදරේ කරන අයත් එක්ක ඉන්න කොට මට මෙහෙම හැසිරෙන එක නවත්තගන්න බෑ. ඔයාව ජනේලෙන් දකින කොට මට හිතුණා පුංචි අම්ම - ඔයා අර කාන්තා සරණ සංගමේ කෙනෙක් නෙමෙයි කියලා. ඔයා මගේ ඇත්තම ඇත්ත පුංචි අම්මා. ඔයාව ඒ විදියට ගොඩක් හොඳට පේනකොට මට මෙහෙම දුවගෙන ඇවිත් ඔයා බදා ගන්න හිතුනා....''

කුදු ගැහුණු මහලු මිනිසා හදිසියේම ආපසු හැරුණේය. මෙහිදී පොලී මෙනෙවියට, සිය සුපුරුදු විලාසයෙන් නොවුණත් මදක් රවා බැලීමට සිදුවිය.

''පොලියානා, ඔයා... මම... ආ! තෝමස් දැනට ඔය ඇති. මං හිතන්නේ රෝස පඳුරු හදන හැටි ඔයාට තේරෙන්න ඇති නෙ....''යි ඇය දරදඬු ලෙස කීවාය. ඊට පසු ඇය හැරී වේගයෙන් නිවෙස දෙසට ඇවිද ගියාය.

''ඔයා හැමතිස්සෙම වැඩ කරනවද සීයෙ....''

ඊට පසු පොලියානා උනන්දුවෙන් ඇසුවාය.

මහලු මිනිසා හැරී බැලුවේය. ඔහුගේ දෙතොල් වෙව්ලන්නට පටන් ගත්තේය. දෑස කඳුළු පිරී ඇති විටෙක මෙන් දිලිසුණේය.

''ඔව් මිස් - මං තමා ටොම්.... වත්තෙ වැඩ කරන එක්කෙනා....'' යි ඔහු උත්තර දුන්නේය. බයාදුවෙන් මෙන්, පාලනය කළ නොහැකි බලවේගයකට අවනත වූ ටොම්, වෙව්ලන අතින් දැරියගේ දීප්තිමත් හිසකේ අත ගෑවේය.

''ඔයා අම්මා වාගේමයි, පුංචි නෝනෙ. මං ඒ ඇත්තිව දන්නෙ ඔයැයිටත් වඩා පුංචි සන්දියේ හිටං... ඒ කාලෙත් මං වත්තෙ වැඩ කොළා නෙව..''

පොලියානා හඬක් නගමින් හුස්මක් අල්ලා ගත්තාය.

''ඇත්තද? ඔයා මගේ අම්මව දන්නවද? එයා ස්වර්ගයට යන්න කලින්, මේ ලෝකෙ සුරංගනාවක් වෙලා ඉන්නකොටත්? අනේ... මට එයා ගැන කියන්නකෝ....'' යි පොලියානා ඇවිටිලි කරන්නට වූවාය.

බංගලාවෙන් සීනු හඬක් නැගිණි. ඊළඟ මොහොතේ නැන්සි පිටුපස දොරෙන් ගෙවත්තට දිව ආවාය. ''මිස් පොලියානා.... බෙල් එක ගැහුවේ උදේ කෑමට....'' ඇය කුඩා දැරියව හනික බංගලාව දෙසට ඇදගෙන යන්නට වූවාය. ''අනික් වේලාවටත් ඒකෙන් කියන්නෙ කෑම ලෑස්තියි කියල. ඔයා කොහේ හිටියත් ඒක ඇහුණම දුවගෙන එන්න. ඔයා එහෙම කළේ නැත්නං.... හොඳයි අපි ඒකෙත් මොකක් හරි සතුටු වෙන්න පුළුවන් දෙයක් දකින එක වඩා හොඳයි.....'' යි කතාව හමාර කළ ඇය අකීකරු කුකුලු පැටවු කාණ්ඩයක් කූඩුවට දක්කන විටෙක මෙන් පොලියානා නිවෙස දෙසට තල්ලු කරගෙන යන්නට වූවාය.

උදේ කෑම ගන්නා අතර පළමු මිනිත්තු පහ නිහඬව ම ගෙවී ගියේය. ඊළඟට පොලී මෙනෙවිය නොරුස්නා බැල්මෙන් කෑම මේසය මත එහාටත් මෙහාටත් පියාඹන මැස්සන් දෙදෙනකු දෙස බලා සිටියාය.

''නැන්සි... කොහෙන්ද මේ මැස්සො ආවේ....'' ඇය දූඩි හඬින් ඇසුවාය.

''මං දන්නෑ මැඩම්. කුස්සියෙ නං එකෙක්වත් හිටියෙ නෑ....'' යි කී නැන්සි ඊයෙ දවල් වරුවෙත් පොලියානා ගේ කාමරයේ ජනෙල් හොඳින් වසා තිබූ බව මතක් වීමෙන් පුදුමයට පත්ව සිටියාය.

''මං හිතන්නෙ ඒ ගොල්ලො මගෙ මැස්සො වෙන්නැති පුංචි අම්මෙ....'' පොලියානා විමසුම් සහගතව කීවාය. ''අද උදේ උන් ගොඩක් උඩ තට්ටුවට ආවා....''

නැන්සි ඇය විසින් උණු උණුවේම තනන ලද පාන් රෝල් මේසයට ගෙනෙන්නට මුළුතැන්ගෙට ගියාය.

''ඔයාගේ!'' පොලී මෙනෙවිය විස්මයෙන් මුව අයාගත්තාය. ''ඔයා මොනවද මේ කියන්නෙ... කොහෙන්ද උන් ආවෙ....?''

''ඇයි පුංචි අම්මෙ... උං එළියෙ ඉඳන්නෙ ආවෙ.. ජනේලෙන් උන් එනව මං දැක්කා...''

''ඔයා උන්ව දැක්කා ! ඔයා කියන්නෙ ඔයා අර තිර දාලා නැති ජනේල ඇරිය කියලද?''

''ඇයි? ඔව්. ඒවට තිර දාලා තිබුණෙ නං නෑ තමා...''

නැන්සි මේ මොහොතේ පාන් රෝල් රැගෙන කාමරයට ඇතුළු වුණාය. නොසැලෙන පෙනුමක් තිබුණු නමුත් ඇගේ මුහුණ තදින් රතුවී තිබුණි.

"නැන්සි." ඇගේ නෝනා මහත්මිය ඇය වෙතට තියුණු බැල්මක් හෙලුවාය. "ඔයා ඕවා මේසෙ උඩින් තියල ඉක්මනට මිස් පොලියානාගේ කාමරේට ගිහිං ජනේල ටික වහන්න. දොරත් වහන්න. ඊළඟට ඔයා ගෙ උදේ වැඩ ටික ඉවර උනාම හැම කාමරේටම ගිහින් හොඳට බලන්න මැස්සො ඉන්නවද කියල...."

ඉන්පසු ඇය ලේලිය වෙත හැරෙමින්....

"පොලියානා... මං ඔය ජනෙල්වලට තිර වගයක් ඕඩර් කරලයි තියෙන්නෙ. මං දන්නව ඒක මගෙ රාජකාරියක් කියල. ඒත් මට පේනවා ඔයා ඔයාගෙ රාජකාරිය නං අමතක කරල කියල...." යි කීවාය.

"මගේ.... රාජකාරිය?" පොලියානා ගේ දෑස් විස්මයෙන් ලොකුවී තිබුණි.

"ඔව්... මං දන්නව ඒ කාමරේ හරි රස්නෙයි. ඒත් මං හිතන්නෙ ජනෙල් තිර එනකං ඔය ජනෙල් ටික හොඳට වහල තියා ගන්න එක ඔයාගෙ රාජකාරියක්. මැස්සො කියන්නෙ පොලියානා, මහ කරදරයක් වෙන, අපිරිසිදු සත්තු ජාතියක් විතරක්ම නෙමේ. උන්ගෙන් ලෙඩත් හැදෙනවා. උදේ කෑමෙන් පස්සෙ මං ඔයාට ඒ ගැන ලියල තියෙන පොතක් දෙන්නං කියවන්න...."

sinhalaebooks.com

"කියවන්න?' අනේ ස්තුතියි පුංචි අම්මෙ. මං කියවන්න හරි ආසයි..."

පොලී මෙනෙවිය හයියෙන් හුස්මක් ඇද ගත්තාය. ඊට පසු ඈ දෙතොල් එකිනෙක තද කර ගත්තාය. පොලියානා ඇගේ දැඩි මුහුණ දකින විට, කල්පනාකාරීව මුහුන අඳුරු කරගත්තාය.

"ඇත්තටම මට හරි කණගාටුයි, මට මගෙ රාජකාරිය අමතක වෙච්ච එක ගැන පුංචි අම්මෙ." ඇය බයාදු ලෙස සමාව අයදින්නට වූවාය. "මං ආයෙ ජනෙල් අරින්නෙ නැතුව ඉන්නං...."

ඇගේ පුංචි අම්මා ගෙන් පිළිතුරක් ලැබුණේ නැත. කෑම කා ඉවර වෙන තුරුම ඇය කතා කළේ නැත. ඊට පසු උන් තැනින් නැගී සිටි ඇය විසිත්ත කාමරයේ තිබූ පොත් රාක්කය වෙත ගොස් කුඩා පොත් පිංචක් එළියට ගෙන ආපිට පැමිණ එය පොලියානා අත තැබුවාය. පොලියානා එහි මැස්සෙකුගේ හිසක් සිය ගුණයකින් පමණ විශාල කොට ඇඳ තිබෙනු දැක, විස්මයෙන් කෑ ගෑවාය.

''අනේ ස්තුතියි පුංචි අම්මේ....'' ඊළඟ මොහොතේ ඇය ප්‍රීතියෙන් කාමරයෙන් එළියට දිව ගියේ දොර මහ හයියෙන් ඇර දමමිනි.

පොලී මෙනෙවිය රවා ගත් වනම සිටියාය. ඉන්පසු ගාම්භීර ලීලාවෙන් කාමරය හරහා ගොස් දොර විවෘත කර බලන විටත් පොලියානා පෙනෙන තෙක් මානයකවත් සිටියේ නැත. ඇය අට්ටාලයට යන තරප්පු පෙළ දිගේ ඉහළට නඟින හඬ ඇසිණ.

පැය භාගයකට පසුව පොලී මෙනෙවිය, බොහොම බැරෑරුම් බවක් පළ කරන මුහුණකින් යුතුව උඩ තට්ටුවට නැග පොලියානාගේ කාමරයට ඇතුළු වූවාය. පොලියානා ඇයව පිළිගත්තේ ඉහවහා ගිය ආසාවකින් හා උනන්දුවකිනි.

''අනේ පුංචි අම්මෙ. මේ වගේ බලන්න ආස හිතෙන පොතක් මං ජීවිතේට දැක්කෙ නෑ. ඒක කියවන්න දුන්නට මට ගොඩක් සතුටුයි. ඒ මොකද, මං දැනගෙන හිටියෙ නෑ මැස්සන්ට උන්ගෙ කකුල්වලින් ඔය තරම් දේවල් ගේන්න පුළුවන් කියල....''

''ඒක එහෙම තමයි.'' පොලී මෙනෙවිය සියුම් ගර්වයකින් යුතුව කීවාය.

''පොලියානා... කෝ, ඔයාගේ ඇඳුම් ටික ගේන්න බලන්න. හැබැයි ඔයාට ගැලපෙන්නෙ නැති ඇඳුම් ටික මං හිඟන්නන්ට දෙනවා. ඇත්තටම...''

ඒ කාරියට නම් පොලියානා මදක් පසුබාන බව පෙනුණි. ඇය

කියවමින් සිටි පත්‍රිකාව පසෙක තබා ඇඳුම් රාක්කය වෙත හැරුණාය.

''මං නං හිතන්නෙ කාන්තා සරණ සංගමේ කට්ටියටත් වැඩියෙන් ඔයා ඒවාට අකමැති වෙයි. ඒ ගොල්ලෝ නං කීවේ ඒවා පොඩ්ඩක්වත් හොඳ නෑ කියලා...'' යි ඇය සුසුම් ලෑවාය.

''පහුගිය දවස්වල අපට හම්බවෙච්ච මිෂනරි තෑගි පෙට්ටිවල වැඩියෙන්ම තිබුණෙ පිරිම ළමයින්ටයි, වයසක අයටයි හරියන ඇඳුං... ඔයාටත් කවද හරි මිෂනරි තෑගි පෙට්ටි හම්බවෙලා තියෙනවද පොලී පුංචි අම්මෙ...?''

ඒ ඇසීමෙන් ඇගේ පුංචි අම්මාගේ මුහුණේ නැගුණු කෝපය දුටු පොලියානා එක්වරම කියමින් සිටි දේ නිවැරදි කළාය.

''නෑ... ඇත්තටම ඔයාට එහෙම ඒවා හම්බ වෙන්න නැතුව ඇති...'' යි මුහුණ රතුකර ගනිමින් ඇය හනික කීවාය. ''මට අමතක උනා. පෝසත් අයට ඒවා ලැබෙන්නෙ නෑ කියල. මට ඇත්තටම සමහර වෙලාවට අමතක වෙනවා... මේ වගේ කාමරේක ඉන්නකොට ඔයා කොයිතරම් පෝසත් ද කියල....''

sinhalaebooks.com

පොලී මෙනෙවියගේ දෙතොල් ඇරුණු නමුත් ඉන් වචන කිසිවක් පිටතට ආවේ නැත. පොලියානා, ඇය කීවේ කොයිතරම් භයානක කතාවක් දැයි නොදැන දිගටම කතා කරගෙන යන්නට වූවාය.

''ඉතිං මං කියන්ඩ ගියෙ අපි හිතන දේ ඒවයේ නෑ කියල දැන ගන්නකං... මිෂනරි තෑගි පෙට්ටි ගැන කිසි දෙයක් අපිට කියන්න බෑ. හැමදාමත් ඒවා එහෙම තමා. අර සෙල්ලම කරන්ඩත් ගොඩාක් අමාරු උනා තාත්තටයි....''

පුංචි අම්මා සමඟ තාත්තා ගැන කිසිවක් කතා නොකළ යුතු බව මෙහිදී කීප වරක්ම පොලියානාට මතක් විය. ඊට පසු ඇය ඇඳුම් රාක්කය වෙත ඇදී ගොස් හනික ඇගේ දූප්පත් ඇඳුම් සියල්ලම

වාගේ අත් දෙකට ගත්තාය.

"මේවා පොඩ්ඩක්වත් හොඳ නෑ...." ඇයට වචන හිර විය. "පල්ලියට රතු කාපට් ඕන වුණේ නැත්නං මේවා කලු පාට ඇඳුං වෙන්නත් තිබුණා. ඒත් මට දැං තියෙන්නෙ මේවා විතරයි...."

පොලී මෙනෙවිය ඇගේ ඇඟිලි තුඩුවලින් පොලියානා හැර වෙන ඕනෑම කෙනෙකුට හරියන විදියේ ඇඳුම් කෑලි එකිනෙක හරව හරවා බලන්නට වූවාය. ඊළඟට ඈ ලාච්චුවේ තිබුණු අණ්ඩ දාමූ යට ඇඳුම් දෙස මුහුණ පුළුටු කරගෙන බලා සිටින්නට වූවාය.

"මං හොඳ යට ඇඳුම් ටික ඇඳගෙනයි ඉන්නෙ...." පොලියානා සමාව ඉල්ලන ස්වරයකින් කීවාය. " කාන්තා සරණ සංගමෙන් මට ඇඳුං වගයක් හම්බවුණා. මිසිස් ජෝන්ස්.... එයා තමයි සබාපති.... එයා කිව්වා මට ඒවා ලැබෙන්නෙ ඒගොල්ලන්ට හැමදාම කාපට් නැති පල්ලියකට යන්න පුළුවං නං විතරයි කියල. ඒත් එහෙම උනේ නෑ. වයිට් මහත්තයා ඒකට කැමති උනේ නෑ. එයා පොඩ්ඩ ඇත්නම් කලබල වෙනව. එයාගේ නෝනා කියන්නෙ එයාට ගොඩක් සල්ලි තියෙනවා කියල. ඉතිං ඒගොල්ලො බලාපොරොත්තු උනා වයිට් මහත්තයා පල්ලියෙ කාපට් එකට ගොඩක් වියදං කරයි කියලත්, මං හිතන්නෙ එයා සන්තෝස වෙනව ඇති එයාට ඒ කලබල වෙන ගතිය තිබුණත් ඒ එක්කම සල්ලිත් තිබුණ එක ගැන. ඔයා එහෙම හිතන් නැද්ද?"

පොලී මෙනෙවියට පොලියානාගේ මේ අගක් මුලක් නැති කතා ඇසුණු බවක් පෙනුණේ නැත. යට ඇඳුම් පරීක්ෂා කිරීම අවසන් වූ පසුව ඇය පොලියානා දෙස අප්‍රසන්න බැල්මක් හෙලුවාය.

"පොලියානා ඔයා ඉස්කෝලේ ගිහිං ඇති මගේ හිතේ නේද?"

"අනේ ඔව් පුංචි අම්මෙ.. සමහරක් වෙලාවට තාත්... නෑ මං කිව්වෙ මං ගෙදරදිත් ඉගෙනගෙන තියෙනවා...." පොලී මෙනෙවිය රවා බැලුවාය.

''බොහොම හොඳයි. තව ටික දවසකිං ඔයාට මෙහෙ ඉස්කෝලෙකට යන්ඩ පුළුවං. ඒකෙ ප්‍රින්සිපල්... මිස්ට පෝල් ඔයාව මොන පන්තියට දාන්න ඕනද කියල පිළිවෙලක් කරල දෙයි. එතකං හැමදාම පැය බාගයක් ඔයා මට ඇහෙන්න පාඩම් පොත හයියෙන් කියවන්න ඕන....''

''මං කියවන්න ආසයි. ඒත් ඔයාට ඒක අහන්න ඕන නැත්තං, මං ආසයි තනියම කියවන්න... ඇත්තමයි පුංචි අම්මෙ. එතකොට ඒකට අමුතුවෙන් සන්තෝස වෙන්න හේතුවක් හොයා ගන්නත් ඕන වෙන්නෙ නැතිවෙයි. මොකද ලොකු ලොකු වචන තියෙද්දි තනියම කියවන එකට මං ආස නිසා....''

''මට ඒකට කමක් නෑ....'' පොලී මෙනෙවිය නොපහන් හැඟීමෙන් කීවාය.

''ඔයා සංගීතෙ ඉගෙනගෙන තියෙනවද?''

''හොඳට ම ඉගෙන ගෙන නෑ. මං මගේ මියුසික්වලට ආස නෑ. මම ආස අනික් අයගෙ ඒවට. පියානෝ එක ගහන්නත් මම චුට්ටක් ඉගෙන ගෙන තියෙනව. මිස් ග්‍රේ... එයා තමා පල්ලියෙ පියානෝ එක ගැහුවෙ... මට ටිකක් විතර ඉගැන්නුවා. ඒත් මං ඉක්මනටම ඒක අතෑරියා පුංචි අම්මෙ, ඇත්තටම මං කැමති උනේ නෑ එහෙම කරන්න...''

''එහෙමද?'' පොලී පුංචි අම්මා ඇස් බැමි උඩට නගා ගෙන කීවාය. ''කොහොම උනත් මං හිතනව, ඔයාට සංගීතෙ ගැන මූලික දැනුමවත් දෙන එක මගේ යුතුකමක් කියල. ඔයා මහනව ඇති ඇත්තටම?''

''ඔව්....'' පොලියානා සුසුම් ලෑවාය. ''මට ඒක ඉගැන්නුවේ කාන්තා සරණ සංගමේ කට්ටිය. ඒ දවස්වල නං මං හරිම නරක කාලයක් ගෙව්වෙ. මිසිස් ජෝන්ස් හිතුවෙ නෑ අනිත් හැමෝම කරනව වගේ බොත්තං කාස මහනකොට ඉදිකටුව අල්ලන විදිය

sinhalabooks.com

හරි කියල. මිසිස් වයිට් හිතුවෙ චාටි මැස්ම උගන්නන්න කලින් දංවැල් මැස්ම උගන්නන්ඩ ඕන කියල. මිසිස් හැරිමාන් කොහොමටවත් හිතුවෙ නෑ පැච්වර්ක් උගන්වන්න ඕන කියල.''

''හොඳයි. ඕක එච්චර අමාරු වෙන එකක් නෑ පොලියානා. මං ඔයාට මහන්න උගන්නන්නංකො. මං හිතන්නෙ ඔයා උයන්න නං දන්නෙ නැතුව ඇති.''

පොලියානා මහ හයියෙන් සිනාසුනාය.

''පසුගිය ග්‍රීස්ම දවස්වල එගොල්ලො මට ඒකත් උගන්නන් පටං ගත්ත. ඒත් මං එච්චර දුර ගියේ නෑ. මහන්න උගන්නනකොටත් වඩා ඒගොල්ලො ඒකෙදි බෙදිල හිටියෙ... එක එක දේවල් කිය කියා. ඔන්න ඒගොල්ලො හිතුවෙ උයන පාඩම පටං ගන්න ඕන පාන්වලිං කියල. ඒත් අඩුම තරමෙං දෙන්නෙකුටවත් එක වගේ ඒවා හදන්න බැරි උනා. ඊට පස්සෙ වාද කරල කරල මීටිමකුත් තියල ඒගොල්ලො තීරණේ කලා සතියකට සැරයක් උදේ වරුවක ඒගොල්ලන්ගෙම ගෙවල්වලදී මට උයන පාඩම කරන්න ඕන කියල. මං ඉගෙන ගත්තෙ චොකලට් ෆජ් * හදන හැටියි ෆිග් කේක්* හදන හැටියි විතරනෙ. ඒත්... ඒත් මට ඒක නතර කරන්න උනා....'' ඇගේ කටහඬ බිඳුනු ස්වරයක් ගත්තේය.

''චොකලට් ෆජ් එකයි ෆිග් කේක් එකයි... අනේ ඇත්තටම...'' පොලී මෙනෙවිය අවඥාවෙන් කීවාය.

''මං හිතන්නෙ අපිට ඔය අඩුපාඩු ඔක්කොම හදාගන්න පුළුවන් වෙයි....'' යි මඳක් නැවතී සිටි ඇය යළි කියාගෙන යන්නට වූවාය. ''හැමදාම උදේ පැය බාගයක් ඔයා මට පාඩම කියවන්න ඕන. ඊට කලිං ඔයා මේ කාමරේ අස් කරන්නත් වෙලාවක් හදාගන්න ඕන. බදාදායි, සෙනසුරාදායි උදේ නවය හමාරෙන් පස්සෙ ඔයා කුස්සියට ගිහිං නැන්සි එක්ක උයන්න ඉගෙන ගන්න ඕන. අනික් දවස්වල

උදේට ඔයාට මාත් එක්ක මැහුම් ඉගෙන ගන්න පුළුවං. එතකොට හැමදාම හැන්දෑවට ඔයාට මියුසික් ඉගෙන ගන්න පුළුවං. ඔයාට මං අනිවාර්යයෙන්ම ගුරුවරියක් හොයල දෙන්නං.....''

ඇය පුටුවෙන් නැගී සිටිමින් තීරණාත්මක ලෙස කතාව හමාර කළාය.

පොලියානාට කට වසාගෙන ඉන්ඩ බැරිවිය.

''අනේ... පුංචි අම්මෙ.... ඒත් ඔයා මට ජීවත් වෙන්න වෙලාවක් ඉතුරු කරල නෑනෙ....''

''ජීවත් වෙන්න... ඇයි ළමයො මොනවද මේ කියවන්නෙ? හරියට අනික් වෙලවාට ඔයා ජීවත්වෙන්නෙ නෑ වගේ......''

''අනේ.... ඇත්තටම මං ඔය කියපු දේවල් කරන කොට හුස්ම ගන්නවා විතරනෙ පුංචි අම්මෙ. ඒත් ඒ කියන්නෙ මං ජීවත් වෙනවා කියන එක නෙමේ. අපි නිදාගන්නකොටත් හුස්ම ගන්නවා. ඒත් ජීවත් වෙන්නෙ නෑනේ. මං ජීවත්වෙනවා කිව්වෙ මං කැමති දේවල් කරන එකට. එළියට ගිහිං සෙල්ලං කරන එක... තනියෙං පොත් කියවන එක, කඳු නගින එක, ටොම් සීයයි නැන්සියි එක්ක වත්තෙ ඉඳගෙන කතා කර කර ඉන්න එක, මං ඊයෙ මෙහාට ආපු ලස්සන වීදි දිගේ තියෙන ගෙවල් ගැනයි, ඒවයේ ඉන්න මිනිස්සු ගැනයි, අනික් හැම තැනක් ගැනමයි විස්තර හොයන එක... ඔන්න ඕවටයි ජීවත් වෙනවා කිව්වෙ පොලී පුංචි අම්මෙ. හුස්ම ගන්නවා කියන්නෙ ජීවත් වෙන එක නෙමේනෙ....''

පොලී මෙනෙවිය කේන්තියෙන් හිස ගස්සා බැලුවාය.

''පොලියානා..... ඔයා නං පුදුමාකාර ළමයෙක්. ඇත්තටම මං ඔයාට සෙල්ලං කරන්න වෙලාවක් දෙන්නං. ඒත් ඔයා දැන ගන්න ඕන, ඔයාට හොඳ රැකවරණයක් දීල, මඟ පෙන්වීමක් දීල මං මගේ රාජකාරිය ඔයා වෙනුවෙන් කරන්න හදන කොට, ඒ රැකවරණයයි

මඟ පෙන්වීමයි කෙළෙහි ගුණයක් නැතුව නාස්ති කරන්න හදන්නෙ නැතුව ඔයත්, ඔයාගෙ රාජකාරිය හරියට කරන්න.''

පොලියානා මදක් තිගැස්සී සිටියාය.

''අනේ පුංචි අම්මෙ... මං කවදාවත් කෙළෙහිගුණ අමතක කරන්නෙ නෑ. ඒ මොකද මං ඔයාට ආදරේ නිසා. ඔයා කාන්තා සරණ සංගමේ කෙනෙක් නෙමේනෙ. ඔයා මගෙ පුංචි අම්මා....!''

''බොහොම හොඳයි. එහෙනං එහෙම හැසිරෙන්න හිතාගන්න....'' යි දොර දෙසට හැරී යන්නට යමින් පොලී මෙනෙවිය කීවාය. ඇය තරප්පු පෙළ දිගේ බාග දුරක් බැස යන විට, ඇයට පිටුපසින් සිහින් හඬගැමක් ඇසිණි.

''කරුණාකරල... පුංචි අම්මෙ. ඔයා තාම කිව්වෙ නැනෙ මගෙ ඇඳුංවලින් අයින් කරන්න ඕන මොනවද කියලා....''

පොලී මෙනෙවිය තෙහෙට්ටුවෙන් සුසුමක් හෙලුවාය. එය පොලියානාටද ඇසිණි.

''ආ ! මට ඒක අමතක වුණා පොලියානා. තිමති අද හැන්දෑවෙ අපිව ටවුන් එකට එක්ක යයි. ඔයාගෙ එක ඇඳුමක් වත් මට නං හරියන්නෙ නෑ. ඒ එක ඇඳුමක් වත් ඔයාට ඇඳගෙන ඉන්න ඉඩ දුන්නොත් මං මගේ රාජකාරිය හරියට කළේ නැති වෙනවා....''

මෙවර පොලියානා සුසුම් ලෑවාය. ඇයට ඒ වචනය දැන් නම් එපා වෙන්නට යන බවක් දැණුනි. රාජකාරි! ''පුංචි අම්මෙ....'' අනේ කරුණාකරල... පොලියානා දුක්බර හඬකින් කීවාය. ''ඔයාට ඔය රාජකාරි ගැන සතුටු වෙන්න පුළුවං වෙන විදියක් හොයාගන්න ඇත්තෙම නැද්ද?

''මොකක්?'' පොලී මෙනෙවිය විස්මයෙන් දෙනෙත් අයාගෙන ඉහළ බැලුවාය. ඊට පසුව එක්වරම රතුකරගත් මුහුණෙන් යුතුව,

තරප්පු පෙළ දිගේ කේන්තියෙන් බැසගෙන ගියාය. ''නැහැදිච්ච කතා කියන්න එපා පොලියානා!''

ඉතා රස්නය සහිත, අට්ටාලයේ කුඩා කාමරයේ සිටි පොලියානා පුටුවක් උඩට ඇද වැටුණාය. නිමාවක් නැති රාජකාරි ඇය වටා හොල්මන් කරන්නාක් මෙන් ඇයට පෙණුනි.

''මට නං පේන්නෙ නෑ, ඇත්තටම ඒක නැහැදිච්ච කතාවක් වෙන්නෙ කොහොමද කියල....'' යි ඇය සුසුම් ලෑවාය. ''මං ඇහැව්වෙ... එයා හැම තිස්සෙම කියන රාජකාරි ගැන සන්තෝස වෙන්න පුළුවන් විදියක් තියෙනවද කියල විතරයි....''

මිනිත්තු කිහිපයක් තිස්සේ ඇය නිහඬව වාඩිවී සිටියාය. ඇගේ තැවුලෙන් පිරුණු දෑස් ඇඳ උඩ ගොඩ ගසා තිබූ ඇඳුම් දෙසට යොමු වී තිබිණි. ඊට පසු හෙමිහිට නැගී සිටි ඇය ඇඳුම් අස්පස් කරන්නට පටන් ගත්තාය.

sinhalaebooks.com

''මට පේන්නෙ නං මෙහිදි කිසි දෙයක් ගැන සන්තෝස වෙන්න බෑ වගේ.'' යි ඇය හඬ නගමින් කීවාය. ''රාජකාරිය කරල ඉවර වුණාට පස්සෙ නං පුළුවං වෙයි....'' මෙහිදී ඇයට හදිසි සිතාවක් පහළ විය.

# 7

# පොලියානා සහ දඬුවම්

එදා දවල් එක හමාරට තිමති පොලී මෙනෙවිය සහ ඇගේ ලේලිය කැටුව අසළ ඇති නරගයට ගියේය. ඔවුහු හැරින්ටන් බංගලාවේ සිට සැතපුම් බාගයක් පමණ එහායින් තිබුණු වෙළෙඳ සල් හතර පහකටම ගියහ.

පොලියානාට ගැලපෙන අලුත් ඇඳුම් සෙවීම හැම දෙනාටම විනෝදජනක අත්දැකීමක් වූයේය. පොලී මෙනෙවිය නම් සාප්පුවෙන් පිටතට ආවේ පුපුරන්නට ආසන්න ගිනි කන්දක් උඩ ඇවිදීමෙන් පසු, මහපොළොව මතට අඩි තබත්ම ඇතිවන අන්දමේ සැනසිලි සහගත හැඟීමකිනි. ඔවුන් සාප්පුවෙන් එළියට යනතෙක් රතු කරගත් මූණෙන් යුතුව සිටි සාප්පු සේවකයන්ට නම් පොලියානා නිසා ඊළඟ සතිය පුරාවටම ඔවුන්ගේ මිතුරන් සමඟ කිය කියා රස විඳින්නට තරම් ඉළ ඇදෙන කතා බොහොමයක් තිබුණි. පොලියානා

ද අලුත් ඇඳුම් අරගෙන පිටතට ආවේ දීප්තිමත් ලෙස සිනා වෙමිනි. ඇගේ හදවත ප්‍රීතියෙන් පිරී තිබුණි. ඒ කොතරම්ද කියනවා නම් ඇය සාප්පු සේවකයකුට ද මෙසේ කියා තිබුණි. ''අර මිෂනරි තෑගි පෙට්ටියි, කාන්තා සරණ සංගමේ කට්ටියයි ඇරෙන්න, මට ඇඳුං දෙන්න වෙන කිසිම කෙනෙක් නැතුව ඉන්නකොට මේ වගේ කෙලින්ම කඩේකට ගිහිං අලුත්ම අලුත් ඇඳුං ගන්න පුළුවනං වෙන එක කොයි තරං හොඳද? අනික මේවා ඇඟට හරියන්නෙ නෑ කියල අහක දාන්න වෙන්නෙත් නෑනෙ....''

සාප්පු සවාරිය වෙනුවෙන් මුලු හැන්දෑ වරුවම වැය විය. රෑ කෑමෙන් පසුව පොලියානාට ගෙවත්තේ සිටි ටොම් සීයා සමඟ කතාබහ කරන්නට ඉස්පාසුවක් ලැබුණි. ඊට පසු පොලී පුංචි අම්මා අසල්වැසි නිවෙසකට ගිය අතරේ නිවසේ පිටුපස බරාඳයට වී නැන්සි සමඟ කතා කර කර ඉන්නට ද වේලාව තිබුණි.

ටොම් සීයා පොලියානාට ඇගේ අම්මා ගැන නොයෙකුත් කතා කීවේය. නැන්සි ද සැතපුම් හයකට එහායින් පිහිටි කුඩා ගොවිපලක ජීවත් වන තම අම්මා ගැනත්, කුඩා නංගිලා මල්ලිලා ගැනත් කීවාය. පොලී මෙනෙවියගේ අවසරයක් ලැබන්නේ නම්, දවසක පොලියානා එහි කැඳවාගනෙ යන්නටද ඇගෙන් පොරොන්දුවක් ලැබුණි.

''මගේ නංගිල මල්ලිලාට තියෙන්නෙ හරි ලස්සන නම්. ඔයා ඒවාට ආසා වෙයි.'' නැන්සි සුසුම් ලමින් කීවාය. ''එක්කෙනෙක් 'ඇල්ජර්නන්', අනිත් එක්කෙනා ''ෆ්ලෝරබල්', ඊළඟ කෙනා 'එස්මිලි' මට තමයි හොඳ නැතිම නම හම්බුණෙ... ''නැන්සි'... අයියෝ.... මට නං ඒක එපා වෙලා...''

''අනේ.... නැන්සි ඇයි එහෙම කියන්නෙ....''

''ඒක අනිත් අයගේ නම් වගේ ලස්සන නෑනෙ.... ඔයා දන්නවද? අම්මට මාව තෙ ඉස්සර වෙලාම හම්බුණේ. ඉතිං ඒ වෙන කොට එයා ලස්සන නම් තියෙන කතන්දර පොත් කියවලා තිබිල නෑ....''

''ඒත් මං නං නැන්සි කියන නමට ආසයි. ඒ මොකද ඒ ඔයා නිසා....'' පොලියානා කීවාය.

''හ්ම්... හොඳයි මං හිතන්නෙ ඔයා 'ක්ලැරිස්සා මාබල්' වගේ නමකටත් ආස වෙයි.'' නැන්සි එකට එක කීවාය. ''එහෙම නමක් තිබ්බා නං මං කොච්චර සන්තෝස වෙයිද? ඒක ඇත්තටම හරි ශ්‍රේෂ්ඨ නමක්....''

පොලියානා සිනාසෙන්නට පටන් ගත්තාය.

''හොඳයි.... කොහොමහරි...'' පොලියානා අතින් කට වසාගෙන සිනාසුනාය. ''ඔයාට සන්තෝස වෙන්න පුළුවං ඒක 'හෙෆිසිබා' වගේ නමක් නොවුණ එක ගැන...''

''හෙෆිසිබා....!''

''ඔව්.... මිසිස් වයිට් ගෙ නම ඒක. එයාගේ මහත්තයා එයාට කතා කළේ ''හෙප්'' කියල. ඒත් එයා ඒකට කැමති උණේ නෑ. එයා කියනවා. මහත්තයා ''හෙප් - හෙප්'' කියල කතා කරනකොට එයාට හිතෙනවලු ඊළඟ මොහොතේ එයා ''හුරේ'' කියයි කියලත්. එයා කොහොමටත් කැමති උනේ නැලු ''හුරේ'' කියනව වගේ එයාට කතා කරනවට.'' නැන්සිගේ අඳුරු මුහුණ පළල් සිනාවකින් එළිය වැටිණි.

''හොඳයි... ඔයා දන්නවද මං කවදාවත් ආයෙ 'නැන්සි' කියන නම ගැන හිතන එකක් නෑ. අර 'හෙප් - හෙප්' කතාව මතක් වෙන කොට. මං හිතන්නෙ මං සන්තෝස වෙනව....'' ඇය මොහොතකට නැවතී විස්මයෙන් පිරුණු දෑස් කුඩා දූරිය වෙත හැරවූවාය. ''කියන්න... මිස් පොලියානා, ඔයා දැන් 'හෙෆිසිබා' වගේ නමක් නොලැබිච්ච එක ගැන සතුටු වෙන්න කියල කළේ අර සෙල්ලම ද?''

පොලියානා මදක් රවා බලා සිනාසෙන්නට පටන් ගත්තාය.

"ඔව් නැන්සි.... ඒක නං එහෙම තමයි. මං කළේ ඒ සෙල්ලම තමා. මං හිතන්නෙ මං ඒක කළේ හිතන්නෙ නැතුව. ඔයා දන්නවද... ඒ සෙල්ලම ගොඩක් සැරයක් කරනකොට සන්තෝස වෙන්න පුළුවං දේවල් හොයන එක ඉබේටම හුරුවෙනවා. ගොඩක් වෙලාවට ටික්ක මහන්සි ගත්තොත්, හැම දේකට මොනව හරි සන්තෝස වෙන්න පුළුවං දෙයක් තියෙනවාම තමයි..."

"හොඳයි.... එහෙම වෙන්නැති..." යි නැන්සි කීවේ මද සැකයෙන් යුතුවය.

එදා රාත්‍රී අට හමාර පසුවන විට පොලියානා ඇඳට ගියාය. තවමත් ඇගේ කාමරයට ජනෙල් තිර ලැබී තිබුණේ නැති බැවින් එය ගිනි උඳුනක් මෙන් උණුසුම් විය. පොලියානාගේ දෑස තදින් වසන ලද ජනේල දෙක වෙත යොමුවී තිබුණු නමුත් ඇය ඒවා ඇර දැමීමට සිතුවේ නැත. ඇය ඇඳ සිටි ඇඳුම් ගලවා දමා, ඒවා පිළිවෙලකට නමා තැබුවාය. ඊට පසු යාඥා කොට, පහන නිවා දමා ඇඳට ගියාය.

රස්නය ඇති ඇඳේ ඒ පැත්තටත් මේ පැත්තටත් හැරෙමින් නිදි නැතිව කොයි තරම් වේලාවක් හිටියේද කියා ඇට නිච්චියක් තිබුණේ නැත. එහෙත් අන්තිමේදී ඇය ඇඳෙන් නැගිට, කාමරය හරහා ගොස් දොර හැර දැමුවාට බොහෝ කලින් එය සිදුවූවක් බව නම් ඇයට මතකය.

අට්ටාලයට පිටතින් ඝන කරුවලක් තිබුණි. එහි ජනේලයෙන් සඳ වතුර රිදී කඳක් මෙන් පෙරී ආවේය. හතික හුසුමක් ගත් පොලියානා එළියේ ඇති බය හිතෙන කරුවල ගැන නොසිතාම රිදී පාට සඳ එළිය බේරෙන අට්ටාලයේ ජනේලය වෙත ගියාය.

ඒ ජනේලයට තිර දමා ඇතැයි යන සිහින් හැඟීමක් ඇය තුළ මෝදු වෙමින් තිබුණද ළඟට ගොස් බැලූ විට එවැනි දෙයක් තිබුණේ නැත. ජනේලයෙන් පිටත සුරංගනා ලෝකයක සුන්දරත්වයෙන් පිරී තිබුණි. ඇගේ දැවෙන කම්මුල්වලට සහ දෑත්වලට එහි ඇති

පිරිසිදු, නැවුම් වාතය කොයිතරම් හොඳ බේතක්ද යන වග ඇය දැන සිටියාය.

ජනේලය ළඟට ම ගොස් එයින් පිටත එබී බලන අතරේ ඇය අපූරු යමක් දුටුවාය. ඒ, පහළ තට්ටුවේ පෝර්ටිකෝවට ඉහළින් තහඩුවලින් තනා තිබූ පළල් වේදිකාවකි. අට්ටාලයේ ජනේලය ළඟ සිට ඒ වේදිකාව මතට බැසීමට තිබුණේ කෙටි දුරකි. එය පොලී මෙනෙවියගේ ගිම්හාන සඳැල්ල* විය.

පොලියානා බියෙන් මෙන් පිටුපස හැරී බැලුවාය. ඇයට පිටුපසින් ඇගේ රස්නය සහිත කාමරයත්, ඒ හා සමානව රත් වූ ඇඳත් තිබිණි. ඒ කාමරයත් ඇයත් අතර අවකාශය කැලි කැපිය හැකි ඝන අඳුරෙන් වැසී තිබුණු අතර ඇයට ඉදිරියෙන් ගිම්හාන සඳැල්ලේ වහලය මතට සඳ රැස් වැටී තිබුණි. ඒ අවට විසිරී තිබුණේ පිරිසිදු, සීත රාත්‍රී වාතයයි.

අනේ ! ඇගේ ඇඳ මේ එළිමහනේ තිබුණා නම්! මිනිසුන් රාත්‍රියට එළිමහනේ නිදා ගන්නා බව ඇය අසා තිබිණි. ඇය දැන සිටි ජොයෙල් හාට් එවැන්නෙකි. ක්ෂය රෝගය වැළඳීමෙන් හොඳටම ඔත්පල වී සිටි ඔහු, එළිමහනේ නිදාගන්නට කැමති වූයේය.

එක්වරම පොලියානාට අට්ටාලයේ ජනේලය ළඟ සුදු පැහැති දිග මලු කිහිපයක් එල්ලා තිබූ බව මතක් විය. එවා ශීත කාලයට අඳින ඇඳුම් බව නැන්සි කියා තිබිණි. තරමක බියෙන් ඒ වෙත ගිය පොලියානා, මලු තුළ බහා තිබූ කදිම, සිනිඳු කබායක්ද (එය පොලී මෙනෙවියගේ හම් කබායකි), ඊට වඩා සිනිඳු, හිසට කොට්ටයක් මෙන් තබා ගත හැකි ඇඳුමක්ද පිටතට ගත්තාය.

මේ සියලු ආම්පන්න රැගෙන ඇය නැවතත් හෙමිහිට අඩි තබමින් සඳ එළිය ගලා එන ජනේලය වෙත ගියාය. ජනෙල් පියන ඇරිය ඇය අතේ තිබුණු ආම්පන්න ජනේලයට පහතින් තිබූ වහළය

* *Sun parlour*

මතට අත හැර, ජනේලයෙන් පැන ඒ මතට නැග ගත්තාය. ඉන් පසුව ඇය පරෙස්සමින් ජනෙල් පියන වසා තැබුවාය. ඇත්තටම ඇයට අර මැස්සන් උන් ගේ කකුල්වලින් ජරාව රැගෙන එන බව අමතක වී නැත.

අනේ.... ඒ එළිමහන කොයිතරම් සීතල වූවාද? පොලියානා සීතල, පිරිසිදු වාතය හොඳ හැටි උරා ගනිමින්, වහළය මත ප්‍රීතියෙන් අඩි තබමින් නැටුවාය. එවිට ඇගේ කකුල්වලට පහතින් වූ තහඩුව නැඟු හඬට ඇය වඩාත්ම කැමති වූවාය. ඇය දෙතුන් වතාවක්ම වහලය මත එහාටත් මෙහාටත් ඇවිද්දාය. අර උණුසුම් කාමරයේ සිටිනවාට වඩා, පිරිසිදු වාතයෙන් පිරි එළිමහන ඇයට මිහිරි ආස්වාදයක් ගෙන දුන්නේය. වහළය බොහෝ පළල් වූ බැවින් ඉන් බිමට වැටේය කියා බිය වන්නට හේතුවක් තිබුණේද නැත.

අවසානයේ සැනසිලි සුසුමක් හෙලූ පොලියානා ඇය ගෙනා කදිම, හම් කබාය ඇඳක් ලෙස වහළ මත සකස් කළාය. ඊට වඩා සිනිඳු, තුනී කබාය කීප වරක් නැමීමෙන් පසු ඇයට කොට්ටයක් සාදා ගන්නට හැකි විය. ඔන්න, දැන් ඇය එළිමහනේ වහළය මත නිදා ගැනීමට සැරසී සිටී!

sinhalaebooks.com

"අර ඕඩර් කරපු ජනෙල් තිර තාම ආවෙ නැති එක නං හරි හොඳයි." ඇය ඉහළ අහසේ දැල්වෙන තරු දෙස බලමින් තමාටම කියා ගත්තාය. "නැත්නං මේ වගේ දෙයක් කරන්න හම්බ වෙන්නෙ නෑනෙ."

මේ අතර පහත තට්ටුවේ ගිම්හාන සඳැල්ලේ වහලයට පහළින් තිබූ කාමරය තුළ, පොලී මෙනෙවිය හති හිනක ඇගේ නිදන ඇඳුම අඳිමින් සෙරෙප්පු පය ලා ගනිමින් සිටියාය. ඇගේ මුහුණ බියෙන් සුදුමැලි වෙලාය. මීට මිනිත්තුවකට කලින් ඇය වෙව්ලන කඩ හඬකින් තිමතිට දුරකතන ඇමතුමක් දී තිබුණි.

"තිමති ඉක්මනට තාත්තත් එක්ක මෙහාට එන්න. එනකොට ලන්තෑරුමත් අරං එන්න. කවුදෝ වහළෙ උඩ ඇවිදිනවා. සමහරවිට

මේ රෝස මැස්ස දිගේ කවුරුහරි උඩට නගින්න ඇති. අර අට්ටාලෙ ජනේලෙන් ඒ මිනිහට ගේ ඇතුළට බහින්නත් පුළුවං. පාත අට්ටාලෙ දොර මං වහලයි තියෙන්නෙ. ඒත් ඉක්මනට, ඉක්මනට එන්න...''

නින්දට වැටී මද වේලාවකට පසුව ලන්තෑරුම් එළියක් සහ පුදුමයට පත් කෑගැසීම්වල හඬින් පොලියානා අවදි වූවාය. ඇස් ඇර බැලූ ඇයට, ඉනිමඟක ඉහළටම නැග, ලන්තෑරුමක් ද ඇතැතිව තමන්ගේ ළඟින්ම සිටින තිමති දැක ගන්නට හැකිවිය. ටොම් සීයා අට්ටාලයේ ජනේලයෙන් පිටතට බසිමින් සිටි අතර ඔහු පසුපස ඇගේ පුංචි අම්මා එබිකම් කරමින් සිටියාය.

''පොලියානා.... මොකක්ද මේකෙ තේරුම.'' ඇගේ හඬගෑම ඊට පසු ඇසිණි.

පොලියානා නිදිගැට කඩමින් නැගී සිටියාය.

''ඇයි ටොම් සීයේ.. පුංචි අම්මෙ....'' ඇය ගොත ගැසුවාය. ''ඔච්චර බය වෙන්න එපා. මට ජොයෙල් හාට්ට වගේ ක්ෂය රෝගෙ හැදිල නෑ. මං එළියෙ නිදාගන්න ආවෙ ඇතුළෙ හරි රස්නෙ හින්ද. මං මතක ඇතුව ජනේලෙ නං වැහුව පුංචි අම්මෙ. ඉතිං මැස්සන්ට ගේ ඇතුළට විසබීජ ගේන්නත් බෑ....''

තිමති එක්වරම පහතට බැස නොපෙනී ගියේය. ටොම් සීයාද ලන්තෑරුම පොලී මෙනෙවිය අතට දී පුතා පසුපස ගියේය. පොලී මෙනෙවිය ඔවුන් ඉවත්ව යන තෙක් දෙතොල තදින් විකාගෙන උන්නාය. ඊට පසු ඈ තදින්ම මෙසේ කීවාය.

''පොලියානා... ඉක්මනට ඔය රෙදි ටික මට දීලා මෙහාට එනවා! මහ අමුතුම ජාතියක ළමයෙක් ඔයා....''

මද වේලාවකට පසු ඇය පොලියානා කැඳවාගෙන, ලන්තෑරුමත් අතින් ගෙන අට්ටාලය වෙත ආපසු යන්නට වූවාය.

පොලියානාට නම් අර එළිමහනේ පිරිසිදු වාතය තුළ ඉඳීමෙන් පසවු දූන් මේ අට්ටාලය තුළ වාතය හුස්ම ගැනීමටත් අපහසු බවක් දූනෙන්නට වන. එහෙත් ඇය තවදුරටත් කං කෙඳිරි ගෑවේ නැත. ඇය වෙව්ලන සුලු දිගු හුස්මක් ගත්තා පමණය. තරප්පු පෙළ ඉහළ දී පොලී මෙනෙවිය නැවතත් කඩා පැන්නාය.

''දූන් පොලියානා..... මගේ ඇඳට වෙලා නිදා ගන්නවා! හෙට අර ඕඩර් කරපු ජනෙල් තිර ටික ලැබෙයිනෙ. එතකං මගෙ රාජකාරිය තමා මට පේන තැනක ඔය ළමයා නිදි කරවන එක....''

පොලියානා හුස්මක් අල්ලා ගත්තාය.

''ඔයා එක්ක?... ඔයාගේ ඇඳේ....?'' ඇය විස්මයෙන් කෑගෑවාය. ''අනේ පුංචි අම්මෙ... අනේ ඔයා කොයි තරං හොඳද? මට මගේම කියල කවුරු හරි එක්ක නිදාගන්න ඕන වෙලා තියන කොට..... මං අර කාන්තා සරණ සංගමේ කට්ටිය එක්ක ඉඳල තියෙනවා. ඒත් ඔයා එහෙම කෙනෙක් නෙමේනෙ. මගේ අම්මේ! අර ජනෙල් තිර ටික ආවෙ නැත්නං මං කොච්චර සන්තෝස වෙයිද? ඔයත් එහෙම නේද?''

ඊට පිළිතුරක් ලැබුණේ නැත. පොලී මෙනෙවිය ඉදිරියෙන් ඇවිද යමින් සිටියාය. ඇත්තම කියනවා නම් ඇය හොඳටම අසරණ වී සිටියාය. පොලියානාගේ පැමිණීමෙන් පසුව මේ ඇයට දඬුවමක් ලැබුණු තුන්වැනි වතාව ය. එහෙත් පොලියානා තුන්වන වතාවටත් ඒ දඬුවම ඇයට ලැබුණු තෑග්ගක් ලෙස බාරගන්නට ලැහැස්ති වී සිටී. ඉතින් පොලී මෙනෙවිය හොඳටම අසරණ වීම පුදුමයක්ද?

# 8

# පොලියානා ගමනක් යයි

පොලී මෙනෙවිය මුලින් බලාපොරොත්තු වූ පිළිවෙළටම නොවුණත්, වැඩි කල් නොගොස්ම හැරින්ටන් බංගලාවේ වැඩ කටයුතු නිවීහැනේ, පිළිවෙළකට සිදුවීම ආරම්භ විය. පොලියානා මැහුම් උගත්තාය. සංගීතය පුහුණු වූවාය. පොලී මෙනෙවියට ඇසෙන්නට හයියෙන් පාඩම් කියෙව්වාය. මුළුතැන් ගෙට වී නැන්සි සමඟ උයන්නට උගත්තාය. මේ සියලු දේම ඇය කළ බව ඇත්තය. එහෙත් ඇය මුලින් සිතාගෙන සිටි පරිදිම ඒ එකකටවත් ඇය වැඩි කාලයක් වැය කළේ නැත. වැඩිපුර කාලය වෙන් වී තිබුණේ ඇය කියන පරිදි ''ජීවත් වෙන්න''ට ය. හැම දවසකම සැන්දෑ වරුවේ දෙකේ සිට හය දක්වා වෙන් වුණේ ''ජීවත් වීම'' සඳහා හෙවත් ඇය කැමති කැමති දේ කිරීම සඳහාය. ඒ කාලය තුළදී ඇය ''අකමැති'' දේ හෙවත් පොලී මෙනෙවිය විසින් සපුරා තහනම් කොට තිබූ ඇතැම් දේ ඇය නොකළ බව සිතමු.

ඇත්තටම ඇයට මේ තරම් විවේක කාලයක් ලැබුණේ දැරියක වශයෙන් පොලියානාට ඇගේ වැඩ කටයුතුවලින් නිදහසක් ලබාදිය යුතු නිසාද, එහෙමත් නැතිනම් පොලී පුංචි අම්මාට පොලියානා ගෙන් නිදහස් වෙන්නට ඕනෑ වූ නිසාද යන්න නම් ප්‍රශ්නයකි.

ජූලි මාසයේ මුල්ම දවස් ගෙවී යත්ම පොලී මෙනෙවියට ''මොන තරම් පුදුමාකාර ළමයෙක්ද '' යන්න වරින් වර කියන්නට සිදු වූ අතර, කියවීමේ සහ මැහුම් පාඩම් අවසානයේ දී හැම දිනකම ඇය තදබල ලෙස විඩාවට පත්ව සිටියාය.

පොලියානාට ඉවුම් පිහුම් ඉගැන්වූ නැන්සිට නම් එසේ වූයේ නැත. හැම බදාදාවක මත්, සෙනසුරාදාවක මත් ඇයට විශේෂ දවසක් විය.

හැරින්ටන් බංගලාවට යාබද අසල්වැසි නිවසේ පොලියානාට සෙල්ලම් කරන්නට කුඩා ළමයින් සිටියේ නැත. බංගලාව පිහිටා තිබුණේද ගමෙන් තරමක් ඈතට වන්නටය. අහල පහළ තිබුණු නිවෙස්වලද පොලියානා ගේ වයසේ ගැහැනු ළමයින් හෝ පිරිමි ළමයින් සිටියේ නැත.

sinhalaebooks.com

''අනේ... මට ඒකට කමක් නෑ....'' යි ඇය නැන්සිට පැහැදිළි කළාය.

''මම මේ හැම තැනම ඇවිදලා, මිනිස්සු දිහා බලලා ගොඩක් විනෝද වෙනවානෙ. මං හරි ආසයි මිනිස්සුන්ව අඳුන ගන්න. ඔයා එහෙම නැද්ද නැන්සි...''

''හොඳයි... ඒත් හැමෝම නෙමේ...'' යි නැන්සි කීවාය.

හැම ප්‍රසන්න හැන්දෑවරුවකම වාගේ පොලියානා කිසියම් කාරියක් සඳහා තමන් එළිපහළියට යවන ලෙස ඉල්ලමින් බැගෑපත් වෙනු දකින්නට ලැබිණි. ඇයට ඒ ''මිනිසා'' නිතරම හමුවෙන්නට පටන් ගත්තේ එවැනි ගමන් බිමන්වලදීය. ඒ හැම දිනෙකම මහ මඟ

දී වෙන කොයිතරම් මිනිසුන් හමු වුවත් පොලියානා නිතරම ඔහු හැඳින්වූයේ ''මිනිහා'' කියාය.

ඒ මිනිසා හැමදාකම දිගු කළු කබායක් සහ උස සිල්ක් තොප්පියක් පැළඳ සිටියේය. ඒවා සාමාන්‍ය මිනිසුන් අඳින, පළඳින ඒවා නොවීය. ඔහුගේ මුහුණේ රැවුල හොඳින් කපා තිබූ අතර මුහුණ මලානික පැහැයෙන් යුතු වීය. තොප්පියට නොවැසුණු ඔහුගේ කොණ්ඩය අලුපාට බව දැකගත හැකි විය. ඔහු සෘජුව, ඉක්මනින් ඇවිද ගිය අතර හැම විටෙකම සිටියේ තනියෙනි. පොලියානාට ඔහු දුටු විට ඔහු සමග කතා කරන්නට සිත් විය.

''කොහොමද සර්... අද හොඳ දවසක් නේද?'' ඔහු ලංවෙන විටම වාගේ ඇය ප්‍රීතිමත් හඬකින් කීවාය. මිනිසා සැකයෙන් නැවතී ක්ෂණික බැල්මකින් අවට පිරික්සුවේය.

''ඔහේ මට කතා කළාද?'' ඔහු තියුණු ස්වරයකින් ඇසීය.

''ඔව් සර්...'' පොලියානා ප්‍රීතියෙන් ඉපිලී ගියාය. ''මං කිව්වේ අද හොඳ දවසක් නේද කියල....''

''ආ...ඔව්...හ්ම්...'' යි කී ඔහු නැවත ඉදිරියට ඇවිද ගියේය.

පොලියානාට සිනහ පහළ විය. ඔහු නම් ඇත්තටම විනෝදකාමී මිනිසෙකියි ඇය සිතුවාය.

ඊළඟ දවසේ ඇය නැවතත් ඔහුව දුටුවා ය.

''අද නං ඊයෙ වගේ හොඳ නෑ. ඒත් අද හරිම ලස්සන දවසක්...'' යි ඇය ප්‍රීතියෙන් හඬ ගෑවාය.

''ආ...හ්ම්....'' මිනිසා ඊයේ වාගේම හඬක් පිටකර යන්නට ගියේය. පොලියානා හොඳටම සිනාසුනාය. තුන්වැනි දවසේදීත් පෙරදා වාගේම ඔහු හමුවන විට ඔහු හදිසියෙන්ම නැවතුණේය.

''මේ බලනවා ළමයා... තමුන් කවුද? ඇයි මට හැමදාම කතා කරන්නෙ....''

''මගෙ නම පොලියානා විටියර්. මං හිතුවෙ ඔයා හරි පාලුවෙං ඉන්නෙ කියල. මට හරි සන්තෝසයි ඔයා මෙහෙම නැවතුණාට. දැං අපි අඳුනනවා නෙ. ඒත් මං තාම ඔයාගෙ නම දන්නෙ නෑ...''

''හොඳයි. ඔක්කොම....'' මිනිසා කියන්නට ගිය දෙය සම්පූර්ණ කළේ නැත. ඒ වෙනුවට ඔහු පැමිණියාටත් වඩා හයියෙන් ඇවිද යන්නට විය.

පොලියානා, බලාපොරොත්තු කඩවූ නමුත්, හැමවිටෙකම සිනාවක් දැල්වී තිබෙන මුහුණෙන් යුතුව ඔහු දෙස බලා උන්නාය. ''එයාට සමහර විට මං කියපු දේ තේරෙන්න නැතුව ඇති... ඒත් ඒක බාගෙට අඳුනා ගැනීමක්නෙ. මං තාමත් එයාගෙ නම දන්නෙ නෑ....'' යි ඇය තනිවම කියමින් ඉදිරියට ඇවිද ගියාය.

අද පොලියානා යන්නේ අසල්වැසියකු වූ ස්නෝ මහත්මියගේ නිවෙසටය. ඇය ස්නෝ මහත්මියට ජෙලි බඳුනක් රැගෙන යමින් සිටින්නීය. පොලී හැරින්ටන් මෙනෙවිය හැම සතියකටම වරක් ස්නෝ මහත්මියට යමක් යැවීම සිරිතක් කොට ගත්තාය. ස්නෝ මහත්මිය ලෙඩ ඇඳේ සිටි දුප්පත් ස්ත්‍රියක වූවා, පල්ලියේ යාවජීව සාමාජිකාවකද වූවාය. ඉතින් ඇය රැක බලා ගැනීම පල්ලියේ හැම සාමාජිකයකුගේම වගකීම විය. පොලී මෙනෙවිය ස්නෝ මහත්මිය වෙනුවෙන් ඇගේ රාජකාරිය ඉටු කරන්නට වෙන්කර ගත්තේ බ්‍රහස්පතින්දා හැන්දෑවරුවයි. එහෙත් ඇය වෙනුවෙන් ඒ කාරිය මෙතෙක් කල් ඉටු කරන ලද්දේ නැන්සි විසිනි. අද ඒ කාරිය ඉටු කිරීම සඳහා පොලියානා කැමැත්තෙන්ම ඉදිරිපත් වී සිටියාය. නැන්සිද පොලී මෙනෙවියගේ අණ පරිදි ඒ රාජකාරිය පොලියානා වෙත කැමැත්තෙන්ම බාර දුන්නාය.

''මට හරි සන්තෝසයි මට ඕකෙන් ගැලවෙන්න ලැබිච්ච එක ගැන...'' යි නැන්සි පොලියානාට රහසින් කීවාය. ''ඒක ඔයාට බාර

දෙන්න වුණු එක ගැන හිතට මොකද්ද වගේ උණත්... අනේ පැට්යො.. ඒක නං එහෙම තමා...''

''ඒත් නැන්සි මං ඒක කරන්න ආසයි නෙ....''

''හොඳයි.... ඔයා එක පාරක් කරල බලන්නකො. ආයෙ කවදාවත් ඒකට කැමති වෙන එකක් නෑ....'' නැන්සි අනාවැකි කීවාය.

''ඇයි ඒ...''

''ඔයා නෙමෙයි..... කවුරුත් එහෙම තමයි. එයා ඔච්චර අසරණ වුණේ නැත්නං මේ ලෝකෙ මිනිහෙක් එයා ළඟට යන එකක් නෑ. එයා නං හරිම වාතයක්. මට දුක, එයාව බලාගන්න එයාගේ දුව ගැන...''

''ඇයි ඔහොම කියන්නෙ නැන්සි....''

නැන්සි දෙවුර සෙලවුවාය.

''හොඳයි.... මේකයි. කොටින්ම කියනවා නම් ස්නෝ නෝනාට මේ ලෝකෙ වෙන කිසිම දෙයක් හොඳට පේන්නෙ නෑ. අඩු ගානෙ සතියෙ දවස් හතවත් එයාට හොඳ නෑ. එයා සඳුදාට කියනවා, අනේ අද ඉරිද උනා නං කොයිතරං හොඳද කියල. එයාට ජෙලි ගෙනිච්චොත් කියනවා, කුකුල් මස් තිබුණා නං හොඳයි කියල. කුකුල් මස් ගෙනිච්චොත් කියනවා එයා එළු මස් කන්න ආසාවෙං හිටියෙ කියල....''

''කොයි තරං හිනා යන චරිතයක්ද?'' පොලියානා කොක් හඬලමින් කීවාය. ''මං හිතන්නෙ මං එයාව දකින්න කැමතියි. එයා හරි පුදුම හිතෙන.... ඒ වගේම වෙනස් කෙනෙක් වෙන්නැති. මං වෙනස් විදියෙ අයට හරි කැමතියි....''

''හ්ම් හොඳයි. ස්නෝ නෝනගේ 'වෙනස' දෙයියන්ගෙ නාමෙට

හොඳ වෙන්න ඕන...." යි නැන්සි මුහුණ අඳුරු කර ගත්තාය.

පොලියානා මේ සියලු දේ මතක් කර ගනිමින් යන අතරේ කුඩා, පරණ නිවෙසක ගේට්ටුවක් ළඟ නැවතුණාය. ස්නෝ මහත්මිය නම් වූ 'වෙනස්' තැනැත්තිය දකින්නට ඇගේ දෑස් පුල පුලා බලා සිටී.

ඇය නිවසේ දොරට තට්ටු කළ විට සුදුමැලි, තෙහෙට්ටුවට පත් වූ පෙනුමක් ඇති ගැහැනු ළමයෙක් එළියට ආවාය.

"ආයුබෝවන් !"පොලියානා ආචාරශීලීව කීවාය.

"මං මිස් පොලී හැරින්ටන් ගෙ ගෙදරිං. මං ස්නෝ නෝනා මුණ ගැහෙන්න කැමතියි...."

"හොඳයි....ඒක එහෙම නං ඔයා වෙන්න ඇති එයාව දකින්න කැමතියි කිව්ව පළවෙනි එක්කෙනා...." ගැහැනු ළමයා මුනු මුනු ගෑවාය. එබැවින් පොලියානාට එය හරිහැටි ඇසුණේ නැත. ඊට පසු ගැහැනු ළමයා හැරී සාලාවක් දිගේ ඇවිද ගොස් දොරක් අසළ නතර වූවාය.

ස්නෝ මහත්මිය ලෙඩ ඇඳේ වැතිර උන් කාමරයට පැමිණි පසුව ඇය දොර වසා දැම්මාය. පොලියානාට එහි තිබූ අඳුරට දෑස් හුරුවීමට මද වේලාවක් ගත විය. ඊට පසුව ඇය ඇඳේ වාඩි වී උන් කාන්තාවකගේ රූපයක් යන්තමින් දුටුවාය. ඇය තරමක් ඉදිරියට ගියාය.

"කොහොමද මිසිස් ස්නෝ? මිස් පොලී ඔයා සනීපෙන් ඇති කියල හිතල මා අතේ ඔයාට, කන්න ජෙලි එකක් එව්ව..."

"මගෙ දෙයියනේ... ජෙලිද?" අසන්තෝෂයෙන් පිරුණු කෙඳිරිල්ලක් ඇසිණි. "ඒකට නං ස්තුතියි. ඒත් මං හිතා උන්නෙ අද එළු මස් සුප් එකක් ලැබෙනවා නං කියල...."

පොලියානා නළල රැලි කර ගත්තාය. ''ආ ! මං හිතුවෙ ඔයාට ජෙලි එකක් ගේනකොට ඕන වෙන්නෙ කුකුල් මස් කියල....''යි ඇය කීවාය.

''මොකක්?'' ස්නෝ මහත්මිය එක්වරම හැරෙමින් ඇසුවාය.

''නෑ.... මොකුත් නෑ....'' පොලියානා සමාව අයදින ස්වරයකින් කීවාය. ''ඇත්තටම ඒකෙ ඒ තරං වෙනසක් නෑ තමයි. ඒත් නැන්සි කිව්වෙ ඔයාට ජෙලි ගෙනාවොත් ඕන වෙන්නෙ කුකුල් මස් කියල. එළු මස් ඕන වෙන්නෙ කුකුල් මස් ගෙනාවොත් කියලත් කිව්ව. මං හිතන්නෙ ඒකෙ අනිත් පැත්ත වෙන්න ඇති. නැන්සිට අමතක වෙලා!''

ලෙඩ ඇඳේ උන් ගැහැනිය සිරුර ඉහළට අද්දවා කෙළින් වී ඉඳ ගත්තාය. මෙය සාමාන්‍යයෙන් ඇය කිසිදාක නොකරන්නකි. එහෙත් පොලියානා ඒ බව නොදත්තාය.

''හොඳයි.... නැහැදිච්ච ළමයො, ඔහේ කවුද?'' ඇය ඇසුවාය.

''ආ... මගෙ නම ඒක නෙමේ, මිසිස් ස්නෝ. ඒක එහෙම නොවුණ එක ගැන මං හරි සතුටුයි. ඒ මොකද ඒ නම 'හොෆිසිබා' කියන නමටත් වඩා කැතයි. මං පොලියානා විටියර්, මිස් පොලී හැරින්ටන් ගේ අක්කගේ දුව. මං දැන් එයත් එක්කයි ඉන්නෙ. මං උදෙන්ම ජෙලි එක අරන් ආවෙත් ඒකයි....''

පොලියානා ගේ කටින් පළමු වාක්‍යය පිටවෙන විට, ස්නෝ මහත්මිය වඩාත් ඕනෑ කමින් කෙළින් වූ අතර, ජෙලි බඳුන ගැන ඇසෙත්ම යළි කොට්ටය මතට වැටුණාය.

''බොහොම හොඳයි. ස්තුතියි. ඇත්තටම ඔයාගෙ පුංචි අම්මා බොහොම කරුණාවයි. ඒත් අද නං මට කෑමට පිරියක් නෑ. මට ඕන කරල තිබුණෙ එළු....'' ඇය එකවරම නැවතුණාය. ඊට පසු කතාව සම්පූර්ණයෙන්ම වෙනස් මගකට හැරවූවාය.

''මං ඊයෙ රෑ පොඩ්ඩක්වත් ඇහැ පියා ගත්තෙ නෑ.... පොඩ්ඩක්වත්....''

''අනේ දෙයියනේ... මමත් එහෙම හිටිය නං....'' පොලියානා සුසුම් ලමින් ජෙලි බඳුන කුඩා මේසය මත තබා ළඟම ඇති පුටුවේ හරි බරි ගැහුණාය.

''ඔයා නිදාගන්න විතරක් කොච්චර කාලෙ නාස්ති කරනවද? ඔයා එහෙම හිතන් නැද්ද?'

''නිදාගන්න එක කාලෙ නාස්ති කිරීමක්ද?'' ස්නෝ මහත්මිය පුදුමයෙන් කීවාය.

''ඔව්.... ඔයා දන්නවද? ඔයා කරන්නෙ 'ජීවත් වෙන' එක නං, රෑටත් 'ජීවත් වෙන්න' බැරි එක හරි අපරාධයක්...''

නැවත වතාවක් ස්නෝ මහත්මිය වඩා ඍජු ඉරියව්වකින් ඇඳේ ඉඳ ගත්තාය.

sinhalaebooks.com

''ඔයා නං පුදුම ළමයෙක් තමා...'' ඇය උස් හඬින් කීවාය. ''මේ , අන්න අර ජනේලෙ ළඟට ගිහිං ඒකෙ තිරේ පොඩ්ඩක් උස්සන්න පුළුවන්ද?'' ඇය ඉල්ලා සිටියාය. ''මං ආසයි ඔයා කොයි වගේද කියලා බලා ගන්න...''

පොලියානා උන් තැනින් නැගිට්ටාය. එහෙත් ඇය තරමක් දුක්බර විලාසයකින් සිනාසුනාය.

''අනේ... එතකොට ඔයා මගෙ මූණෙ තියෙන ලප දකියිනෙ...'' ඇය සුසුම් ලමින් ජනේලය වෙත ගියාය. ''මේ වගේ කාමරේ කරුවලට තියෙන එක ගැන මට සන්තෝසයි. මොකද එතකොට ඔයාට ඒවා පේන්න නැති නිසා. ඔන්න! දැං ඔයාට... අනේ...!'' ඇය හදිසියෙන්ම කියන්නට ගිය දේ නවතා ඇඳ දෙසට හැරුණාය. ''ඔයාට මාව බලාගන්න ඕන වුණ එකට මට සන්තෝසයි. ඒ

මොකද මට දැං ඔයාවත් පේන නිසා. කවුරුවත් කිව්වෙ නැත්තෙ ඔයා මෙච්චර ලස්සනයි කියල...''

''මම! ලස්සනයි....! ස්නෝ මහත්මිය අවඥාවෙන් කීවාය.

''ඇයි... ඔව්.... ඔයා ඒක දන්නෙ නැද්ද?'' පොලියානා කෑගැවාය.

''නෑ.. මම දන්නෙ නෑ...'' ස්නෝ මහත්මිය වියළි හඬකින් කීවාය. ඇගේ වයස දැන් අවුරුදු හතලිහකි. ඒ අවුරුදු හතලිහෙන් අවුරුදු පහළොවක්ම ඇය හැම දෙයක්ම වෙනස් වේවායි පතමින්, ජීවිතය විඳ ගැනීමට කාලයක් සොයමින් ඉතා කාර්යබහුල වී සිටියාය.

''අනේ... ඔයාට තියෙන්නෙ ලොකු, කළු පාට ඇස්. ඔයාගේ කොණ්ඩෙත් කළුයි - ඒවා කැරලි ගැහිලා...'' පොලියානා වර්ණනා කළාය.

''මං ආසයි කැරලි ගැහිච්ච කළු කොණ්ඩෙකට... (මං ස්වර්ගෙට ගියාම ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරන දේවල්වලින් එකක් තමයි ඒ....) අනිත් එක ඔයාගෙ කම්මුල් රෝස පාටයි. අනේ දෙවියනේ! ඔයා කොයිතරං ලස්සනද! මං හිතන්නෙ ඔයාට කණ්ණාඩියකින් බැලුවොත් නං ඒ බව පෙනෙයි....''

''කණ්ණාඩියකින්!'' කේන්තියෙන් හඬ ගෑ ස්නෝ මහත්මිය යළි කොට්ටය උඩට ඇද වැටුණාය.

''මං මේ දවස්වල කණ්ණාඩිය ඉස්සරහට ගිහිං පේන්තු වෙන්නෙ නෑ. ඔයත් මං වගේ ලෙඩ ඇඳට වැටුණ නං එහෙම කරන එකක් නෑ....''

''ඒක නං ඇත්ත තමා... මාත් එහෙම කරන එකක් නෑ....'' පොලියානා අනුකම්පා සහගතව ඊට එකඟ වූවාය.

''ඒත් පොඩ්ඩක් ඉන්න. මං ඔයාට පෙන්නන්නං....'' යි පැවසූ

ඇය මේසය ළඟට ගොස් කුඩා අත් කණ්ණාඩියක් ගත්තාය.

එය රැගෙන ඇඳ වෙත යන අතරේ ඇය මොහොතකට නැවතී ලෙඩ ඇඳේ උන් ස්නෝ මහත්මිය දෙස තියුණු බැල්මක් හෙලුවාය.

''සමහර විට, ඔයා කැමති නං, මේකෙන් මූණ බලන්න කලිං මං ඔයාගෙ කොණ්ඩෙ ටිකක් හැදුවට කමක් නෑ නේද?'' ඇය යෝජනා කළාය.

''ආ... ඔයා කැමති නං එහෙම කළාට කමක් නෑ....'' ස්නෝ මහත්මිය ඕනෑවට එපාවට මෙන් කීවාය. ''ඒත් කොණ්ඩෙ හැදුවට ඒක හිටින එකක් නෑ හොඳද?''

''අනේ... ස්තුතියි. මං කාගේ හරි කොණ්ඩෙ දාන්න හරි ආසයි....'' පොලියානා පරිස්සමට කණ්ණාඩිය තබා පනාවක් සොයන අතරේ කීවාය.

''මං අද ඒතරං හොඳට ඒක කරන එකක් නෑ. ඒත් මං ඉක්මනටම කොණ්ඩෙ පීරල පිළිවෙළකට බඳින්නං. එතකොට ඔයා කොයිතරං ලස්සනද කියල ඔයාටම බලාගත්තෑකි. ඒත් කවද හරි දවසක මං ඔයාට හොඳ කොණ්ඩ මෝස්තරයක් දාල පෙන්නන්නංකො....'' යි ඇය කීවේ ඇගේ ඇඟිලිවලින් සුමුදු ලෙස ස්නෝ මහත්මියගේ නළලට උඩින් වූ කෙහෙරැලි අල්ලා ගනිමිනි.

විනාඩි පහක් තිස්සේ පොලියානා කඩිසර ලෙස වැඩෙහි යෙදුණාය. ඇය කඩිසරව, දක්‍ෂ ලෙස හිස පීරා ගැට ගැසී තිබූ කොණ්ඩ කැරලි පුම්බා තැබුවාය. බෙල්ල දිගේ එල්ලී වැටෙන කෙහෙරැලි අල්ලා උඩට කොට බැන්දාය. වෙන එකක් තබා ස්නෝ මහත්මිය නිදා සිටි කොට්ටයද සොලවා පුම්බා තැබුවේ එහි හිස වඩා හොඳ ඉරියව්වකින් තබනු පිණිසය. මේ අතරේ මුල සිටම රවා ගත් මුහුණෙන් යුතුව, මුළු වැඩපිළිවෙල ගැනම අවලාද කියමින් සිටි ස්නෝ මහත්මිය ද අන්තිමේදී පුදුමයට පත් වෙමින් සිටියාය.

"ඔන්න!" පොලියානා හති ඇරියාය. ඇය හනික අසළ පෝච්චියක තිබූ පින්ක්* මලක් ගෙන ස්නෝ මහත්මියගේ කළු කොණ්ඩය වඩා හැඩ කරනු පිණිස එහි රැඳවූවාය.

"ඔන්න දැං අපි මූණ බලන්න ලෑස්තියි!" ඇය ජයග්‍රාහී ලීලාවෙන් කණ්ණාඩිය ස්නෝ මහත්මියගේ මුහුණට ළං කළාය.

"හ්ම්..." කණ්ණාඩියෙන් පෙනෙන තම රුව දෙස බලමින් ඇය නොමනාපයෙන් හඬ නැගුවාය. "මං ආසයි රතුපාට පින්ක් මල් වලට... රෝස පාට ඒවට වඩා. අනික මේක රෑ වෙනකොට පරවෙලා යයිනෙ. ඉතිං මොකද්ද වෙනස?"

"ඒත් ඔයා එහෙම වෙන එක ගැන සතුටු වෙන්නකො..." පොලියානා සිනාසුනාය. "එතකොට ඔයාට තව තව ඒවා ගහගන්න පුලුවං. මං හරි ආසයි ඔයාගෙ කොණ්ඩෙ ඔහොම පිම්බිලා තියෙන කොට." යි ඇය තෘප්තිමත් බැල්මකින් කතාව නිම කළාය." ඔයා එහෙම හිතන් නැද්ද?"

'හ්ම්' සමහර විට. ඒත් මේ කොණ්ඩෙ මේ විදිහට තියෙන එකක් නෑ. මේ කොට්ටෙ උඩ එහාට මෙහාට ඔලුව හරවන කොට."

"ඔව්... එහෙම තියෙන එකක් නං නෑ තමා.. ඒත් මං ඒකටත් කැමතියි." පොලියානා ප්‍රීතියෙන් ඔලුව වැනුවාය. "එතකොට මට පුලුවං ආයෙ පාරක් ඔය කොණ්ඩ මෝස්තරේ දාන්න. කොහොම උනත් ඔයාගෙ කොණ්ඩෙ කළු වෙච්ච එක ගැන ඔයා සන්තෝස වෙන්න ඕන. ඒ මොකද, මගෙ වගේ තඹ පාට කොණ්ඩයක් කොට්ටයක් උඩ තියෙනවාට වැඩිය කළු කොණ්ඩයක් කොට්ටයක් උඩ තියෙන කොට ලස්සනට පේනවා...."

"ඒක එහෙම වෙන්නැති. ඒත් මේ කළු කොණ්ඩෙ සුදුපාට වෙලා ඉදෙන කොට ඒක ඉක්මනටම පේන්න පටං ගනියි..." ස්නෝ

* එනම් සුවඳැති මල් වර්ගය

මහත්මිය එකට එක ම කීවාය. ඇය කතා කළේ නොසන්සුන් බවකින් නමුත් ඇය ඒ වන විටත් කණ්ණාඩිය අල්ලාගත් වනම සිටියාය.

''අනේ.... මං කළු කොණ්ඩෙකට කොච්චර කැමතිද? මගේ කොණ්ඩෙ කළු උනානං මං කොයි තරං සන්තෝස වෙයිද? යි පොලියානා සුසුම් ලෑවාය.

ස්නෝ මහත්මිය කණ්ණාඩිය පහත හෙලා නොරිස්සුම් සහගත බැල්මක් හෙලුවාය.

''හොඳයි... ඔයා මං උනා නං එහෙම වෙන එකක් නෑ. ඔයා කළු කොණ්ඩයක් ගැන තෙමෙයි... මේ ලෝකෙ කිසිම දෙයක් ගැන සන්තෝස වෙන එකක් නෑ. ඇඳක දවස තිස්සෙම වැතිරිලා ඉන්න උනොත්....''

පොලියානා නළල රැලි කළාය.

sinhalaebooks.com

''ඇයි? එතකොට ඒක කරන්න ගොඩක් අමාරු වෙයි නේද?'' ඇය යමක් හොඳට සිතා බලමින් කීවාය.

''මොනව කරන්නද?''

''සන්තෝස වෙන එක.''

''සන්තෝස වෙන්න!.... හැමදාම ලෙඩ ඇඳට වැටිල ඉන්නකොට?'' ස්නෝ මහත්මිය ඇසුවාය. ''කියන්න බලන්න ඒ ගැන සන්තෝස වෙන්න පුළුවං එක දෙයක්!''

පුදුමයකට මෙන් උන් තැනින් නැගී සිටි පොලියානා අත්පුඩි ගැසුවාය.

''අන්න හොඳයි. .. ඒක නං ටිකක් අමාරු වැඩක් එහෙම

නේද? මට දැං යන්න ඕනෙ. ඒත් මං මඟ දිගට හිතල හිතල ඊළඟ සැරේ ඔයාව බලන්න ආවම ඒක කියන්නං. අද මං ඔයා එක්ක හොඳට විනෝද උනා. ගුඩ් බායි. මං හිගිං එන්න...." ඇය දොර දෙසට යන අතරේ කීවාය.

"හොඳයි... මට නං හිතා ගන්න වත් බෑ එයා ඒ කිව්වෙ මොනවද කියල." ස්නෝ මහත්මිය පිටුපා හැරී යන පොලියානා දෙස බලමින් සිතුවාය. මුහුණ ඒ පැත්තටත් මේ පැත්තටත් හරවමින් ඇය කණ්ණාඩියෙන් ඇගේ පිළිඹිබුව දෙස සැලකිල්ලෙන් බැලුවාය.

"පොඩි දේකිං කොණ්ඩෙ හුරුබුහුටි කරල..." ඇය තමන්ටම කියා ගත්තාය. "මං දන්නෙ නෑ මෙහෙම ලස්සනද කියල. ඒත් ඒකෙං මොකක්ද මට ඇති පලේ..." ඇය නොසන්සුන් විලාසයෙන් කොට්ටය මත හිස ඒ මේ අත හැරවූවාය.

ටික වේලාවකට පසු මිලී, ස්නෝ මහත්මියගේ දියණිය, කාමරයට ආවාය. ඇය එන විටත් කණ්ණාඩිය ඇඳ ඇතිරිලි අස්සේ සැඟවී තිබිණි.

"ඇයි අම්මෙ.... මේ ජනෙල් තිර උස්සලා." මිලී කෑගැවාය. ඇය ජනේලය දෙසත්, අම්මාගේ කොණ්ඩයේ ගසා ඇති මල දෙසත් වරින්වර බැලුවාය.

"ඇයි මොකද්ද ඒකෙ වැරැද්ද?" ස්නෝ මහත්මිය කඩා පැන්නාය. "මං ලෙඩ ගානෙ හිටියත්, හැමදාම කරුවල කාමරේක ඉන්න පුළුවන්ද?"

"බෑ... ඇත්තටම බෑ..." මිලී හනික උත්තර දුන්නාය. ඇය ඒ අතරේ බෙහෙත් බෝතලය සොයන්නට වූවාය. "මං කිව්වෙ... ඔයා දන්නවනෙ මං කොයි තරං කාලෙක ඉඳලද ඔයාට කිය කිය හිටියෙ මේ කාමරේට ටිකක් එළිය වැටෙන්න දෙමු කියල. කෝ... ඔයා ඇහුවයැ." ඊට පිළිතුරක් ලැබුණේ නැත. ස්නෝ මහත්මිය ඇගේ නිදන ඇඳුමේ ලේස් පටය අත ගාමින් සිටියාය.

''මට හිතෙනවා... මට කවුරු හරි අලුත් නිදන ඇඳුමක් දෙනවා නං කියල... එළු මස් සුප් වෙනුවට, පොඩි වෙනසකටත් එක්ක...''

''ඇයි අම්මෙ...!''

මෙහිදී මිලී වික්ෂිප්ත වී කට අයා ගැනීම පුදුමයක් නොවේ. ඒ මොහොතේ ඇයට පිටුපසින් වූ අල්මාරියේ හොඳටම අලුත් නිදන ඇඳුම් දෙකක්ම තිබුණු අතර, ඒවා අඳින ලෙස ඇය මාස ගණනක සිටම තම මවගෙන් ඉල්ලමින් සිටියාය.

sinhalaebooks.com

# 9

# අමුතු මිනිසා ගැන තොරතුරු

ඊළඟට එළඹුණු වැසි දිනයක පොලියානා නැවත අර මිනිසා දුටුවාය. ඉතින් ඇය දීප්තිමත් සිනාවකින් ඔහුට සුභ පැතුවාය.

''අද දවස නම් එච්චර හරි නෑ නේද?'' ඇය ප්‍රීතිමත් හඬකින් කීවාය. ''හැම තිස්සෙම වහින්නේ නැත්නම් මං හරි කැමතියි....''

මිනිසා මේ වර වචනයක් වත් කටින් පිට නොකළ අතර අඩුම තරමින් හැරී බැලුවේ වත් නැත. පොලියානා සිතුවේ ඔහුට ඈ කී දෙය ඇසුණේ නැති බවය. ඊළඟ දවසේදී (එය සිදුවුණේ හරියටම ඊට පසු දිනයේදීය) ඒ නිසා ඇය තරමක් හඬ නඟා කතා කළාය. හොඳින් ඉර පායා ඇති, පිරිසිදු උදෑසන වාතය විඳගත හැකි එවැනි දවසක ඒ මිනිසා අත් දෙක පිටුපසට කරගෙන, බිම බලාගෙනම ඇවිද යාම පොලියානාට නම් පෙණුනේ විකාරයක් ලෙසය. මේ

දවසේදී පොලියානා අසළ නිවෙසකට පණිවිඩයක් ගෙනයමින් සිටියාය.

''කොහොමද...?'' පොලියානා ඇසුවාය. ''මට හරිම සන්තෝසයි. අදත් ඊයෙ වගේ නොවුණ එකට. ඔයා එහෙම හිතන් නැද්ද?''

මිනිසා හදිසියේ නැවතුණේය. ඔහුගේ මුහුණෙන් කේන්තියක් දිස්විණ.

''මේ බලනවා ළමයෝ. අපි අදම මේක බේරුමක් කරගනිමු.''යි ඔහු කතාව පටන් ගත්තේය.

''මට ඔය කාලගුණේ ගැන හිතනවට වඩා හිතන්න දේවල් තියෙනවා. මට ඉර පෑව්වත් එකයි... නැතත් එකයි...''

පොලියානාගේ සතුට ඉහවහා ගියේය.

''ඇත්තටම සර්, මමත් හිතුවේ ඔයා එහෙම දේවල් ගැන හිත්නෙ නෑ කියල තමා. ඒකනේ මං ඔයාට කිව්වේ...''

sinhalaebooks.com

''හා... හොඳයි.... ආ! මොකක්?'' ඔහු එක්වරම නැවතුණේය. පොලියානා කී දෙය ඔහුට වැටහුණේ ඊට පසුවය.

''මං කිව්වේ.... ඒක තමයි මං ඔයාගෙන් ඇහුවේ. එතකොට ඔයාට කාලගුණේ කොහොමද කියලා පෙනෙයිනේ. ඉර පායන එක ගැනත් ඔයා දකියි. මං හිතුවේ ඔයා ටිකක් නැවතිලා ඒ ගැන හිතුවොත් ඔයාට සතුටක් ලැබෙයි කියලා. ඔයා ඒ වගේ දේවල් හිතනවා කියලා, ඔයා දිහා බලපුවාම පොඩ්ඩක් වත් හිතෙන්නේ නෑ...''

''එහෙමද....? එහෙනං'' අසරණ බැල්මකින් බලා සිටි ඔහු හදිසියේම කීවේය. ඊට පසු නැවතත් ඔහු හැරී යන්නට ගිය අතර මොහොතකට පසු ආපිට හැරුණේය. ඔහු තවමත් රවාගත් වනමය.

"මේ බලනවා! ඇයි ඔය ළමය ගේම වයසේ කෙනෙක් හොයා ගන්නෙ නැත්තේ කතා කර කර ඉන්න...."

"එහෙම තමයි මාත් කැමති සර්. ඒත් අහළ පහළ එහෙම කවුරුවත් නෑනේ. ඒත් මං ඒක ගැන එච්චර හිතන්නෙ නෑ. මං හිතන්නේ මං ලොකු අයට කැමතියි. ළමයින්ටත් වඩා - අර කාන්තා සරණ සංගමේ කට්ටිය එක්ක ඉඳලම."

"හ්ම්..... 'කාන්තා සරණ'.... එහෙමද මාවත් ගණං අරගෙන ඉන්නේ..." මිනිසාගේ දෙතොල් අතරින් සිනාවක් පිටවෙන්නට ඔන්න මෙන්න කියා තිබිණි. එහෙත් මුහුණේ තිබූ රැවුම විසින් එය දෙතොල් අතරින් පිටවෙන්නට නොදී වළක්වනු ලැබුවේය.

පොලියානා ප්‍රීතියෙන් සිනා වෙන්නට වූවාය.

" අනේ නෑ සර්. ඔයා බින්දුවක් වත් ඒ වගේ නෙවෙයි... ඇත්තටම ඔයා ඒගොල්ලන්ටත් වැඩිය ගොඩක් හොඳයි..." ඇය හනික ආචාරශීලී වෙමින් කීවාය.

" මට හොඳටම විශ්වාසයි ඔයා පිටට පේනවටත් වඩා හොඳයි කියලා...."

මිනිසා උගුර යටින් හඬක් පිට කළේය.

"එහෙමද? එහෙනං...." ඔහු නැවත වතාවක් යමක් කියන්නට සැරසී ආපිට හැරී යන්නට ගියේය.

ඊළඟ දිනයේදී පොලියානා නැවතත් ඔහු දුටුවාය. මෙවර ඔහුගේ දෑස් පොලියානා වෙත යොමුවී පැවතුණු අතර ඔහුගේ මුහුණද වෙනදාට වඩා ප්‍රසන්න යැයි පොලියානා සිතුවාය.

"සුභ සැන්දෑවක්...." තරමක රළු හඬකින් ඔහු පොලියානාට සුභ පැතීය. "බාගදා මං දූන්මම කියන එක හොඳයි... අද හොඳට

පායපු දවසක් කියලා...."

"ඔයා ඒක මට කියන්න ඕන නෑ...." පොලියානා හිස සැලුවාය. "මං දැනගත්තා ඔයා දැකපු හැටියෙම ඔයා ඒ බව දන්නව කියලා...."

"හ්ම්." හඬක් පිට කළ මිනිසා යන්නට ගියේය. ඊට පසු හමුවන හැම දවසකම පාහේ ඔහු පොලියානා සමග කතා කළේය. බොහෝ විට පළමුවෙන් කතා කළේ ඔහුය. සාමාන්‍යයෙන් වැඩිපුර කතා නොකළ මුත් අඩුම තරමේ "සුබ සැන්දෑවක්" කියාවත් සුබ පතන්නට අමතක නොකළේය. එක දවසක් නැන්සි සමඟ ගමනක් යන්නට ගිය පොලියානාට ඔහු මුණ ගැසුණි. ඔහු පොලියානාට සුබ පතනු ඇසූ නැන්සි පුදුමයෙනුත් පුදුමයට පත්වූවාය.

"දෙයියෝ සාක්කි මිස් පොලියානා !"ඇය මුව අයා ගත්තාය. "ඒ මිනිහා ඔයා එක්ක කතා කරනවද?"

"ඇයි.... ඔව් එයා දැන් හැමදාම කතාකරනවා." යි පොලියානා සිනාසුනාය.

sinhalaebooks.com

"හැමදාම? දෙයියනේ ! ඔයා දන්නවද එයා කවුද කියලා?" නැන්සි ඇසුවාය.

නළල රැලි කරගත් පොලියානා ඔලුව දෙපසට වැනුවාය. "මං හිතන විදියට එයාට ඒක කියන්න අමතක වුණා. ඔයා දන්නවද? මම කවුද කියල නං මං කිව්ව. ඒත් එයා කිව්වෙ නෑනෙ...."

නැන්සිගේ දෑස් විසල් විය.

"එයා කාත් එක්කවත් කතා කරන්නෙ නෑ ළමයො. මං හිතන විදියට දැං අවුරුදු ගාණක ඉඳල.... එයාගෙ බිස්නස් වැඩකට කා එක්ක හරි වචනයක් දෙකක් කතා කළොත් ඇර. එයා තමා ජෝන් පෙන්ඩල්ටන් කියන්නෙ. පෙන්ඩල්ටන්වල තියෙන ලොකු ගේක එයා තනියම ජීවත් වෙන්නෙ. අඩු ගාණෙ ඒ ගෙදර උයන්නවත්

වැඩ කාරයෙක් තියාගෙන නෑ. ඒ හින්ද හෝටලේකට ඇවිත් දවසට තුන්පාරක්ම කෑම අරගෙන යනව. ඒ හෝටලේ වැඩ කරන වේටර් කෙනෙක් මං අඳුනනවා... සැලී මයිනර් කියල. එයා කියනවා හෝටලේට ඇවිත් කෑම ටික ඕඩර් කරන එකටවත් ඒ මිනිහා වචන දෙක තුනක් ඇරෙන්න කතා කරන්නෙ නැලු. ඉතිං වේටර්ල එයාට ඕන විදියෙ කෑම බීම මේසෙට ගෙනත් තියනවලු. එයා කන්නෙ ලාබම කෑම හින්ද, එයාට ඕන මොනවද කියල හිතා ගන්න පුළුවංලු.''

පොලියානා අනුකම්පාවෙන් හිස සැලුවාය.

''මං දන්නව කවුරු හරි ලාබ දේවල් හොයන්නෙ එයා දුප්පත් හින්ද. තාත්තයි මමයි ඔහොම කෑම අරගෙන තියෙනව. අපි හැමදාම කන්නෙ බෝංචියි, මාලු බෝලයි. ඒ දවස්වල අපි බෝංචි කන්න කැමති වෙච්ච එක ගැන සන්තෝස වෙන්න පුරුදු වෙලා හිටියා. අපිට එහෙම හිතන්න වුණා, බැදපු කළුකුං මස් වගේ ගණං කෑම ජාති ගැන හිතන කොට. පෙන්ඩල්ටන් මහත්තයා බෝංචි කන්න කැමතිද දන්නෙ නෑ....''

''කැමති ද? එයා කැමති උනත් නැතත් අපිට මොකෝ? එයා දුප්පත් නෑ මිස් පොලියානා. එයාට සල්ලි ගොඩක් තියෙනවා, එයාගේ තාත්තගෙන් උරුම වෙච්ච. මේ පළාතෙ කිසි කෙනෙක් එයා වගේ පෝසත් නෑ. එයා දන්නෙ නැතුවට එයාට ඕන නං සල්ලි කන්න උනත් පුළුවං....''

පොලියානා හිකි හිකි ගෑවාය.

''සල්ලි කන්න කටට දාගත්තම හපන්නෙ කොහොමද කියල නං දන්නෙ නැතුව ඇති....''

''මං කිව්වෙ එයා හොඳටම පෝසත් කියල.'' දෙවුර ගැස්සූ නැන්සි කීවාය. ''එයා සල්ලි වියදං කරන්නෙ නෑ. නිකං ගොඩ ගහනවා විතරයි....''

"මිථ්‍යාදෘෂ්ඨික කතා! " පොලියානා කීවාය. "ඒක කොච්චර හොඳද. ඒ ගැන ඔහොම හිතනකොට ඒක ආගමට විරුද්දයි. මට තාත්ත කියල තියෙනවනෙ..."

නැන්සිගේ මුව එක් වරම ඇරී ගියේය. එයින් ඇට ආ කේන්තිය පිටවන්නට ගිය නමුත්, පොලියානා ගේ ආගම් භක්තියෙන් පිරුණු මුහුණ දෙස බලන විට, එය පිටට ආවේ නැත.

"හ්ම්...." ඇය පොලියානාට විරුද්ධවීමට සිතුවේ නැත. ඊට පසු ඇය කිසිවක් සිදු නොවුණ ආකාරයට දිගටම කතාකර ගෙන යන්නට වූවාය."ඒත් එයා ඔයාට කතා කරන එක නං හරි පුදුමයි මිස් පොලියානා. එයා කාත් එක්කවත් කතා කරන්නෙ නෑ. මිනිස්සු කියන්නෙ ලස්සන ලොකු ගෙදරක එයා තනියෙන්මලු ඉන්නෙ. සමහරු කියන්නෙ නං එයාට ටිකක් පිස්සු කියල. තවත් සමහර අය නං කියනව එයා අල්මාරියෙ ඇටසැකිලි හංගාගෙන ඉන්න ජාතියෙ* මිනිහෙක් කියල...."

"අනේ නැන්සි...." පොලියානා දෙවුර ගැස්සුවාය. එයා ඒවගේ භයානක දෙයක් හංගාගෙන ඉන්නෙ ඇයි? විසි කරල දාන්නෙ නැතුව."

sinhalaebooks.com

නැන්සිට තනිවම සිනහ ගියේය. පොලියානාට ඈ කියූ පිරුල තේරී තිබුණේ නැත. එහෙත් එය කුමක්දැයි කියා දෙන්නට නැන්සි සිතුවේද නැත.

"හැමෝම කියන්නෙ එයා හරි අබිරහස් මිනිහෙක් කියල..." ඇය කියාගෙන ගියාය. එයා සමහර අවුරුදුවල පිට රට ගිහිං සති ගණං ඉන්නවලු. ඊජිප්තුව, ආසියාව, සහරා කාන්තාරෙ වගේ තැන්වලටලු යන්නෙ..."

"ආ! ධර්මදූත ගමනක්." පොලියානා හිස සැලුවාය.

---

*** *Skeleton in the Cupboard* - *හෙළි කළ නොහැකි රහසක් සඟවාගෙන සිටීම යන අරුත දෙන ඉංග්‍රීසි ප්‍රස්තාපිරුලක්.***

නැන්සි අමුතු විදියට සිනාසුණාය.

"හොඳයි... මං එහෙම කිව්වෙ නැතෙ මිස් පොලියානා. එයා ඒ මිත්‍යාදෘෂ්ඨික රටවල්වලට ගිහිං දැකපු දේවල් ගැන පොත් ලියනවා. හරිම අමුතු විකාර පොත්, එයාට මෙහෙ දේවල්වලට තමා සල්ලි වියදං කරන්න බැරි. අඩු ගානෙ ජීවත් වෙන්නවත්..."

"එහෙම කියන්න බෑනෙ.... එයා ඒවා ඉතුරු කරන්නෙ මිත්‍යාදෘෂ්ඨිකයො වෙනුවෙන් නං..." පොලියානා ස්ථිර ලෙස කීවාය. "ඒත් එයා හරි විනෝදයි, හරි වෙනස්... මිසිස් ස්නො වගේ ඇත්තටම එයා නං මට හරිම වෙනස් ජාතියෙ කෙනෙක්...."

"ඔව්... මං ඔයාටත් වැඩියෙං එහෙම හිතනවා...." නැන්සි කට හසාගෙන සිනාසුනාය.

"මං දැං කවදාවත් නැති තරං සන්තෝස වෙනවා... එයා මට කතා කරපු එක ගැන...." පොලියානා සුසුමක් හෙලමින් කීවාය.

# 10

# ස්නෝ මහත්මියට පුදුමයක්

ඊළඟ දවසේ පොලියානා ස්නෝ මහත්මිය හමුවෙන්නට ගියවිට, ඇය පෙර පරිදිම අර අඳුරු කාමරයට වී උන්නාය.

sinhalaebooks.com

''මිස් පොලී ගෙ ගෙදරිං අර ගෑනු ළමයා ඇවිත් අම්මෙ....'' තෙහෙට්ටුවට පත්ව සිටි මිලී හඬගෑවාය. ඊළඟට පොලියානා ස්නෝ මහත්මිය සමඟ කාමරයේ තනිවූවාය.

''ආ! ඒ ඔයාද?'' ඇඳ දෙසින් ශෝකී ස්වරයක් නැගිණි. ''මට ඔයාව මතකයි. ඔයාව අමතක වෙන්නෙ නෑ කාටවත්, එක සැරයක් දැක්කා නං. ඔයා ඊයෙ ආවා නං හොඳයි. මට ඔයාව මුණ ගැහෙන්න ඕන වෙලා තිබුණෙ ඊයෙ....''

''ඇත්තද? මට සතුටුයි තාම ඊයෙ පහුවෙලා ගොඩක් වෙලා

ගිහින් නැති හින්ද....'' යි පොලියානා සිනාසුණාය. ඇයි ප්‍රීතියෙන් කාමරය තුළට ඇතුලු වී එහි තිබූ පුටුවක් මත ගෙනා කූඩය තැබුවාය.

''මගෙ අම්මේ... මෙතන කරුවලයිනෙ. මට ඔයාව පොඩ්ඩක්වත් පේන්නෙ නෑ...'' යි කී ඇය හනික ජනේලය ළඟට ගොස් එය ඇර දැමුවාය.

''මට බලන්න ඕන ඔයා මං එදා දාපු විදියට කොණ්ඩෙ තියාගෙන ඉන්නවද කියල. අයියෝ.... නෑනෙ. කමක් නෑ. මට සතුටුයි ඔයා එහෙම නොකර ඉන්න එක ගැන. මට එතකොට ආයම සැරයක් ඔයාගෙ කොණ්ඩෙ දාන්න පුළුවන්නෙ. මං ඒක පස්සෙ කරන්නං. ඒත් දැන් මං පෙන්නන්නංකො මං ඔයාට ගෙනාවෙ මොනවද කියල....''

ස්නෝ මහත්මිය කැළඹීමෙන් යුතුව ඇඳේ හිඳගෙන ''හරියට පෙනුම හොඳ නං කෑමෙ රහත් වැඩි වෙයි වගේ නෙ ඔයා කියන්නෙ...'' යි සමච්චලයෙන් කීවාය.

''හොඳයි මොනවද ඕකෙ තියෙන්නෙ....''

''ටිකක් හිතන්න බැරිද? මොනවද ඔයාට ඕන....''යි කී පොලියානාගේ මුහුණ ආලෝකමත් විය.

''මට කිසි දෙයක් ඕන නෑ, මං දන්න විදියට....'' ස්නෝ මහත්මිය සුසුම් ලෑවාය. ''අන්තිමට බැලුවම ඔය ඔක්කොගෙම රස එකම විදියයි....''

''නෑ.... ටිකක් හිතන්න බලන්න. ඔයාට මොනව හරි ඕන වුණා නං, ඒ මොනවද?''

ස්නෝ මහත්මිය තරමක් පසුබාන බව පෙනුණි. ඇත්තටම ඒ කුමක්දැයි ඇය දැන සිටියේ නැත. ඇය මෙතෙක් කල් හුරු වී සිටියේ

තමන්ට නැති දේ ගැන උවමනාවක් ඇති කර ගන්නටය. ඒ නිසා ඇයට යමක් ලැබෙන තුරු ඇයට උවමනා වී තිබුණේ කුමක්ද යන වග තේරුම් ගැනීම අපහසු විය. ඒත් දැන් පැහැදිලිවම ඇය යමක් කිව යුතුය. මේ අමුතු, පුදුමාකාර ගෑනු ළමයා එය බලාපොරොත්තුවෙන් සිටින්නීය.

''හොඳයි... ඇත්තටම එලු මස් සුප් තිබුණා නං...''

''මං ඒක ගෙනාවා...'' පොලියානා කෑගැවාය.

''ඒත් ඇත්තටම, මට ඒක ඕන වෙලා තිබුණෙ නෑ.'' අන්තිමේදී තමන්ට වුවමනා වී තිබුණේ කුමක්දැයි තේරුම් ගත් ලෙඩ ගැහැනිය කීවාය. ''මට ඕන වුණේ කුකුල් මස්....''

''ආ! මං ඒකත් ගෙනාවා.'' පොලියානා අතින් කට වසාගෙන සිනාසෙන්නට වූවාය.

sinhalaebooks.com

ස්නෝ මහත්මිය පුදුමයෙන් ඇය දෙස බලා ''දෙකම ගෙනාවද?''යි ඇසුවාය.

''ඔව්... තව ජෙලි එකකුත් ගෙනාව.'' පොලියානා ජයග්‍රාහී ලීලාවෙන් කීවාය.

''මං ඔයාට ඕන කරන දේවල් එක සැරෙන්ම ගෙනාවා. නැන්සියි, මමයි තමයි ලැහැස්ති කළේ. හැම එකකින්ම තියෙන්නෙ පොඩ්ඩ පොඩ්ඩ. ඒත් හැම ජාතියක්ම ඔතන තියෙනවනේ. මට හරි සතුටුයි ඔයාට කුකුල් මස් ඕන වුණු එකට....'' ඇය කූඩයෙන් එළියට ගත් දීසි තුනම අරිමින් කීවාය.

''ඒ මොකද දන්නවද.... මං මේ මග දිගට හිත හිත ආවෙ, ඔයා මං ළඟ නැති මොනව හරි ඕන කියයි කියල. මම මෙච්චර හරියක් කරලත්, ඔයා ඒවගේ දෙයක් කීව නං කොච්චර ලැජ්ජාවක්ද මට....''

ඇය කොක් හඬලා සිනාසුනාය. ඊට පිළිතුරක් ලැබුණේ නැත. ස්නෝ මහත්මිය, හිතෙන්; අමතක වූ යමක් මතකයට නගන්නට උත්සාහ කරන්නාක් මෙන් පෙනුණි.

"ඔන්න ! මං මේවා ඔක්කොම තියල යනව...." පොලියානා කීවාය. ඇය මේසය මත ගෙනා දීසි තුනම පිළිවෙළට තැබුවාය. "ඔයාට හෙට එළු මස් සුප් ඕන උනොත් ඔන්න ඒකත් තියෙනවා. කොහොම ද ඔයාට අද?" යි ඇය ආචාරශීලීව විමසුවාය.

"හොඳටම හරි නෑ... ස්තුතියි...." ස්නෝ මහත්මිය මුනු මුනු ගෑවාය. ඇය නැවතත් ඇගේ සුපුරුදු අසහනකාරී ඉරියව්වෙන් පසු වූවාය. "මට අද උදේ චුට්ටක්වත් ඇහැ පියව ගන්න බැරි උනා. අල්ලපු ගෙදර නෙලී හිගින්ස් එයාගෙ සංගීත පාඩම පටන් ගත්ත. මුළු උදේ වරුවෙම, එක මිනිත්තුවක් වත් නැර ඒ ළමයා පියානෝ ගැහුවා... දෙයියනේ මොන තරං කරච්චලයක්ද? අනේ මන්ද මට නං තේරෙන්නෙ නෑ මොනව කරන්නද කියල...."

පොලියානා ශෝකයෙන් හිස සැලුවාය.

"මං දන්නවා. ඒක නං කරච්චලයක් තමා. ඉස්සර කාන්තා සරණ සංගමේ, මිසිස් වයිට්ටත් ඔහොම උණා. එයාට ඒ දවස්වල රූමටික් උණත් තිබුණා. ඉතිං එයාට පොඩ්ඩක්වත් ඇඟ හොලවන්න බැරිව තිබුණෙ. එයා නං ඒ දවස්වල කිව්වෙ එහෙම කරන්න පුලුවන් උනා නං හොඳයි කියල. ඇත්තටම ඔයාටත් එහෙම කරන්න බැරිද?"

"මොකක්ද? මට තේරුණේ නෑ....."

"ඇඟ හොලවන්න. ඒ කියන්නෙ මියුසික් අහගෙන ඉන්න බැරිවෙන කොට ඒක ඇහෙන්නෙ නැති විදියට, වෙන ඉරියව්වකින් ඉන්න...."

ස්නෝ මහත්මිය මොහොතක් බලා සිටියාය.

''ඇයි? ඇත්තටම මට ඇඳේ ඕන පැත්තකට හැරෙන්න පුලුවන්නෙ.'' ඇය මදක් තුරුස්නා ස්වරයෙන් කීවාය.

''ඉතිං.... ඔයාට ඒක ගැන සතුටු වෙන්න පුලුවන්නෙ....'' පොලියානා හිස සලමින් කීවාය. ''මිසිස් වයිට්ට නං එහෙම කරන්න බැරි වුණා. රූමටික් උණ හැදුණාම හෙලවෙන්නවත් බැනෙ. එයාගෙ නංගිගෙ සංගීත පාඩං එයාට මහා කරච්චලයක් වුණා. ඒ නංගි බීරි කෙනෙක් නොවෙන්න, එයාට පිස්සු හැදෙන්න තරං ඒකට කේන්ති යයි කියල මිසිස් වයිට් ඒ දවස්වල කිව්වා....''

''එයාගෙ නංගි... මොකක් කියලද කීවෙ....''

පොලියානා සිනහසුනාය.

''හොඳයි.... මං ඔයාට ඒ කිසිම දෙයක් ගැන කිව්වෙ නෑනෙ. මට අමතක වුණා ඔයා මිසිස් වයිට් ගැන මුකුත්ම දන්නෙ නෑ කියල. මිසිස් වයිට් ගෙ මහත්තයාගෙ නංගිගෙ කන් කොහොමටවත් ඇහෙන්නෙ නෑ. එයා මිසිස් වයිට්ට උදව්වට එයාලගෙ ගෙදර නැවතිලා හිටිය. එයාට මොනව හරි තේරුං කරල දෙන්න අනික් අයට ගොඩක් මහන්සි වෙන්න උනා. ඉතිං, නංගි පියානෝ එක ගහන්න පටන් ගන්න කොට, ඒක කොයිතරං කරච්චලයක් උනත් මිසිස් වයිට් ඒක ගැන සන්තෝස වෙන්න පුරුදු වෙලා හිටිය. ඒ මොකද, එතකොට එයාට හිතෙනවලු එයාටත් කන් ඇහෙන්නෙ නැතුව හිටිය නං, එයා කොයි තරං දුක්වෙයිද කියල. ඔයා දන්නවද මිසිස් වයිට් ඒ සෙල්ලමත් කළානෙ.... මමයි ඒක එයාට කියලා දුන්නේ....''

''සෙල්ලම?''

පොලියානා අත්පුඩියක් ගැසුවාය.

''ඔන්න! ඔන්න මං ඒක ඔයාට කියන්න හිතාගෙන හිටියට අමතක වුණානෙ. ඒ මොකද්ද දන්නවද? ඔයාට සන්තෝස වෙන්න

පුළුවං දේ...."

"සන්තෝස වෙන්න... ඔයා මොනවද මේ කියන්නෙ?"

"ඇයි මං ඔයාට එදා කිව්වෙ - මම අද එනකොට එහෙම එකක් හිතාගෙන එන්නම් කියල. ඇයි මතක නැද්ද? ඔයා මට එදා කිව්වෙ මේ වගේ ඇඳක දවස තිස්සෙම වැතිරිලා ඉන්න වෙනකොට, ඒ ගැන සතුටු වෙන්න පුළුවං යමක් තියෙනවා නං කියන්න කියල....."

"ආ! ස්නෝ මහත්මිය අවඥාවෙන් කීවාය. "ඒකද?... ඔව් මට මතකයි නේන්නං. ඒත් ඔයා මට වැඩිය අවංක වෙයි කියල මං හිතන්නෙ නෑ...."

"අනේ... එහෙම හිතන්න එපා!" පොලියානා උද්‍යෝගිමත් ලෙස හිස සැලුවාය. "මං ඒක හොයාගත්ත. ඒත් එහෙම හිතන එක නං ටිකක් අමාරුයි. ඒක අමාරු වෙන තරමට විනෝදෙත් වැඩී. මං ඒකෙ වගකීම බාර ගන්නං. මුලදී නං මට කිසි දෙයක් හිතා ගන්න බැරි උනා. අන්තිමේදී මට ඒක කල්පනා උනා...."

"ඔය කියන්නෙ ඇත්තටමද? එහෙනං ඒක කියන්න..." ස්නෝ මහත්මිය පුළුවන් තරම් ආචාරශීලී වීමට තැත් කළාය. එහෙත් ඇ කතා කළේ උපහාසයෙනි. පොලියානා දිගු හුස්මක් ගත්තාය.

"මං හිතුව... ඔයාට කොයිතරං සන්තෝස වෙන්න පුළුවන්ද... මේ වගේ ලෙඩ ඇඳේ ඉන්න අනික් මිනිසුන්ට වඩා...." ඇය හැඟීම් බරව කියන්නට වූවාය.

ස්නෝ මහත්මිය දෑස අයාගෙන සිටියාය. ඇගේ දෑස් කෝපයෙන් දූවෙමින් තිබිණි.

"එහෙමද? ඇත්තටම!" ඇගේ කඩ හඬේ තිබුණේ එකඟතාවය පළ කරන ස්වරයක් නොවේ.

''මං දැං කියන්නං සෙල්ලම ගැන....'' දැඩි විශ්වාසයෙන් යුතුව පොලියානා යෝජනා කළාය.

''ඒක කොච්චර අමාරු උනත්, ඒක කරන එක හරිම විනෝද දෙයක්. අමාරුව වැඩි වෙන්න වැඩිවෙන්න විනෝදෙත් වැඩි වෙනවා. ඔන්න බලන්න. ඒක මේ වගේ...''

ඊට පසුව ඇය මිෂනරි තෑගි පෙට්ටි ගැනත්, කිහිලිකරු ගැනත්, බලාපොරොත්තු වූ පරිදි බෝනික්කා නොලැබීම ගැනත් කීවාය.

කතන්දරය ඉවර වෙන විටම වාගේ මිලී දොර අසල පෙනී සිටියාය.

''මිස් පොලියානා.... ඔයාගෙ ආන්ටි ඔයාට එන්න කිව්ව.'' ඇය දුබල හඬකින් කීවාය. ''එයා මේ ළඟ ගෙදරකට ටෙලිෆෝන් කරල කිව්වලු. කලුවර වැටෙන්න කලින් සංගීතෙ පුරුදු වෙන්න තියෙන නිසා ඉක්මනට එන්න කියල...''

sinhalaebooks.com

පොලියානා තරමක් අදිමදි කරමින් උනත් තැනින් නැගී සිටියාය.

''හොඳයි....'' ඇය සුසුම් ලෑවාය. ''මට ඉක්මනට යන්න ඕන...'' හදිසියේම ඇය සිනහ වෙන්නට පටන් ගත්තාය.

''මං හිතන්නෙ මම ඇවිදගෙන යන්න කකුල් දෙකක් තියෙන එක ගැන සන්තෝස වෙන්නම ඕන... නේද මිසිස් ස්නෝ?''

ඊට පිළිතුරක් ලැබුණේ නැත. ස්නෝ මහත්මියගේ දෑස් වැසී තිබුණි. එහෙත් පුදුමයෙන් දෑස් විසල් කරගෙන උන් මිලීට, ඇගේ දෙකම්මුල් දිගේ කඳුලු ගලමින් තිබූ බව දැක ගත හැකි විය.

''ආයුබෝවන්....'' පොලියානා දොර අසළට විත් ඇගේ දෙවුර අසලින් ඉගිල්ලී ගියාය.

"මට හොඳටම දුකයි, ඔයාගෙ කොණ්ඩෙ දාන්න බැරිවුණ එකට. මං ඊළඟ දවසෙ ඇවිත් ඒක කරන්නං."

දවසින් දවස ජූලි මාසයේ දවස් පසු වී ගියේය. පොලියානාට නම් ඇත්තටම ඒවා ප්‍රීතිමත් දවස් වූයේය. ඇය නිතරම පාහේ ඇගේ පුංචි අම්මට ඈ කොතරම් සතුටට පත්ව සිටියාද යන්න කීවාය. ඒ හැම විටකම පාහේ පුංචි අම්මාද විඩාබර හඬකින් මෙසේ කීවාය.

"බොහොම හොඳයි පොලියානා.... එහෙම නං මම ඒ ගැන සන්තෝස වෙනව. ඒ වගේම මං හිතනව පහුගිය දවස් ඔයාට ගොඩක් ප්‍රයෝජනවත් විදියට ගෙවිල ගියා කියලත්. එහෙම නැත්නං මං මගේ රාජකාරිය හරියට කළේ නැති වෙනව."

සාමාන්‍යයෙන් මෙසේ කී විට, පොලී මෙනෙවිය ඉතා තදින් අකමැති පුරුද්දක් වූ, වැළඳගෙන හාදුවක් දීම පොලියානාගේ සිරිතක් විය. ඒත් එක් දවසක එසේ නොකර ඇය කතා කළාය. එය මැහුම් උගත් වේලාවක් විය.

"ඔයා කියන්නෙ පහුගිය දවස් හරි විනොදෙං ගෙවිල ගිය එක විතරක් මදි කියලද පුංචි අම්මෙ...?

පොලියානා දුක්බර ලෙස ඇසුවාය.

"අන්න ඒක තමයි මං කිව්වෙ පොලියානා...."

"ඒවා ප්‍රයෝ...ජ...න...වත් වෙන්න ඕනද?"

"ඇත්තෙන්ම...."

"මොකද්ද ප්‍රයෝජනවත් කියන්නෙ.."

"ඇයි? ඒ කියන්නෙ..... ඒ කියන්නෙ ප්‍රයෝජනවත් කියන

එකට. නැත්නම් ප්‍රයෝජනවත් යමක් ලැබෙන එකට. ඔයාට පුළුවන් වෙන්න ඕන ඒ වගේ යමක් ඒ දවසෙත් ලැබුණා කියන්න. අනේ ඇත්තට... ඔයා නං පුදුමාකාර ළමයෙක් තමා!''

''එහෙනං... සතුටු වෙන එක ප්‍රයෝජනවත් යමක් නෙමෙයිද?''

''ඇත්තටම නෑ...''

''අනේ... ඒ කියන්නෙ ඔයා ඒකට කැමති නෑ. මට හිතෙන්නෙ ඔයා කවදාවත් ඒ සෙල්ලම කරන එකක් නෑ පුංචි අම්මෙ....''

''සෙල්ලම? මොන සෙල්ලමද?''

''ඇයි... මට තාත්ත...'' පොලියානා අතින් කට වසා ගත්තාය. ''න්...නෑ.... මොකුත් නෑ....'' ඇය ගොත ගැසුවාය.

පොලී මෙනෙවිය රවා බැලුවාය.

''අදට මෙච්චරක් ඇති පොලියානා...'' යි නැගී සිටි ඇය මැහුම් පාඩම අවසාන කළාය.

sinhalaebooks.com

එදා හැන්දෑවේදී අට්ටාලයේ සිට පහත මාලයට බසිමින් සිටි පොලියානාට තරප්පු පෙළ දිගේ උඩට නගින පොලී මෙනෙවිය හමුවිය.

''අනේ පුංචි අම්මේ.... කොයි තරං හොඳද....'' යි ඇය කෑගෑවාය. ''ඔයා මාව බලන්න උඩට ඇවිත්! එන්න එන්න. මං හරි කැමතියි ටිකක් කතා කර කර ඉන්න....'' යි කී ඇය නැවත උඩට නැග අට්ටාලයේ කාමරයේ දොර හැරියාය.

ඇත්තටම පොලී මෙනෙවිය අට්ටාලය උඩට නැංගේ පොලියානා හමුවීමට සිතා ගෙන නොවේ. ඇයට උවමනා වී තිබුණේ අට්ටාලයේ ලී පෙට්ටගමක දමා තිබූ සුදු වූල් සාලුවක් සොයා

ගැනීමටය. එහෙත් පුදුමයකට මෙන් ඇගේ දෙපා ඇදී ගියේ මහ අට්ටාලයේ තිබූ පෙට්ටගම දෙසට නොව, පොලියානා ගේ කුඩා කාමර වෙතය. එහි තිබූ ඇඳි පුටුවක ඉඳගත් ඇයට පොලියානා ආ දවසේ පටන් ගෙවී ගිය වාර බොහෝ ගණනකදී මෙන් ඇයත් සිතූ දෙයට වඩා හාත්පසින්ම වෙනස්, පුදුම දේ කරමින් සිටින බව පසක් විය.

''මං ඔයත් එක්ක ඉන්න ආසයි....'' යි නැවත වතාවක් කී පොලියානා, කාමරය වටේ කැරකුණේ හරියටම රජ මාලිගාවක් ඇට ලැබුණු විටෙක මෙනි. ''මට මේ කාමරේ ලැබුණු දවසෙ ඉඳන්.... මේ හැම දෙයක්ම මගෙ. ඔයා දන්නවද මට ඉස්සර කාමරයක් තිබුණට ඒක කුළී කාමරයක්. කුළී කාමරයක් කවදාවත් තමංගෙම එකක් වගේ බාගයක් වත් හොඳ වෙන්නෙ නෑ. ඇත්තටම මට දැං මේ කාමරේ අයිතියි. එහෙම නේද?

''ඔ...ඔව් පොලියානා...'' පොලී මෙනෙවිය ගොත ගැසුවාය. ඇය ඒ වන විට සිතමින් සිටියේ මෙතැනින් නැගී සිට අර සාලුව සොයන්නට යාමට තමන්ට සිත් නොදෙන්නේ ඇයිද කියායි.

''ඇත්තටම මං දැන් මේ කාමරේට ආසයි. මට ඕන වෙලා තිබුණ විදිහයට කාපට්වත්, ජනෙල් තිරවත්, පින්තූරවත් නැති උනාට, '' දුක්බර ලෙස මුහුණ රතු කරගනිමින් පොලියානා මදකට නැවතුණාය. ඒ මොහොතේ ඇය කියමින් සිටි දෙයට වඩා හාත්පසින්ම වෙනස් දෙයක් කියන්නට ගිය අතර, එය පොලී මෙනෙවියගේ බාධා කිරීම නිසා කටින් පිට වුණේ නැත.

''ඇයි පොලියානා... මොකද?''

''මූ.. මුකුත් නෑ පුංචි අම්මෙ... ඇත්තටම මං ඒක කියන්න හිතුවෙ නෑ...''

''එහෙනං කියන්න එපා...'' යි හැඟීම් විරහිතව කියූ පොලී මෙනෙවිය ''ඒත් ඔයා මොකද්දෝ කියන්න හැදුවා. ඉතිං අපි ඒ

කතාවෙ ඉතුරු ටිකත් අහමු...'' යි කීවාය.

''ඒ වැඩි දෙයක් නෙමේ. මං හිතාගෙන හිටියේ ලස්සන කාපට්, ලේස් තිර රෙදි දාපු කාමරයක් මට ලැබෙයි කියල. ඒත් ඇත්තටම....''

''ඔයා හිතාගෙන හිටිය?'' පොලී මෙනෙවිය තියුණු හඬින් අසමින් බාධා කළාය.

පොලියානා වඩාත් දුක්බර ලෙස මුහුණ රතු කර ගත්තාය.

''මට එහෙම කරන්න වටින්නෙ නෑ පුංචි අම්මෙ....'' ඇය සමාව ඉල්ලා සිටියාය.

''මං හිතන්නෙ මට ඒවා කවදාවත් ලැබිල තිබුණෙ නැති හින්ද, ලබා ගන්න ඕන වෙන්න ඇති. අපිට තිබුණෙ කඩමලු වෙච්ච කාපට් දෙකක්. එකක තීන්ත පැල්ලං. අනික් එක හිල්වෙලා. ගෙදරටම තිබුණෙ පින්තූර දෙකයි. එකක් තාත්.... මං කියන්න ගියෙ හොඳ එක අපි විකුණුවා කියල. ඉතිං ඒ දේවල් එහෙම උනේ නැත්නං, මං කවදාවත් අර වගේ දේවල් බලාපොරොත්තු වෙන එකක් නෑ. මෙහෙට එන දවසෙ මං හිතුවෙ ඒවා හම්බ වෙනව නං කොයිතරං හොඳද කියල. ඒත්.... මේ ඇත්තමයි පුංචි අම්මෙ, මෙහාට ඇවිත් ටික වේලාවක් ගියාට පස්සෙ මං මේ කාමරේට කණ්ණාඩියක් නැති එක ගැන සන්තෝස වෙන්න පටන් ගත්ත. මොකද එතකොට මගෙ මූණෙ ලප පේන්නෙ නැති හින්ද. පින්තූර නැති අඩුව මට දැනුණෙ නෑ. ජනේලෙන් එහා පැත්තෙ පින්තූරයක් වගේ ලස්සන නිසා. ඔයා මට ගොඩක් හොඳට සැළකුවා...''

මෙහිදී පොලී මෙනෙවිය එක්වරම පුටුවෙන් නැංගාය. ඇගේ මුහුණ හොඳටම රතුවී තිබුණි.

''ඔය ඇති පොලියානා....'' ඇය තදින්ම කීවාය.

''ඔය කිව්වා හොඳටම ඇති... මට විස්වාසයි....''

ඊළඟ මොහොතේ ඇය පහත මාලයට බැස යන හඬ ඇසිණි. අට්ටාලයට නැංගේ සුදු පාට වූල් සාලුවක් සොයන්නට බව මතක් වන විට ඇය සිටියේ පහත මාලයේය.

මේ සිදුවීමෙන් පැය විසි හතරක් ඉකුත් වෙන්නට පෙර පොලී මෙනෙවිය නැන්සිට හඬ ගෑවාය.

''නැන්සි.... ඔයා උදෙන්ම පොලියානාගෙ බඩු ටික පාත තට්ටුවෙ අට්ටාලෙ කාමරේට හරියටම පාතින් තියන කාමරේකට ගේන්න ඕන. මට හිතෙනවා, මගේ ලේලිට මේ තට්ටුවෙ කාමරයක් දෙන්න ඕන කියල...''

''හා මැඩම්...'' නැන්සි හයියෙන්ම කීවාය.

''අනේ... කොච්චර හොඳද....'' ඊට පසු ඇය රහසින් කියා ගත්තාය.

මොහොතකට පසු ඇය ප්‍රීතිමත් හඬකින් පොලියානාට කතා කළාය.

''මේක අහන්නකො මිස් පොලියානා, ඔයා අද ඉඳන් පහත තට්ටුවේ කාමරේක නිදා ගන්නයි යන්නෙ....''

පොලියානා සුදුමැලි වූවාය.

''ඔයා ඔය ඇත්තටම... ඇත්තටම නෙමෙයි නේද කියන්නෙ නැන්සි...''

''ඔයා ඒක ඇත්තම කියලා හිතුවොත් හොඳයි.'' නැන්සි උදම් වෙමින් දෑනුම් දුන්නාය. ඇය ඇඳුම් රාක්කයේ තිබූ ඇඳුම් ගොන්නක් ඔසවා ගෙන සිටි පොලියානා දෙස බලා හිස සැලුවාය. ''මම මේ ආවෙ පාත තට්ටුවට ඔයාගෙ බඩු ගෙනියන්න. එයා කිව්වා එහෙම කරන්න කියල. දැං ඔන්න එයා ලැස්ති වෙලා එයාගෙ හිත වෙනස්

කරනගන්න.

පොලියානා නැත්සි කියමින් සිටි වාක්‍යයේ අවසානය අසන්නට සිටියේ නැත. ඇය පහතට පෙරළී යාමේ අවදානමද නොසලකා හරිමින් අඩියට දෙකට තරප්පු පෙළ දිගේ පහත මාලයට ඉගිල්ලී ගියාය.

ඇගේ ගමනේ වේගය කොතරම් ද යත්, අතර මග දොරවල් දෙකක් දඩාං ගා වැසී ගිය අතර පුටුවක්ද පෙරළී ගියේය. කඩාගෙන බිඳගෙන අන්තිමේදී පොලියානා තමන් බලාපොරොත්තු වූ තැනට ආවාය. පොලී පුංචි අම්මා!

''අනේ පුංචි අම්මෙ... පුංචි අම්මෙ... ඔයා ඒක කිව්වෙ ඇත්තටමද? ඒ කාමරේ හැම දෙයක්ම තියෙනවනේ. කාපට්, ජනෙල් තිර, පින්තූර තුනක්. ජනේලෙට එහා තියෙන පින්තූරෙ ඇරෙන්න. අනේ පුංචි අම්මෙ...''

''බොහොම හොඳයි පොලියානා. මං සතුටු වෙනවා ඔයා මේ වෙනසට කැමති වෙච්ච එකට. ඔයා ඔය තරම්ම ඒ දේවල් ගැන හිතනවා නං, බඩු පරිස්සං කරන්නත් ඕන. එච්චරයි. දැන්... පොලියානා කරුණාකරල ඔය පුටුව කෙලින් කරල තියන්න. ඔයා මේ ටිකට දොරවල් දෙකකුත් මහ හයියෙන් ඇරගෙනයි ආවෙ.'' පොලී මෙනෙවිය එසේ කීවේ තදිනි. ඇය ඉතාම තදින් ඒ වචන කිහිපය කියූ අතර, පැහැදිලි කළ නොහැකි යම් හේතුවක් නිසා ඇයට ඇඬෙන්නට ආවේය. එහෙත් කිසි දිනෙකවත් ඇය කිසිම දේකට හඬන්නට පුරුදු වී සිටියේ නැත.

sinhalaebooks.com

පොලියානා පෙරලුණු පුටුව කෙළින් කළාය.

"හා!... මං දන්නව. මං ඒ දොරවල් ඇරල වහපු විදිය හොඳ නැති බව...'' ඇය මද සිනහවකින් කීවාය.

"ඒත් මට හිතෙනවා... ඔයා දොරවල් හයියෙන් වැහුව නං...'' පොලියානා මදක් නැවතී මහත් උනන්දුවෙන් පුංචි අම්මා දෙසට

නෙත් හෙලුවාය.

''පුංචි අම්මෙ... ඔයා කවදක හරි දොරවල් හයියෙන් වහල තියෙනවද?''

''මං හිතන්නෙ නැහැ පොලියානා...'' පොලී මෙනෙවියගේ කට හඬ වෙව්ලුවේය.

''අයියෝ... කොයි තරං ලැජ්ජාවක්ද?'' පොලියානාගේ මුහුණේ බැරෑරුම් සංවේගයක් පහළ විණ.

''ලැජ්ජාවක්....'' යි ප්‍රතිරාවය කළ පොලී මෙනෙවිය තවත් වචනයක් කියන්නට බැරි තරම් වික්ෂිප්තව සිටියාය.

''ඔව්...ඔව්.. ඒ කියන්නෙ ඔයා කවදක හරි දොරවල් දඩාං ගාලා වහල තිබුණොත් තමා, ඔයාට ආයෙ පාරක් ඒක කරන්න හිතෙන්නෙ. ඒත් එහෙම දෙයක් කවදාවත් කරල නැත්නං, එකෙන් කියන්නෙ ඔයාට කිසිම දෙයක් ගැන සතුටු වෙන්න බෑ කියන එක. ඔයාට ඒකට කරන්න කිසිම දෙයක් නැති වෙනව. මට හරි දුකයි, ඔයාට කිසිම දෙයක් ගැන සතුටු වෙන්න බැරි වුණ එක ගැන....''

''පොලියානා !'' පොලී මෙනෙවියගේ හඬගෑම ඇසෙන විට, පොලියානා ඇසෙන තෙක් මානයක සිටියේ නැත. ඈතින් දොරක් මහ හයියෙන් ඇරී වැසෙනු පමණක් ඇසිණ. නැන්සි සමඟ ''තමන්ගේ බඩු මුට්ටු'' පහත මාලයට ගෙනෙනු වස් පොලියානා උඩ තට්ටුවට දිව ගොස් තිබුණාය.

විසිත්ත කාමරයේ හිඳ සිටි පොලී මෙනෙවිය කැළඹුමට පත්ව සිටියාය. එහෙත් ඒ අතරින් ඇය යම් යම් දේ ගැන සතුටු වන්නටද පටන් ගෙන තිබිණි.

# 11

# ජිම් හමුවීම

අගෝස්තු මාසය එළඹුණේය. අගෝස්තුව ආවේ පුදුම සහගත සිදුවීම් සහ වෙනස් වෙනස් දේ රැගෙනය. කොහොම නමුත් ඒවා නැන්සිට නම් පුදුම සහගත දේවල් වුණේ නැත. පොලියානා ආ දවසේ පටන්ම ඇය මෙවැනි පුදුමයන්ට සහ වෙනස්කම්වලට හුරු වී සිටියාය. පළමුවෙන්ම ඒ පූසි පැටවෙකි.

පොලියානාට ඌව හමුවුණේ පාරේ කෑගසමින් සිටින විටදීය. අහළ පහළ කිසිවෙකුත් ඌට අයිතිවාසිකම් කීවේ නැත. ඉතින් පොලියානා ඌ ගෙදර රැගෙන ආවාය.

"ඌ කාගෙවත් නොවුණ එක ගැන මට සතුටුයි..." ඇය ප්‍රීතමත් හඬකින් ඇගේ පුංචි අම්මා සමග කීවාය. "මට ඕන වුණේම ඌව ගෙදර ගේන්න. මං පූසන්ට ආසයි. මං දන්නවා, ඔයත් උන් මේ ගෙදර ජීවත් වෙනවට කැමතියි...."

පොලී මෙනෙවිය පොලියානාගේ දෑත්වල ගුලිවී සිටි අසරණ, අලුපාට පුළුන් ගොඩ දෙස බලා වෙව්ලුම් කෑවාය. පොලී මෙනෙවිය කොහොමටත් පූසන්ට කැමති නැත. උන් නිරෝගී, ලස්සන, පිරිසිදු වූවත් එය එසේමය.

''ඒ.... පොලියානා, මොන ජරාවක්ද ඔය. අනික් එක ඌට මැක්කොයි, කුෂ්ඨ ලෙඩයි නැත්තං පුදුමයක්....''

''මං දන්නව. ඒත් ඌ කොච්චර පවුද?'' පොලියානා ඌ සුමුදු ලෙස අත ගාමින් ඌගේ බියට පත් දෑස් දෙස බැලුවාය.

''අනේ ඌ හොඳටම බයවෙලා. ඌ තාම දන්නෙ නෑ අපි හොඳක් කරන්න යන්නෙ කියල...''

''නෑ කිසි කෙනෙක් එහෙම කරන්නෙ නෑ.....'' පොලී මෙනෙවිය දැඩි ලෙස කීවාය.

''මං හැමෝටම කිව්වා, අයිතිකාරයො හම්බුණේ නැත්තං, මං පූසව තියා ගන්නව කියලා. අනේ අසරණ පූසි පැටවු.....!''

පොලී මෙනෙවිය යමක් කියන්නට දෙතොල් විවර කළ මුත් වචන පිට වුණේ නැත. පොලියානා පැමිණි දවසේ පටන් ම ඇගේ සිත තුළ ඇති වෙමින් තිබූ අර අමුතු, අසරණ හැඟීම මේ වන විට වඩ වඩාත් ඉස්මතු වෙමින් පැවතිණ.

''ඇත්තටම මං දන්නවා....'' පොලියානා ස්තුතිවන්ත වෙමින් හනික කීවාය. ''ඔයා කවදාවත් පුංචි අසරණ පූස් පැටියෙකුට නවාතැනක් හොයාගෙන ගෙයක් ගෙයක් ගානෙ ඇවිදින්න ඉඩ දෙන එකක් නෑ කියල. මං මිසිස් ෆෝඩ්ටත් එහෙම කිව්වා... ඔයා මාව මෙහෙ නවත්තගන්න කැමති වෙයිද දන්නෙ නෑ කියල එයා කියපු වෙලාවෙ. මට නං ඒ කාලෙ කාන්තා සරණ සංගමේ අයවත් හිටිය. ඒත් මේ කිටී ට එහෙම කෙනෙක් වත් නැනෙ. මං දන්නවා. ඔයාටත් එහෙම හිතෙනව ඇති...'' යි හිස නැමූ පොලියානා ප්‍රීතියෙන්

කාමරය හරහා දිව්වාය.

''ඒත් පොලියානා.... පොලියානා....!'' පොලී මෙනෙවිය විරුද්ධත්වය පළ කරන හඬකින් කෑ ගැවාය. ''මම කැමති නෑ....'' පොලියානාට එය ඇසුණේ නැත. ඇය ඒ වන විටත් මුළුතැන්ගෙයට ළඟාවෙමින් නැන්සිට හඬගානු ඇසිණි.

''නැන්සි... නැන්සි. බලන්නකො මේ ලස්සන පූසි පැටිය දිහා. පොලී පුංචි අම්ම මට ඌව හදාගන්න කිව්වා....''

එහෙත් පූසන්ට ඉතා අකමැති පොලී පුංචි අම්මා විසිත්ත කාමරයේ පුටුවක් මතට ඇද වැටී කැළඹීමෙන් යුතුව, විරුද්ධවීමට බැරි තරම් අසරණ කමකින් යුතුව උන්නාය.

ඊළඟ දවසේ පොලියානා ගෙනාවේ බලු පැටියෙකි. ඌ අර පූසි පැටවාටත් වඩා අපිරිසිදුව, අසරණව සිටියේය. නැවත වතාවක් පොලී මෙනෙවිය තමන් ගැනම පුදුමයට පත් වෙමින් සිටියාය. පොලියානා ඇය වෙත ආරූඪ කරන්නට උත්සාහ කරන කරුණාවන්ත, දයාවන්ත දෙව්දුවකගේ ප්‍රතිරූපයට තමන් ඉබේම නතු වෙමින් සිටින හැටි ඇයට තේරුම් ගියේය. පූසන්ටත් වඩා බල්ලන් ඉතා අප්‍රිය කළ මේ ගැහැනිය මුල් වතාවේදී මෙන්ම විරුද්ධවීමට බැරි අන්දමට අසරණ වී සිටියාය.

sinhalaebooks.com

එහෙත් සතියක් ගත වීමට මත්තෙන් ඇයට පොලියානාගේ වැඩ ගැන කතා නොකරම බැරි විය. ඒ, පොලියානා මහ පාරේ ඇවිදිමින් සිටි වැරහැලි ඇඳගත් පුංචි පිරිමි ළමයෙකු ද ගෙදරට කැඳවාගෙන ආ දවසේය. ඇය ඒ ළමයාට රැකවරණය දෙන ලෙස පොලී මෙනෙවිය ගෙන් ඉල්ලා සිටියාය. එය සිදු වුණේ මෙහෙමය:

එක් ප්‍රසන්න බ්‍රහස්පතින්දා උදෑසනක පොලියානා ජෙලි බඳුනක් රැගෙන ස්නෝ මහත්මිය හමුවීමට යමින් සිටියාය. ඒ වන විට පොලියානාත්, ස්නෝ මහත්මියත් ගජ මිතුරියන්ව සිටියහ. ඒ මිතුරුදම ඇරඹුණේ පොලියානා අර සෙල්ලම ගැන කියා දීමෙන් පසුව,

තුන්වැනි වරට ඇගේ නිවසට ගොඩ වැදුණු දවසේය. ස්නෝ මහත්මිය ද පොලියානා සමඟ සෙල්ලම කිරීමට පුරුදු වූ නමුත් ඇය එය හොඳින් කරන්නට සමත් වූයේ නැත. ඉතා දිගු කාලයක් තිස්සේ හැම දෙයක් ගැනම දුක් වෙන්නට පුරුදු වී සිටි ඇයට, හැම දෙයක් ගැනම සතුටු වීමට පුරුදු වීම අමාරුය. එහෙත් පොලියානාගේ උද්‍යෝගිමත් මඟ පෙන්වීම සහ විනෝදකාමී ලෙස වැරදෙන තැන් පෙන්වා දීම් නිසා ඇය ඉතා ඉක්මනින් එය ඉගෙන ගනිමින් සිටියාය. මේ කියන දවසේ පොලියානා ඉතා පුදුමයට පත් කරවමින්, ස්නෝ මහත්මිය කියා සිටියේ පොලියානා ජෙලි බඳුනක් ගෙනා එක ගැන තමන් සතුටු වෙන බවය. තමන්ට ඕනෑ වී තිබුණේ එයම බවත් ඇය කීවාය.

එහෙත් ඒ වන විටත් දේවගැතිවරයාගේ බිරිඳ විසින් ස්නෝ මහත්මිය වෙත එවන ලද එම වර්ගයේම විශාල ජෙලි බඳුනක් නිවසේ තිබෙන බව, දොරකඩදීම මිලී පොලියානාට කියා තිබුණාය. ස්නෝ මහත්මිය ඒ බවක් දැන සිටියේ නැත.

මේ ගැන සිතමින් ආපහු එන අතරේදීය, ඇය මුලින් කියූ පිරිමි ළමයා දුටුවේ.

ඔහු පාර අයිනේ වූ උස් තැනක වාඩි වී දුක්බර විලාසෙන් අතේ තිබූ කෝටුවක් කපමින් සිටියේය.

"හලෝ!" පොලියානා සුහද ලෙස සිනාසුනාය. පිරිමි ළමයා ඔලුව ඔසොවා බලා, හතික අහක බලා ගත්තේය.

"හලෝ...." ඔහු නොපැහැදිලි හඬින් කෙඳිරුවේය. පොලියානාට සිනහ පහළ විය.

"ඔයාට ජෙලි එකක් ලැබුණත් සන්තෝස වෙන්න බැරි පෙනුමක් තියෙන්නෙ...." ඇය ඔහු ඉදිරිපිටම නැවතෙමින්, අතින් කට වසාගෙන හිනැහුණාය.

පිරිමි ළමයා ඉතා කැළඹීමෙන් සිටියේය. ඔහු පොලියානා දෙස පුදුමයෙන් බලා අසහනකාරී ලෙස අතේ තිබුණු කැඩුණු පිහියෙන් කෝටුව කපා දැමුවේය.

පොලියානා තරමක දෙගිඩියාවෙන් යුතුව අසළ තණ බිස්සේ සුව පහසු ලෙස වාඩි වුණාය. තම වයසේ යහළුවන් නැති එක ගැන සිතන්නේ නැතැයි කියමින් කොයි තරම් නිර්භීත ලෙස හිත හදාගන්නට උත්සහ කළත් සමහර අවස්ථාවල ඒ අඩුව ඇයට නොදැනුනාම නොවේ. දැන් ඇය උත්සහ කරමින් සිටින්නේ ඒ අඩුව පිරිමසා ගන්නටය.

''මගේ නම පොලියානා විටියර්.'' ඇය ප්‍රසන්න ලෙස කීවාය. ''ඔයා ගෙ නම මොකක්ද?''

නැවත වතාවක් පිරිමි ළමයා කලබල විය. ටික වේලාවකින් ඔහු නැත්පත්ව හිඳ ගත්තේය.

''ජිම් බීන්....'' යි ඔහු උගුර යටින් පිට කළ හඬක් ඇසිණි.

sinhalaebooks.com

''හොඳයි... දැං අපි අඳුනනවානෙ. මට සන්තෝසයි ඔයා ගෙ නම කිව්වට. සමහර මිනිස්සු එහෙම කරන්නෙ නෑ... ඔයා දන්නවද? මං ඉන්නෙ මිස් පොලී හැරින්ටන් ගෙ ගෙදර. ඔයා ඉන්නෙ කොහෙද?''

''මට ඉන්න තැනක් නෑ.....''

''ඉන්න තැනක් නෑ! ඒක වෙන්න බෑනෙ. හැමෝටම ඉන්න තැනක් තියෙනවනෙ....'' යි පොලියානා සහතික වූවාය.

''ඒත්.... මට එහෙම තැනක් නෑ... දැනට. මං අලුත් තැනක් හොය හොයා ඉන්නෙ....''

''කොහෙද?''

පිරිමි ළමයා ඇය දෙස අවඥාවෙන් බැලුවේය.

"මෝඩි. හරියට අහන්නෙ මං යන්න තැනක් ගැන දැනගෙන ඉන්නව වගේ... ඇත්තටම මං දන්නව නං..."

පොලියානා මදක් උඩ විසි වුණාය. මේ නම් හොඳ ළමයෙක් වන්නට බැරිය. ඇය කෙදිනකවත් තමන් 'මෝඩි' කියා අමතනු අසන්නට අකමැතිය.

"ඔයා මීට කලින් හිටියෙ කොහෙද?" ඇය ඇසුවාය.

"හොඳයි.... ඔය තරං ප්‍රස්න අහන්නෙ මොන එහෙකටද?" පිරිමි ළමයා නොඉවසිල්ලෙන් සුසුම් ලෑවේය.

"මට එහෙම අහන්න වෙනවා!" පොලියානා සන්සුන් ලෙස කීවාය. "එහෙම නැත්නං ඔයා ගැන මොනවත් දැන ගන්න බැනෙ. ඔයා කතා කරනව නං, මං මෙච්චර ප්‍රශ්න අහන එකක් නෑ..."

පිරිමි ළමයා එක්වරම සිනාවක් නැගුවේය. එය හිතාමතා කළ එකක් නොවේ, ලජ්ජාවෙන් මිරිකුණු සිනහවක් විය. එහෙත් මේ වතාවේ ඔහුගේ මුහුණ මුලදීට වඩා තරමක් ප්‍රසන්න විය.

"හොඳයි... එහෙනං ඔන්න අහගන්න. මම ජිමි බීන්. මට වයස අවුරුදු දහයයි.... දැං එකොළහ ලබන්නයි යන්නෙ. මං ගිය අවුරුද්දෙ අනාථ නිවාසෙ නවතින්න ආවා. ඒත් එහෙ ළමයි පිරිල හින්දා මට කාමරයක් ලැබුණෙ නෑ. මං හිතන්නෙ ඒගොල්ලන්ට මාව ඕන වෙන්නෙත් නැතුව ඇති. ඉතිං මං එහෙං ආවා. මට ඕන වෙන තැනක ඉන්න... ඒත් තවම මට තැනක් හම්බුණේ නෑ. මං කැමතියි ගෙදරක ඉන්න.... හැම තැනම තියෙනවා වගේ. ඒ කියන්නෙ මේට්‍රන් කෙනෙක් වෙනුවට අම්ම කෙනෙක් ඉන්න. ඔයාට ගෙදරක් තියෙනවනං ඒකෙ ගොඩක් කට්ටිය ඉන්නව ඇතිනෙ. ඒත් මට එහෙම නෑ. මගේ අප්පච්චි මැරුණා. ඒ හින්ද මං දැං අලුත් ගෙදරක් හොයනවා. මං ගෙවල් හතරකටම ගියා. ඒ ගොල්ලන්ට මාව ඕන

නැතිලු. ඇත්තටම මට ඕන වුණේ ඒ ගොල්ලන්ට වැඩ කරල දීලා, නවතින්න තැනක් හොයාගන්න. ඔන්න! දං ඔයාට මං ගැන අහගත්තා ඇතිද?'' අන්තිම වාක්‍ය දෙක තුනේදී පිරිමි ළමයාගේ කඩහඬ බිඳුණු ස්වරයක් ගත්තේය.

''අනේ කොයි තරං පව් ද?'' පොලියානා දුක් වූවාය.

''ඔයාව කාටවත්ම ඕන වුණේ නැද්ද? අනේ... මට හිතාගන්න පුළුවන් ඔයාට මොනව හිතෙනව ඇතිද කියල. ඒ මොකද මගේ තාත්තත් නැති උනාට පස්සෙ... මටත් අර කාන්තා සරණ සංගමේ කට්ටිය ඇරෙන්න කවුරුත්ම හිටියෙ නැතෙ... පොලී පුංචි අම්මා මාව තියා ගන්න කැමතියි කියන කම්....'' පොලියානා හිටි ගමන් නැවතුනාය. ඇගේ මුහුණෙන් ඇයට පහළ වෙමින් තිබුණු ඒ පුදුමාකාර අදහසේ ආලෝකය පෙනුණි.

''අනේ මං දන්නවා ඔයාට තැනක්....'' ඇය කෑගෑවාය. ''පොලී පුංචි අම්මා ඔයාව තියා ගනී. මං දන්නවා. එයා එහෙම කරයි. එයා මාවත් එහෙම තියා ගත්තෙ නැද්ද? අනිත් එක ෆ්ලෆීවයි බලෆීවයි තියාගත්තෙ නැද්ද... උන්ට යන්න එන්න තැනක් නැතුව ඉන්දෑද්දි. අනේ එන්න... මං දන්නවා පොලී පුංචි අම්මා ඔයාව තියා ගනියි. ඔයා දන්නෙ නෑ එයා කොයිතරං හොඳද, කරුණාවන්ත ද කියල.''

ජිමී බීන් ගේ කැහැටු, කුඩා මුහුණට එළිය වැටුණි.

''ඔය ඇත්තද? එයා එහෙම කරයිද? මේ දැන්? මං එයාට වැඩ කරල දෙන්නං, දන්නවද මං හරි ශක්තිමත්...'' ඔහු කුඩා, ඇට පෑදුණු බාහුව එසවූයේය.

''ඇත්තටම එයා එහෙම කරයි. මගේ පුංචි අම්මා තමයි මේ ලෝකෙ ඉන්න හොඳම ගෑනු කෙනා... මගෙ අම්මා සුර දූතිකාවක් වෙලා ස්වර්ගෙට ගිහින්. මං ඉන්න ගෙදර කාමරත් ගොඩක් තියෙනවා...'' ඈයි කීවේ උඩ පනිමිනි. ඇය ජිමීගේ අතින් අල්ලා ගත්තාය.

"ඒක ලොකුම ලොකු ගෙදරක්. ඒත් සමහර විට...." යි තරමක් චකිතයෙන් කී ඇය හනික ඉතිරි අඩ සම්පූර්ණ කළාය. "සමහර විට ඔයාට මුලින් අට්ටාලෙ තියෙන කාමරේක නිදා ගන්න වෙයි. මමත් මුලින් එහෙම කළා. දැන් නම් ඒ කාමරේ ජනේලවලට තිර දාලා තියෙන්නෙ. ඒ හින්ද ඒ හැටි රස්නෙ වෙන එකකුත් නෑ. අනික එතකොට මැස්සන්ට, උන්ගෙ කකුල්වලින් ජරාව අරගෙන එන්නත් බෑ ඇතුළට. ඔයා ඒ ගැන දන්නවද? ඒක නං දැන ගන්නම වටින දෙයක්. සමහර විට ඔයා හොඳට හිටියොත්... මං කිව්වෙ ඔයා නරකට හිටියොත් එයා ඔයාට ඒ පොත කියවන්න දෙයි..." ඉන්පසු ජිමී ගේ මුහුණ දෙස හොඳට බැලූ ඇය "ආ ඔයාගෙ මූනෙත් ලප තියෙනවා. ඒ හින්ද කාමරේ කණ්ණාඩියක් නැති එක ගැන ඔයා සතුටු වෙයි. අනික බිත්තියේ ගහල තියෙන පින්තූරවලට වඩා හොඳ ලස්සන පින්තූරයක් ඔයාට ජනේලෙ ඇරියාම බලා ගත්තැකි. ඒ කාමරේ නිදාගන්න වෙන එකට ඔයා කොහොමටත් අකමැති වෙන එකක් නෑ... මට විස්වාසයි" යි හනි දැමූ ඇයට සිය හුස්මේ ඉතිරි අඩ කතාවට පමණක් වැය කළ නොහැකි බව දැනුණි.

"අම්මෝ!" පුදුමයෙන් තමුත් පොලියානා අගය කරන හඬකින් කෑ ගැසූ ජිමී බීන් "මං නං හිතන්නෙ නෑ කාටවත් ඔය තරං වේගෙන් කතා කරන්න පුලුවං කියල. වෙන කෙනෙකුට කතා කරන්න වෙලාවක් දෙන්නෙම නැනෙ ඔයා...." යි කීවේය.

පොලියානා සිනාසුනාය.

"හොඳයි.... කොහොම හරි ඔයාට ඒ ගැන සන්තෝස වෙන්න පුළුවන්...." ඇය කීවාය. "ඒ මොකද, මං කතා කරන කොට, ඔයාට කතා නොකර ඉන්න පුළුවන් නිසා...."

නිවසට ළඟා වූ විට, පොලියානා ඇගේ මිතුරාව, නොපැකිලිවම ඇගේ පුංචි අම්මා වෙත කැඳවාගෙන ගියාය.

"අනේ පොලී පුංචි අම්මෙ...." ඇය ජයග්‍රාහී ලීලාවෙන් කීවාය. "මේ බලන්න, මම ෆ්ලෆීටයි, බ්ලෆීටයි වඩා හදාගන්න හොඳ කෙනෙක් ඔයාට ගෙනාවා. ඇත්තම, පුංචි පිරිමි ළමයෙක්. මුලින්ම

අට්ටාලෙ නිදා ගන්න වුණත් එයා ලෑස්තියි. අනිත් එක එයා කියනව, ඒ වෙනුවට එයා වැඩ කරලත් දෙන්නංලු. ඒ උනාට මං නං කැමතියි එයා එක්ක සෙල්ලං කරන්න....''

පොලී මෙනෙවිය සුදුමැලි වූවාය. ඊට පසු මුහුණ රතු කර ගත් ඇයට පොලියානා කී දෙය මුල සිට අගටටම හරි හැටි තේරුණේ නැත. එහෙත් තේරුම් ගත් හරිය හොඳටම ඇති බව ඇය සිතුවාය.

''පොලියානා... මොකද්ද මේකෙ තේරුම. කවුද මේ හඩු ළමයා... කොහෙන්ද එයාව හොයා ගත්තෙ....''

ඇය තියුණු හඬින් ඇසුවාය.

''හඩු ළමයා'' පියවර දෙකක් ආපස්සට ගොස් දොර දෙස බැලුවේය. එහෙත් පොලියානා ප්‍රීතියෙන් සිනාසුණාය.

''ආ! මට එයාගෙ නම කියන්න අමතක උනානෙ. මං අර මිනිහා තරමටම ම නරක් වෙලා. එයා හඩු බව ඇත්ත. ඇත්තටම එහෙම නේද? මං කියන්නෙ මේ ළමයා ගැන. ෆ්ලෆීවයි, බ්ලෆීවයි මෙහාට ගේනකොටත් ඔහොම තමා හිටියෙ. ඒත් ඒ ගොල්ලො වගේ මෙයාවත් ටිකක් හෝදල, නාවලා ගත්තාම හොඳට ඉඳියි. ආ! ඔන්න මට ආයෙමත් සැරයක් අමතක උනා.'' ඇය සිනාසෙමින් කීවාය. ''මෙයා ජිමී බීන්, පුංචි අම්මෙ....''

''හොඳයි.... එයා මොකද මෙහෙ කරන්නෙ?''

''ඇයි පුංචි අම්මෙ මං දැං කිව්වෙ....'' පොලියානා ගේ දෑස් විස්මයෙන් පිරී තිබිණි. ''එයා ගෙනාවෙ ඔයාට. මං එයා ගෙදර ගෙනාවෙ.... එයාට අපිත් එක්ක ඉන්න පුළුවන් හින්ද. එයාට ගෙදරක් ඕන. ඉතිං මම එයාට කිව්ව ඔයා මටයි, ෆ්ලෆීටයි, බ්ලෆීටයි කොයි තරං හොඳට සළකනවද කියල. ඒ වගේම ඔයා එයාටත් හොඳට සළකයි කියල මං දන්නව... ඒ මොකද එයා පූසන්ට, බල්ලන්ට වැඩිය ගොඩක් හොඳ නිසා...''

පොලී මෙනෙවිය පුටුව උඩට ඇද වැටුණාය. ඇය වෙව්ලන දෑතින් ගෙල අල්ලා ගත්තාය. ඇගේ පරණ අසරණ කම දූත් ඇය අභිබවා යාමට ලෑස්ති වෙමින් සිටී. එය මැඩ පැවැත්වීම සඳහා දැඩි චිත්ත අරගලයක යෙදුණු ඇය, අවසානයේදී ඉන් ජයගෙන හනික කෙලින් වී පුටුවේ ඉඳ ගත්තාය.

''ඔය ඇති පොලියානා. මෙච්චර කල් ඔය ළමයා කරපු මෝඩම වැඩේ තමයි මේක. දඩාවතේ යන පූසොයි, බල්ලොයි මදිවට තව ඉබාගාතෙ යන හිඟන්නොත් ගෙදරට ගේන්න ඕන වෙලා....''

මෙහිදී පිරිමි ළමයා මහත් කැළඹීමකට පත්වෙනු පෙනුණි. ඔහුගේ ඇසිපිය වේගයෙන් සැලිණි. මුහුණ එස විණි. ඔහු නොබියව පොලී මෙනෙවිය ඉදිරියට පියවර තැබුවේය.

''මං හිඟන්නෙක් නෙමේ, නෝනා. මට ඔයාගෙං මොනවත් ඕන් නෑ. මං ආවෙ වැඩ කරල දෙන්ඩ. මේ ගෑනු ළමයව හම්බුණේ නැත්තං මං මෙහාට එන් නෑ. එයා කිව්ව ඔයා ගොඩක් හොඳයි. කරුණාවන්තයි, මාව තියාගන්න ගොඩක් ආස වෙයි කියල. එච්චරයි....'' එක්වරම ආපසු හැරුණු ඔහු උදාර ලීලාවකින් කාමරයෙන් පිටවිය. එය ඉතා දුක්මුසු දසුනක් නොවූයේ නම් සමහරවිට එය විකාරයක් ලෙසද පෙනෙන්නට ඉඩ තිබිණි.

''අනේ පුංචි අම්මේ....'' පොලියානා කං කෙඳිරි ගෑවාය. ''මං හිතුවා එයා මෙහාට ගෙනාවම ඔයා සතුටු වෙයි කියල. මට හොඳටම විස්වාසයි ඔයා සතුටු වෙයි කියල....''

පොලී මෙනෙවිය නිහඬ ඉරියව්වක පසුවෙමින් සිය අත එසවූවාය. අන්තිමේදී ඇය සන්සුන් වී සිටී. ඇය ''කරුණාවන්ත... හොඳ'' බව කියූ පිරිමි ළමයාගේ වචන ඇගේ දෙසවන තුළ දෝංකාර දුන්නේය. ඒ සමගම ඇගේ පුරුදු 'අසරණ කම' නැවතත් හිස එසවීමට තැත් කරමින් සිටී. එහෙත්, ඇගේ ශක්තියේ අවසාන බිංදුවත් ප්‍රයෝජනයට ගත් ඇය, හිතට දිරිය ගත්තාය.

''පොලියානා....'' ඇය තිබුණු ලෙස හඬ ගෑවාය. ඔය ''සතුටු'' කෑල්ල නොකියාම බැරිද...හැමදාම ඕන එහෙකට සතුටුයි, සතුටුයි, සතුටුයි. උදේ ඉඳල රෑ වෙනකං ඒ වචනෙමයි. මට හිතෙනව මට පිස්සු හැදෙයි කියල...''

පුදුමයකට මෙන් පොලියානාගේ කට වැසිණි.

''ඇයි පුංචි අම්මෙ...'' ඇය හෙමිහිට කීවාය. ''මට හිතන්න වෙනවා මාව තියාගත්ත එකට ඔයා සතු... අනේ!'' කියන්ට ගිය දේ නොකියා අතින් කට වසාගත් ඇය කාමරයෙන් පිටතට හනික දිව ගියාය.

ගේට්ටුවෙන් පිට වෙන්නට මොහොතකට පෙර ඇය පිරිමි ළමයා වෙත ළඟා වූවාය.

''අනේ... ළමයො... ළමයො.... ජිමී බීන්. මට කියන්න ඕන මං කොච්චර... කොච්චර ඒ ගැන දුක් වෙනවද කියල...'' ඇය හති දමමින් ඔහුගේ අත අල්ලා ගත්තාය.

sinhalaebooks.com

''මොකට දුක් වෙනවද? මං ඔයාට මොනවත් කිව්වෙ නෑනෙ...'' යි කී පිරිමි ළමයා බුම්මා ගත්තේය.

''මං හිඟන්නෙක් නෙමේ...'' යි ඔහු හදිසියේ ඇතිවූ ප්‍රාණවත් බවකින් පිළිතුරු දුන්නේය.

''ඇත්තටම ඔයා එහෙම නෑ. ඒත් එහෙම කිව්වට අපේ පුංචි අම්මට බනින්නත් එපා...'' යි පොලියානා ඇයද සිටියාය. ''මං හිතන්නෙ එහෙම වෙන්න ඇත්තෙ මම හරියට ඔයාව අඳුන්නලා දුන්නෙ නැති හන්ද. ඇත්තටම, ඔයා කව්ද කියලා වැඩි විස්තර මං එයාට කිව්වෙ නෑනෙ. එයා හරිම හොඳයි. කරුණාවන්තයි.... හැම තිස්සෙම එහෙම තමයි. ඒත්, මම හරියට ඒක පැහැදිලි කළේ නැති එක තමා වැරැද්ද. අනේ! මට පුළුවන් නං ඔයාට හොඳ තැනක් හොයල දෙන්න.''

පිරිමි ළමයා දෙවුර අකුලමින් ආපිට හැරුණේය.

"කමක් නෑ. මට හිතෙනවා, මට පුළුවන් වෙයි කියල තැනක් හොයා ගන්න. මං හිඟන්නෙක් නෙමෙයි. ඔයා දන්නවානෙ..."

පොලියානා නළල රැලි කර ගනිමින් කල්පනාවේ ගැලී උන්නාය. එක්වරම ඇගේ මුහුණ ආලෝකමත් වීය.

"ඔන්න! මං කියන්නං මොකද කරන්න ඕන කියල. 'කාන්තා සරණ' සංගමේ කට්ටිය අද හැන්දෑවෙ එකතු වෙනව. පුංචි අම්ම එහෙම කියනව මට ඇහුණා. මං ඔයාගෙ විස්තරේ ඒ ගොල්ලන්ට කියන්නං. තාත්තත් හැමදාම කළේ එහෙම තමයි... එයාට මොනව හරි ඕන වුණාම, මිථ්‍යාදෘෂ්ඨිකයන්ට උගන්වන්න ඕන වුණාම, අලුත් කාපට් ඕන වුණාම..."

පිරිමි ළමයා ගස්සාගෙන යන්නට හැරුණේය.

"මං මිථ්‍යාදෘෂ්ඨිකයෙක්වත්, කාපට් එකක් වත් නෙමේ. ඒක නෙමේ මොකද්ද ඔය 'කාන්තා සරණ'?"

පොලියානා තිගැස්සී පුදුමයෙන් බලා සිටියාය.

"ඇයි ජිමී බීන්. ඔයා කොයි ලෝකෙද ඉන්නෙ? 'කාන්තා සරණ' සංගමේ කට්ටිය ගැන දන්නෙ නැද්ද?"

"ආ...හරි... ඔයා කියන් නැත්තං මං යනව..."

පොලියානා ඉදිරියට ඇදී ගොස් ඔහුගේ පැත්තකින් සිට ගත්තාය.

"ඒ කියන්නෙ.. ඒ කියන්නෙ, ගොඩක් නෝනලා එකතු වෙන රැස්වීමක්. ඒ ගොල්ලො එකතු වෙලා මහනවා, කෑම හදනවා, කතා කරනවා... ඉතිං ඒක තමා 'කාන්තා සරණ ' සංගමේ. ඒ ගොල්ලො හොඳටම කරුණාවන්තයි... මං ඉස්සර හිටපු පළාතෙ තිබුණ සංගමේ

කට්ටියත් එහෙමයි. මං මෙහෙ කට්ටිය නං අඳුරන්නෙ නෑ. ඒත් මම හිතනව ඒ ගොල්ලො ගොඩක් හොඳ වෙයි කියල. මං අද හැන්දෑවෙ ඒ ගොල්ලන්ට ඔයා ගැන කියන්නං...."

නැවත වතාවක් පිරිමි ළමයා පිටවී යන්නට හැදුවේය.

"ඔයා හිතුවට හරියන්නෙ නෑ! සමහර විට ඔයා හිතාන ඇති මං එක්කෙනෙක් මදිවට, ගෑනු ගොඩක් හිඟන්නා කියල කියනව අහන්න යයි කියල. මං අහුවෙයි ඕවට!

"අනේ.... ඒත් ඔයා එන්නෙ නැත්තං..." පොලියානා හනික කීවාය. " මං තනියම යනව. ඇත්තටම ගිහින් ඒ ගොල්ලන්ට කියනව...."

"ඔයා එහෙම කරනවද?"

"ඔව්.... මං මේ සැරේ ඒ වැඩේ හොඳට කරන්නං..." හනික කියූ පොලියානා, පිරිමි ළමයාගේ මුහුණේ සිදු වූ වෙනස්කම් එකවර හැඳින්නාය. "මං දන්නව... එතන සමහර අය ඇති ඔයාට නවතින්න තැනක් හොයල දීල සන්තෝස වෙන්න පුළුවං."

sinhalaebooks.com

"මං වැඩ කරන්නං. ඒක කියන්න අමතක කරන්න එපා." පිරිමි ළමයා අවවාදාත්මක ස්වරයෙන් කීයේය.

"ඇත්තටම නෑ..." යි පොලියානා සතුටින් පොරොන්දු වූවාය. අන්තිමේදී ඈ කී දෙය ඔහු පිළිගනිමින් සිටී. "මං ඒ ගැන ඔයාට හෙට කියන්නං..."

"කොහෙදිද?"

"පාර ළඟදි... මට අද ඔයා හම්බවුණ තැන...ඒ කියන්නෙ මිසිස් ස්නෝ ගෙ ගෙදර ළඟ...."

''හරි... මං එතන ඉන්නං'' පිටවී යන්නට පෙර ඔහු මදකට නැවතුනේය. ''මං හිතන්නෙ මං නිවාසෙට ආපහු ගියොත් හොඳයි... අද රෑට විතරක් මට ඉන්න තැනක් නෑ... ඔයා දන්නවනෙ. අනික මං අද එහෙ දාල ආවෙ නෑ... ළඟට යනව කියලයි ආවෙ. මං ආපහු එන්නෙ නෑ කියල ඒ ගොල්ලන්ට කියල ආවෙත් නෑ. මම ටික වෙලාවකට පේන්න හිටියෙ නැති උනත්, ඒ ගොල්ලන්ට ගානක් නෑ. ඒ ගොල්ලත් හරි අමුතුයි, දන්නවද? ඒ ගොල්ලන්ට කිසිම ගාණක් නෑ...''

''මං දන්නව...'' පොලියානා හිස සැලුවේ, සියල්ල තේරුම් ගත් බැල්මකිනි.

''මට හොඳටම විස්වාසයි, හොඳ මිනිස්සු ඉන්න, හොඳ ගෙදරක් ඔයාට හෙට වෙන කොට හොයල දෙන්න පුලුවන් කියල. ගුඩ් බායි....'' යි ප්‍රීතියෙන් කී ඇය, නිවෙස දෙසට යන්නට ආපිට හැරුණාය.

මේ මොහොතේ විසිත්ත කාමරයේ සිටි පොලී මෙනෙවිය ජනේලයෙන් ළමයින් දෙදෙනා දෙස බලා සිටියාය. ඉන්පසු සුසුමක් හෙලූ ඇය මහපාර දිගේ ඇවිද යන පිරිමි ළමයා නොපෙනී යන තුරුම, කණස්සල්ලෙන් ඔහු දෙස බලා සිටියාය. ඉන්පසු සුසුමක් හෙලූ ඇය, නැගී සිට උදාසීන විලාසයකින් උඩ තට්ටුවට නැංගාය. සාමාන්‍යයෙන් ඇය තුළ මෙවැනි උදාසීන කමක් ඇති වන්නේ නැත. එහෙත් මේ වන විට ඇගේ දෙසවන් තුළ අර පිරිමි ළමයා කියූ 'ඔබ හරිම හොඳයි... කරුණාවන්තයි' කියන වදන් පෙල රැව් පිළි රැව් දුන්නේය. ඇගේ හදවත තුළ යමක් නැතිවූ විටෙක මෙන් මහා හුදෙකලාවක් දැල්විණ.

# 12

# කාන්තා සරණය අබිමුව

කාන්තා සරණ සංගමයේ රැස්වීම පැවැත්වීමට නියමිතව තිබුණු දා හැරින්ටන් බංගලාවේ දහවල් කෑම මේසය නිහඬතාවයෙන් පිරී තිබිණි. පොලියානා කතා කරන්නට උත්සහ කළ බව ඇත්තය. එහෙත් හතර වතාවකදීම 'සතුටුවීම' යන්න කියවෙන්නට ගිය නිසා ඇගේ ඒ හැම උත්සාහයක්ම වැරදී ගියේය. ඒ හැම අවස්ථාවකම ඇය මුහුණ රතු කරගනිමින් මහත් අපහසුතාවයකට පත් වුණාය. පස්වෙනි වතාවටත් එය සිදු වූ විට, විඩාවට පත්ව සිටි පොලී මෙනෙවිය පොලියානා දෙස බැලුවාය.

''කියන්න ළමයො... ඔයාට ඔය හැටි ඒක කියන්න ඕන නං.'' යි කී ඇය සුසුම් ලෑවාය.

''මට විස්වාසයි. ඒක නොකියා ඉන්නවට වැඩිය කියනවා නං හොඳයි කියල. මේ ඔක්කොම අවුල් ඇති වෙන්නෙ ඒක හින්ද

නං..."

පොලියානා ගේ ඇකිලුණු කුඩා මුහුණට ආලෝකයක් වැටිණ.

"අනේ ... බොහොම ස්තුතියි. මට හිතෙන්නෙත් ඒක නොකිය ඉන්න එක මහ අමාරු වැඩක්. ඔයා දන්නවද මම හුඟ කාලෙක ඉඳන් ඒක සෙල්ලං කරනව..."

"ඔයා... මොකක් කියලද කිව්වෙ..." පොලී මෙනෙවිය නැවත ඇසුවාය.

"සෙල්ලං කළා... ඒ සෙල්ලම. ඔයා දන්නවනෙ... තාත්ත." පොලියානා දුක්බර ලෙස මුහුණ අඳුරු කරගනිමින් නැවතුණේ තමන් ඉතා ඉක්මනට නැවතත් තහනම් වචනයක් කී බව තේරුම් ගිය නිසාය.

පුංචි අම්මා රවා බැලූ මුත් කිසිවක් කීවේ නැත. කෑම මේසයේ ගත වූ ඉතිරි වේලාවද ඉන් පසු නිහඬව ම ගෙවී ගියේය.

කෑම වේලාවෙන් පසු පොලී පුංචි අම්මා දේවගැතිවරයාගේ බිරිඳට කතා කොට, හිසරදයක් වැළඳී ඇති බැවින් කාන්තා සරණ සංගමයේ රැස්වීමට තමන්ට සහභාගි වෙන්නට බැරි බව දන්වා සිටියාය. ඒ අසා සිටි පොලියානා ගේ හිතට සැනසිල්ලක් ලැබිණි. පොලි පුංචි අම්මා උඩ තට්ටුවට ගොස් දොර වසා ගත් පසුව, ඇයට වැළඳුණු හිසරදය ගැන දුක් වූ පොලියානාට, ඒ සමඟම එසේ වීම ගැන සතුටු නොවී ඉන්නටද බැරි විය. ඒ, හිසරදය නිසා පොලී පුංචි අම්මා එදා හවස් වරුවේ පැවැත්වෙන කාන්තා සරණ සංගමයේ රැස්වීමට සහභාගි නොවන බැවිනි. ඉතින් දැන් පොලියානාට තනිවම එහි ගොස්, ජිමී බීන් පිළිබඳ පුවත ඔවුන්ට සැල කළ හැකිය. පොලී පුංචි අම්මාත් එහි ගොස් කාන්තා සරණ සංගමයේ සාමාජිකයන් ඉදිරිපිට ජිමී බීන් 'හිඟන්නෙකු' ලෙස හඳුන්වනවාට ඇය කැමති වූයේම නැත.

පොලියානා කාන්තා සරණ සංගමය රැස්වන තැනත්, වේලාවත් දැන සිටියාය. තැන හැරින්ටන් බංගලාවට සැතපුම් බාගයකට නුදුරින් පිහිටි දේවස්ථානයයි. ඔවුහු පස්වරු දෙක පමණ වන විට මේ දේවස්ථානයට රැස් වෙති. දැන්මම එහි ගියොත් පස්වරු තුන වෙන විට එහි ළඟා විය හැකි බව පොලියානා සිතුවාය.

'ඒ ගොල්ලො ඔක්කොමල ඉන්නවා නං හොඳයි...'' ඇය තමාටම කියා ගත්තාය.

''සමහර විට එතන නැති එක්කෙනා, ජිමී බීන්ව ගෙදර තියා ගන්න කැමති වෙන කෙනා වෙන්න පුළුවන්. දෙකට කිව්වට ඒ ගොල්ලො එකතු වෙනකොට කොහොමත් තුන වෙයි...''

හිතට දිරිය ගෙන, තිහඬවම පල්ලියේ පියගැට පෙළ නැංග පොලියානා, දොර තල්ලු කොට හැරියාය. ප්‍රවේශ ශාලාවට ඇතුලු වූ ඇයට, ඇතුලත ප්‍රධාන කාමරයෙන් ගැහැනුන්ගේ කතා බහ සහ සිනා හඬ ඇසිණ. මොහොතක් පමණ පැකිලෙමින් නැවතී සිටි පොලියානා ඊළඟට ඇතුලු දොරක් තල්ලු කර හැරියාය.

sinhalaebooks.com

කතාබහ එක්වරම විස්මය පළ කරන හඬවල් ගොඩකට පරිවර්තනය විය. පොලියානා බියෙන් මෙන් කාමරය තුළට ඇවිද ගියාය. දැන් ඇත්තටම ඇයට ලැජ්ජාවක් දැනෙන්නට පටන්ගෙන තිබුණි. අන්තිමේදී මේ බාගයක් හඳුනන, බාගයක් නොහඳුනන මුහුණු, ඈ දන්නා 'කාන්තා සරණ ' සාමාජිකයන් නොවන වග ඇයට පසක් කළේය.

''ආයුබෝවන්...'' ඇය පුළුවන් තරම් ආචාරශීලී වෙමින් තැතනුවාය.

''මම පොලියානා විටියර්. මම හිතනව බාගදා ඔයාලගෙන් සමහරක් අය මාව දන්නව ඇති. කොහොම හරි, මම ඔය ගොල්ලො ඔක්කොම මේ විදියට දන්නෙ නෑ...''

නිහඬතාවය තව දුරටත් පැතිරෙන්නට වන. රැස්ව සිටි පිරිසෙන් ඇතැමෙක් මේ ඔවුන්ගේ සාමාජිකාවකගේ අරුම පුදුම ලේලිය බව දැන සිටියහ. හැම දෙනෙකුම ඇය පිළිබඳව අසා තිබුණු නමුත්, කුමක් කියන්නදැයි ඔවුන් කිසිවකුට සිතාගන්නට පුලුවන් වුණේ නැත.

"මං... මං ආවෙ... ඔයගොල්ලන්ට සිද්ධියක් ඉදිරිපත් කරන්න...." මොහොතකට පසුව නොදැනුවත්වම වාගේ තාත්තාගේ නිතර කී වචන මතකයට නඟා ගත් පොලියානා ගොත ගැසුවාය. එවිට කාන්තාවන් අතර මද කසු කුසුවක් ඇති විය.

"ඔයාව... ඔයාව එව්වෙ ඔයාගෙ පුංචි අම්මද දරුවො? යි දේවගැති වරයා ගේ බිරිඳ වූ ෆෝඩ් මහත්මිය ඇසුවාය.

පොලියානා තරමක් රතු වූවාය.

"අනේ නෑ. මං තනියෙම්මයි ආවෙ. මට ඔයගොල්ලො වගේ කට්ටිය පුරුදුයි. තාත්තත් එක්ක මාව හදා ගත්තෙ 'කාන්තා සරණ සංගමේ' කට්ටිය."

කාගේදෝ මුවින් සිනාවක් පැන්නේය. දේවගැතිවරයාගේ බිරිඳ එදෙස රවා බැලුවාය.

"කියන්න දරුවො, ඇයි ඔයා අවෙ...?"

"ඒ...ඒ, ජිමී බීන් ගැන කියන්න..." යි පොලියානා සුසුම් ලෑවාය. "එයාට ගෙදරක් නෑ... අනාථ නිවාසෙ ඇරෙන්න. එහෙත් ගොඩක් ළමයි ඉන්නවලු. ඒ.. ගොල්ලන්ට එයාව ඕන නැතිලු. කොහොම හරි එයා හිතන්නෙ එහෙම තමා. ඒ හින්ද එයා නවතින්න වෙන තැනක් හොයනවා. එයාට ඕනලු මෙට්‍රන් කෙනෙක් වෙනුවට අම්ම කෙනක් ඉන්න, එයාට හොඳින් සළකන මිනිස්සු ඉන්න ගෙයක්. ජිමීට දැං අවුරුදු දහයක්. එයා එකොළහ ලබන්නයි යන්නෙ. මං හිතුව ඔයාලගෙන් කවුරු හරි එයාව නවත්තගන්න කැමති වෙයි

කියල..."

"හොඳයි... අනේ ඇත්තටම!" පොලියානාගේ කතාවෙන් පසු ඇති වූ නිහඬතාවය බිඳ දමමින් කවුදෝ කසු කුසු ගෑවේය.

බලාපොරොත්තුව දල් වූ දෑසකින් පොලියානා තමන් වටා ඇති මුහුණු දෙස බැලුවාය.

"මට කියන්න අමතක උනා... එයා ගෙදර වැඩත් කරල දෙයි..." යි ඇය ඉතා ඕනෑ කමින් එකතු කළාය.

තවමත් හැම දෙනාම නිහඬය. ඉන් අනතුරුව නිහඬතාවය මැදින් කිහිප දෙනෙක් පොලියානා ගෙන් හරස් ප්‍රශ්න අසන්නට වූහ. මඳ වේලාවකට පසු කතන්දරය මුල සිට අගටම තේරුම් ගත් ඔවුහු එකිනෙකා සමඟ උණුසුම් කතා බහකට එළඹුනහ. එහෙත් එය කිසිසේත්ම ප්‍රසන්න කතාබහක් වූයේ නැත.

පොලියානා ඒ කතා බහ වෙත කුතුහලයෙන් ඇහුම්කන් දුන්නාය. ඔවුන් කතා කළ සමහර දේ ඇයට කොහෙත්ම තේරුණේ නැත. අන්තිමේදී ඇය තේරුම් ගත්තේ ඔවුන් අතරින් කිසිවෙකුත් ජිමී භාර ගැනීමට අකමැති බවය. එතැන සිටි බොහෝ දෙනෙකුගේ නිවෙස්වල කුඩා පිරිමි ළමයින් නොසිටි නමුත් ඔවුන් සියල්ලෝම ජිමී නවත්වා ගැනීම සම්බන්ධයෙන් තවත් කෙනෙකු ඉදිරිපත් වනු ඇතැයි බලාපොරොත්තු වූහ. එහෙත් කිසිවෙකුත් ජිමී භාර ගැනීමට ඉදිරිපත් වුණේ නැත.

ඉන්පසු දේවගැතිවරයාගේ බිරිඳ තම සංගමයෙන් ඉන්දියාවේ කුඩා ළමයින් ගේ සුබ සෙත සඳහා යොදවන්නට නියමිතව තිබූ මුදල්, අවශ්‍ය නම් මේ කියන පිරිමි ළමයා වෙනුවෙන් යෙදවිය හැකි යැයි යෝජනා කළාය.

ඒ යෝජනාව වෙනුවෙන් අදහස් දක්වන්නට බොහෝ දෙනෙකු ඉදිරිපත් වූ අතර, එකවර කටහඬ රාශියක් නැගී ආවේය. ඔවුහු

පෙරටත් වඩා මහ හයියෙන්, ඉතා අමිහිරි ලෙස වාද කරන්නට පටන් ගත්හ. ඔවුන්ගේ සංගමය වඩාත් ප්‍රචලිතව ඇත්තේ හින්දු මිෂනරි සේවය වෙනුවෙන් බවත්, මේ අවුරුද්දේ ඒ වෙනුවෙන් යොදවන මුදල් ප්‍රමාණය අඩු වුවහොත් එය ඉතා ලජ්ජාවට කාරණයක් වනු ඇති බවත් ඔවුහු කීවෝය. මෙවරත් ඔවුන් කී බොහෝ දේ තමන්ට නොතේරෙන බව පොලියානා සිතුවාය. ඔවුන් කියන හැටියට ඔවුන්ගේ මුදල්වලින් කුමන වැඩක් කළ ද කම් නැත. එහෙත් මොකක්දෝ 'වාර්තාවක' සංගමයේ නමට ඉදිරියෙන් මුදල්වලින් කළ වැඩය 'ලැයිස්තුවේ ඉහළින්ම' තිබිය යුතුය.

පොලියානාට නම් ඒ සියලු කතා මහා අවුල් ජාලයකි. ඉතා අප්‍රසන්න ලෙස ඇදී ගිය ඒ වාදයෙන් මිදී, නැවතත් එළිමහනේ නැවුම්, පිරිසිදු වාතය තුළට එන්නට හැකි වීම ගැන පොලියානා සතුටු වූවාය. එහෙත් ඇය තුළ එකම දුකක් ඉතිරි වී තිබිණි. ඒ, සිදුවූ දේ ජිමීට කියන්නට සිදුවීම ගැනය. එය ඉතා දුක්බර මෙන්ම කියන්නට කිසිසේත්ම ලෙහෙසි නොවන ක්‍රියාවක් බව ඈ දනී... ඇයට හෙට දිනයේදී ජිමී බීන්ට කියන්නට ඉතිරිව ඇත්තේ කාන්තා සරණ සංගමය තමන්ගේ නගරයේ ජීවත්වන අනාථ ළමයකු හදාවඩා ගන්නවාට වඩා, දුර ඈත පිහිටි ඉන්දියාවේ ජීවත්වන කුඩා ළමයිගේ සුබ සෙත පිළිබඳව සැළකිළිමත් වන බවය. ඔවුන් සතු මුදල් සියල්ලම ඉන්දියාවට යවන්නට ඔවුහු කැමැත්තෙන් සිටිති. උපැස් යුවලක් පැළඳ සිටි උස කාන්තාව කී පරිදි, ජිමී වෙනුවෙන් මුදල් යෙදවුවහොත් ඔවුන්ට මොකක්දෝ වාර්තාවකින් ප්‍රශංසාවක් ලබා ගත නොහැකි වනු ඇත.

"ඒක කොහොමටවත් හොඳ නෑ. ඔය වගේ රටකට සල්ලි යවන එක. මම එහෙම නං ඒ ගොල්ලන්ට පොඩ්ඩක්වත් සල්ලි යවන්නෙ නෑ..." යි පොලියානා තනිවම සුසුම් ලෑවාය. ඇය ඉතා දුකින් ඉදිරියට ඇවිද ගියාය."ඒ ගොල්ලො හැසිරුණේ නං මෙහෙ ඉන්න පුංචි පිරිමි ළමයි චුට්ටක්වත් ගණං ගන්නෙ නැති ගානට. ඒ ගොල්ලන්ට ලොකු වෙලා තියෙන්නෙ කොහේවත් තියන රටක ඉන්න ළමයි. ඒ ගොල්ලන්ට ජිමී බීන් හොඳට හැදෙනවා දකිනවට වඩා, අර මහ ලොකු රිපෝට් එකක් ලොකු උනේ කොහොමද?"

# 13

# පෙන්ඩල්ටන් වන රොද තුළ

පල්ලියෙන් පිට වී ආ පොලියානා ගේ දෙපා නිවෙස දෙසට ඇදී ගියේ නැත. ඒ වෙනුවට ඒවා අසළ තිබුණු පෙන්ඩල්ටන් කඳු මුදුන වෙත ඇදී යමින් තිබිණ. පොලියානාට එය 'තිවාඩු' දවසක් වූවත් (කලාතුරකින් එළඹෙන, මැහුම් පාඩම් හෝ ඉවුම් පිහුම් පාඩම් නැති දවස් ඇය හැඳින්වූයේ එලෙසිනි.) ගතවුණු කාලය ඉතා වෙහෙසකර වී ය. යම් තරමක හෝ අස්වැසිල්ලක් ලබා ගැනීම සඳහා කොළ පැහැති තුරු මුදුන් ගැවසී ගත් පෙන්ඩල්ටන් කඳු මුදුන වෙත යාම සුදුසු බව පොලියානා සිතුවාය. ඉතින් හිරුගේ ගිනි රස්නය මැද්දේ වුවද ඇයට කෙමෙන් කෙමෙන් කන්ද නගින්නට පටන් ගත්තාය.

''පහ හමාර වෙන කල් ගෙදර යන්න ඕන නෑ...'' යි තමන්ටම කියාගත් ඇය මෙසේද සිතුවාය:

sinhalaebooks.com

"කැළෑව පැත්තෙන් තියන පාරෙ ටිකක් ඇවිදින එක හොඳයි... එතකොට කන්ද නගින්න ඕන වුණත් කමක් නෑ..."

පොලියානා පලපුරුද්දෙන්ම දන සිටි පරිදි පෙන්ඩල්ටන් වන රොද ඉතා ලස්සන වීය. හෙට දවසේ ජිමී බීන් ට කිව යුතු දේ ගැන සිතමින්, බලාපොරොත්තු සුන් වූ හදින් සිටි පොලියානාට අද එය වෙන කවරදාටත් වඩා සුන්දර බව පෙනුණි.

"අර කෑ ගහ ගහ හිටපු නෝනල ටික මේ වගේ තැනකට ආව නං..." යි පොලියානා තනිවම සුසුම් ලෑවාය. ඇය හිස ඔසවා බැලුවිට හිරු එළිය වැටුණු හරිත තුරු මුදුන් අතර තිබූ හිදැස් අතරින් අහසේ විචිත්‍රවත් නිල් පැහැය පෙනුණි.

"ඒ ගොල්ලො මෙතන හිටිය නං, මට හිතෙනව එයාල ජිමී බීන්ව බාරගන්න කැමති වෙයි කියල..." ඇය සිතුවාය. එහෙත් එසේ වීමට හේතුව කුමක් දැයි ඇයම නොදත්තාය.

එක්වරම පොලියානා නැවතී යමකට ඇහුම් කන් දෙමින් සිටියාය. මදක් ඈතින් බල්ලෙක් බුරමින් සිටී. මොහොතකට පසු උෟ බුරමින් ඇය වෙත දිව ආවේය.

"හලෝ... බල්ලෝ... කොහොමද?" පොලියානා උගේ හිස අතගාමින් යමක් බලාපොරොත්තුවෙන් මෙන් ඉදිරියෙන් වූ අඩිපාර දෙස බැලුවාය. මේ බල්ලා එක්වතාවක් දැක ඇති බවට ඇයට හොඳටම විශ්වාසය. උෟ ජෝන් පෙන්ඩල්ටන් සමඟ සිටිනු ඇය දැක ඇත. ඇය දැන් බලා ඉන්නේ කොහෙත් හෝ ඔහු මතු වන තුරුය. මිනිත්තු කිහිපයක් තිස්සේ ඉතා ඕනෑ කමින් ඇය බලා සිටි නමුත් ඔහු පෙනෙන තෙක් මානයක සිටියේ නැත. ඊට පසු ඇය ආපිට හැරී බල්ලා දෙස පරීක්ෂාකාරීව බැලුවාය.

පොලියානාට පෙනුණු ආකාරයට උෟ හැසිරෙන්නේ අමුතුම විදියකටය. උෟ තවමත් බුරමින් සිටින අතර වරින් වර උස් හඬින් මොර දුන්නේය. ඉදිරියෙන් ඇති අඩිපාර දිගේ දුවමින් සහ ආපසු

හැරී දුවමින් උෟ කුමක්දෝ කියන්නට හදයි. උෟ සමග ඉදිරියට ගිය පොලියානාට පැත්තකින් තවත් අඩි පාරක් වැටී තිබෙනු දකින්නට හැකි විය. මේ පාර දිගේ ඉදිරියට දිව ගිය බල්ලා, එක් වතාවක් ආපසු පැමිණ මහ හයියෙන් බුරමින් නැවත ඉදිරියට දිව්වේය.

''ආ! ඔය ගෙදරට යන පාර නෙමේනෙ...'' යි සිනාසුණු පොලියානා තවමත් ප්‍රධාන පාර දිගේ ඉදිරියට යමින් සිටියාය.

බලු පැටවා දැන් හැසිරෙන්නේ වියරු වැටුණ ගානටය. ඉදිරියට... පසුපසට... ඉදිරියට.. පසුපසට, පැත්තෙන් වූ අඩිපාරත්, පොලියානා අතර උෟ දුවමින්, මහ හයියෙන් බුරමින් සිටී. උගේ දුඹුරු පැහැති කුඩා සිරුරේ හැම සෙලවීමක් පාසාම, දෑසින් බලන හැම බැල්මක් පාසාම, ඉතා දක්ෂ අයුරින් කරන යම් අයැදුමක් තිබිණි. අන්තිමේදී එය තේරුම් ගත් පොලියානා, ආපිට හැරී උෟ පසුපස යන්නට පටන් ගත්තාය.

ඇයට ඉදිරියෙන් වූ අඩි පාර දිගේ බල්ලා උමතුවෙන් මෙන් දිව ගියේය. වැඩි වේලා නොගොස්ම මේ සියල්ලටම හේතුව සොයා ගැනීමට පොලියානාට sinhalaebooks.com හැකියාව ලැබිණ. අඩි පාරට නුදුරින් වූ උසැති ගල් කුළක් පාමුල මිනිසෙක් නිසොල්මන්ව වැතිර සිටී

පොලියානා ගේ පයට පෑගී රිකිල්ලක් බිඳී ගිය හඬ අසා, මිනිසා හිස එස වූයේය. පොලියානා පුදුමයට පත්ව කෑගසමින් ඔහු ළඟට දිව ගියාය.

''මිස්ට පෙන්ඩල්ටන්... අනේ ඔයාට ගොඩක් තුවාලද?''

''තුවාල? අපෝ නෑ. මං මේ අව්ව තැප තැප නිදාගත්තා...'' යි නුරුස්නා හඬින් කී ඔහු ''මේ බලනවා! ඔයා මොනවද දන්නෙ. ඔයාට මොනවද කරන්න පුළුවං. ඔයාට පොඩ්ඩක් හරි දැනුමක් තියෙනවද?' යි ඇසුවේය.

පොලියානා හැම විටෙකම කරන්නාක් මෙන් කට මදක් විවර

කොට සුසුමක් ගත්තාය. ඇය පෙන්ඩල්ටන් මහතා ඇසූ ප්‍රශ්නවලට පිළිවෙලින් උත්තර බඳින්නට පටන් ගත්තේ ඊට පසුවය.

''ඇයි... මිස්ට පෙන්ඩල්ටන්. මම... මම... එච්චර දන්නෙ නැති බව ඇත්ත. මට ගොඩක් ලොකු දේවල් කරන්ඩත් බෑ. ඒත් මිසිස් රෝසන් ඇරෙන්න කාන්තා සරණ සංගමේ ගොඩක් අය කිව්වෙ මට හොඳ අවබෝධයක් තියෙනව කියල. මට ඒ ගොල්ලො දවසක එහෙම කියනව ඇහුණ. ඒත් මං අහගෙන හිටපු බව එයාල දන්නෙ නෑ....''

පෙන්ඩල්ටන් මහතා මද සිනාවක් පෑවේය.

''ඔන්න, ඔන්න ළමයො. මට සමාවෙන්න, මට විස්වාසයි. මගේ අමාරුව තියෙන්නෙ මේ කකුලෙ විතරයි. ඉතිං දූං අහන්නකො...'' යි මදක් නැවතුණු ඔහු, අමාරුවෙන් කලිසම් සාක්කුවට අත යවා යතුරු කැරැල්ලක් අතට ගෙන එය මහපට ඇඟිල්ලත්, වෙදැඟිල්ලත් අතර රඳවා ගත්තේය.

''මේ පාර දිගේ කෙළින්ම විනාඩි පහක් විතර ඉස්සරහ ගිහාම තමයි මගේ ගෙදර තියෙන්නෙ. මේ යතුර පෝටිකෝවෙ පැත්තකින් තියෙන දොරක. දන්නවද මොකද්ද පෝටිකෝව කියන්නෙ කියල?''

''ආ! ඔව් සර්. අපේ පුංචි අම්මගේ ගෙදර ඒකට උඩින් සන් පාලර් එකකුත් තියෙනව. ඒක උඩ තමයි මම දවසක් දා නිදා ගත්තෙ. ඇත්තටම මට නිදාගන්න හම්බුණේ නෑ... එයාලා මාව හොයා ගත්ත...''

''හ්ම්! ආ... හොඳයි. ඔයා ගෙට ඇතුල් වුණාම, බරාඳය දිගේ ගිහින්, සාලාවට ඇතුල් වෙලා ඒක කෙළවරේම තියෙන දොර ළඟට යන්න. ඒ දොරෙං ඇතුල්වෙලා තියෙන කාමරේ ලොකු මේසයක් උඩ ටෙලිෆෝන් එක ඇති. ඔයා ටෙලිෆෝන් එක පාවිච්චි කරන්න දන්නවද?''

''ආ... ඔව් සර්. එක දවසක් පොලී පුංචි අම්මා...''

''ආ! දූත් ඔය පොලී පුංචි අම්මගෙන් වැඩක් නෑ'' යි කේන්තියෙන් බාධා කළ පෙන්ඩල්ටන් මහතා මදක් සෙලවෙන්නට තැත් කළේය. ''ඒ ළඟ තියෙන ටෙලිෆෝන් අංක ලියපු කාඩ් එකෙන් ඩොක්ටර් තෝමස් කිල්ටන්ගෙ අංකය හොයා ගන්න. සමහර විට අහළ පහළ ඇණයකින් ඒක එල්ලලා ඇති. බාගදා ඒක එතන නැතුවත් ඇති. ටෙලිෆෝන් කාඩ් එක කියන්නෙ මොකටද දන්නවද? ඔයාට දැක්කම හිතා ගත්තැකි.''

''ආ ඔව්. සර් පුංචි අම්මගෙ එකට මං හරි කැමතියි. ඒකෙ ගොඩක් අමුතු නම් තියෙනව තව...''

''දොස්තර කිල්ටන්ට කියන්න පෙන්ඩල්ටන් ගෙ කකුලක් කැඩිල, පෙන්ඩල්ටන් කැලෑවෙ ලිට්ල් ඊගල් පච්ච ළඟ ඉන්නව කියල. තව උදව්වට දෙන්නෙකුත් එක්ක එන්න කියන්න. ඊළඟට කරන දේ එයා දන්නවනෙ. ආ! තව කියන්න මෙතෙන්ට එනකොට ගෙදරට ඇවිත් එතන ඉඳල තියෙන පාර දිගේ එන්න කියල...''

''කකුල කැඩිල? අනේ මිස්ට පෙන්ඩල්ටන්, කොච්චර බය හිතෙන වචනයක්ද?'' යි පොලියානා දෙවුර හැකිලුවාය. ''මට හරි සතුටුයි මෙතෙන්ට ආපු එක ගැන. මට බැරිද...''

''ඔව්... ඔයාට පුළුවං. ඒත් ඔයාට ඒක කරන්න බෑ. කරුණාකරල කතාව නවත්තල ගිහිං මං කියපු වැඩේ කරනවද?'' යි පෙන්ඩල්ටන් මහතා කෙඳිරි ගෑවේය. පොලියානාට ඇඬුම් එන්නට ආ අතර, ඇය හනික එතැනින් පිටව ගියාය.

පොලියානා හිරු එළිය වැටුණු තුරු මුදුන් අතරින් පෙනෙන අහස් නිල දෙස බලන්නට වත් නැවතුණේ නැත. ඇය රිකිල්ලක හෝ ගලක හැපී ගමන බාධා වේ යයි බියෙන් බිම බලාගෙනම හනික ඇවිද ගියාය.

වැඩි වේලා නොගොස්ම ඇය පෙන්ඩල්ටන් නිවෙස පෙනෙන තෙක් මානයට ආවාය. ඇය මේ නිවෙස මීට පෙර දැක තිබූ නමුත් මේ තරම් සමීපයට ඇවිත් තිබුණේ නැත. තේජස් පෙනුමෙන් නැගී සිටි අලු පැහැති ගලින් බැඳ තිබූ ආලින්දත්, මන බඳින සුළු ගෙයි ඉදිරිපසත් කොයි තරම් විසාල වූවාද යත්, එය පොලියානා තැති ගන්වන සුළු වී ය. මොහොතක් පමණ නැවතී සිටීමෙන් අනතුරුව ඇය අමුත්තන් කිසිවෙකු ගේ පා පහස නොලබන විශාල පාර දිගේ ගෙය වටා ගොස්, පෝටිකෝව යට තිබූ පැති දොර සොයා ගත්තාය. ඇගේ ඇඟිලිවලට තද වී තිබූ යතුරු කැරැල්ල යතුරු සිදුරට දමා කරකැවූ පසුව, අන්තිමේදී ඒ විශාල, බරැති, කැටයම් කැපූ දොර ඇරී ගියේ ය.

පොලියානා දිගු හුස්මක් අල්ලා ගත්තාය. හදිස්සිය අමතක කොට, මොහොතකට නැවතුණු ඇය බරාඳය දිගට නෙත් යවා ඊළඟට එහායින් ඇති පළල්, අඳුරු සාලාව දෙස බැලුවාය. ඇගේ සිතුවිලි සුළියකට හසුවූ විටෙක මෙන් කැරකෙන්නට පටන් ගත්තේය. මේ ජෝන් පෙන්ඩල්ටන් ගේ නිවෙසය. එය අබිරහස්වලින් ගහණය. මේ නිවසේ කොහේ හෝ ඇට සැකිල්ලක් ද සඟවා තිබේ! තවමත් ඇය, පොලියානා, මේ භයංකාර නිවසේ කාමරවලට ඇතුලුවන්නට බලාපොරොත්තුවෙන් සිටින අතර, නිවෙස් හිමියාට වී ඇති හදිය ගැන දොස්තරට දුරකතන ඇමතුමක් ද දිය යුත්තේ ද ඇය විසිනි.

එක්වරම, පොලියානාට හැඬුම් ආ අතර, ඇය දකුණු පසවත්, වම් පසවත් නොබලාම සාලාව දිගේ දිව ගොස් කෙළවර තිබූ දොර හැරියාය.

ඉන් විවර වූ කාමර විශාලය. අර ශාලාවේ මෙන්ම මෙහිද අඳුරු පැහැ ලී බඩුද, එල්ලූ සැරසිලි ද තිබුණි. එහෙත් බටහිර පැත්තේ වූ ජනේලයකින් හිරු රත් පැහැ කිරණ ගෙබිම මතට එවමින් සිටියේය. ඒවා ගිනි උඳුනේ දුර්වර්ණ වූ ඇන්ඩිරෝනය* මතට වැටී දිස්න දුන් අතර, කාමරය මැද්දේ මහ මේසයක් මත තබා තිබූ ටෙලිෆෝනයේ

* ඇන්ඩිරෝගය (andiron) - ගිණි උඳුනේ දර දැවීම සඳහා ගන්නා ආධාරකයක්

නිකල් තනඩුද ඒ එළියෙන් දිස්න දුන්නේය. පොලියානා ශබ්ද නොකොට ඇඟිලි මතින් හනික එහි ගියාය.

දුරකථන අංක කාඩ් පත එල්ලා තිබුණේ නැත. එය තිබුණේ බිමය. කෙසේ නමුත් එය සොයා ගත් පොලියානා ඇගේ වෙව්ලන ඇඟිලි තුඩ "සී" අකුරුවලින් පටන්ගන්නා නම් දිගේ යැව්වාය. අවසානයේ ඒ නම.. "කිල්ටන්" යන්න ඇයට හමු විය. ඊළඟට දොස්තර කිල්ටන් දුරකථනය එහා කෙළවරේ සිටි අතර, වෙව්ලන හඬින් පණිවිඩය කී පොලියානා ඉන්පසු දොස්තර ගේ තියුණු, හරස් ප්‍රශ්න රැසකටද උත්තර දුන්නාය. මේ සියල්ලම කළ පසු රිසිවරය ආපසු තැබූ පොලියානා සැනසුම් සුසුමක් හෙලුවාය.

පොලියානා කෙටි බැල්මකින් හාත්පස සිසාරා බැලූ අතර, ඇගේ දෑස් කුතුහලයෙන් පිරී තිබුණි. රතු පැහැති තිර රෙදි, බිත්තියේ වූ පොත් රාක්ක, කුණු පිරුණු ගෙබිම, අවුල් වූ මේස, ගණන් කරන්නට බැරි තරම් වැසූ දොරවල් (අර ඇටසැකිල්ල සඟවා ඇත්තේ මේවායින් එකකය!) සහ හැමතැනම දූවිලි... දූවිලි. මිසක් අන් කිසිවක් නැත. ආපසු හැරුණු ඇය දිව ගොස් බාගෙට ඇර දමා තිබුණු මහ දොරෙන් එළියට පැන ගත්තාය.

සිතා ගන්නටත් නොහැකි තරම් කෙටි කාලයකින් පොලියානා නැවතත් අර වන රොදේ වැතිර සිටි මිනිසා අසළ පෙනී සිටියාය.

"හොඳයි... මොකද උණේ, ඔයාට ඇතුළට යන්න බැරි උනා ද?" යි ඔහු ඇසුවේය. පොලියානා දෑස් ලොකු කර ගත්තාය.

"ඇයි? ඇත්තටම මං ඒක කළානෙ. ඉතිං මං ආපහු ආවා..." ඇය කීවාය. "ඔයා අහන්නෙ හරියට මං ඒක කරන්නෙ නැතුව ආවා වගේනෙ. දොස්තර මහත්තය ඉක්මනටම එයි. එයා කිව්ව ඔයා ඉන්න තැන එයා දන්නව කියල. ඉතිං එයා එක්ක එන්න ඉන්නෙ නැතුව මං ආව. මට ඕනෑ වුණේ ඔයා එක්ක ඉන්න..."

"එහෙමද? මිනිසා යන්තමින් සිනාවක් පෑවේය. "හොඳයි...

මට කියන්න බෑ ඔයාගෙ තේරීම හරියටම හරි කියල. මං හිතන්නෙ මීට වඩා හොඳ යාළුවො ඔයාට හම්බවෙයි.''

''ඔයා ඔය කියන්නෙ... ඔයාට හරියට තරහ යන නිසාද?''

''ඔයාගේ අවංක කමට ස්තුතියි. ඔව්...''

පොලියානා මෘදු ලෙස සිනාසුනාය.

''පිටින් බැලුවම නම් පේන්නෙ ඔයාට තරහ යනව වගේ තමයි. ඒත් ඇතුළෙන් නම් ඔයා පොඩ්ඩක්වත් නපුරු වෙන්න විදියක් නෑ...''

''ඇත්තටම! ඔයා කොහොමද ඒක දන්නෙ...'' යි ඇඟ නොසොල්වා, ඔලුව පමණක් යන්තම් සෙලවීමට උත්සාහ කරමින් පෙන්ඩල්ටන් මහතා ඇසීය.

''ආ! ඒකට ගොඩක් විදි තියෙනව. එකක් තමයි බල්ලයි, ඔයයි ඉන්න විදිය...'' යි කී ඇය බල්ලාගේ සිනිඳු හිස මත තබා ගෙන සිටි පෙන්ඩල්ටන් මහතාගේ දිගු හින්දෑරි අත දෙසට ඇඟිල්ල දිගු කළාය.

''මිනිස්සුන්ට වැඩිය බල්ලන්ටයි පූසන්ටයි මිනිස්සුන්ගෙ ගතිගුණ ගැන කියන්න පුලුවං. ඒක හරි පුදුමයි නේද? හිතන්නකො මමත් ඔයාගෙ ඔලුව අත ගානව කියල..'' යි කියමින් ඇය එක්වරම කතාව නැවැත්තුවාය.

පෙන්ඩල්ටන් මහතා දෙතුන් වතාවක් වේදනාවෙන් ඇකිලෙමින් කෙඳිරි ගෑ අතරේදී ඒ වෙනස සිදූ විය. මීට පෙර ගල් කුලේ කුහරයක් මත තිබූ පෙන්ඩල්ටන් මහතා ගේ හිසට, පොලියානාගේ උකුල කදිම විකල්පයක් විය.

''ආ! එහෙම හොඳයි...'' යි ඔහු දුබල හඬින් මුනු මුනු ගෑවේය.

ටික වේලාවක් යනතුරු ඔහු කතා කළේ නැත. පොලියානා ඔහුගේ මුහුණ දෙස බලා සිටිමින් ඔහු නින්දේ පසුවන බව සිතුවාය. වේදනාවෙන් නඟන කෙඳිරිලි පිටතට නොඑන්නට මෙන් ඔහුගේ දෙතොල් තදින්ම පියවී තිබිණි. ඔහුගේ විශාල ශක්තිමත් දේහය මේ තරම් අසරණ ලෙස බිම වැතිරී තිබෙනු දකින විට පොලියානාට මහ හයියෙන් කෑ ගැසෙන්නට ගිය තරම්ය. ඔහුගේ එක් අතක් පැත්තකට විසිවී, එහි ඇඟිලි මිට මෙලවී හැලහොල්මනක් නැතිව තිබිණි. අනෙක් අත දුබල ලෙස බල්ලා ගේ හිස මත රැඳුණේය. බල්ලාගේ කල්පනාවෙන් බරවූ නොඉවසුම් දෑස් ස්වාමියාගේ මුහුණ මත රැඳවී තිබුණු අතර ඒවා ද නිසල විය.

මිනිත්තුවෙන් මිනිත්තුවට කාලය ගෙවී ගියේය. ඉර බටහිර අහසේ තවත් පහළට ගිය අතර ගස් යට අඳුරු සෙවනැලි වඩාත් දිගු වන්නට විය. පොලියානා නිසලව හිටි තැනම වාඩිවී උන්නාය. ඇයට හුස්ම ගන්නට පවා අමාරු සෙයක් දැනිණි. කුරුල්ලෙක් ඇගේ අත පොවන මානයේ කිසිම බියක් නැතිව එහාටත් මෙහාටත් ඉගිලුණේය. ලේනෙක් ගසේ අත්තක සිට පොලියානාගේ නාසය අසලින්ම වාගේ උගේ පිම්බුණු වලිගය එහාටත් මෙහාටත් වැනුවේය. එහෙත් දීප්තිමත්, කුඩා ඇස් දෙකින් බලා සිටින බල්ලා තවමත් නිසලය.

sinhalaebooks.com

අන්තිමේදී බල්ලා කන් දෙක ඔසවා මෘදු ලෙස කෙඳිරි ගෑවේය. මොහොතක් ගත වන විට, පොලියානාට කටහඬක් ඇසුනු අතර අනතුරුව ඒ කටහඬවල අයිති කරුවෝ පෙනී සිටියහ. මිනිසුන් තිදෙනෙක් ආම්පන්න රැගෙන ඔවුන් වෙත එමින් සිටියහ.

ඔවුන් අතර සිටි හොඳින් රැවුල බා සිටි, කරුණාවන්ත ඇස් ඇති, උසැති මිනිසා දොස්තර කිල්ටන් විය යුතු යැයි පොලියානා සිතුවාය. ඔහු ප්‍රීතිමත් ලෙස ඉදිරියට එමින් සිටියේය.

"කොහොමද පුංචි නෝනා? නර්ස් කෙනෙක් වෙලා නේද?"

"අනේ නෑ සර්..."යි පොලියානා සිනාසුනාය.

''මං එයාගේ ඔලුව උකුල උඩ තියාගෙන හිටිය විතරයි. මං එයාට බෙහෙත් මොනවත් දුන්නෙ නෑ. ඒත් මෙතෙන්ට එන්න පුළුවං වෙච්ච එක ගැන මං සතුටු වෙනව...''

''මමත් එහෙමයි.'' වෛද්‍යවරයා හිස සලා තුවාල ලබා සිටි පෙන්ඩල්ටන් මහතා වෙත අවධානය යොමු කළේය.

# 14

# ජේලි පිළිබඳ කාරණාව

ජෝන් පෙන්ඩල්ටන්ට අනතුර සිදුවූ දා රෑ කෑමට පොලියානා ගෙදර ආවේ මදක් ප්‍රමාද වෙලාය. එහෙත් ඇයට කිසිවෙකුගෙන් බැනුම් අසන්නට නොවී බේරෙන්නට පුළුවන් විය.

sinhalaebooks.com

ඇයට දොර අසළ දී නැන්සි හමුවිය.

''අනේ! අනේ....! ඔයා දිහා ඇහැ ගහගෙන ඉන්න වෙච්ච එක ගැන මං සතුටු නොවුණා නං මීට හොඳයි....''යි ඇය සැනසුම් සුසුමක් හෙළුවාය.

''දැං වෙලාව හය හමාරයි.''

''මං දන්නවා...''යි පොලියානා අවුල් සහගත සිතින් කීවාය. ''ඒත් මට බනින්න හේතුවක් නෑ... ඇත්තටම නෑ. මං හිතන්නෙ

පොලී පුංචි අම්මත් එහෙම කියයි...."

"එයාට එහෙම කියන්න ලැබෙන්නෙ නෑ...." නැන්සි ආපිට කීවේ ලොකු තෘප්තියකිනි.

"එයා ගියා...."

"ගියා!"පොලියානාගේ කට ඇරිණි.

"එයා ගියෙ මං හින්ද නෙමේ නේද?" යි කී පොලියානා ගේ සිතේ මේ වන විට උදෑසන සිදු වූ කණගාටුදායක සිදුවීම් එකිනෙක දිග හැරෙමින් තිබුණි. වීදියේදී හමුවූ ළමයා, පූසා, බල්ලා සහ එකවරම කියවෙන්නට ගිය 'සන්තෝසය' සහ තහනම් වචනය වූ 'තාත්තා' (එය නිතරම වාගේ අමතක වන ඇගේ පුංචි දිවට නිකම්ම ඇදී ආවේය) "අනේ එයාව යැව්වෙ මං නෙමේ..."

"ඔයා කරපු දෙයක් නෑ...." යි නැන්සි සමච්චලයෙන් කීවාය. "බොස්ටන් පැත්තෙ ඉන්න එයාගෙ ඥාති සහෝදරියක් අන්ත්‍රාවෙලා. ඉතිං එයාට යන්න උනා. හවස ඔයා ගියාට පස්සෙ එයාට ටෙලිග්‍රෑම් එකක් ලැබුණා. තව දවස් දෙක තුනකට විතර එයා මෙහෙ එන එකක් නෑ. දැං මං හිතන්නෙ අපි ඔක්කොම ඒක ගැන සන්තෝස වෙන්න ඕන. ඔයයි මමයි එකතු වෙලා අද ඉඳන් ගේ බලා ගම්මු. අපි ඒක කරනවා ම යි! කරනවා ම යි!

පොලියානා තවමත් තිගැස්සී සිටියාය. "සන්තෝස? අනේ නැන්සි... මළ ගෙයක් තියෙද්දී!"

"ආ! මං සන්තෝස උණේ ඒක ගැන නෙමෙයි මිස් පොලියානා. ඒ..." නැන්සි එක් වරම නැවතුණාය. ඇගේ දෑස්වලට තුවණැති දීප්තියක් වැටිණි. "ඇයි මිස් පොලියානා, මට ඒ සෙල්ලම කරන්න ඉගැන්නුවෙ ඔයාම නේද?" ඇය කෑගෑවේය.

පොලියානා කරදරකාරී පෙනුමක් මවා ගනිමින් තළල රැලි

කර ගත්තාය.

''මට හිතාගන්න බෑ නැන්සි'' යි ඔලුව දෙපසට සොලවමින් ඇය කීවාය. ''සමහර දේවල් තියෙනවා ඒ සෙල්ලමට හරි යන්නෙ නැති. මං හිතන්නෙ මළ ගෙවල් කියන ඒවත් එහෙම එකක්. මළ ගෙදර කියන්නෙ සන්තෝස වෙන්න කිසිම දෙයක් නැති වෙලාවක්...''

නැන්සි කට තද කර ගෙන සිනාසුණාය.

''ඒක අපේ එකක් නොවුණ එක ගැන සන්තෝස වෙන්න පුළුවංනෙ.'' නැන්සි විරුද්ධ වෙමින් කීවාය. ඒත් පොලියානාට එය ඇසුණ බවක් පෙනුණේ නැත. ඇය පෙන්ඩල්ටන් මහතාට සිදුවූ අනතුර ගැන කියන්නට පටන් ගත් අතර, මද වේලාවකින් නැන්සිද කට ඇරගෙන එය අසා සිටින්නට වූවාය.

ඊළඟ දවසේ හැන්දෑ වරුවේදී පොරොන්දු වූ පරිදි පොලියානා ජිමී බීන් මුණ ගැසුණාය. ඇය සිතූ පරිදිම ජිමී බීන් කාන්තා සරණ සංගමයේ තීරණය ගැන අසා බලවත් බලාපොරොත්තු කඩවීමකට ලක් වුණේය. ''හොඳයි... දන්න දේවල්වලට වැඩිය නොදන්න දේවල් හොඳ වෙනවලු. මට හිතෙනව ඒ වගේ කවුරු හරි ඇතින් ඉන්න කෙනෙක් ගැන බලන්න. කොහොමද, ඉන්දියාවෙ ඉන්න කෙනෙකුට මාව ඕන උණොත්, ඇත්තටම ඒක හොඳ නැද්ද?''

පොලියානා අත්පුඩියක් ගැසුවාය.

''ඇයි නැත්තෙ? ඇත්තටම! ඒක තමයි හරිම විදිහ ජිමී. 'මගේ' කාන්තා සරණ සංගමේ කට්ටියට ලියන්නං ඒ ගොල්ලො ඉන්නෙ ඉන්දියාවෙ නං නෙමේ. බස්නාහිර පළාතෙ. ඒත් මෙහෙ ඉඳං එහාට සෑහෙන්න දුරයි. හරියටම ඔයා කිව්ව වගේ තමා. මං වගේ දුර ගෙවාගෙන එහෙ ඉඳන් මෙහාට ආව නං, ඔයත් එහෙම කියයි මගෙ හිතේ...''

ජිමීගේ මුහුණට එළිය වැටිණි.

ඔයා හිතන්නෙ ඒගොල්ලො....... ඇත්තටම මාව බාර ගනීද?'' යි ඔහු ඇසුවේය.

''ඇත්තටම ඒ ගොල්ලො එහෙම කරයි. ඒ ගොල්ලො ඉන්දියාවෙ ළමයි හදා ගන්න ගත්තෙ නැද්ද? හොඳයි ඒ ගොල්ලන්ට පුළුවන් නෙ ඔයා ඉන්දියාවෙ ඉඳං ගෙනාව කියල පෙන්නන්න. මං හිතන්නෙ ඒ ගොල්ලන්ගෙ රිපෝට් එකට ලියන්න තරම් සෑහෙන දුරක නෙ ඔයා ඉන්නෙ. ඔහොම ඉන්නකො, මං එයාලට ලියන්නං. මං මිසිස් වයිට්ට ලියන්නං. නෑ. මං ලියන්නෙ මිසිස් ජෝන්ස්ට. මිසිස් වයිට්ට ගොඩක් සල්ලි තිබුණට දෙන්නෙ නෑ. ඒත් මිසිස් ජෝන්ස්ට එච්චර නැති උනාට එයා තමා වැඩියෙන්ම වියදං කරන්නෙ. හරි විහිලු වැඩක් නේද... ඒ ගැන හිතන කොට? ඒත් මං හිතන්නෙ නං ඒ ගොල්ලං ගෙං කවුරු හරි ඔයාව බාර ගනීවි.''

'' හරි... ඒත් අමතක කරන්ඩ එපා, මං වැඩ කරල දෙන්ඩ ලෑස්තියි කියන එක.'' යි ජිමී කීයේය. ''මං හිඟන්නෙක් නෙමේ. ගනුදෙණු නං ගනුදෙණු. ඔය කාන්තා සරණෙ එක්කත් එහෙමයි හරිද?'' ඔහු මදක් නැවතී සිට යළි කතා කළේය.

''එහෙනං. මං හිටපු තැනම ඉන්නං... පණිවිඩයක් හම්බුවෙන කං....''

''ඇත්තටම'' යි පොලියානා උනන්දුවෙන් හිස සැලුවාය. ''එතකොට මං දන්නවෙන... ඔයා හම්බවෙන්න පුළුවන් කොතනදිද කියල. ඒ ගොල්ලො ඔයාව බාර ගනී. ඒකට ඔයා ඉන්න දුරත් හරි යනව. පොලී පුංචි අම්මත් මාව....!'' යි එක්වරම කියමින් සිටි දේ නැවැත්වූ පොලියානා ''ඔයා හිතන්නෙ පොලී පුංචි අම්ම මාව ඉන්දියාවෙන් ගෙනාව කියලද?''

''හොඳයි... ඔයා ඔය තරං අමුතු ළමයෙක් නොවුණ නං එහෙම හිතයි...'' යි විරිත්තූ ජිමී ආපිට හැරී දිව්වේය.

පෙන්ඩල්ටන් වන රොද තුළ සිදුවූ අනතුරෙන් සතියකට පමණ පසුව, එක් උදෑසනක පොලියානා ඇගේ පුංචි අම්මා ඇමතුවාය.

"පුචි අම්මෙ.... කරුණාකරල කියන්න, මේ සැරේ මිසිස් ස්නෝට ගෙනියන ජෙලි එක, වෙන කෙනෙකුට ගෙනිච්චට කමක් නැද්ද කියල... මේ සැරේට විතරක්.... මිසිස් ස්නෝට ඒක ඕන නැති වෙයි...."

"මගෙ දෙයියනේ... පොලියානා.. ඒ සැරේ මොකකටද එන්න හදන්නෙ..."යි ඇගේ පුංචි අම්මා සුසුම් ලෑවාය. "ඔයා නං මහ අසාමාන්‍ය ළමයෙක්." පොලියානා නළල රැලි කර ගත්තාය.

"පුංචි අම්මෙ... මොකද්ද 'අසාමාන්‍ය' කියන්නෙ. කවුරු හරි අසාමාන්‍ය කෙනෙක් වුණොත් ඒ කියන්නේ එයා සාමාන්‍ය නෑ කියන එකද? එහෙමද?"

"ඔව් එහෙම තමයි."

"ආ! එහෙනං කමක් නෑ. මං සතුටු වෙනව, මම අසාමාන්‍ය කෙනෙක් වෙච්ච එකට..." යි පොලියානා සුසුමක් හෙලුවාය. ඇගේ මුහුණ නැවත වතාවක් දීප්තිමත් විය. "ඔයා දන්නවද ඉස්සර මිසිස් වයිට් කියනවා. මිසිස් රෝසන් හරිම සාමාන්‍ය කෙනෙක් කියල... එයා මොකක් හරි හේතුවක් හින්ද මිසිස් රෝසන්ට කැමති නෑ. ඒ ගොල්ලො නිතරම රණ්ඩු උණා... මං කිව්වෙ තාත්තා... නෑ මං කියන්නෙ කාන්තා සරණ සංගමේ අනිත් අයගෙ රණ්ඩු බේරනවට වැඩිය, අපිට ඒගොල්ලන්ගෙ රණ්ඩු බේරන්න හරිම අමාරු උණා...." යි වැරදෙන්නට ගිය තැන් නිවැරැදි කරමින් කතා කළ පොලියානාට තාත්තා ගැන කතා කළ විට පුංචි අම්මා ගෙන් ලැබෙන ප්‍රතිචාරය ගැන මතක් වී හුස්ම නැවතෙන්නට ගිය තරම්.

"ඔව්... ඔව් හොඳයි.. කමක් නෑ..." පොලී පුංචි අම්මා නොඉවසිල්ලෙන් අතරමැද්දට පැන්නාය.

"ඔයා තව ටිකක් ඔහොම කියවයි පොලියානා! මොනව කතා

sinhalaebooks.com

කරන්න ගියත් ඔයාගෙ වැඩේම ඔය 'කාන්තා සරණ' සංගමේ ගැන කියවන එකනෙ.''

''ඔව්.....''යි පොලියානා ප්‍රීතිමත් සිනාවක් පෑවාය.

''මං හිතන්නෙ මං එහෙම කරනව ඇති. ඒත් ඔයා දන්නවනෙ ඒ ගොල්ලො තමයි මාව හදා ගත්තෙ...''

''ඔය ඇති පොලියානා....'' හැඟීම් විරහිත බාධා කිරීමක් ඇසිණ. ''දැන් කියන්න.. මොකද්ද ඔය ජෙලි කතාව...''

''මුකුත් නෑ පුංචි අම්මෙ... ඇත්තටම ඔයාට හිතන්න තරං දෙයක් නෑ. මට විස්වාසයි, ඔයා මිසිස් ස්නෝට ජෙලි අරන් යන්න ඉඩ දුන්නනෙ. ඉතිං ඒ වගේ මං මේ කියන්න හදන කෙනාටත්, එක සැරයක් විතරක් එහෙම කරන්න ඔයා ඉඩ දෙයි. කකුල තුවාල වෙනවයි කියන්නෙ හැමදාම හොඳ නොවී තියෙන එකක් නෙමේනෙ. ඉතිං, මිසිස් ස්නෝට කරනව වගේ එයාට හැමදාම සළක්න ඕන වෙන්නෙ නෑ... එක සැරයක් දෙසරයක් ඇරෙන්න....''

''කවුරු ගැනද ඔයා මේ කියන්නෙ.. කකුල තුවාල වෙලා! මොනවද පොලියානා මේ කියවන්නෙ...''

පොලියානා දෑස් අයා ගත්තාය. ඊට පසු ඇගේ මුහුණට සැනසිලි සහගත පෙණුමක් ලැබිණි.

''ආ! මට අමතක උනා. ඔයා ඒක ගැන දන්නෙ නෑනෙ. ඒක උනේ ඔයා අර ගමන ගිය අතරෙ. ඔයා ගිය දවසෙම තමයි, මට එයාව අර කැලෑවේදි හම්බ වුණේ. ඔයා දන්නවද මම තමයි, එයාගෙ ගෙදර දොර ඇරගෙන ගිහිං, දොස්තරට ටෙලිෆෝන් කරල එන්න කිව්වෙ. එයාගෙ ඔලුව තියාගෙන හිටියෙත් මගෙ උකුල උඩ. ඔය හැමදේම කරල ආවට, මට එදාට පස්සෙ එයාව එක සැරයක් වත් දකින්න බැරි උණා. ඒත් මිසිස් ස්නෝට ගෙනියන්න කියල නැන්සි ජෙලි හදපු වෙලාවෙ මට හිතුනා, එක වතාවක් විතරක් එයාටත් එහෙම දෙයක් ගෙනිහින් දෙන්න පුළුවන් නං කොච්චර හොඳ ද

කියල. පුංචි අම්මෙ. ඉතිං මං ගෙනියන්නද?''

''ඔව්... ඔව්, එහෙම කරන්න පුළුවන්...'' විඩාවට පත්ව සිටි පොලී මෙනෙවිය කීවාය. ''එයා කවුරු කියලද ඔයා කිව්වෙ...?''

''පිරිමි කෙනෙක්. මං කියන්නෙ එයා මිස්ට ජෝන් පෙන්ඩල්ටන්...''

පොලී මෙනෙවිය හිඳ සිටි පුටුවෙන් විසි වෙන්නට ගිය තරම්.

''ජෝන් පෙන්ඩල්ටන්!''

''ඔව්... නැන්සි තමයි එයාගෙ නම කිව්වෙ. මං හිතන්නෙ ඔයත් එයාව දන්නව ඇති...''

පොලී මෙනෙවියට ඊට උත්තර දුන්නේ නැත. ඒ වෙනුවට ''ඔයා දන්නවද එයාව'' යි ඇසුවාය.

sinhalaebooks.com

''අනේ ඔව්... එයා දැන් හම්බ වුණාම කතා කරනව... හිනාවෙනවා. එයා නපුරුයි වගේ පේන්නෙ පිටට විතරයි, දන්නවද? මං දැං ගිහින් ජෙලි එක ගේන්නං. මම මෙතෙන්ට එනකොට නැන්සි ඒක හදල ඉවර වෙන්න ලං වෙලා තිබුණෙ'' යි කියා හමාර කළ පොලියානා ඒ වන විටත් කාමරය හරහා බාග දුරක් දිව ගොස් තිබුණාය..

''පොලියානා! ඔහොම ඉන්නවා.'' හදිසියේම පොලී මෙනෙවිය ගේ කට හඬ තියුණු ස්වරයක් ගෙන තිබුණි.

''මං අදහස වෙනස් කළා. මං හිතන්නෙ අදත් මිසිස් ස්නෝට ජෙලි එක ගිහින් දුන්නොත් හොඳයි. එච්චරයි. දැන් යන්ඩ පුළුවං....''

පොලියානාගේ මුහුණ එල්ලා වැටිණි.

''අනේ ඒත් පුංචි අම්මෙ.. එයාගෙ ලෙඩේ හැමදාමත් තියෙන එකක් නෙ. එයා හැම තිස්සෙම ලෙඩ වෙලා නිසා ගොඩක් දේවල් ලැබෙනවා. ඒත් අරයට තියෙන්නෙ තුවාල වෙච්ච කකුලක් නෙ. ඒ කකුල් හැමදාම තියෙන එකක් නෑ... මං කිව්වෙ තුවාලෙ. දැනටමත් ඒක වෙලා සතියක් පහුවෙලා...''

''ඔව්. මට මතකයි. මට ආරංචි උණා ජෝන් පෙන්ඩල්ටන්ට කරදරයක් වෙලා කියල...'' යි පොලී මෙනෙවිය තරමක් තදින් උත්තර දුන්නාය. ''ඒත් මං කැමැති නෑ ජෝන් පෙන්ඩල්ටන්ට ජෙලි ගිහින් දෙනවට පොලියානා!''

''මං දන්නවා. එයා නපුරුයි වගේ පෙනුණට එහෙම නෑ...'' යි දුක්බර ලෙස එක් කළ පොලියානා, ''ඔයා ඒක නිසා වෙන්නැති එයාට අකමැති. ඒත් ඒක එව්වෙ ඔයා කියල මං කියන්න යන්නෙ නෑ. මං කියන්නං, ජෙලි එක ගෙනාවෙ මං තනියෙන්ම හිතල කියල. මං එයාට කැමතියි. එයාට ජෙලි ගිහින් දෙන්න ලැබෙනව නං ඒක මට සතුටක්.''

පොලී මෙනෙවිය නැවතත් ඔලුව දෙපසට වැනුවාය. ඊට පසු හදිසියේම නැවතුනු ඇ, කුතුහලය දනවන තැන්පත් ස්වරයකින් මෙසේ ඇසුවාය.

''එයා දන්නවද ඔයා කවුද කියල පොලියානා...''

කුඩා ගැහැනු ළමයා සුසුම් හෙලනු පෙනුණි.

''මං හිතන්නෙ නෑ. මං එයාට එක සැරයක් මගේ නම කිව්වා. ඒත් එයා කවදාවත් මට නම කියල කතා කළේ නෑ... කවදාවත් ම නෑ...''

''එයා දන්නවද ඔයා ඉන්නෙ කොහෙද කියල... එයා දන්නෙ නැතුව ඇති නේද... ඔයාගෙයි, මගෙයි තියන නෑදෑකම....''

"මං හිතන්නෙ නෑ..."

මොහොතක පමණ නිහැඬියාවක් පැතිරුණි. පොලී මෙනෙවියගේ දෑස් පොලියානා වෙත හැරවී තිබුණු නමුත් ඇය වෙන මොකක්දෝ කල්පනාවක සිටින බව පෙණිනි. කුඩා ගැහැනු ළමයා ඒ කකුලටත් මේ කකුලටත් බර වෙමින් නොඉවසිල්ලෙන් සුසුම් ලමින් සිටියාය. ඊට පසු පොලී මෙනෙවිය නැගී සිටිමින් ආරම්භයක් ගත්තාය.

"හොඳයි. පොලියානා..." ඇය අන්තිමේදී කීවාය. තවමත් ඇගේ කටහඬේ අමුතු ස්වරය නොවෙනස්ව පැවතුණි. එය හරියටම ඇගේ කටහඬ මෙන් නොවීය. "ඔයාට පුලුවන්.. ඔයාට පුලුවන්, ඔයාගෙම තෑග්ගක් විදිහට ඔය ජෙලි එක මිස්ට පෙන්ඩල්ටන්ට ගිහිං දෙන්න. ඒත් මතකයි නෙ. මම එහෙම ඕකට ගෑවිලාවත් නෑ. එයාට මං එව්වා කියල හිතන්ඩ ඉඩ දෙන්නත් එපා... හොඳට මතක තියාගන්න..."

sinhalaebooks.com

"හා... පුංචි අම්මෙ. ගොඩක් ස්තුතියි." පොලියානා දොරින් එළියට ඉගිලී යන අතරේ හඬ ගෑවාය.

# 15

# දොස්තර කිල්ටන්

ජෝන් පෙන්ඩල්ටන් මහතාගේ මහා මන්දිරයට පොලියානා දෙවැනි වරට ගිය මොහොතේදී එය පළමු වතාවට වඩා බෙහෙවින් වෙනස් වී ඇති බව පෙනුණි. ජනෙල් ඇර දමා තිබුණු අතර, වැඩිහිටි කාන්තාවක් තිවසේ පිටුපස කොටසේ රෙදි වනමින් උන්නාය. දොස්තරගේ අශ්ව කරත්තය පෝටිකෝව යට නවතා තිබිණි.

පොලියානා සුපුරුදු පරිදි පැත්තෙන් තිබූ දොර වෙත ගියාය. අද ඇගේ අත එදා මෙන් යතුරු කැරැල්ලකට සිරවී තිබුණේ නැති බැවින් ඇය සීනුව නාද කළාය.

පුරුදු පෙනුමක් තිබූ කුඩා බල්ලෙක් ඇය පිළිගන්නට මහත් උද්යෝගයෙන් දිව ආයේය. මඳ පමාවකට පසු රෙදි වනමින් උන් කාන්තාව පැමිණ දොර හැරියාය.

''මම ජෝන් පෙන්ඩල්ටන් මහත්මයට ජෙලි එකක් ගෙනාවා'' යි පොලියානා මදහසක් පෑවාය.

''ස්තූතියි'' යි කී කාන්තාව, පොලියානා අත තිබූ බඳුන ගන්නට අත දිගු කළාය. ''මේක එව්වෙ කවුරු කියලද මං කියන්නෙ...''

මේ මොහොතේදී ශාලාව දෙසට එමින් සිටි දොස්තර මහතා, පොලියානාගේ බලාපොරොත්තු කඩ වූ මුහුණ දැක්කේය. ඔහු ඉක්මන් ගමනින් එතැනට ආවේය.

''ආ! ජෙලිද?'' යි ඔහු ප්‍රීතිමත් ස්වරයෙන් ඇසීය.

''කොච්චර හොඳද? ඔයා සමහර විට අපේ ලෙඩාව බලන්න කැමති ඇති නේද?''

''අනේ ඔව් සර්...'' පොලියානා ප්‍රීතියෙන් පිම්බී ගියාය. ඊට පසු අර කාන්තාව දොස්තර මහතාගේ හිස සැලීමට කීකරු වෙමින් පොලියානා ගෙතුළට කැඳවාගෙන යන්නට වූවාය. එහෙත් ඇගේ මුහුණෙන් දිස් වුණේ ඇය ඉතා පුදුමයට පත් වී ඇති බවකි.

දොස්තර මහතාට පිටුපසින් සිටි තරුණයෙක් (ළඟම ඇති නගරයේ සිට පැමිණි පුහුණු හෙද සේවකයෙක්) පුදුමය පළ කරන හඬක් නැඟුවේය.

''ඒත්... ඩොක්ටර්, මිස්ට පෙන්ඩල්ටන් කිව්වෙ නැද්ද කාටවත් ඇතුළට එන්න දෙන්න එපා කියල?''

''ආ... ඔව් තමයි'' දොස්තර මහතා ශාන්තව හිස සැලුවේය. ''ඒත් දැන් එහෙම කරන්න කියල කියන්නෙ මමයි. මම වගකීම බාර ගන්නං...'' යි කී ඔහු හදිසියේ පහළ වූ කල්පනාවකින් මෙන් ''ඔයා දන්නෙ නෑ.. මේ පුංචි ගෑනු ළමයා බෙහෙත් ගැලුමකට වැඩිය හොඳයි. වෙන කිසිම දේකටවත්, කිසිම කෙනෙකුටවත් අද හැන්දෑවෙ

පෙන්ඩල්ටන් ගෙ අවධානය ගන්න බැරි උණත්, මේ ළමයට පුළුවං. ඒකයි මං එයාව යැව්වෙ..,''

''කවුද එයා.''

කෙටි නිහඬතාවයක් පැතිරුණු අතර දොස්තර මහතා පිළිතුරු දෙන්නට මදක් පැකිලුණේය.

''අපි හොඳටම දන්න අසල්වැසියෙක් ගෙ නෑදෑ වෙන දුවක්. එයාගෙ නම පොලියානා විටියර්. මට තාමත් ඔය පුංචි තෝනත් එක්ක හොඳට කතා බහ කරල දැන අඳුන ගන්න නං බැරි උණා. ඒත් මගේ ලෙඩ්ඩු නං එහෙම කරල තියෙනව. ඒගොල්ලන්ට ස්තුති වෙන්න ඕන...''

හෙද සේවකයා සිනාවක් නැගුවේය.

''ඇත්තට! ඉතින් මොකද්ද ඔය ළමය ළඟ තියෙනවැයි කියන 'පුදුම බේත'?''

දොස්තර මහතා හිස දෙපසට වැනුවේය.

''මං දන්නෙ නෑ. මං හිතන්නෙ ඒ ළමයා ළඟ තියෙන ගති ගුණයක්.... ඒ කියන්නෙ සිද්ධ වුණ දෙයක් ගැන හරි සිද්ධවෙන්න යන දෙයක් ගැන හරි ඒ ළමයා පුදුමාකාර විදියට සන්තෝස වෙනව. ඒ ළමය කිව්ව කතා මම කොච්චරවත් අහල තියෙනව... වෙන අයගෙන්. මට පෙනුණ හැටියට ඒ ළමය හැම තිස්සෙම කියන්නෙ හැම දෙයක් ගැන ම ''සන්තෝසෙන් ඉන්න'' කියලලු '' යි කී දොස්තර මහතා අමුතු සිනහවක් පාමින් ආලින්දයට පා තැබුවේය. ''මට හිතෙනව, මට එයාව නියම කරන්න පුළුවන් නං.. අර ගන්න පුළුවන් නං.. බෙහෙත් පෙති වගේ, ඔයාටයි මටයි එතකොට හෙදකමෙනුත්. දොස්තර කමෙනුත් හොයන සල්ලිවලින් හිතෙන හිතෙන දේ කරන්න පුළුවං වෙයි.''

මේ අතර වාරයේ පොලියානා, දොස්තර මහතාගේ නියමය පරිදි, ජෝන් පෙන්ඩල්ටන් මහතාගේ කාමරය වෙත කැඳවාගෙන යමින් සිටියාය.

ඇය ඇතුලු වූ සාලාව කෙළවරේම විශාල පුස්තකාලය පිහිටි අතර, ඉක්මන් ගමනින් ඒ හරහා යන අතරේ වුවද, පොලියානා එහි ඇති වී තිබූ වෙනස්කම් හැඳින්නාය. පොත් රාක්කය සහ තිර රෙදි ඒ ආකාරයටම තිබුණු නමුත් බිම කුණු බිඳක්වත් තිබුණේ නැත. ඇස ගැටෙන මානයේ දූවිලි පොදක් නැති තරමට හැම තැනම පිරිසිදු වී ය. මේසය ද ඉතා පිළිවෙළට සකසා තිබිණි. ටෙලිෆෝන් අංක සහිත කාඩ් පත නියම තැන එල්ලා තිබූ අතර, පිත්තල ඇන්ඩිරෝනය හොඳ හැටි ඔප නංවා මැද තිබුණි. එදා පොලියානා දුටු එක් අබිරහස් දොරක් අද ඇර දමලාය. කාන්තාව ඇය කැඳවාගෙන ගියේ එයින් විවර වූ මග ඔස්සේය.

මද වේලාවකට පසු ඉතා අනර්ඝ ගෘහ භාණ්ඩ සහිත කාමරයක් තුළ තමන් සිටිනු දුටු පොලියානාට කාන්තාවගේ වෙව්ලන කටහඬ ඇසිණි.

sinhalaebooks.com

''සර් කරුණාකරල බලන්න මේ... ගෑනු ළමයෙක් ඉන්නවා කෑමක් අරං ඇවිත්. දොස්තර මහත්තය කිව්වා එයාව මෙහාට... එක්කගෙන එන්න කියල...''

ඊළඟ මොහොතේ පොලියානාට පෙනුණේ, නපුරු මුහුණක් සාදාගෙන, ඇඳේ වැතිරී සිටින මිනිසෙකු සමඟ කාමරයේ තමන් තනිවී ඇති බවය.

''මේ බලනවා... මං කිව්වෙ නැද්ද...'' කෝපයෙන් කතා කරන හඬක් නැගී ආවේය. ''ආ! ඔයානෙ!'' පොලියානා ඇඳ අසලට කිට්ටුවෙන විට එය වඩාත් කෘතඥ පූර්වක හඬක් බවට පෙරළිණි.

''ඔව් සර්...'' යි පොලියානා මදහසක් පෑවාය.

''අනේ මට හරි සතුටුයි ඒ ගොල්ලෝ මට එන්න ඉඩ දුන්නට. ඔයා දන්නවද? අර ගෑනු කෙනා මගේ අතේ තිබුණ භාජනේ ගත්තම ගියා. ඉතිං, මම ගොඩක් බය උණා මට ඔයා බලන්න බැරිවෙයි කියල. ඊට පස්සෙ තමයි දොස්තර ඇවිත් කිව්වෙ මට යන්ඩ පුළුවං කියල. මට මෙතෙන්ට එන්න දෙන්න තරං එයා කොයිතරං හොඳද නේද?''

පෙන්ඩල්ටන් මහතාගේ මුවෙහි සිනහවක් ඇඳෙන්නට ගිය අතර, ඔහු වහා දෙතොල් තද කොට ගෙන ''හ්ම්'' යි කීවේය.

''මං ඔයාට ජෙලි එකක් ගෙනාවා'' යි පොලියානා නැවත වතාවක් කීවාය. ''කාෆ්ස් ෆුට් ජෙලි, මං හිතනවා ඔයා ඒවට කැමතියි කියල?'' ඇගේ කටහඬේ ස්වරය නැගී එමින් තිබිණි.

''කවදාවත් කාල නෑ...'' පෙන්ඩල්ටන් මහතා ගේ මුහුනේ ඇඳෙමින් තිබූ සිනාව මැකී ගියේය. ඔහු බුම්මා ගත්තේය.

ක්ෂණයකින් පොලියානාගේ මුහුනේ බලපොරොත්තු කඩවූ සේයාවක් ඇඳුණ අතර, ඇය ජෙලි බඳුන මේසය මත තබන විටම වාගේ එය නැතිවී ගියේය.

''කාල නැද්ද? හොඳයි කාල නැත්තං, ඔයා දන්නෙ කොහොමද ඔයා ඒකට කැමති නෑ කියල. ඇත්තටම එහෙම කියන්න පුළුවං ද? ඉතින්, මට නං සතුටුයි ඔයා ඒවා කාල නැති එක ගැන, අන්තිමේදී, දැන් ඔයා දන්නව නං...''

''ඔව් ඔව්.. හොඳයි. මං දැනටමත් එක දෙයක් නං දන්නව. මං මේ මොහොතෙ ඇඳේ දිගාවෙලා ඉන්නවා. මට හිතෙන විදියට ලෝක විනාසෙ වෙන කල්ම මට මෙහෙමම ඉන්ඩ වෙයි.!''

පොලියානා තැති ගත් බවක් පෙනුණි.

''අනේ... නෑ ලෝක විනාසෙ වෙන කල් නං ඉන්ඩ වෙන

එකක් නෑ. ඔයා දන්නවද බයිබලේ කියල තියෙන්නෙ ඒක අපි හිතනවට වැඩිය ඉක්මනට ළඟා වෙනව කියල. ඒත් මම එහෙම හිතන්නෙ නෑ, ඒ මොකද... මං බයිබලේ විශ්වාස කළත්, මම හිතන්නෙ නෑ ඔය තරං ඉක්මනට ඒක ළඟාවෙයි කියල, ඒක මේ දැන් වෙනව උණත්...''

ජෝන් පෙන්ඩල්ටන් හදිස්සියේම, මහ හයියෙන් සිනාසුණේය. ඒ වෙලාවේ එදෙසට එමින් සිටි හෙද සේවකයාට සිනා හඬ ඇසුණ අතර, ඔහු නැවතී නිශ්ශබ්දව, එහෙත් ඉක්මනින් පසුපසට ගියේය. ඔහුට දැනුණේ පෝරණුවේ ඇති බාගෙට පිච්චුණු කේක් ගෙඩියකට සුලං වැදී නරක් වෙතැයි සිතා, ඉක්මනින් පෝරණුවේ දොර වසා දමන කෝකියකු තුළ ඇතිවන හැඟීමය.

''ඔයාට පොඩ්ඩක් පැටලිලා නේද?'' යි ජෝන් පෙන්ඩල්ටන් පොලියානාගෙන් ඇසුවේය.

ගැහැනු ළමයා ද හයියෙන් සිනාසුණාය.

sinhalaebooks.com

''සමහර විට. ඒත් මං කියන්න හැදුවෙ ඔය කකුල වැඩි කල් තියෙන එකක් නෑ... ඒ කිව්වෙ තුවාල වෙච්ච එක හොඳද... ඒවා ජීවිත කාලෙටම නැති වෙච්ච දේවල් නෙමේ... හරියට මිසිස් ස්නෝට වුණා වගේ. ඉතිං ලෝක විනාසෙ වෙන කල් ඔයාට ඔහොම ඉන්න වෙන එකක් නෑ, කොහොමටත්, මම හිතන්නෙ ඔයා ඒ ගැන සතුටු වෙන්න ඕන...''

''ආ! ඔව් නේන්නං...'' පෙන්ඩල්ටන් මහතා සැරෙන් කීවේය.

''ඔයාගෙ කැඩුණෙ එක කකුලයි. ඔයා සන්තෝස වෙන්න කකුල් දෙකටම මොනව හරි උණේ නැති එක ගැන...'' පොලියානා ඇගේ මතයට තව තවත් පෝර දමමින් උන්නාය.

''අනේ ඇත්තටම... ඒක කොයිතරං වාසනාවක්ද?'' පෙන්ඩල්ටන් මහතා ඇස් බැම් උඩට ඔසවා හුස්මක් ඉහලට ඇද

ගනිමින් කීවේය. ''ඔහොම බලාගෙන යනකොට මට හිතෙනව මං පත්තෑයෙක් වෙලා, කකුල් පනහක් කැඩිච්ච නැති එක ගැනත් සන්තෝස වෙන්න ඕන කියල..''

පොලියානා කට තද කරගෙන හිනැහුණාය.

''ආ! ඒක තමයි හොඳම දේ! ඇය පාරම් බෑවාය. ''මං දන්නව පත්තෑයා මොන වගේද කියල. ඌට කකුල් ගොඩාක් තියෙනවා. ඔයාට සතුටු වෙන්න පුළුවන්...''

''ආ! ඇත්තටම'' යි තියුණු හඬින් බාධා කළ පෙන්ඩල්ටන් මහතාගේ මුහුණට පැරණි නපුරු පෙනුම ආදේශ වෙමින් තිබුණි. ''මට සන්තෝස වෙන්න පුළුවන්... ඔය ඔක්කොම ගැන. නර්ස් ගැන. ඩොක්ටර් ගැන, අර කුස්සියෙ වැඩට ගත්ත ගෑනි ගැන.''

''ඔව් සර්. ටිකක් හිතන්නකො. ඒ ගොල්ලෝ හිටියෙ නැත්තං තත්වෙ කොච්චර නරක් වෙයිද?''

''හොඳයි මම.. මොකක්?'' ඔහු නොතේරුණ බවක් ඇඟවීය.

''ඇයි? මං කිව්වෙ ඒ ගොල්ලො හිටියෙ නැත්තං ගෙවෙන කල දසාව කොයිතරං නරකද කියන එක ගැන විතරක් හිතන්න කියල. ඔයාට කවුරුත් උදව්වට නැතුව මෙහෙම වැතිරිලා ඉන්න වෙයි...''

''හරියට ඔයා කියන්නෙ ඒක මේ ඔක්කොටම මුල නෙමෙයි වගේ නෙ..'' පෙන්ඩල්ටන් මහතා විරුද්ධ වෙමින් කීයේය. ''මට මේ වගේ ඇඳේ දිගා වෙලා ඉන්න වුණු පළියට, ඔයා හිතන්නෙ මං සන්තෝස වෙන්න ඕන කියලද? අර මෝඩ ගෑනි ගේ අස් කරනව කිය කියා මුලු ගෙදරම අනිත් පැත්ත හරවපු එකට.. හෙදකම කරනව කිය කිය තවත් මනුස්සයෙක් එයාට උදව් කර කර මේක අස්සට වෙලා ඉන්නකොට.... ඒ දෙන්නම උසිගන්වන දොස්තර කෙනෙකුත් ඉන්නකොට.... ඔය හැමෝම මම ඒ ගොල්ලන්ට ගෙවයි කියල.

හොඳට ගෙවයි කියල හිතාගෙන ඉන්නකොට... එහෙමද?''

පොලියානා දුකෙන් මෙන් නළල රැලි කරගත්තාය. ''ඔව්. මං දන්නව. ඔය පැත්ත නං ඒ හැටි හොඳ නෑ... සල්ලි ගැන හිතන කොට නං. ඔයා මෙච්චර කල් ඉතුරු කළා නෙ නේද?''

''කවදද...! ආ...''

''ඉතුරු කළා නේද...? බෝංචියි, මාළුයි කකා... කියන්න, ඔයා බෝංචිවලට ආසද...? එහෙම නැත්තං කළුකුම් මස්වලට ඊට වඩා කැමතිද...? සල්ලි වියදං වෙන නිසාද ඒවා කන්නෙ නැත්තෙ?''

''මේ බලන්න ළමයො. ඔයා මොනවද මේ කියවන්නෙ..''

පොලියානා දීප්තිමත් සිනාවක් පෑවාය.

''මං කතා කරන්නෙ ඔයාගෙ සල්ලි ගැන...දන්නවද? ඔයා ගැනවත් හිතන්නෙ නැතුව, ඔයා මිථ්‍යාදෘෂ්ටිකයො වෙනුවෙන් ඒවා ඉතුරු කරනවා. ඔයා දන්නවද.. මං ඒවා ඔක්කොම හොයා ගත්තා. ඇයි මිස්ට පෙන්ඩල්ටන් ඔයා ගෙ හිත නපුරු නෑ කියල මං දැනගත්තෙ ඔය වගේ දේවල්වලින් තමයි. නැන්සි මට ඔය ඔක්කොම කිව්ව....''

sinhalabooks.com

පෙන්ඩල්ටන් ගේ කට වැසිණි.

''නැන්සි ඔයාට කිව්ව මම සල්ලි ඉතුරු කරනවා කියලා! හොඳයි, මං අහන්නද කවුද ඔය නැන්සි කියන්නෙ කියල...''

''අපේ නැන්සි. එයා පොලී පුංචි අම්ම ළඟ වැඩට ඉන්න එක්කෙනා...''

''පොලී පුංචි අම්ම! හොඳයි, කවුද පොලී පුංචි අම්ම කියන්නෙ.''

''එයා තමයි මිස් පොලී හැරින්ටන්. මං ඉන්නෙ එයාගෙ

ගෙදර....''

පෙන්ඩල්ටන් මහතා සෙලවෙන්නට තැත් කළේය.

''මිස්.. පොලී... හැරින්ටන්!'' යි ඔහු හුස්මක් අල්ලා ගත්තේය. ''ඔයා ඉන්නෙ එයත් එක්ක!''

''ඔව් මං එයාගෙ අක්කගෙ දූ. ඔයා දන්නවද, එයා මාව හදාගන්න ගත්තෙ මගේ අම්ම වෙනුවෙන්...'' යි පොලියානා සිහින් සරයෙන් ගොත ගැසුවාය. ''තාත්ත අම්මයි, අනිත් හැමෝම එක්ක එකතු වෙන්න ස්වර්ගෙට ගියාට පස්සෙ... මට කාන්තා සරණ සංගමේ කට්ටිය ඇරෙන්න කවුරුත් ඉතුරු උණේ නෑ. ඉතිං පුංචි අම්ම මාව හදා ගත්ත..''

පෙන්ඩල්ටන් මහතා පිළිතුරක් දුන්නේ නැත. කොට්ටය මත ඔලුව තබා ගත් ඔහුගේ මුහුණ දැන් සුදුමැලි වෙමින්.. ඉතා සුදුමැලි වෙමින් තිබුණු අතර ඉන් පොලියානා තැති ගත්තාය. ඇය සැකයෙන් මෙන් නැගී සිටියාය.'' මං හිතන්නෙ.. මං දැන් ගියොත් හොඳයි...'' ඇය කියා සිටියාය. ''මම...මම හිතනවා ඔයා ජෙලි එකට කැමති වෙයි කියල...''

පෙන්ඩල්ටන් මහතා හදිසියේ ම හිස හරවා, ඇස් දෙක ඇර බැලුවේය. පුදුමයකට මෙන් ඒවායේ කුතුහලය දනවන, මහත් ආසාවෙන් බරවූ බැල්මක් රැඳී තිබෙනු පොලියානා දුටුවාය.

''ආ! එහෙමද...? ඔයා මිස් පොලී හැරින්ටන් ගෙ අක්කගෙ දූ..''

''ඔව් සර්...''

තවමත් ඔහුගේ දෑස් පොලියානාගේ මුහුණ මත රැඳවී තිබිණි. අන්තිමේදී පොලියානා ඇගේ සිතට යාන්තමට වාගේ අසහනකාරී හැඟීමක් මෝදු වන්නට වූ විට පහත් හඬින් කෙඳිරුවාය.

''මම... මම හිතන්නෙ ඔයා එයාව දන්නව ඇති...''

ජෝන් පෙන්ඩල්ටන් මහතා ගේ දෙතොල් අතර අමුතු සිනහවක් ඇඳී ගියේය.

''ආ... ඔව්. මං දන්නව එයාව'' යි ඔහු මදක් පැකිලෙමින් කියා, අර අමුතු සිනාවත් සමඟම නැවතත් කතා කරගෙන යන්නට වී ය. ''ඒත්... ඔයා අදහස් කලේ නෑ නේද.. ඒ කියන්නෙ ඔයාට කියන්න බෑ නේද ජෙලි එක මට එව්වෙ මිස් පොලී හැරින්ටන් කියල...?'' යි ඔහු සෙමින් ඇසුවේය. පොලියානා මහත් පීඩනයකට ලක් වෙනු පෙනුණි.

''න්...නෑ සර්. එයා එහෙම කළේ නෑ. එයා කිව්ව, එයා එහෙම කළා කියල ඔයාට දැනගන්න ඉඩ අරින්න එපා කියල. ඒත් මම...''

''මං ඔහොම හිතුව...'' යි ඔහු එකඟ වෙමින් කීවේය. මද වේලාවකට පසු, ඔහු නැවත හිස අනෙක් පසට හරවා ගත් අතර පොලියානා හිමින් සීරුවේ කාමරයෙන් එළියට ඇදී ගියාය.

පෝටිකෝව යට දී ඇයට අශ්ව කරත්තයට නැගී මග බලා සිටින දොස්තර මහතා හමුවිය. හෙද සේවකයා පියගැට පෙළ මත රැඳී සිටියේය.

''හොඳයි... මිස් පොලියානා. ඔයාව ගෙදරට ඇරලවන්න මට අවසර දෙනවද?'' දොස්තර මහතා සිනහවක් පාමින් ඇසීය.

''මං ටික වේලාවකට කලිනුයි යන්න හැදුවෙ. ඒත් මට හිතුණා, ඔයා එනකං ඉන්න...''

''බොහොම ස්තුතියි සර්. මට හරි සතුටුයි ඔයා එහෙම කළාට. මං හරි ආසයි අස්ස කරත්තෙන් යන්න..'' පොලියානා ප්‍රීතියෙන් කීවේ, කරත්තයට නැගීමට දිගු කළ ඔහුගේ අත ගනිමිනි.

''එහෙමද?'' යි මදහසක් පෑ දොස්තර මහතා, පියගැට පෙළ මත සිට ගෙන සිටි තරුණයාට ආයුබෝවන් කීමට මෙන් හිස සැලුවේය. ''හොඳයි... මට පේන හැටියට ඔයා කරන්න ''ආස''

දේවල් ගොඩක් තියනව නේද? ආ!''' යි කරත්තය ඉදිරියට ඇදී යන අතරේ ඔහු ඇසුවේය.

පොලියානා හඬ නගා සිනාසුනාය.

''අනේ මං දන්නෙ නෑ. මං හිතන්නෙ සමහරවිට එහෙම වෙන්න ඇති...'' යි ඇය එකතු කළාය. මං ''ජීවත්වෙන්න''කරන දේවල් හැම එකටම වාගෙ ගොඩක් කැමතියි. ඇත්තටම කියනවා නං අනිත් දේවල්වලට මං ඒ හැටි කැමති නෑ... මහන එක, හයියෙන් පාඩං කියවන එක වගේ දෙවල්. ඒවා කරද්දී ''ජීවත් වෙනව'' කියල හිතෙන්නෙ නෑ...''

''නෑ? එතකොට ඒවගේ දේවල්වලට මොනවද කියන්නෙ....''

''පොලී පුංචි අම්ම නං කියන්නෙ ඒවා කරන්න ඕන 'ජීවත් වෙන්න ඉගෙන ගන්න' ලු '' යි සුසුම් ලෑ පොලියානා, කණස්සලු සහගත සිනාවක් පෑවාය.

දොස්තර මහතාද මෙහිදී තරමක් අමුතු විදිහේ සිනහවක් පෑවේය.

''එයා කියන්නෙ එහෙමද? හොඳයි. මං හිතන විදියට එයා කියනවා ඇත්තෙ එච්චරයි''

''ඔව්.'' යි පොලියානා පිළිතුරු දුන්නාය. ''ඒත් මට නං කොහෙත්ම එහෙම හිතෙන්නෙ නෑ. මම හිතන්නෙ නෑ ජීවත් වෙන්න ඉගෙන ගන්න ඕන කියල. කොහොම උණත් මං එහෙම කරන්නෙ නෑ.'' දොස්තර මහතා දිගු හුස්මක් ගත්තේය.

''මට පේන විදියට නං, අන්තිමේදී අපි අතර ඉන්න සමහර අයට එහෙම කරන්නම වෙනව දරුවො...'' යි ඔහු කීවේය. අනතුරුව මද වේලාවක් යනතුරු ඔහු නිහඬ වූයේය. ඔහු දෙස හොරැහින් බැලූ පොලියානාට, ඔහු ගැන සියුම් දුකක් පහළ විය. ඔහු සිටියේ ඉතාමත් දුකිනි. ඒ ගැන කුමක් හෝ තමන් ට කළ හැකි වේවා යි ඇය පැතුවාය. සමහර විට ඇයට මේ වචන කිහිපය කියන්නට

සිතුණේ ඒ නිසා වන්නට පුළුවන.

''ඩොක්ට කිල්ටන්. මට හිතන්න වෙනවා, දොස්තර කෙනෙක් වෙන එක තරම් සතුටු වෙන්න පුළුවන් දෙයක් තවත් නෑ කියල...''

දොස්තර මහතා පුදුමයෙන් හැරී බැලුවේය.

''ඒ තරං සතුටු වෙන්න පුළුවන් වෙන දෙයක් නෑ! මම යන හැම තැනදිම, හැම වේලේම වේදනා විඳින, දුක හිතෙන දේවල් දක දක?'' යි ඔහු කෑගැසුවේය.

ඇය ඔලුව සෙලවූවාය.

''මං දන්නවා. ඒත් ඔයා ඒවගේ වෙලාවට කාට හරි උදව් කරනව නෙ. ඔයාට ඒක පේන්නෙ නැද්ද? ඇත්තටම ඔයා සන්තෝස වෙන්න, ලෙඩෙකුට ඔයාට උදව් කරන්න පුළුවන් වුණු එකට. ඉතිං, හැම වෙලේම, අපි හැමෝටම වැඩියෙන් ඔයාට සතුටු වෙන්න පුළුවන් ඒක නිසා...''

sinhalaebooks.com

දෝසතර මහතා ගේ දෑස හදිසියේම කඳුලින් පිරී ගියේය. ඔහුගේ ජීවිතය ගෙවෙන්නේ තනිකඩව ය. ඔහුට බිරිඳක සිටියේ නැත. ගෙදරක් තිබුණේ ද නැත. තිබුණේ තවාතැන ගත් නිවසේ, කාමර දෙකකින් යුත් කාර්යාලය පමණය. ඔහුගේ රැකියාවට ඔහු බෙහෙවින් ඇලුම් කළේය. පොලියානා ගේ දීප්තිමත් දෑස් දෙස බලා සිටින විට ඔහුට දැනුණේ, ඔහුගේ හිස මත තැබූ ආදරණීය අතකින්, කවුදෝ ආශිර්වාද කරන්නාක් මෙනි. මීට පසු හැමදාමත් පොලියානා ගේ දෑසින් ගලා ආ ප්‍රමෝදය, තමන්ගේ දිගු රාජකාරි වේලාවන් අතරේත්, නිදි නැතිව ගෙවන වෙහෙසකර රෑ යාමයන් අතරේත්, රැඳී පවතින බව ද ඔහු දත්තේය.

''දෙවි පිහිටයි ඔයාට... දරුවො...'' යි ඔහු කීවේය. ඊට පසු ඔහුගේ රෝගීන් හොඳටම ආසා කරන විදියේ දීප්තිමත් සිනහවකින් සංග්‍රහ කළ ඔහු ''මං හිතන්නෙ, අන්තිමේදී දොස්තරටත් එයාගෙ

ලෙඩ්ඩුන්ට වගේම අර බෙහෙතෙන් උගුරක් ඕන වෙනවා වගේ..'' යි කීවේය.

ඔහු කී හැම දෙයක්ම පොලියානාට මහා ප්‍රහේලිකාවක් විය. පාර හරහට ලේනෙක් දිව යනු දකින තුරුම ඔහුගේ වචන ඇගේ සිතේ හොල්මන් කරමින් තිබුණි.

දොස්තර මහතා පොලියානා ගේ දොරකඩටම ගෙනැවිත් බැස්සුවේය. ඔහු ඉදිරිපස බරාඳය අතුගාමින් සිටි නැන්සිට සිනහවක් පා, වේගයෙන් රිය පදවාගෙන යන්නට ගියේය.

''මං දොස්තරත් එක්ක හොඳටම හොඳ ගමනක් ආවා.'' යි පොලියානා පිය ගැට පෙළ නගින අතරේ කීවාය.

''එයා හරි හොඳයි නැන්සි.''

''ඇත්තට!''

''ඔව්. මං එයාට කිව්වා එයා කරන වැඩේ තමයි මේ ලෝකෙන්ම තියෙන හොඳටම සන්තෝස වෙන්න පුළුවන් වැඩේ කියල...''

''මොනව! ලෙඩ්ඩු බලන එකයි... ලෙඩක් නැතුවත් තමං ලෙඩ වෙලා කියල හිතන මිනිස්සු බලන එකයි. කොයිකද වඩා නරක?'' නැන්සි ගේ මුහුණ සැකයෙන් පිරී තිබිණි.

පොලියානා මහත් ප්‍රමෝදයෙන් සිනාසුනාය.

''ඔව්. එයත් එහෙම තමයි කිව්වෙ. ඒ උණත් ඒ ගැන සන්තෝස වෙන්න විදිහකුත් තියනව, ටිකක් හිතල බලන්න..''

නැන්සි කල්පනාකාරීව නළල රැලි කරගත්තාය. එසේ කිරීමෙන් සන්තෝසයෙන් සිටීමේ සෙල්ලම සාර්ථකව කළ හැකි වෙනු ඇතැයි ඈ සිතුවාය. ඊටත් වඩා ඇය ආසා කළේ පොලියානාගේ බැරෑරුම් ප්‍රශ්න ඇසීම් අධ්‍යයනය කරන්නටය.

''ආ! මං දන්නවා...'' යි නැන්සි සිනාව තද කරගෙන කීවාය. ''ඒක තමයි ඔයා ස්නෝ නෝනට කියපු එකේ අනික් පැත්ත...''

''අනික් පැත්ත.....?'' යි පොලියානා ව්‍යාකූල වූ සිතින් ප්‍රශ්න කළාය.

''ඔව්, ඔයා ස්නෝ නෝනට කිව්වෙ අනිත් අය එයා වගේ ලෙඩ වෙලා නැති එක ගැන සන්තෝස වෙන්න කියල නෙ?''

''ඔව්'' පොලියානා ඔලුව වැනුවාය.

''ඉතින්, ඔය දොස්තර මහත්තයට සන්තෝස වෙන්න පුළුවන්නෙ එයා ලෙඩෙක් උණේ නැති එකට. මං කියන්නෙ. එයා දොස්තර කෙනෙක් වුණ එක ගැන...'' යි නැන්සි ජයග්‍රාහී ලීලාවෙන් කියා හමාර කළාය.

ඊළඟට නළල රැලි කර ගැනීමෙන් වාරය එළඹුනේ පොලියානාටය.

sinhalaebooks.com

''හොඳයි, ඔ...ඔව්...'' යි ඇය කීවාය. ''ඇත්තටම ඒකත් එක විදිහක් තමයි. ඒත් මං කිව්වෙ ඊට වඩා වෙනස් විදියෙ දෙයක්, සමහර වෙලාවට මට ඔයා කියපු එක ගැන ඒ හැටි කැමති වෙන්නත් බෑ වගේ. ඒකෙන් කියන්නෙ, අනිත් අය ලෙඩ වෙලා ඉන්න එක ගැන එයා සන්තෝස වෙනවා වගේ දෙයක් නං නෙමෙ. ඒත්... ඔයා සමහර වෙලාවට සෙල්ලම කරන්නෙ හරි විකාර විදියට නැන්සි...'' යි සුසුම් හෙලූ ඇය, ගෙතුළට වැදුණාය.

පොලියානාට විසිත්ත කාමරයේදී ඇගේ පුංචි අම්මා මුණ ගැසිණි.

''කවුද පොලියානා ඔයාව මෙහාට ගෙනත් ඇරලුවේ...?'' යි තරමක් තියුණු ස්වරයෙන් ඇය ඇසුවාය.

''ඇයි පුංචි අම්මෙ, එයා ඩොක්ට කිල්ටන් නෙ. ඔයා දන්නෙ නැද්ද එයාව?''

''ඩොක්ට කිල්ටන්! එයා මොකද.. මෙහෙ කරන්නෙ?''

''එයා මාව ගෙනත් ඇරලුවා. අනේ! මං අර ජෙලි එක මිස්ට පෙන්ඩල්ටන්ට දුන්නනෙ. ඊට පස්සෙ...'' පොලී මෙනෙවිය හතික හිස ඔසවා බැලුවාය.

''පොලියානා... එයාට දැනුණෙ නෑ නේද ඒක එව්වෙ මං කියල?''

''අනේ නෑ පුංචි අම්මෙ... මං එයාට කිව්වා, ඒක එව්වෙ ඔයා නෙමේ කියල....''

පොලී මෙනෙවියගේ මුහුණ සැනයකින් රෝස පැහැ විය.

''ඔයා කිව්වා, මං එව්වෙ නෑ කියල!''

පුංචි අම්මාගේ පුදුමයට පත් වූ ස්වරය අසා පොලියානා දෑස් ලොකු කරගත්තාය.

''ඇයි, පුංචි අම්මෙ. ඔයානෙ එහෙම කියන්න කිව්වෙ...''

පොලී පුංචි අම්මා සුසුම් ලෑවාය.

''මම කිව්වෙ පොලියානා... එයාට ඒක මම එව්වැයි කියල හිතන්න ඉඩ අරින්න එපා කියලා. ඒක කෙළින්ම 'මම එහෙම දෙයක් එව්වෙ නෑ' කියල කියනවාට වඩා ගොඩක් වෙනස්.'' යි කී ඇය ආපිට හැරී යන්නට ගියාය.

''දෙයියනේ! හොඳයි... මට පේන්නෙ නෑනෙ, ඒ වෙනස මොකද්ද කියල...'' යි කී පොලියානා, ඇගේ තොප්පිය එල්ලා තැබීම පිණිස, පොලී පුංචි අම්මා නියම කර තිබූ ඇණය වෙතට ගියාය.

# 16

# රතු රෝස මල සහ ලේස් සාලුව

sinhalaebooks.com

පොලියානා ජෝන් පෙන්ඩල්ටන් මහතා හමුවීමට ගිය දිනට, හරියටම සතියකට පසුව එළඹුණු වැසි දිනයක, පොලී මෙනෙවිය තිමති සමඟ 'කාන්තා සරණ' සංගමයේ රැස්වීමකට ගියාය. ඇය ආපසු පැමිණියේ පස්වරු තුනට පමණය. ඒ වන විට ඇගේ කම්මුල් දීප්තිමත්ව, ලස්සන රෝස පැහැයකට හැරී තිබිණි. තෙතැති සුළඟට හසු වීමෙන් කොණ්ඩ කටු ගැලවී තිබුණු තැන්වල කොණ්ඩය රෝල් වී, කැරලි ද ඇති වී තිබුණි.

පොලියානා කිසි දවසක ඇගේ පුංචි අම්මා ඒ ආකාරයට සිටිනු දැක ඇත.

''අනේ... අනේ... අනේ....! පුංචි අම්මෙ ඔයාට ඒවා ලැබිලා,'' යි ඇය පුංචි අම්මා විසිත්ත කාමරයට ඇතුළු වන විට ඇය වටා කැරකෙමින් නැටුවාය.

"හම්බවෙලා! මොනවද? පිස්සු ළමයා!"

පොලියානා තවමත් ඇගේ පුංචි අම්මා වටා කැරකවෙමින් උන්නාය.

"මං කවදාවත් හිතුවෙ නෑ ඔයාට ඒවා තියෙනව කියල. ඇත්තටම තමන්ට නැහැ කියල හිතාගෙන ඉන්න දෙයක් එහෙම මිනිස්සුන්ට ලැබෙන්න පුළුවන්ද? ඔයා හිතන්නෙ මට ඒවා ලැබෙයි කියලද... ස්වර්ගෙට යන්න කලින් මං කියන්නෙ..." යි කෑ ගැසූ ඇය ඇඟිලි තුඩුවලින් ඇගේ කණට ඉහළින් පිහිටි ඍජු කොණ්ඩය අදිමින් සිටියාය. "ඒත් ඒවා ලැබුණත්, කළු වෙන්නෙ නං නෑ. 'කළු කියන එකත් කාටවත් නොකිය ඉන්න බෑ..."

"පොලියානා, ඇත්තටම මොකද්ද මේකෙ තේරුම?" යි තොප්පිය ගලවමින්, අවුල් වූ කොණ්ඩය සකසා ගන්නා අතරේ පොලී මෙනෙවිය ඇසුවාය.

"එපා... එපා.. අනේ කරුණාකරල පුංචි අම්මෙ...." පොලියානාගේ විනෝදකාමී කටහඬ ආයාචනාත්මක ස්වරයක් ගත්තේය. "අනේ ඔව් අතගාන්න එපා. මං මේ කියන්නෙ අර... ලස්සන කළු කොණ්ඩ කැරලි ගැනයි. අනේ පුංචි අම්මෙ...ඒවා කොයි තරං ලස්සනද?"

"විකාර! පොලියානා, ඔයා අර කාන්තා සරණ සංගමේ රැස්වීමට ගිහින්, අර හිඟන ළමය ගැන කියල මොකද්ද කරන්න හිතුවෙ ආ!"

"ඒක විකාරයක් නෙමෙයි" යි පොලියානා පුංචි අම්මා පළමුවෙන් සඳහන් කළ දෙයට පිළිතුරු දෙමින් ඊටපසු කතාව වෙනතක හැරවූවාය. "ඔයා දන්නෙ නෑ ඔයාගෙ කොණ්ඩෙ ඔය විදියට තියෙනකොට, ඔයා කොච්චර ලස්සන ද කියල! අනේ පුංචි අම්මෙ... කරුණාකරල මට ඉඩ දෙනවද, මම මිසිස් ස්නෝට කළා වගේ, ඔයාගෙ කොණ්ඩෙටත් මෝස්තරයක් දාලා මලක් ගහන්න.

මට හරි ආසයි ඔයා එහෙම ඉන්නව බලන්න! ඔයා එයාටත් වඩා ගොඩක් ලස්සනට ඉඳීවි.''

''පොලියානා!'' (පොලී මෙනෙවිය හඬ ගෑවේ තියුණු ස්වරයකිනි. පොලියානා ගේ වචන නිසා ඇයට අමුතු සතුටුක් දැනුණු බැවින් එය හොඳටම තියුණු ස්වරයක් ගත්තේය. මීට කලින් කිසිවකු හෝ ඇය ගැනවත්, ඇගේ කොණ්ඩය පිළිබඳවත් සැළකිල්ලක් දක්වා තිබුණේද? කවරකු හෝ මීට කලින් ඇය 'ලස්සනට' සිටිනු බලන්නට ''ආසාවෙන් '' සිටියාද?) ''පොලියානා, ඔය මං ඇහුව දේට උත්තර දෙන විදිහද? ඔයා ඇයි අර විදියට කාන්තා සරණ සංගමේ කට්ටිය හම්බ වෙන්න ගියෙ, පිස්සු වැඩකට...?

''ඔව්. මං දන්නවා. ඒත් කරුණාකරල මේක තේරුං ගන්න. මං දැන ගෙන හිටියෙ නෑ ඒක කොයිතරං විකාර වැඩක්ද කියල, ඒ ගොල්ලන්ට ජිමී බීන් හදා ගන්නවට වැඩිය, අර වාර්තාවක් ලොකුයි කියල දැන ගන්නකං. ඒ හින්ද මං 'මගේ' කාන්තා සරණ සංගමේට ලිව්වා... මොකද ජිමී ඒ ගොල්ලන්ට වඩා සෑහෙන තරමක් දුරින් ඉන්න නිසා... මං හිතුව ඒ ගොල්ලන්ට ජිමී ඉන්දියාවෙන් ගෙනාපු ළමයෙක් වගේ දැනෙයි කියල... පුංචි අම්මෙ, මමත් ඔයාගේ පුංචි ඉන්දියන් ගෑනු ළමයද? පුංචි අම්මෙ... ඔයා මට කොණ්ඩෙ දාන්න දෙනවාමයි. එහෙම නේද?''

පොලී මෙනෙවිය ඇගේ අත ගෙල මත තබා ගත්තාය. අර පැරැණි අසරණකම යළිත් මතු වෙමින් පවතින බව ඇය තේරුම් ගත්තාය.

පොලියානා පයේ ඇඟිලිවලින් ඉස්සී, සැහැල්ලුවෙන් එහෙට මෙහෙට වැනෙමින් රැඟුම් පෑවාය.

''ඔයා කිව්වෙ නෑ...! ඔයා කිව්වෙ නෑ මට ඔයාගෙ කොණ්ඩෙ දාන්න එපා කියල...'' ජයග්‍රාහී ලීලාවෙන් හඬ ගෑ ඇය ''මට හොඳටම විස්වාසයි ඒකෙ අනිත් පැත්ත තමයි තේරුං ගන්න ඕන. ඒ කියන්නෙ එදා මිස්ට පෙන්ඩල්ටන්ට ඔයා ජෙලි එක යැව්වෙ නෑ.. ඒ වගේම

ඔයාට ඕන වුණේ නෑ ඔයා එච්චෙ නෑ කියල මා ලවා කියවන්නත්. දන්නවද? ඔහොම පොඩ්ඩක් ඉන්න ඔතනම. මං දුවල ගිහිං පනාවක් අරන් එන්නං...''

''ඒත් පොලියානා, පොලියානා!'' යි හඬ ගෑ පොලී මෙනෙවිය කාමරයෙන් දිව ගොස් තරප්පු පෙළ දිගේ උඩට නගින පොලියානා පසුපස ඇදී ගියාය.

''ආ! ඔයා උඩට ආවද?'' යි පොලියානා පොලී මෙනෙවියගේ කාමරයේ දොර අසළ දී ඇය පිළිගත්තාය.

''ඒක වැඩියෙන් හොඳයි. මට පනාව හම්බ වුණා. කරුණාකරල මෙතන ඉඳගන්නකො. අනේ මට හරි සතුටුයි ඔයා මට මේක කරන්න ඉඩ දීපු එක ගැන.''

''ඒත් පොලියානා..... මම... මම...''

පොලී මෙනෙවිය කියන්නට ගිය දේ සම්පූර්ණ නොකළාය. පුදුමයකට මෙන් ඇයට දැනුණේ තමන් කණ්ණාඩිය ඉදිරිපිට වූ පහත් පුටුවක ඉඳගෙන, කන අසළ ඇති කෙස් රොදවල් ඇඹරවීමට ඉතා ඕනෑ කමින් මෙහෙයවන හුරුබුහුටි ඇඟිලි දහයකට ඉඩ දෙමින් සිටින බවය.

''මගේ දෙයියනේ....! ඔයාට තියෙන්නෙ කොච්චර ලස්සන කොණ්ඩයක්ද?'' යි පොලියානා වර්ණනා කළාය. ''මිසිස් ස්නෝට වඩා කොණ්ඩෙත් වැඩියි. ඇත්තටම ඔයාට එයාට වැඩියෙන් කොණ්ඩෙ තියෙන්නත් ඕන. ඒ මොකද ඔයා ලෙඩ වෙලා නැනෙ. ඔයාට මිනිස්සුන්ට පේන්නත් එක්ක තැන් තැන්වලට යන්නත් පුළුවන් නෙ. අම්මෝ! මට හිතෙන්නෙ මේක දකිනකොට අනිත් අය කොච්චර සතුටු වෙයිද. ඒ මොකද ඔයා මෙච්චර කල් ඒක හංගගෙන හිටිය නිසා. පුංචි අම්මෙ, හැමෝටම ඔයා දිහා බලන්න හිතෙන විදිහට මං ඔයාව ලස්සන කරන්නං....''

''පොලියානා!'' හිස කෙස් අතරින් තදින්... එහෙත් වෙව්ලුම්

ස්වරයෙන් හඬ ගෑමක් ඇසිණ. ''මම...මම දන්නෙ නෑ, ඔයාට මේ මෝඩ වැඩේ කරන්න ඉඩ දීල මං ඇයි මෙහෙම ඉන්නෙ කියල''

''ඇයි පුංචි අම්මෙ.. මට හිතන්න වෙනවා, ඔයා දිහා අනිත් අය බලනවට ඔයා කැමතියි කියල. ලස්සන දෙයක් දිහා බලන්න ඔයා කැමති නැද්ද? මම නං හැමදාම ආසයි ලස්සන අය දිහා බලන්න. ඒ මොකද එහෙම නොවෙන අය දිහා බලනකොට මට ඒ ගොල්ලො ගැන දුක හිතෙනවා...''

''ඒත්...ඒත්...''

''මං කොණ්ඩ දාන්නත් කැමතියි...'' පොලියානා සිහින් සරයෙන් කීවාය. ''මං කාන්තා සරණ සංගමේ කට්ටිය ගෙත් කොණ්ඩ දාලා තියෙනවා. ඒත් ඒ එක්කෙනෙක්ගෙවත් කොණ්ඩෙ ඔයාගෙ තරං ලස්සන නෑ. මිසිස් වයිට් ගෙ කොණ්ඩෙත් හරි ලස්සනයි. මං එක දවසක් එයාව ඇන්දුවාම හරි ලස්සනට හිටිය. අනේ පුංචි අම්මෙ මට බඩුවක් මතක් උණා. ඒත් ඒක රහසක්. මං දැන්ම කියන්නෙ නෑ. ඔන්න දැන් ඔයාගෙ කොණ්ඩෙ දාලා ඉවරයි. දැං මම ඉක්මනට ගිහිං එනකම් ඔයා ඔහොමම මිනිත්තුවක් ඉන්න. ඔයා පොරොන්දු වෙන්න... පොරොන්දු වෙන්න... පොරොන්දු වෙන්න... මං ආපහු එනකම් කොණ්ඩෙ හොලවන්නෙ නැතුව... කණ්ණාඩියට එබෙන්නෙ නැතුව ඉන්නවා කියල. මතකයි නෙ?'' යි කියා හමාර කළ ඇය කාමරයෙන් පිටතට දිව ගියාය.

පොලී මෙනෙවිය හඬ නගා කිසිවක් කීවේ නැති බව සැබෑය. එහෙත් ඇය, මේ කොණ්ඩය ගලවා දමා, නැවත තිබුණු පිළිවෙළටම සකසා නොගත්තේ මන්දැයි තමාටම කියා ගනිමින් උන්නාය. කණ්ණාඩියට එබී බැලීම ගැන නම්....

මේ මොහොතේදී... නොසිතූ විරූ ලෙස... පොලී මෙනෙවිය කණ්ණාඩිය තුළින් තමන් ගේ පිළිඹිබුව දුටුවාය. ඇය දුටු දෙය ඇගේ දෙකම්මුල් රෝස පැහැයට හරවන්නට සමත් වූ අතර, ඒ

දැකීමෙන් ඇය වඩ වඩාත් රතු වන්නට පටන් ගත්තාය.

ඇය දුටු මුහුණ.. තරුණ නොවූ නමුත් එය පුදුමයෙන් සහ විස්මයෙන් පිරී තිබිණ. කම්මුල් හොඳටම රෝස පාට වෙලාය. දෑස් බබළමින් තිබුණි. කලු කොණ්ඩය තවමත් එළිමහනේ වාතයට හසුවීමෙන් තෙත බරිත වී තිබුණු අතර ඒවා නළලට ඉහළින් ඇලි වැටී ලිහිල්ව කඩා හැලුණේ විය. එහෙත් කනට ඉහළින් පිටුපසට කරකැවී, පුදුමාකාර ලෙස කෙලින් වී තිබුණු කොණ්ඩයේ අතරින් පතර කැරලි දකින්නට ලැබිණි.

පුදුමයෙන් ගල් ගැසී සිටි පොලී මෙනෙවියට කණ්ණාඩියෙන් තමන් දුටු දෙය නිසා, කොණ්ඩය ගලවා දැමීමේ අදහස ගැන අමතක විය. එය ඇගේ මතකයට ආවේ පොලියානා නැවත කාමරයට ඇතුලු වන විටය. ඇය සෙලවෙන්නට තැත් කරන විටම වාගේ, නමන ලද රෙදි කඩකින් ඇගේ දෑස් බැඳ දමනු ඇයට දැනුණි.

"පොලියානා.... පොලියානා! මොකද මේ කරන්නෙ...?" යි ඇය කෑගැවාය.

පොලියානා සිනාසුනාය.

"ඒක තමයි මම ඔයා දැන ගන්නවට අකමැති දේ. මට හිතෙන්නෙ ඔයා කණ්ණාඩියට එබෙයි කියල. ඒ හින්ද මං ලේන්සුවකින් ඇස් දෙක බැන්දා. දැන් වාඩිවෙලා ඔහොම ඉන්නකො. මං මිනිත්තුවක් ගන්නං. ඊට පස්සෙ ඔයාට බලන්න දෙන්නම්..."

"ඒත් පොලියානා..." යි පොලී මෙනෙවිය දෙපයින් සිට ගැනීමට දඟලුවාය. "ගලවන්නකො මේක! ඔයා.... ළමයො... ළමයො, මොනවද මේ කරන්න යන්නෙ...." යි පුදුමයෙන් කී ඇයට ඇගේ උරහිස් හරහා මෘදු යමක් එතෙනු දැනෙන්ට වී ය.

පොලියානා තවත් සතුටින් සිනාවුණා පමණය. ඇය වෙව්ලන දෑතින් පුංචි අම්මාගේ දෙවුර වටා ලස්සන ලේස් සාලුවක් දවටමින්

උන්නාය. එය අවුරුදු ගණනාවක් තිස්සේ නවා පසෙකට දමා තිබීමෙන් කහ ගැන්වී තිබුණු අතර ඉන් ලැවැන්දරා සුවඳක් ද හමා ආයේය. පොලියානාට මේ සාලුව හමුවුණේ මීට සතියකට උඩදී නැන්සි අට්ටාලය අස්පස් කරන විටදීය. ඇයට එය දකීමෙන් සිහි වූයේ ඇගේ බටහිර පිහිටි නිවසේ උන් වයිට් නෝනා මහත්මිය මෙන්. ඇගේ පුංචි අම්මාද හොඳින් ඇඳ පැළඳ නොසිටින්නේ ඇයි දැයි කියායි.

වැඩය අහවර වී පොලියානා එය අනුමත කරන දෑසකින් එදෙස බලා සිටියාය. එහෙත් ඇය එහි දුක්කේ එක් අඩුවක් පමණි. ඉතින් ඒ නිසා, උද්යෝගයෙන් පිරුණු හිතකින් ඇය පුංචි අම්මා අසළ තිබූ ගිම්හාන සඳැල්ල වෙත තල්ලු කරගෙන ගියාය. එහි තිබුණු රෝස ගස්වල අත පොවන මානයේම රතු රෝස මලක් පිපී තිබුණි.

"පොලියානා, මොකද මේ කරන්නෙ? කොහෙද මේ මාව එක්කරගෙන යන්නෙ...." ආපස්සට ඇදුණු පොලී මෙනෙවිය නැවත කාමරය දෙසට යාමේ නිරර්ථක උත්සහයක යෙදුණාය. "පොලියානා... මට බෑ.."

sinhalaebooks.com

"මිනිත්තුවකට විරතයි... මේ සන් පාලර් එකට යන්නෙ. ඔයාව මං නප්පරයක් යනකොට ලෑස්ති කරල දෙන්නං...." යි හති දමූ පොලියානා, අත දිගු කොට රෝස මල කඩා ගෙන, එය පොලී මෙනෙවියගේ වම් කනට ඉහලින් කොණ්ඩයේ රැඳවූවාය.

"ඔන්න!" යි ප්‍රීතියෙන් උදම් වෙමින් පොලී මෙනෙවියගේ දෑස බැඳි ලේන්සුවේ ගැටය හැර, එය පසෙකට කරලමින් පොලියානා කීවාය.

"අනේ පුංචි අම්මෙ, මම දන්නං හිතනවා ඔයා මෙහෙම අන්දවපු එක ගැන, ඔයා සතුටු වෙයි..."

එක මොහොතකට පමණ පොලී මෙනෙවිය ඇය හැඩ ගත්වා ඇති අන්දම දෙස බලා සිටියාය. ඊට පසු වට පිට බැලූ ඇය එක්වරම පහත් ස්වරයෙන් හඬක් පිට කරමින් කාමරයට දිව ගියාය. පොලියානා, ඇගේ පුංචි අම්මා අන්තිම වරට බැලූ දිශාව දෙස ගිම්හාන සඳැල්ලේ ඇරුණු ජනේල තුළින් බැලුවාය. එහිදී ඇයට දක්නට ලැබුණේ ගෙය දෙසට එමින් සිටි අශ්වයෙක් බැඳි තිරික්කලයකි. අසුගේ තෝන් ලණු අල්ලාගෙන සිටි පුද්ගලයාව එක් වරම හඳුනාගන්නට ඇයට හැකි විය.

ප්‍රීතියට පත් වූ ඇය ඉදිරියට නැමුනාය.

''ඩොක්ට කිල්ටන්! ඩොක්ට කිල්ටන්! ඔයා මාව හම්බ වෙන්නද ආවෙ? මම ඉන්නෙ මෙහෙ...උඩ...''

''ඔව්.'' මදහසක් පෑ දොස්තර මහතා ගේ මුහුණෙන් බැරෑරුම් ස්වභාවයක් පළ විය. ''කරුණාකරල පොඩ්ඩක් පහළට බහිනවද?''

නිදන කාමරයට ඇතුළු වූ පොලියානාට එහිදී ලේස් සාලුව රඳවා තිබූ ඇල්පෙනෙති එකිනෙක ඉවත් කරමින්, ලැජ්ජාවෙන් රතු වූ මුහුණෙන් සහ කෝපයෙන් දැවෙන දෑස්වලින් යුතු පොලී මෙනෙවිය දැක ගත හැකි විය.

''පොලියානා... කොහොමද මේවා කළේ...?'' යි ඇය කෙඳිරි ගෑවාය. ''ටිකක් හිතල බලන්න, මට මේ විදියට ඇඳුම් පටවලා, අර විදියට පේන්න... සලස්වපු එක ගැන...''

පොලියානා ගල් ගැසී නතර වූවාය.

''ඒත් ඔයා හරිම ලස්සනයි. හොඳටම ලස්සනයි පුංචි අම්මෙ, තව....''

''ලස්සනයි! '' කඩා පැන්න පොලී මෙනෙවිය සාලුව ගලවා පැත්තකට වීසි කොට, වෙව්ලන ඇඟිලි තුඩුවලින් කොණ්ඩය

අඳින්නට පටන් ගත්තාය.

''අනේ පුංචි අම්මෙ, කරුණාකරල... කරුණාකරල කොණ්ඩෙ ඔය විදියට තියන්න...''

''තියන්න? මේ විදියට? එහෙම කරයි කියලද හිතාගෙන ඉන්නෙ!'' යි කී පොලී මෙනෙවිය අන්තිම කොණ්ඩ කැරැල්ලත් දිග හැරෙන තුරු ඇඟිලිවලින් කොණ්ඩය පිටුපසට තදින් අදින්නට වූවාය.

''අනේ දෙයියනේ, ඔයා ලස්සනට හිටියා.'' යි කාමරයෙන් එළියට යන අතෙර්, අඬන්නට ඔන්න මෙන්න ව සිටි පොලියානා කීවාය.

පහත මාලයේදී අශ්ව කරත්තයට නැගී තමන් එනතුරු බලා සිටි දොස්තර මහතාව ඇයට මුණ ගැසිණ.

''මම ලෙඩෙකුට බේතක් විදියට ඔයාව නියම කළා. ඉතිං ඒක සම්පූර්ණ කරන්න එයා මාව මෙහාට එව්වා...'' යි දොස්තර මහතා දැනුම් දුන්නේය.

sinhalaebooks.com

''ඔයා එතවද යන්න...?''

''ඔයා කියන්නෙ... බෙහෙත් ගබඩාවට...යමුයි කියලද?'' පොලියානා මඳ සැකයෙන් යුතුව ඇසුවාය. ''මම ඉස්සර කාන්තා සරණ සංගමේ අය වෙනුවෙන් නං එහෙම තැන්වලට ගිහිං තියෙනවා...''

දොස්තර මහතා මඳහසක් පාමින් ඔලුව දෙපසට වැනුවේය.

''එහෙම නෙමෙයි. ඒ, මිස්ටර් ජෝන් පෙන්ඩල්ටන්. එයාට අද ඔයා දකින්න ආසයිලු! ඔයා එයා බලන්න එන්න තරං කරුණාවන්ත වෙනවා නම්. වැස්සත් නැවතුණු නිසා, මං ඔයාව හොයාගෙන

ආවා. ඔයා එනවද? මං හැන්දෑවෙ හය වෙන්න කලිං ඔයාව ගෙදරට ඇරලවන්නං..."

"මම කැමතියි" යි පොලියානා කෑගැසුවාය. "මං පුංචි අම්මාගෙන් අහල එන්නං..."

මද වේලාවකට පසු ඇය තොප්පියකුත් අතැතිව ආපිට පැමිණියාය. එහෙත් ඇගේ මුහුණ වඩාත් හැඬුම් බර ස්වභාවයක් ගෙන තිබුණි.

"ඔයාගෙ පුංචි අම්මා... ඔයාට යන්න කිව්වෙ නැද්ද?" යි ඔවුන් නිවසින් ඉවතට යන අතරේ දොස්තර මහතා දුබල හඬින් ඇසීය.

"ඔ....ඔව්..." යි සුසුම් හෙලූ පොලියානා කීවාය.

"එයා...එයා මං යනවට ගොඩක් කැමති උණා මගෙ හිතේ..."

"යනවාට ගොඩක් කැමති උණා!"

පොලියානා නැවත වතාවක් සුසුම් ලෑවාය.

"ඔව්. මට හිතෙන විදිහට එයාට මේ වෙලාවෙ මං එතන නොඉන්න එක හොඳ ඇති. ඔයා දන්නවද එයා කිව්වා ඔව්... ඔව්, යන්න... යන්න... මං මේ හිතන්නෙ මීට කලිං ගියා නං කොයි තරං හොඳද, කියල"

දොස්තර මහතා මදහසක් පෑවේය. ඔහුගේ දෑස්වලින් හොඳටම බැරෑරුම් ස්වභාවයක් පළ විය. ටික වේලාවක් යනතුරු ම ඔහු කිසිවක් කීවේ නැත. ඊළඟට, මදක් පැකිලෙමින්, ඔහු මෙසේ ඇසුවේය:

"මීට ටිකකට කලින් අර සන් පාලර් එකේ ජනේලෙ ළඟදී, මං

ඔයා එක්ක ඉන්නව දැක්කෙ ඔයාගෙ පුංචි අම්ම නේද?''

පොලියානා දිගු හුස්මක් ගත්තාය.

''ඔව්. ඒක තමයි මේ ඔක්කොම ප්‍රශ්නවලට මුල, මම හිතන විදියට. ඔයා දන්නවද, මට ගෙදර උඩ තට්ටුවෙ තිබිලා හම්බවුණ හොඳටම ලස්සන ලේස් සාලුවක් මං එයාට ඇන්දුවා. තව එයාගෙ කොණ්ඩෙට මෝස්තරයක් දාලා, මලකුත් ගැහුවා. එතකොට එයා හරි ලස්සනට හිටිය. ඇත්තටම ඔයා හිතන්නෙ නැද්ද එයා ලස්සනයි කියල...''

මොහොතකට දොස්තර මහතා නිහඬ වූයේය. ඊට පසු ඔහු ගේ කටහඬ ඉතා පහත් වූ අතර පොලියානාට යන්තමින් වචන තෝරා බේරා ගන්නට පමණක් හැකි විය.

''ඔව් පොලියානා, මම... මම හිතන්නෙ එයා... ලස්සනට හිටියා...''

''ඇත්තද? මං හරි සතුටුයි. මං ඒක එයාට කියන්නං....'' යි කුඩා දැරිය විශ්වාසයෙන් යුතුව ඔලුව වැනුවාය. එහෙත් ඇගේ පුදුමයට මෙන් දොස්තර මහතා එක්වරම හඬ නැගුවේය.

''කවදාවත් එපා පොලියානා! මම... මම හිතන විදියට ඔයා ඒක නොකියා ඉන්නවා නං හොඳයි... මට එහෙම ඉල්ලන්න වෙනවා...''

''ඇයි ඩොක්ට කිල්ටන්! ඇයි එපා කියන්නෙ? මම හිතන්නෙ ඔයා සතුටු...''

''ඒත් එයා සතුටු නැති වෙයි...'' දොස්තර මහතා හරස් කපමින් කීවේය.

''එහෙමද... සමහර විට එයා අකමැති වෙයි තමා'' යි ඇය සුසුම් ලෑවාය. ''මට දැන් මතකයි. ඔයා දැකපු ගමන් තමයි එයා

ඇතුලට දිව්වෙ. එයා ඊට පස්සෙත්, ඒ ඇඳුම පිටින් ඔයා දැකපු එක ගැන කතා කළා...''

''මං ඔහොම හිතුව..'' යි දොස්තර මහතා හෙමිහිට කීවේය.

''තවමත්.. මට නං තේරෙන්නෙ නෑ ඒ ඇයි කියල'' යි පොලියානා දිගටම කියමින් උන්නාය...'' එයා ඒ තරං ලස්සනට පෙනෙද්දිත්...''

දොස්තර මහතා කිසිවක් ම කීවේ නැත. ඊට පසු ජෝන් පෙන්ඩල්ටන් මහතා ලෙඩ ඇඳට වැටී සිටින, විශාල මන්දිරය ළඟට එනතුරුම... ඇත්තට ම ඔහු කිසිම දෙයක් කතා කළේ නැත.

සිංහල EBOOKS

සිංහල නවකතා 1000කට අධික ප්‍රමාණයක් නොමිලේ
Ebook ආකාරයෙන් කියවන්න...
දැන්ම www.sinhalaebooks.com වෙත පිවිසෙන්න..

# 17

# පොතක කතාවක් වගෙයි

එදා ජෝන් පෙන්ඩල්ටන් සිනහවක් පාමින් පොලියානා පිළිගත්තේය.

sinhalaebooks.com

''හොඳයි මිස් පොලියානා, මං මේ හිත හිත ඉන්නෙ, ඔයා කොයි තරං අනුන්ට සමාව දෙන පුංචි නෝන කෙනෙක්ද කියලයි. නැත්තං ඔයා මාව අද බලන්න ඒවියැ...''

''ඇයි මිස්ටර් පෙන්ඩල්ටන්, මං මෙහෙ ආවෙ හරිම සතුටින්. මට හොඳටම විශ්වාසයි එහෙම නොවෙන්න මට හේතුවක් නෑ කියල...''

''ආ.... එහෙනං හොඳයි. ඔයා දන්නවද, මම මීට කලින් ඔයාට හොඳටම නපුරු උණා... ඔයා අර තරං කරුණාවෙන් මට ජෙලි එකක් අරන් ආපු දවසෙත්. මගෙ කකුල කැඩිලා ඉන්දැද්දි, ඔයාට

මාව හම්බවුණු වෙලාවෙත්. මම හිතන්නෙ නෑ, මම ඒවට ඔයාට ස්තුති කළා කියලවත්. දැං මට විස්වාසයි, ඒ වගේ කෙළෙහි ගුණයක් නැති වැඩ කරලත් ඔයා මෙහෙම මාව බලන්න එන්න තරං, ඔයා කොයිතරං කරුණාවන්ත වෙන්න ඕනද කියල.''

පොලියානා මහත් කැළඹීමකට පත් වෙනු පෙනුණි.

''ඒත් මට සන්තෝසයි ඔයාව එහෙම හම්බ වුණාට... ඒ කියන්නෙ, මං ඔයා ගෙ කකුල කැඩිච්ච එක ගැන සතුටු වෙනවා කියන එක නං නෙමේ.... ඇත්තටම...'' පොලියානා වහා නිවැරදි කළාය.

ජෝන් පෙන්ඩල්ටන් සිනහවක් පෑයේය.

''මට තේරෙනවා. සමහර වෙලාවට ඔයාගෙ දිව පැටලෙනවා නේද මිස් පොලියානා? ඒ කොහොම උණත් මං ඔයාට ස්තුති කරන්න ඕන. ඔයා එදා කරපු දේ නිසා, මම ඔයාට සළකන්නෙ හරිම නිර්භීත ගෑනු ළමයෙක් විදියට. එදා ගෙනාපු ජෙලි එකටත් ගොඩක් ස්තුතියි...'' යි ඔහු සැහැල්ලු හඬකින් කීවේය.

''ඔයා ඒකට කැමතිද?'' යි පොලියානා උනන්දුවෙන් ඇසුවාය.

''හොඳටම... මම හිතන්නෙ.. අද නං පොලී පුංචි අම්ම 'එවපු නැති' දෙයක්, ඔයා ළඟ නැතුව ඇති. එහෙම නේද?'' යි ඔහු ඇසුවේ අමුතු සිනාවක් පාමිනි.

ඔහුගේ අමුත්තිය මහත් අපහසුතාවයකට පත් වූ බවක් පෙනුණි.

''න්...නෑ සර්...'' යි ඇය කියාගෙන යන්නට වූයේ තවත් ලැජ්ජාවෙන් රතු වෙමිනි. ''කරුණාකරල මිස්ට පෙන්ඩල්ටන්, එදා පොලී පුංචි අම්ම ජෙලි එක එව්වෙ නෑ කියල, හිත රිදවන කතාවක් කියන්න නෙමෙයි මට ඕන වුණේ...''

ඊට පිළිතුරක් ලැබුණේ නැත. ජෝන් පෙන්ඩල්ටන් ගේ මුවෙහි සිනාවක් තිබුණේ නැත. ඔහු, ඔවුන්ට ඉදිරියෙන් තිබූ යමක් දෙස, එක එල්ලේ බලා සිටින බවක් පෙනුණි. මද වේලාවකට පසු දිගු හුස්මක් හෙළූ ඔහු පොලියානා දෙසට හැරුණේය. ඔහු කතා කරන්නට පටන් ගත් විට, කටහඬේ තිබුණේ පැරණි, අසතුටුදායක, කලබල ස්වරයයි.

"හොඳයි, හොඳයි, මේක හරි යන වැඩක් නෙමේ. මං ඔයාට එන්න කිව්වෙ, මං කණගාටුවෙන් ඉන්නව දකින්න නෙමේ. මේ අහන්න. පුස්තකාලෙට එහා, ටෙලිෆෝන් එක තියෙන ලොකු කාමරේ ඔයා දන්නවා නෙ. එකෙ ගිනි උඳුනට ටිකක් ඈතින් තියෙන මුල්ලක වීදුරු පියන් තියෙන අල්මාරියක් ඇති. ඒකෙ පහතම තට්ටුවෙ කැටයම් කපපු පෙට්ටියක් ඇති. අර හැම දෙයක්ම අවුල් කරන ගෑනි 'අස් කරනවා' කියල ඒක වෙන කොහෙටවත් දාල නැත්නම්, ඒ පෙට්ටිය එතන තියෙන්න ඕන. ඒක මෙහාට අරන් එන්න. ඒක ටිකක් බරයි. ඒත් මං හිතන්නෙ, ඔයාට උස්සාගෙන එන්න බැරි තරං බර නෑ..."

sinhalaebooks.com

"ආ! මට ගොඩක් හයිය තියෙනවා..." පොලියානා උන් තැනින් නැඟී සිටිමින් ප්‍රීතියෙන් කීවාය. මිනිත්තුවකට පමණ පසු ඇය පෙට්ටිය සමඟ පෙනී සිටියාය.

ඊළඟට ගතවූ පැය බාගය පුදුමාකාර විය.

ඒ පෙට්ටියේ තිබුණු වස්තු සම්භාරය ජෝන් පෙන්ඩල්ටන් අවුරුදු ගණනාවක් දේශ දේශාන්තරවල ඇවිදීමෙන් එකතු කර ගත් ඒවා විය. ඒ හැම බඩුවක් හා බැඳුණු රසවත් කතාන්දරයක් ද වූයේය. චීනයෙන් ගෙනා, ඉතා සියුම් ලෙසත්, ලස්සනටත් කැටයම් කරන ලද චෙස් රූප වුවත්, ඉන්දියාවෙන් ගෙනා කුඩා ස්ත්‍රී දේව ප්‍රතිමාවක් වුවත් ඒ කතන්දරවල රසවත්කම අඩු නොවීය.

දේවව ප්‍රතිමාව පිළිබඳ කතාව ඇසූ පසුව පොලියානා කණගාටුවෙන් මෙසේ කීවාය. ඇය එය කීවේ පහත් හඬිනි.

"හොඳයි... මං හිතන්නෙ, පිළිමයක් අස්සෙ දෙවියො ඉන්නවා කියල හිතන පුංචි ළමයෙක් ඉන්දියාවෙන් අරන් හදාගන්න එක හොඳයි... දෙවියන් වහන්සෙ ඉන්නෙ අහසෙ කියල දන්න ජිමී බීන් හදා ගන්නවාට වැඩිය. ඒත් ඒ ගොල්ලො ඉන්දියාවෙ ළමයි පැත්තකින් තියලා ජිමී බීන් තෝරා ගත්තා නං කියල මට නොහිතා ඉන්න බැරි හැටි...!"

ජෝන් පෙන්ඩල්ටන්ට එය ඇසුණු බවක් පෙනුණේ නැත. නැවත වතාවක් ඔහු ඉදිරියෙන් ඇති අවකාශය දෙස ඔහේ බලාගත් වනම සිටියේය. එහෙත් ඉක්මනින්ම යථා තත්වයට පත් වූ ඔහු. වෙනත් යමක් ගැන කතා කරන්නට පටන් ගත්තේය.

ඔවුන්ගේ හමුව ඇත්තටම, ප්‍රීතිමත් එකෙක් වූයේය. එය අවසන් වෙන්නට පෙර පොලියානා යමක් තේරුම් ගනිමින් උන්නාය. ඒ, ඔවුන් කැටයම් සහිත ලස්සන පෙට්ටියේ තිබුණු පුදුමාකාර බඩුවලට පිටස්තර වූ දේවල් ගැනද කතා කරමින් සිටින බවය. ඔවුහු ඇය ගැනත්, නැන්සි ගැනත්, පොලී පුංචි අම්මා සහ ඇගේ එදිනෙදා වැඩ පිළිවෙළ ගැනත් කතා කරමින් සිටියහ. ඊට අමතරව ඈත බටහිර නගරයක පිහිටි පොලියානාගේ ගෙදර ගැනත් ඔවුහු කතා කළහ.

යන්නට වේලාව එළඹුණු විට, පොලියානාට තද හිතක් ඇති ජෝන් පෙන්ඩල්ටන් ගෙන් කිසිදාක බලාපොරොත්තු වන්නට බැරි හඬකින් මෙසේ කියනු අසන්නට ලැබිණ.

"දරුවො, මං ආසයි ඔයා මාව නිතරම බලන්න එනවා නං. ඔයා එනව නේද? මම හරියට තනිවෙලා. ඒ හින්ද මට ඔයාව අවශ්‍යයි. ඒකට තවත් හේතුවක් තියෙනවා. මං දැං ඒක ඔයාට කියන්නං. මුලදි, ඔයා කාගෙ කවුද කියල දැන ගත්තට පස්සෙ මට හිතුණ, ඔයාව ආපහු සැරයක් දකින්න නොලැබෙනවා නං හොඳයි කියල. ඒකට හේතුව ඔයා නිසා... මම අවුරුදු ගාණක් තිස්සෙ අමතක කරල දාන්න හදපු දෙයක් මට මතක් වුණ එක. ඉතිං මම,

මටම කියා ගත්ත, ඔයාව ආපහු දකින්න ඕන නෑ කියලා. හැමදාම දොස්තර ඇවිත්, ඔයා මා ළඟට එක්ක එන්න ද ඇහුවාම, මම කිව්වෙ එපා කියල....''

''ඒත් ටික කාලෙකට පස්සෙ මට තේරුණා, මම ඔයා දකින්න හොඳට ම ඕනෑ කමින් ඉන්නවා කියලා. ඒකට හේතුව තමයි, ඔයාව නොදැක ඉන්න කොට... මට අර අමතක කරල දාන්න හදපු දේ තව තවත් වැඩියෙන් මට මතක් වෙච්ච එක. ඉතිං... දැන් ඔයා එනවට මං කැමතියි. ඔයා එනවා නේද දරුවො?''

''ආනේ... ඔව් මිස්ට පෙන්ඩල්ටන්...'' යි හුස්මක් අල්ලාගත් පොලියානා කීවාය. ඇගේ දෑස්, ඇය ඉදිරිපිට දිගාවී උන්, දුක්බර මුහුණින් යුතු මිනිසා වෙනුවෙන් උපන් දුකකින් දිදුලන්නට වන. ''මං මෙහෙ එන්න ආසයි...''

''ස්තුතියි'' යි ජෝන් පෙන්ඩල්ටන් මෘදු ලෙස කීවේය.

එදා හැන්දෑවේ රාත්‍රී භෝජනය සප්පායම් වීමෙන් පසු, පොලියානා පිටුපස බරාඳයට වී ජෝන් පෙන්ඩල්ටන් මහතා ගේ පුදුමාකාර කැටයම් කැපූ පෙට්ටිය ගැනත්, ඊටත් වඩා පුදුමාකාර වූ, එහි ඇතුලත තිබූ භාණ්ඩ ගැනත් නැන්සිට කීවාය.

''පොඩ්ඩක් හිතන්නකො...'' යි සුසුමක් හෙලූ නැන්සි කීවාය. ''එයා ඔයාට ඒ සේරම දේවල් පෙන්නලා, ඔය වගේ දේවල් කිව්වා කිව්වම. හරිම නපුරු, කාත් එක්කවත්... කිසිම කෙනෙක් එක්කවත් කතා නොකරන එයා!''

''අනේ එයා නපුරු නෑ නැන්සි. ඒ පිටට පේන හැටි...'' පොලියානා හතික ඇති වූ විශ්වාසදායී හැඟීමකින් කීවාය. ''මට තේරෙන්නෙ නෑ ඇයි හැමෝම එයා නපුරුයි කියල හිතන්නෙ කියල. කිසි කෙනෙක් එහෙම කියන එකක් නෑ, එයාව අඳුනනවා නං. පුංචි අම්මා උණත් එයාට ඒ හැටි කැමති නෑ. ඔයා දන්නවනෙ. එයා මිස්ට පෙන්ඩල්ටන්ට ජෙලි යැව්වෙ නෑ. ඒ වගේම තමයි එයා හරියට බය වුණා මං ගෙනිච්ච එක එයා එව්වැයි කියල මිස්ට

පෙන්ඩල්ටන් හිතනවට...''

''ඒ දෙන්නා අතර කිසිම ආශ්‍රයක් තියෙන්න නැතුව ඇති...'' යි දෙවුර අකුලමින් නැන්සි කීවාය. ''ඒත් මට හිතාගන්න බැරි එයා ඔයාව පිළිගත්ත එක මිස් පොලියානා, කිසිම අමනාපයක් නැතුව. අත්තටම, එයා සාමාන්‍යයෙන් ළමයින්ට කැමති විදියේ කෙනෙක් නෙවේ. ඇත්තටම එයා එහෙම නෑ....''

පොලියානා ප්‍රීතියෙන් සිනාවක් පෑවාය.

''ඒත් එයා එහෙම තමයි නැන්සි...'' යි ඇය හිස සැලුවාය. ''හැම තිස්සෙම එහෙම නැති වුණත්... මට තේරුණ විදියට. අද එයා මට කිව්වා, දැන් ටික කාලෙකට කලින්, එයාට මාව කවදාවත් දකින්න නොලැබෙනවා නං හොඳයි කියල හිතුනලු. ඒකට හේතුව, මාව දකිනකොට එයා අමතක කරල දාන්න හදන දෙයක් මතක් වෙනවාලු. ඒත් ඊට පස්සෙ...''

''ඒ මොකද්ද?'' යි පුදුමයට පත් වූ නැන්සි බාධා කළාය. ''එයා ඔයාට කිව්වා, එයා අමතක කරන්න හදන දෙයක් ඔයා දකින කොට මතක් වෙනවා කියල?''

''ඔව්, ඒත් ඊට පස්සෙ...''

''මොකද්ද ඒ?'' යි නැන්සි ඉතා ඕනෑ කමින් විමසුවාය.

''එයා ඒක මට කිව්වෙ නෑ. එයා කිව්වෙ 'අමතක කරන්න ඕන දෙයක්' කියල විතරයි.''

''අභිරහස!'' යි හුස්මක් අල්ලා ගත් නැන්සි, පුදුමයෙනුත් ත්‍රාසයෙනුත් හඬ ගෑවාය. ''ඒක තමයි එයා ඔයාට පළවෙනි තැන දීල තියෙන්නෙ. අනේ, මිස් පොලියානා, ඒක හරියට පොතක තියෙන කතාවක් වගේ. මං ඒ වගේ පොත් ගොඩක් කියවලා තියෙනවා. ''මෝඩ් ආර්යාවගේ රහස'', ''නැතිවූ උරුමය'', ''අවුරුදු

ගාණකක් සැඟවී'', වගේ පොත්වල තියෙන්නෙ හරියටම මේ වගේ අභිරහස්. මගේ දෙයියනේ! ටිකක් හිතන්නකො, ඒ වගේ පොතක් අත දිග ඇරපු මානෙම ජීවත් වෙලා ඉන්දැද්දී, මෙච්චර කල් ඒක ගැන නොදැන හිටපු එක. දැන් මට එයා කියපු හැමදේම... හැමදේම කියන්න මිස් පොලියානා. පුදුමයක් නෙමෙයි එයා ඔයාව ආශ්‍රය කරන්න හිතපු එක. පුදුමයක් නෙමෙයි.. පුදුමයක් නෙමෙයි.''

''ඒත් එයා එහෙම කළේ නෑ'' යි පොලියානා කෑ ගැවාය. ''මං එයා එක්ක ඉස්සර වෙලාම කතා කරන කල්. එයා මං කව්ද කියල දැන ගෙන හිටියෙ නෑ. මං ජෙලි එක අරන් යනකම්. මට සිද්ධ උණා, ඒක එව්වෙ පුංචි අම්මා නෙමෙයි කියල එයාට ඒත්තු ගන්වන්නත්....''

නැන්සි එකවරම නැගී සිට, දැත් එකිනෙක මිරිකා ගත්තාය.

'අනේ මිස් පොලියානා, මම දන්නවා, මම දන්නවා, මම දන්නවා....'' යි ඇය නොනවත්වාම කියාගෙන යන්නට වූවාය. ඊළඟ මොහොතේදී ඇය පොලියානා පසෙකින් හිඳ ගත්තාය. ''මට කියන්න... දැන් හිතන්න, උත්තරේ කෙළින්, හරි එකක් වෙන්න ඕනෑ...'' යි ඇය පුදුමයට පත්වෙමින් උනන්දු කළාය. ''ඔයා මිස් පොලී ගෙ අක්කගෙ දූ කියල දැන ගත්තට පස්සෙ නේද එයා කිව්වෙ ඔයාව ආයමෙත් දකින්න නොලැබෙනවා නං හොඳයි කියල. එහෙම නේද?''

''අනේ ඔව්. ඒක ගැන කිව්වෙ එයාව මට හම්බවුණු අන්තිම දවසෙ. එයා ඔය කතාව කිවෙ අද...''

''මං ඔහොම හිතුව...'' යි නැන්සි ජයග්‍රාහී ලීලාවෙන් කීවාය. අනිත් එක පොලී මැඩම්.. එයා හිතා මතාම ජෙලි එක යැව්වෙ නෑ නේද?''

''නෑ''

''ඉතිං ඔයා කිව්වා, ඒක එච්චෙ මිස් පොලී නෙමෙයි කියල...''

''ඇයි, ඔව්...මම...''

''ඉතිං එයා එකපාරටම අමුතු විදියට හැසිරෙන්න පටන් ගත්තා, ඔයා මිස් පොලීගෙ අක්කගෙ දූව කියල දැන ගත්තාම. එයා එහෙම කළා, නැද්ද?''

''ඇයි...ඔ..ඔව්. එයා ටිකක් අමුතු විදියට තමයි ඔය ජෙලි එක ගැන හැසිරුණේ..'' යි එකතු කළ පොලියානා කල්පනාකාරී ලෙස නළල රැලි කර ගත්තාය. නැන්සි දිගු හුස්මක් හෙලුවාය.

''දැන් මං ඒක දන්නවා, මට විස්වාසයි, දැන් අහගන්න, ජෝන් පෙන්ඩල්ටන් මහත්තයා තමයි මිස් පොලී හැරින්ටන් ගෙ ආදරවන්තයා වෙලා හිටියෙ!'' යි නැන්සි හැඟීම්බරව කීවේ, උරහිසට පිටුපසින් ගෙල හරවා බලමිනි.

''ඒක වෙන්න බැනෙ නැන්සි. පුංචි අම්මා එයාට කැමති නෑනෙ...'' යි පොලියානා විරුද්ධ වෙමින් කීවාය.

නැන්සි අවඥා සහගත බැල්මක් හෙලුවාය. ''ඇත්තටම එයා කැමති නෑ තමයි. ඒගොල්ලො රණ්ඩු වෙලා!''

පොලියානා තවමත් අදහා ගත නොහැකිව බලා සිටින්නීය. තවත් දිගු හුස්මක් ඇදගත් නැන්සි, ප්‍රීතිමත් ස්වරයකින් කතාව කියන්නට හරිබරි ගැහුනාය.

''ඒක උණේ මෙහෙමයි. ඔයා මෙහෙට එන්න කලින් ටොම් මාමා මට කිව්වා, පොලී නෝනාට ඉස්සර ආදරවන්තයෙක් හිටියා කියල. මං ඒක විස්වාස කළේ නෑ... මට හිතාගන්න බෑ... එයයි ආදරවන්තයෙකුයි ගැන! ඒත් ටොම් මාමා කිව්වෙ එයාට එහෙම කෙනෙක් හිටියා කියලමයි. දැනටමත් ඒ මනුස්සයා මේ වටුමෙ ම ඉන්නවා කියලත් කිව්වා. දැං ඇත්තටම මට හිතාගන්න පුළුවන්. ඒ

තමයි ජෝන් පෙන්ඩල්ටන්. එයා ගෙ ජීවිතේ අභිරහස් නැද්ද? අර ලොකු ගෙදරට වෙලා දොරවල් වහගෙන, තනියම, කාත් එක්කවත් කතා නොකර නෙමෙයිද එයා ඉන්නෙ? ඔයා පොලී නෝනගේ නෑදෑයෙක් කියල දැනගත්තාම එයා අමුතු විදියට හැසිරුණේ නැද්ද? එයා දැන් කිව්වෙ නැද්ද, ඔයා දකින කොට එයා අමතක කරල දාන්න හදන දෙයක් මතක් වෙනවා කියල? කාටවත් ම කියන්න බෑ ඒ පොලී නෝන නෙවෙයි කියල. අනිත් එක එයත් කිව්වානෙ, එයා පෙන්ඩල්ටන් මහත්තයට කෑම යවන්නෙ නෑ කියලත්. ඇයි මිස් පොලියානා, ඒක සක්සුදක් වගේ පැහැදිලියි නෙව...''

''අනේ....'' යි පොලියානා විස්මයෙන් විසල් කරගත් දෑසින් යුතුව හුස්මක් අල්ලා ගත්තාය. ''ඒත් නැන්සි, මට නම් හිතෙන්නෙ ඒ ගොල්ලො කාලයක් ආදරේ කළා නම්, කවදහරි ආයෙත් යාලු වෙයි නෙ. ඒ දෙන්නාම, මෙච්චර අවුරුදු ගණනක් තිස්සෙ තනිවෙලා නෙ හිටියෙ. මං හිතන්නෙ, ආයෙත් යාලු වෙන්න පුළුවන් නම් ඒ ගොල්ලො සතුටු වෙයි.''

නැන්සි අවඥාවෙන් හිස සැලුවාය.

sinhalaebooks.com

''මට හිතෙන්නෙ ඔයා ආදරවන්තයො ගැන දන්නෙ නෑ මිස් පොලියානා. ඒක තේරුම් ගන්න තරං ඔයා තාම පුංචි වැඩියි. ඔයාගෙ ඔය ''සතුටු වෙන සෙල්ලම'' වැඩක් නැති කවුරු හරි මේ ලෝකෙ ඉන්නවා නං ඒ කොච්චරවත් රණ්ඩුවෙන ආදරවන්තයො දෙන්නෙක් වෙන්න ඕන. අපි මේ කියන දෙන්නත් එහෙම තමයි. පෙන්ඩල්ටන් මහත්තයාත් ගොඩක් වෙලාවට තරහ ගිහින් නෙමෙයිද ඉන්නෙ... පොලී නෝනාත්...''

හිටි වනම නැන්සි තමන් කතා කරන්නේ කාටද යන වග මතක් වීමෙන් කතාව නැවැත්තුවාය. ඊට පසු ඇය හදිසියේම සිනාසුනාය.

''මං එහෙම කියන්න හිතුවෙ නෑ මිස් පොලියානා. ඒත් ආපහු එකතු වෙන එක ගැන සතුටු වෙන්න, ඒ ගොල්ලො ලවා ඔය සෙල්ලම කරවන්න නං, ඔයාට ඒගොල්ලන්ගෙ කනෙන් රිංගන්න

වෙයි. හත්වලාමේ! පොලී නෝනයි ආදරවන්තයායි දිහා මිනිස්සු කොහොම බලයිද! මට හිතෙන හැටියට නං එහෙම දෙයක් වෙන්න පුළුවන් ඉඩ හොඳටම අඩුයි. හොඳටම අඩුයි...''

පොලියානා කිසිවක් නොකීවාය. එහෙත් ටික වේලාවකට පසුව, ගෙතුළට යනවිට ඇගේ මුහුණ බෙහෙවින් කල්පනාකාරීව තිබුණි.

# 18

# ප්‍රිස්ම

අගෝස්තුවේ උණුසුම් දවස් එකිනෙක ගෙවී යද්දී පොලියානා පෙන්ඩල්ටන් කඳු මුදුණේ පිටිහි විසල් මන්දිරය වෙත නිතර නිතර යාමට පුරුදුව සිටියාය. එහෙත් ඒ ගමන් හොඳටම සාර්ථක වූ බව කියන්නට ඇයට නුපුළුවන. ඇත්තටම, ජෝන් පෙන්ඩල්ටන් ඇය දැකීමට කැමැත්තෙන් සිටියත්... තමන් වෙත ඇය ගෙන්වා ගත්තත්, ඇගේ පැමිණීමෙන් පසු සතුටින් සිටින බවක් පෙනුණේ ඉතා කලාතුරකිනි: අඩුම තරමින් පොලියානා සිතුවේ එලෙසය.

ඔහු ඇය හා කතා බහ කරන බව ඇත්තය. ඒ වගේම තමන් සතු පොත්, පින්තූර, විසිතුරු බඩු වැනි අලංකාර පුදුම සහගත භාණ්ඩ ඇයට පෙන්වූ බවත් ඇත්තය. එහෙත් තවමත් තමන්ගේ අසරණකම ගැන ඔහු කණගාටුවෙන් සිටින බව සහතිකය. ඔහුගේ ආරාධනයකින් තොරව දැන් ඔහුගේ නිවසේ පදිංචි වී සිටින අත්

උදව් කරුවන්ගේ රෙගුලාසිවලට යටත් වී සිටීමෙන් ඔහු බලවත් මානසික පීඩනයකටද ගොදුරු වී සියින බව පැහැදිලිය. ඔහු ඇත්තෙන්ම පොලියානා කතා කරනු අසා සිටින්නට කැමති බවක් පෙනුණි.

පොලියානා ද ඔහු හා කතාබහ කරන්නට ආසා කළාය. එහෙත් ඒ අතරේ, කොට්ටය මත හිස තබාගෙන ඇඳේ වැතිරී සිටින ඔහුගේ සුදුමැලි, වේදනා බර බැල්ම දෙස තමන් නොබලා සිටියා යැයි සහතික වන්නට ඇයට බැරිය. ''සතුටුවීමේ සෙල්ලම'' ගැන ඔහුට කීම ගැනත්, ඔහු ලවා එය කරවීම ගැනත් බලන විට, එය ඇසීමට තරම්, එය ගණන් ගැනීමට තරම් සුදුසු මානසික මට්ටමකින් ඔහු සිටින බව මෙතෙක් කිසිදාක ඇය දැක නැත. ඇය, ඒ ගැන ඔහුට කීමට දෙවරක් උත්සාහ ගත්තාය. එහෙත් ඒ දෙවතාවේදීම තාත්තා ගැන සඳහන් කිරීමෙන් ඔබ්බට යන්නට පොලියානාට බැරිවිය. ඊට හේතුව ඒ හැම වතාවකදීම, ජෝන් පෙන්ඩල්ටන් එක් වරම කතාව වෙනතක හරවා, වෙනත් දෙයක් ගැන කතා කරන්නට පටන් ගැනීමයි.

පොලියානා, දැන් කිසි විටෙකත් පොලී පුංචි අම්මා සහ ජෝන් පෙන්ඩල්ටන් එක්තරා කාලයක ආදරවන්තයන් ව සිටි බව අවිශ්වාස නොකළාය. ඇය ඔවුන් පිළිබඳ ආදරණීය, විශ්වාසවන්ත හැඟීම්වලින් පිරී තිබූ ඇගේ මුළු හදින්ම, ඔවුන් ගේ තනිකඩ දුක්බර ජීවිතවලට සතුට උදාවේවායි පැතුවාය.

කොහොම නමුත් එය කළ හැක්කේ කෙසේ දැයි ඇයම නොදත්තාය. ඇය පෙන්ඩල්ටන් මහතා සමඟ ඇගේ පුංචි අම්මා ගැන කතා කළාය. ඔහු ඇතැම් විට සාවධානවත්, ඇතැම් විට නොරිස්සුම් සහගත හැඟීමෙනුත්, බොහෝ විට දෙතොල් අතර රැඳුණු සමච්චල් සහගත සිනාවකිනුත් ඊට ඇහුම් කන්දුන්නේය. පොලියානා ඇගේ පුංචි අම්මා සමඟත් පෙන්ඩල්ටන් මහතා ගැන කතා කරන්නටඃ වඩා නිවැරදිව කියනවා නම් කතා කරන්නට උත්සාහ ගත්තාය.

සාමාන්‍යයෙන් සිදුවන පරිදි පොලී මෙනෙවිය එය වැඩි වේලා අසා සිටියේ නැත. ඇයටත් ඒ හැමවිටම පාහේ කතා කරන්නට වෙනත් යමක් තිබුණි. ඇය වෙනත් බොහෝ අවස්ථාවලඃ උදාහරණයක් ලෙස පොලියානා දොස්තර කිල්ටන් ගැන කතා කරන විට පවා එලෙස හැසිරෙන්නට උත්සාහ කළාය. පොලියානා එයට හේතුව ලෙස සිතුවේ, එදා ගිම්හාන සඳැල්ල මත දී කොණ්ඩයේ රෝස මලක් ගසාගෙන ලේස් සාලුව දවටාගෙන සිටි පුංචි අම්මා, දොස්තර කිල්ටන් විසින් දකිනු ලැබීම ය කියායි. පොලී පුංචි අම්මා දොස්තර කිල්ටන් ට දරුණු අකමැත්තක් දැක්වූ අතර, පොලියානාට එය තේරුම් ගියේ නරක හෙම්බිරිස්සාවක් වැළඳී ගෙතුළට වී සිටින්නට වූ දවසකය.

''රෑ වෙන කොට ඔයාට අඩු වුනේ නැත්තං මම දොස්තරව ගෙන්නනවා...'' යි පොලී මෙනෙවිය කීවාය.

''ඇත්තද? එහෙනං මං මේක තවත් වැඩි කරගන්නවා....'' යි පොලියානා සතුට හඟවන හඬක් උගුරෙන් පිට කළාය. ''මං ආසයි ඩොක්ට කිල්ටන් මාව බලන්න එනවාට....''

sinhalaebooks.com

එවිට ඇගේ පුංචි අම්මාගේ මුහුණෙන් පළවූ පෙනුම දැක ඇය පුදුමයට පත්වූවාය.

''මං කිව්වෙ ඩොක්ට කිල්ටන් නෙමෙයි පොලියානා....'' යි පොලී මෙනෙවිය තදින් කීවාය. ''අපේ පවුලෙ දොස්තර ඩොක්ට කිල්ටන් නෙමෙයි. මං එන්න කියන්නෙ ඩොක්ට වොරන් ට, ඔයාට තව වැඩි උණොත්...''

පොලියානාගේ අසනීපය සුව අතට හැරුණු අතර, දෝස්තර වොරන් කැඳවීමේ අවශ්‍යතාවයක්ද මතු නොවීය.

''මට හරි සතුටුයි...'' යි එදා හැන්දෑවේ පොලියානා ඇගේ පුංචි අම්මාට කීවාය. ''මං ඩොක්ට වොරන්ට කැමතියි තමයි. ඒත් ඊට වඩා ඩොක්ට කිල්ටන් ට කැමතියි. මං හිතන්නෙ එයාට වුණත්

හිත රිදෙයි මාව බලන්න එන්න වුණේ නැත්තං. ඇත්තටම එයාගෙ වැරැද්දක් නෑ. මං ඔයාව ලස්සනට අන්දවපු දවසෙ, එයා ඔයාව දැක්කෙ අහම්බෙන් පුංචි අම්මෙ....'' යි ඇය වේදනාවෙන් කීවාය.

''ඔය ඇති පොලියානා, මට ඇත්තටම ඕන නෑ ඩොක්ට කිල්ටන් ගැනවත්... එයාගෙ හැඟීම් ගැනවත් කතා කරන්න....'' පොලී මෙනෙවිය තරවටු කරන හඬකින් කීවාය.

පොලියානා ඇය දෙස කුතුහලයෙන් පිරුණු, දුක්මුසු දෑසින් බලා සිටියාය. ඊට පසු ඇය සුසුමක් හෙලුවාය.

''මම හරි කැමතියි, ඔයාගෙ කම්මුල් ඔහොම රෝස පාට වෙලා තියෙනවා දකින්න පුංචි අම්මෙ. ඒත් මම ගොඩාක් කැමති ඔයාගෙ කොණ්ඩෙට මෝස්තරයක් දාන්න. ඇයි පුංචි අම්මෙ...'' එහෙත් ඒ වන විට පුංචි අම්මා ඇගේ දසුනෙන් ඉවත්ව, පහත සාලාවට ගොස් සිටියාය.

අගෝස්තු මාසයේ අග භාගයේ දවසක පොලියානා උදේ පාන්දරින්ම ජෝන් පෙන්ඩල්ටන් ගේ නිවසට ගියාය. එහිදී ඇයට ඔහු වැතිර උන් කොට්ටය මත නිල්පාට, රත්තරන් පාට, කොළපාට, රතුපාට, දම්පාට රේඛා රාශියක් ඇඳී තිබෙනු දැක ගන්නට හැකි විය.

''ආනේ... මිස්ට පෙන්ඩල්ටන්. මෙන්න පුංචි දේදුන්නක්. ඇත්තම දේදුන්නක් ඇවිත් ඔයාව බලන්න...!'' යි හඬ ගෑ ඇය, මුදු ලෙස ඇගේ දෑත් එකිනෙක මිරිකා ගත්තාය. ''අනේ... අනේ... අනේ, ඒක කොච්චර ලස්සනද! ඒත් ඒක කොහොමද මෙතෙන්ට ආවෙ...'' යි ඇය කෑ ගැසුවාය.

පෙන්ඩල්ටන් මහතා තරමක් අසතුටුදායක අන්දමින් සිනහවක් නැගුවේය. ඔහු මේ උදෑසන අවට ඇති හැම දෙයක් ගැනම හිත නරක් කරගෙන ඉන්නා බව පෙනුණි. ''හොඳයි. මම හිතන්නෙ ඒක 'එන්න ඇත්තෙ...' අර ජනේලෙ එල්ලලා තියෙන උෂ්ණත්ව මානෙ, ආනතියක් තියෙන අග කොටසෙන් වෙන්න ඕන...'' යි ඔහු විඩාවට

පත් හඬකින් කීවේය. ''ඒකට ඉර එළිය වැටෙන්න හොඳ නෑ. ඒත් උදේ කාලෙට එහෙම වෙනවා...''

''අනේ. ඒත් ඒක හරිම ලස්සනයි, මිස්ට පෙන්ඩල්ටන්! ඒක වෙන්නෙ ඉර එළිය හිත්ද විතරද? මගේ අම්මේ! ඒක මගේ නං, මම දවස තිස්සෙම අව්වෙ තියනවා....!''

''හොඳට තියෙයි එතකොට!'' යි පෙන්ඩල්ටන් මහතා හිනැහුණේය. ''එතකොට ඔයා කොහොමද පරිසරය කොච්චර රස්නෙද හරි කොච්චර සීතලද කියල හරි දැන ගන්නෙ, උෂ්ණත්ව මානෙ දවස තිස්සෙම අව්වෙ එල්ලලා තියෙන කොට...''

''ඒකට මට කමක් නෑ....'' යි හුස්මක් අල්ලා ගත් පොලියානා, ඇගේ විස්මයට පත් වූ දෑස්, කොට්ටය මතට වැටී තිබුණු, වෛවර්ණයෙන් යුතු පටිය මත රැඳවූවාය. ''දවස තිස්සෙම දේදුන්නක් ඇතුළේ ජීවත් වෙන්න ලැබුණොත්, ඕනෑම කෙනෙක් එහෙම කරයි.''

පෙන්ඩල්ටන් මහතා හිනැහුණේය. ඔහු පොලියානා ගේ ප්‍රීතියෙන් පිනා ගිය මුහුණ දෙස මද කුතුහලයෙකින් බැලීය. එක්වරම ඔහුට අලුත් අදහසක් ආවේය. ඔහු අසළ තිබූ සීනුවක් හැඬවීය.

sinhalaebooks.com

''නෝරා''යි අර වැඩිහිටි කාන්තාව දොර ඉදිරියේ පෙනී සිටි විට ඔහු කීවේය.

''ඉස්සරහ සාලෙ විමිතිය ළඟ තියෙන ලොකු, පිත්තල ඉටිපන්දම් රඳවනය අරන් එන්න....''

''හා සර්...'' යි මදක් පුදුමයට පත්ව සිටි කාන්තාව මිමිනුවාය. මිනිත්තුවකින් පමණ පසු ඇය ආපිට ආවාය. විස්මයෙන් ඇඳ දෙසට පිය නැගූ ඈ සමග කිංකිණි රාවයක්ද කාමරයට ඇතුළු විය. එය පැමිණියේ ඇය අත තිබූ පරණ තාලේ ඉටි පන්දම් රඳවනයක් වටා එල්ලෙමින් තිබූ ප්‍රිස්ම* කෑලි වලිනි.

* ප්‍රිස්ම - පිරමීඩාකාර වීදුරු කැබලිය. මේවා මතට ආලෝකය වැටුණු විට විවිධ වර්ණවලට වෙන් වී දේදුන්නක් මෙන් දිස්වේ.

"ස්තූතියි. ඕක මෙතනින් තියන්න...." යි පෙන්ඩල්ටන් මහතා විධානය කළේය. "දැං නූලක් අරගෙන අර ජනෙල් රෙද්ද එල්ලා තියෙන කොක්කට හයි කරන්න. ජනෙල් රෙද්ද අයින් කරලා, ජනේලෙ එහා කොනේ ඉඳන් මෙහා කොණට නූල අල්ලන්න. එච්චරයි. ස්තූතියි." ඇය ඔහු කී පරිදි සියල්ලම ඉටු කළ විට ඔහු කීවේය.

කාන්තාව කාමරයෙන් පිටවී ගිය පසු ඔහු සිනාසෙන දෑස්වලින්, පුදුමයට පත්ව සිටි පොලියානා දෙස බැලුවේය.

"කරුණාකරලා, අර ඉටිපන්දම් රඳවනය මං ළඟට අරන් එන්න පොලියානා...."

අත් දෙකින්ම අල්ලාගෙන ඇය එය ඇඳ ළඟට ගෙන ගිය පසුව, ඔහු ඒ වටා තිබූ ප්‍රිස්ම කැලි එකිනෙක ගලවන්නට විය. අන්තිමේදී ඇඳ වටා පැත්තෙන් පැත්තට දමා තිබුණු ප්‍රිස්ම කැලි දුසිමක් පමණ තිබුණි.

"දැන් දරුවො ඔයාට පුළුවන් නේද මේ ප්‍රිස්ම ටික තෝරලා, තෝරා ජනේලෙ හරහට ඇදපු ලණුවෙ එල්ලන්න. ඔයාට දේදුන්නක ජීවත් වෙන්න ඕන නං එහෙම කරන්න. මට නං එහෙම පේන්නෙ නෑ, ඒත් අපිට දේදුන්නක් ඕන වෙලා තියෙනවානෙ ඔයාට ජීවත් වෙන්න!"

පොලියානා නූල හරහට ප්‍රිස්ම තුනක් එල්ලීමට මත්තෙන් ම, සිදුවෙන්නට යන දේ ගැන කුඩා අවබෝධයක් ඇයට ලැබිණ. ඇය ඉතා පුදුමයට පත් වී සිටි අතර, ඉතිරි ප්‍රිස්ම කැලි ටික එල්ලා ගැනීමට ඇගේ වෙව්ලන ඇඟිලි ඉතා අමාරුවෙන් පාලනය කරගත්තාය. එහෙත් අන්තිමේදී වැඩය අහවර වූ විට, ඇය පිටුපසට අඩි තැබුවේ ප්‍රීතිය හඟවන පහත් හඬක් කරමිනි.

එය සුරංගනා ලෝකයක් බවට පත්වී තිබුණි... ඒ අනර්ඝ එහෙත් අඳුරු කාමරය! හැම තැනෙකම රතුපාට සහ කොළපාට, දම්පාට

සහ තැඹිලි පාට, රත්තරන් සහ නිල්පාට, සෙවණැලි එහාට මෙහාට නාටමින් තිබිණි. බිත්තිය, බිම, ලී බඩු මෙන්ම ඇඳ පවා නොයෙක් පැහැයෙන් ආලෝකමත් වෙලාය!

''අනේ, අනේ, අනේ, කොච්චර ලස්සනද!''යි හුස්මක් ඇදගනිමින් පොලියානා කීවාය. ඊට පසුව ඇය හදිසියේම සිනාසෙන්නට වූවාය. ''මට දැන් හිතුනා. ඉරත් ඒ සෙල්ලම කරන්න හදනවා වගේ කියල.... ඔයා එහෙම හිතන්නෙ නැද්ද?'' යි ඇය කෑගැවේ, පෙන්ඩල්ටන් මහතා ඇය කතා කරමින් සිටින දෙස ගැන කිසිම දෙයක් නොදන්නා බව අමතක කරමිනි. ''අනේ... මට මේ වාගේ ඒවා ගොඩක් තියෙනවා නං කොයි තරං හොඳයිද! ඒවා පොලී පුංචි අම්මාටයි, මිසිස් ස්නෝටයි... තවත් හුඟ දෙනෙකුටයි දෙන්න පුළුවන් නං මං කොච්චර කැමතිද! මට හිතෙන්නෙ එතකොට ඒ ගොල්ලො සන්තෝස වෙයි කියල. මට විස්වාසයි පොලී පුංචි අම්මා උනත් මේ වගේ දේදුන්නක ජීවත් උණොත්, දොරවල් දඩාං ගාලා වහන්න තරං සන්තෝස වෙයි. එහෙම නේද?''

පෙන්ඩල්ටන් මහතා සිනාසුණේය.

sinhalaebooks.com

''හොඳයි.... ඔයාගෙ පුංචි අම්මා ගැන මගේ මතකයේ හැටියට නං මිස් පොලියානා, මට කියන්න වෙනවා, ඔය විදියට එයා සන්තෝස කරන්න නං ප්‍රිස්ම කෑලි දෙක තුනකට වඩා වැඩි යමක් ඕන වෙයි. ඒත් මෙහාට එන්න, දැන් කියන්න ඇත්තටම, මොකද්ද ඒ කතාවෙ තේරුම?''

පොලියානා තුෂ්නීම්භූත වී බලා සිට දිගු සුසුමක් හෙලුවාය.

''අනේ මට අමතක උණා. ඔයා ඒ සෙල්ලම ගැන දන්නෙ නෑ කියල. මට දැනුයි මතක් වුණේ...''

''මං හිතනවා, ඔයා මට ඒක ගැන කියයි කියල....''

ඉතින්, මෙවර පොලියානා ඔහුට ඒ ගැන කීවාය. ඇය ඒ පිළිබඳ සියලුම විස්තර මුල පටන්ම; බෝනික්කන් ඕනෑ වූ විට

කිහිලිකරු ලැබුණ තැන් පටන් ම ඔහු හා කීවාය. ඇය ඒ විස්තරය කියද්දී, ඔහුගේ මුහුණ දෙස බැලුවේ නැත. ඇගේ - ප්‍රීතියෙන් පිනා ගිය මුහුණ තවමත්, හිරු එළිය වැටුණු ජනේලය ළඟ පැද්දෙමින් තිබූ, ප්‍රිස්ම කැලිවලින් විහිදුණු එහාට මෙහාට නටන පාට රේඛා මත රැඳී තිබිණ.

''ඉතිං ඕක තමයි විස්තරේ....'' අවසන් සුසුමක් හෙළමින් ඇය කීවාය. ''දැං ඔයා දන්නවා නෙ, ඉරත් ඒ සෙල්ලම කරනවා ඇති කියල. මම කියපු එකේ තේරුම....''

මොහොතක නිහැඬියාවක් පැතිරිණි. ඊට පසු ඇඳ දෙසින් පහත් ස්වරයක් නැඟී ආවේය.

''සමහර විට. ඒත් මට හිතෙනවා ඒවා අතර තියෙන හොඳම ප්‍රිස්මය ඔයා කියල, පොලියානා!''

''අනේ, ඒත් මට බැනෙ ඉර එළියෙ හිටියට ලස්සන රතු, දම්, කොළ පාට විහිදන්න... මිස්ට පෙන්ඩල්ටන්!''

''ඔයාට බැරිද''යි ඔහු මදහසක් පෑවේය. පොලියානා ඔහුගේ මුහුණ දෙස බැලූ විට, දෑසේ කඳුළු පිරී තිබෙනු දැක පුදුමයට පත්වූවාය.

''බැනෙ...'' යි ඇය කීවාය. මිනිත්තුවක් පමණ ගතවූ පසු ඇය දුක්බර ලෙස මෙසේ කීවාය. ''මට හිතෙන්නෙ මිස්ට පෙන්ඩල්ටන්, ඉරට පුළුවන් මගෙ මූණෙ දුඹුරු ලප ඇති කරන්න විතරමයි. පොලී පුංචි අම්මත් කිව්වා, ලප එන්නෙ ඉර අව්වට අහු උනාම කියල...''

පෙන්ඩල්ටන් මහතා මඳක් සිනාසුණේය. නැවත වතාවක් පොලියානා ඔහු දෙස බැලුවාය. ඒ සිනහව, ඉකි බිඳුමකට සමාන වී ය.

# 19

# පුදුමයක්

සැප්තැම්බර් මාසයේදී පොලියානා පාසලට ඇතුළු වූවාය. sinhalaebooks.com ප්‍රාරම්භ පරීක්ෂණවලදී ඇය ඇගේ වයසට සරිලන තරමේ සතුටුදායක මට්ටමක් පෙන්නුම් කළාය. ඉතින් ඇයට ඇගේම වයසේ ගැහැනු සහ පිරිමි ළමයින් සිටින පන්තියක සාමාජිකාවක වන්නට වරම් ලැබිණ.

පාසල, සමහර විටෙක පොලියානාට පුදුමයක් වූ අතර, බොහෝ විට පොලියානා, පාසලට පුදුමයක් වූවාය. හැම දෙයක්ම ඉක්මනින් හොඳ අතට හැරුණු අතර අන්තිමේදී පොලියානා පුංචි අම්මාට කියා සිටියේ පාසල් යාම 'ජීවත් වෙන' අන්දමේ වැඩක් බවය. එහෙත් මුලදී ඇය සිතා සිටියේ ඒ ආකාරයට නොවේ.

අලුත් වැඩකටයුතුවල ප්‍රීතියෙන් තියැලෙන අතරේ වුවද

පොලියානා පරණ මිතුරන් අමතක නොකළාය. ඇත්තටම කියනවා නම් ඔවුන් සඳහා වැඩි කාලයක් වෙන් කිරීමට දැන් ඇයට නොහැකි වුවද, ඇය හැකි සෑම විටෙකම ඔවුන් බලන්නට ගියාය. කොහොම නමුත් මේ හේතුව නිසා, වැඩිපුරම කණස්සල්ලෙන් ඉන්නට ඇත්තේ ජෝන් පෙන්ඩල්ටන් වන්නට ඇත.

එක් සෙනසුරාදා හැන්දෑවක ඔහු ඒ ගැන පොලියානාට කීවේය.

''මේ බලන්න පොලියානා, ඔයාට මෙහෙ නවතින්න එන්න බැරිද?'' යි ඔහු ඇසුවේ මද නොඉවසිල්ලකිනි. ''මේ දවස්වල ඔයා කොහොමටවත් දකින්න හම්බ වෙන්නෙ නැතෙ...''

පොලියානා සිනාසුණාය. පෙන්ඩල්ටන් මහතා කොයිතරම් විහිලු කාරයෙක්ද!

''මං හිතුවෙ, ඔයා මෙහෙ වැඩිය මිනිස්සු ගැවසෙනවට කැමති නෑ කියල...'' යි ඇය කීවාය.

ඔහු මුහුණ ඇද කරගත්තේය.

''ආ...ඒ ඔයා අර සෙල්ලම කියල දෙන්න කලින්. දැන් මම එක කකුලකිනුයි, අතකිනුයි ඉන්න වෙච්ච එක ගැන සතුටු වෙනවානෙ! කමක් නෑ. මට ඉක්මනටම කකුල් දෙකෙන්ම හිට ගන්න ලැබෙයි නෙ. ඊට පස්සෙ මම බලන්නං, මෙහෙ කැරකෙන්නෙ කවුද කියල...'' යි කියා හමාර කළ ඔහු, කිහිළිකරුවක් අතට ගෙන, එය විනෝදකාමී ලෙස පොලියානා දෙසට වැනුවේය. අද ඔවුන් වාඩිගෙන සිටින්නේ මහ පුස්තකාලයේය.

''ඒත් ඔයා ඒ ගැන කොහොමටවත් සතුටු වෙන්නෙ නෑ. නිකං කියවනවා විතරයි...'' යි පොලියානා තොල පෙරලා ගත්තාය. ඇගේ දෑස් ගිනි උඳුන ඉදිරිපිට වැතිරී සිටින බල්ලා ළඟ නැවතී තිබිණි.

''ඔයාම දන්නවා. ඔයා තවමත් හරියට ඒ සෙල්ලම කරන්නෙ නෑ කියල මිස්ටර් පෙන්ඩල්ටන්. ඔයා ඒ බව දන්නවා...''

පෙන්ඩල්ටන් මහතාගේ මුහුණ බැරෑරුම් ස්වභාවයක් ගති.

''ඒක තමයි මට ඔයා ඕනෑ කරන්නෙ දරුවෝ. ඒක සෙල්ලං කරන්න මට උදව් වෙන්න. ඔයා මෙහෙ නවතින්න එනවාද?''

පොලියානා පුදුමයෙන් හැරී බැලුවාය.

''මිස්ටර් පෙන්ඩල්ටන්... ඇත්තටම ඔයා අදහස් කළේ නෑ නේද...ඒක...''

''මං ඇත්තටමයි කියන්නෙ. මට ඔයාව ඕන. ඔයා එනවද?''

''පොලියානා මහත් පීඩනයකට හසුවනු පෙනුණි.

''ඇයි මිස්ටර් පෙන්ඩල්ටන්, මට එහෙම කරන්න බැනෙ. ඔයා දන්නවා මට බෑ කියල. මම... පොලී පුංචි අම්මා ගෙ නෙ...''

sinhalaebooks.com

පෙන්ඩල්ටන් මහතා ගේ මුහුණේ හදිසියේම යමක් ඇදී ගිය අතර, පොලියානාට එය තේරුම් ගන්නට බැරි විය. ඔහු එක් වරම ඔලුව ඔසවා තියුණු බැල්මක් හෙලුවේය.

''ඔයා තවදුරටත් එයාගෙ නෙමෙයි. එහෙම... සමහරවිට එයා මෙහෙ නවතින්න ඔයාට ඉඩ දෙයි...'' යි ඔහු ශාන්ත හඬකින් අන්තිම වචන කීපය වෙන අතකට හැරවූයේය.

''එයා කැමති උණොත්... ඔයා එනවද?''

පොලියානා නළල රැලි කරගෙන ගැඹුරු කල්පනාවක ගැලුණාය.

''ඒත් පොලී පුංචි අම්මා මට... ගොඩාක් හොඳට සළකනවා...''

යි ඇය හෙමිහිට කියන්නට පටන් ගත්තාය. ''එයා මාව බාර ගත්තෙ මට කාන්තා සරණ සංගමේ කට්ටිය ඇරෙන්න වෙන කවුරුවත් හිටියෙ නැති වෙලාවක, තව...''

නැවත වතාවක් හදිසි ආවේගයක් ඔහුගේ මුහුණෙන් දිස්විය. ඒත් මේ වතාවේ ඔහු කතා කරන්නට පටන් ගත් විට, කටහඬ, පහත්, දුක්බර ස්වභාවයක් ගත්තේය.

''පොලියානා, ගොඩක් ඉස්සර මං කෙනෙකුට ගොඩාක් ආදරේ කළා. මම හිතුවා, එයාව කවදක හරි මේ ගෙදරට ගේනවා කියල. අපි මේ ගෙදර සන්තෝසෙන් ඉන්න හැටි ගැන, මං ඒ දවස්වල හිතෙන් මවා ගත්තා...''

''ඔව්'' යි දුක් වූ පොලියානා ගේ දෑස්, කඳුලින් බර වී තිබිණ.

''ඒත්... හොඳයි, මට ඒක කරන්න බැරි වුණා. ඒකට හේතුව අපි අමතක කරමු. මට ඒක කරන්න බැරි උනා... එච්චරයි. එදා ඉඳන්, මේක මහා මාලිගාවක් විතරයි. මේක කවදාවත් ''ගෙදරක්'' උණේ නෑ. ගෙදරක් වෙන්න නම්, ගෑනියෙකුගේ අතයි, හදවතයි හරි, ළමයෙක් හරි ලැබෙන්න ඕන පොලියානා. මට ඒ එකක් වත් ලැබුණෙ නෑ. දැං කියන්න, ඔයා එනවද දරුවො...?''

පොලියානා නැගී සිටියාය. ඇගේ මුහුණ හොඳටම ආලෝකමත් වී තිබුණි.

''මිස්ට පෙල්ඩල්ටන්. ඔයා... ඔයා... කියන්නෙ, ඔයා මෙච්චර කාලයක් තිස්සේ ඒ ගෑනු කෙනාගේ අතයි, හදවතයි ලැබුණා නම් කියල හිත හිතා හිටියා කියලද?''

''ඔව්... පොලියානා....''

''අනේ මට හරි සතුටුයි. එහෙනං ඔක්කොම හරි'' යි ඇය සුසුම් ලෑවාය. ''දැන් ඔයාට අපි දෙන්නාම එක්කගෙන එන්න පුළුවන්.

එතකොට හැම දෙයක්ම කොච්චර හොඳ වෙයිද?''

''එක්කගෙන එන්න... ඔය දෙන්නම...'' යි පුදුමයට පත් වූ පෙන්ඩල්ටන් මහතා ඇසීය.

පොලියානාගේ මුහුණේ සැකයක සේයාවක් ඇඳී ගියේය. .

''හොඳයි... ඇත්තටම, පොලී පුංචි අම්මා ගෙ හිත දිනාගන්න කාටවත් පුළුවන් වෙලා නෑ තවම. ඒත් මට විස්වාසයි. ඔයාට ඒක කරන්න පුළුවන්, ඔයා දූන් ඔය මට කියපු විදියටම කිව්වොත්. ඊට පස්සෙ අපි දෙන්නාම, මෙහෙ නවතින්න එන්නං. ඇත්තමයි...''

පෙන්ඩල්ටන් මහතා බිරාන්ත වී සිටියේය.

''පොලී පුංචි අම්මා... මෙහෙ එක්ක එන්න!''

පොලියානා ඇස් ලොකු කර ගත්තාය.

sinhalaebooks.com

''එහෙනං ඔයා එහෙ යන්නද කැමති?'' යි ඇය ඇසුවාය. ''ඇත්තටම ඒ ගෙදර ගොඩක් ලස්සන නෑ. ඒ වුණාට ඒක...''

''පොලියානා.... මොනවද මේ කියවන්නෙ?'' යි පෙන්ඩල්ටන් මහතා, මෙවර ශාන්ත හඬකින් ඇසුවේය.

''ඇයි? අපි කොහෙද ඉන්නෙ යන්නෙ කියලානෙ මේ කතා වෙන්නෙ...'' යි පොලියානා කීවේ පුදුම වෙමිනි. ''මං හිතුවෙ මුලින් ඔයා කිව්වෙ මෙහෙ ගැන කියල. ඔයා කිව්වෙ, ඔයාට මේ තරං කාලයක් ඕන වෙලා තිබුණෙ, පොලී පුංචි අම්මගෙ අතයි, හදවතයි අරගෙන මේක 'ගෙදරක්' කරන්න කියලනෙ.... ඉතින්....''

පෙන්ඩල්ටන් මහතාගේ මුවින් හඬක් පිටවිය. ඔහු අත ඔසවා කතා කරන්නට තැත් කළේය. එහෙත් ඊළඟ මොහොතේදී ඔහු හැඟීම් පාලනය කරගෙන අත පහත හෙලුවේය.

''දොස්තර මහත්තයා ඇවිත් සර්...'' වැඩිහිටි කාන්තාව දොර අසළ පෙනී සිට කීවාය.

පොලියානා යන්නට නැගී සිටියාය.

ජෝන් පෙන්ඩල්ටන් හිතේ කැළඹීමෙන් යුතුව, පොලියානා දෙසට හැරුණේය.

''පොලියානා, දෙයියන්ගෙ නාමෙට මං අහපු කිසි දෙයක් ගැන කියන්න එපා... තවම...'' යි ඔහු පහත් හඬින් යැද්දේය.

පොලියානා දීප්තිමත් මදහසක් පෑවාය.

''ඇත්තටම නෑ! ඔයාම ඒක එයාට කියන්න කැමැත්තෙන් ඉන්නවා කියල මම දන්නෙ නෑ කියලද හිතන්නෙ?'' යි ඇය පිටුපස හැරී විනෝදයෙන් කීවාය.

ජෝන් පෙන්ඩල්ටන් දුර්වල ලෙස පුටුව මතට වැටුණේය.

''ඇයි, මොකද උනේ?'' යි ඊට මිනිත්තුවකට පමණ පසුව දොස්තර මහතා ඇසුවේ තම රෝගියාගේ නාඩි බලමිනි.

ජෝන් පෙන්ඩල්ටන් ගේ දෙතොල් මතින් සිනහවක් පිපිරෙන්නට ආසන්න තිබිණ.

''ඔයාගේ බේත් වේල.... අද ටිකක් වැඩි වුණා මගෙ හිතේ...'' යි ඔහු සිනාසුණේය. ඒ වන විට නිවසින් පිටවී යන පොලියානා ගේ රුව දෙස දොස්තර මහතා බලා සිටිනු ඔහු දුටුවේය.

# 20

# ලොකුම පුදුමයක්

ඉරිදා උදෑසන පොලියානා පල්ලියටත්, දහම් පාසලටත් ගියාය. sinhalaebooks.com ඉරිදා හැන්දෑ වරුවේ දී නැන්සි සමඟ කොහේ හෝ ඇවිදින්නට යාම ඇගේ සිරිත වීය. සෙනසුරාදා හැන්දෑ වරුවේ ජෝන් පෙන්ඩල්ටන් මහතා ගේ නිවසට ගොස් ආ පසු, ඇය පසුදා නැන්සි සමග එවැනි ගමනක් යන්නට සැළසුම් කොට තිබුණාය. එහෙත් පසු දින දහම් පාසල ඇරී එනවිට ඇයට අතරමගදී දොස්තර කිල්ටන් හමුවිය. ඔහු ඇය දැක අසු නැවැත්තුවේය.

''පොලියානා, ඔයාව ගෙදරට බස්සන්න, ඔයා මට ඉඩ දෙයි මගෙ හිතේ...'' යි ඔහු යෝජනා කළේය. ''මට ඔයා එක්ක පොඩ්ඩක් කතා කරන්න ඕන. මං මේ ඔයාව හම්බවෙන්න ගෙදරට යන ගමං'' යි පොලියානා කරත්තයට නැග පසෙකින් හිඳ ගන්නා විට ඔහු කීවේය. ''මිස්ට පෙන්ඩල්ටන් කිව්වා නොවරදවාම අද හවසට

ගිහින් ඔයාව හම්බවෙන්න කියලා. එයාට වැදගත් යමක් කියන්න තියෙනවලු...,''

පොලියානා සතුටින් හිස සැලුවාය.

''ඔව්, ඒක එහෙම තමයි. මං දන්නවා. මම යන්නං....''

දොස්තර මහතා පුදුමයට පත් වෙමින් ඇය දෙස බැලීය.

''ඔයාට යන්න දෙන්න ඕනද කියල, මට හරියටම කියන්න බෑ...'' යි පැවසූ ඔහුගේ දෑස් දිස්න දෙමින් තිබිණි. ''ඔයා ඊයෙ එයාගෙ හිත හදනවාට වඩා, හිත කලබල කළා නේද පුංචි නෝනා.''

පොලියානා හිනැහුණාය.

''ආ... ඒ මං හින්දා නෙමෙයි... ඇත්තටම නෑ ඒ, පොලී පුංචි අම්මා නිසා, දන්නවද?''

දොස්තර මහතා තිගැස්සී හැරී බැලුවේය.

''ඔයාගෙ.. පුංචි අම්මා!'' යි ඔහු බිරාන්ත වෙමින් කීයේය.

පොලියානා ප්‍රීතිමත් ලෙස මදක් උඩ විසිවෙමින් ඉඳ ගත්තාය.

''ඔව්, ඒක හරිම පුදුම හිතෙන ලස්සන කතාවක් වගේ, දන්නවාද? මම... මම ඒක ඔයාට කියන්නං....'' යි හදිසියේ පහළ වූ හැඟීමකින් ඇය කියන්නට පටන් ගත්තාය. ''මිස්ට පෙන්ඩල්ටන් නම් කිව්වෙ ඒක කියන්න එපා කියල. ඒත් ඔයා දැන ගන්නාවට එයා අකමැති වෙන එකක් නෑ, ඇත්තටම. එයා කිව්වෙ පුංචි අම්මාට ඒක කියන්න එපා කියල....''

''පුංචි අම්මට....?''

"ඔව්, පොලී පුංචි අම්මට. ඉතිං ඇත්තටම එයාට ඕන වෙන්න ඇති මම කියනවට වැඩිය, ඒක එයාගෙ කටින් ම පුංචි අම්මට කියන්න.... ඒ ගොල්ල ආදරවන්තයො නෙ!"

"ආදරවන්තයෝ" දොස්තර මහතා ඒ වචනය කියන විටම, තෝන් ලණු හදිසියේ ගැස්සූ විටෙක මෙන් අශ්වයා කරත්තය ඇදගෙන උමතුවෙන් මෙන් දිව යන්නට විය.

"ඔව්" යි පොලියානා ප්‍රීතිමත් ලෙස හිස සැලුවාය.

"ඒක තමයි කතාවක් වගේ කිව්වෙ. මම ඒක දැනගෙන හිටියෙ නෑ, නැන්සි කියන කල්ම. එයා කිව්වා පොලී පුංචි අම්මට අවුරුදු ගාණකට ඉස්සර ආදරවන්තයෙක් හිටිය කියල. පස්සෙ ඒ ගොල්ලො රණ්ඩු උණාලු. නැන්සිත් දැනගෙන හිටියෙ නෑ මුලදි ඒ කව්ද කියල. ඒත් දැන් අපි ඒක හොයාගෙනයි තියෙන්නෙ. ඒ තමයි මිස්ට පෙන්ඩල්ටන්, දන්නවද?"

දොස්තර මහතා හදිසියේම සැනසුම් සුසුමක් හෙලනු පෙනුණි. තෝන් ලණු අල්ලාගෙන සිටි ඔහුගේ දෑත් දුබල ලෙස උකුල මතට වැටිණි.

sinhalaebooks.com

"ඒක වෙන්න බෑ, මම... දන්නෙ නෑ...."..." යි ඔහු ශාන්ත ලෙස කීවේය.

ඔවුන් ඒ වන විට හැරින්ටන් බංගලාවට ළඟා වෙමින් සිටි නිසා, පොලියානා ඉක්මනින් කතා කර ගෙන ගියාය.

"ඔව් දැන් මට හරි සතුටුයි. ඒක එළියට ආවෙ හරි ලස්සන විදියකට. මිස්ට පෙන්ඩල්ටන් මට කිව්වා එහෙ ඇවිත් නවතින්න කියල. ඒත් මට පොලී පුංචි අම්මාව දාල යන්න බෑනෙ. එයා මෙච්චර හොඳට මට සැළකුවට පස්සෙත්. ඊට පස්සෙ තමයි එයා කිව්වෙ, ගෑනු කෙනෙක්ගෙ අතයි, හදවතයි එයාට ඕන වෙලා තිබුණු කතාව. ඉතිං මට හරිම සන්තෝස හිතුනා. ඇත්තටම දැන්

එයාට ඕන වෙලා තියෙන්නෙ ආපහු සමාදාන වෙන්න නං හැම දෙයක්ම හොඳට සිද්ද වෙයි. එතකොට පොලී පුංචි අම්මයි, මමයි දෙන්නම එහෙ නවතින්න යනවා. එහෙම නැත්තං, එයා මෙහෙ එයි අපිත් එක්ක ඉන්න. ඇත්තටම පොලී පුංචි අම්මා මේ ගැන තාම මොනවත් දන්නෙ නෑ. අපිට ඒ කතාව ඉවරයක් කරගන්න බැරි උණා. මට හිතෙන්නෙ නං එයාට මාව හම්බවෙන්න ඕන ඇත්තෙ ඒකයි. මට විස්වාසයි....''

දොස්තර මහතා හනික කෙළින් වී ඉඳ ගත්තේය. ඔහුගේ දෙතොල් අතරේ අමුතු සිනහවක් රැඳී තිබිණ.

''ඔව්, මට හිතාගන්න පුළුවන් මිස්ට පෙන්ඩල්ටන්ට ඔයාව දකින්න ඕන වෙලා තියෙනවා කියන එක, පොලියානා....'' යි හිස සැලූ ඔහු දොරකඩ අසු නවත්වමින් කීයේය.

''අන්න, පොලී පුංචි අම්මා ජනේලෙ ළඟ!'' යි කෑ ගැසූ පොලියානා, මොහොතකට පසුව ''නෑ.... එයා එතන නෑ. මං හිතන්නෙ මං එයාව දැක්කා!''

''නෑ.... එයා දැන් එතන නෑ...'' යි පැවසූ දොස්තර මහතාගේ මුවෙහි සිනහව අතුරුදහන් වී තිබුණි.

පොලියානාට එදා හැන්දෑ වරුවේදී, හමු වුණේ, බෙහෙවින් කලබලයට පත්ව තමන් එනතුරු බලා සිටි ජෝන් පෙන්ඩල්ටන්වය.

''පොලියානා....'' ඔහු එක් වරම කතාවට බැස්සේය.

''මං ඊයෙ තිස්සෙ කල්පනා කළේ. මෙච්චර කාලයක් ඔයාගෙ පොලී පුංචි අම්මගෙ අතයි හදවතයි මං බලපොරොත්තු වුණා කියල, ඔයා ඊයෙ කියපු විකාර කතාව ගැන, ඇත්තටම ඒකෙන් ඔයා මොකද්ද අදහස් කළේ...''

''ඇයි, ඔය ගොල්ලො ආදරවන්තයො වෙලා හිටියා කියලනෙ.

ඉතිං මට හරි සන්තෝස හිතුණා, ඔයා තවමත් එහෙම හිතන එක ගැන....''

''ආදරවන්තයො... ඔයාගෙ පුංචි අම්මයි මමයි?''

පෙන්ඩල්ටන් මහතාගේ කඩ හඬේ ගැබ්වී තිබුණු පුදුමය නිසා, පොලියානා ඇස් ලොකු කර ගත්තාය.

''ඇයි මිස්ට පෙන්ඩල්ටන්, නැන්සි එහෙම කිව්වානෙ....!''

ඔහු මද සිනාවක් පෑවේය.

''ඇත්තටම? හොඳයි, මට කියන්න වෙනවා නැන්සි ඒ ගැන මොනවත් දන්නෙ නෑ කියලා...''

''එතකොට ඔයගොල්ලො... ආදරවන්තයො වෙලා හිටියෙ නැද්ද?'' යි ඇසූ පොලියානා ගේ කටහඬ වඩාත් දුක්බර විය.

sinhalaebooks.com

''කවදාවත් නෑ...!''

''එහෙනං, ඒක පොතක එන කතාවක් වගේ නෙමෙයි!''

ඊට පිළිතුරක් ලැබුණේ නැත. පෙන්ඩල්ටන් මහතාගේ හැඟීම්බර දෑස් ජනේලය දෙසට යොමුවී තිබිණ.

''අනේ දෙයියනේ. හැම දේම හරිම හොඳට සිද්ධ වෙවී තිබුණා.'' පොලියානාට ඇඬුම් යන්න ආවේය. ''මම හරිම සතුටෙන් හිටියෙ පොලී පුංචි අම්මත් එක්ක මෙහෙට එන්න....''

''ඉතිං... දැන් ඔයා එන්නෙ නැද්ද?'' යි පෙන්ඩල්ටන් මහතා හිස නොහරවාම ඇසීය.

''ඇත්තටම නෑ. මම පොලී පුංචි අම්මගෙ...''

පෙල්ඩල්ටන් මහතා ඔලුව ගස්සා බැලුවේය.

''ඔයා එයාගෙ වෙන්න කලින් පොලියානා, ඔයා ඔයාගෙ අම්ම ගෙ දුව වුණේ. මට ගොඩක් කාලෙකට කලින් ඕන වෙලා තිබුණෙ ඔයාගෙ අම්ම ගෙ අතයි හදවතයි...''

''මගේ අම්මගෙ!''

''ඔව්. මං ඒක ඔයාට කියන්න හිතුවෙ නෑ. ඒත් අන්තිමට බලනකොට ඒක කියන එක හොඳයි. මම දැන්... කියන්නං.''

ජෝන් පෙන්ඩල්ටන් ගේ මුහුණ හොඳටම සුදුමැලි විය. ඔහු කතා කළේ අපහසුවකින් බව පැහැදිලිය. පොලියානා භීතියෙන් විසල් වූ දෙනෙතින් යුතුව, මුව අයාගෙන ඔහු දෙස ඇසිපිය නොහෙලා බලා උන්නාය.

''මං ඔයාගෙ අම්මාට ආදරේ කළා. ඒත් එයා මට ආදරේ කළේ නෑ. ටික කාලෙකට පස්සෙ එයා ඔයාගෙ තාත්තා එක්ක ගියා. මම ඒ වෙන කං දැනගෙන හිටියෙ නෑ, මං එයා ගැන කොයි තරම් බලාපොරොත්තු තියාගෙන හිටියද කියල. මට දැනුණේ මුළු ලෝකෙම මගේ ඇස් ඉදිරිපිට කඩා වැටෙනවා වගේ. ඒත් ඒකට කමක් නෑ. අවුරුදු ගණනක් තිස්සෙ මම නපුරු, නිතරම තරහ යන, ආදරයක් නොලබපු, ආදරේ නොකරන නාකි මනුස්සයෙක් වගේ හිටිය. මට තවම අවුරුදු හැටට කිට්ටු වෙලාවත් නැතිකොට. ඉතින්, එක දවසක් අර ඔයා ගොඩක් ආසා කරපු ප්‍රිස්ම වගේ, ඔයා මගේ ජීවිතේට ඇවිත් මගේ අඳුරු ලෝකෙ, ඔයාගෙ ප්‍රීතිමත් බව කියන දම්පාට රත්තරන් පාට, රතුපාට එළිය විහිදුවලා ආලෝකමත් කළා. මම ටික කාලෙකට පස්සෙ, ඔයා කව්ද කියල දැනගත්තාට පස්සෙ, ආයෙම කිසි දවසක ඔයා දකින්න ඕන නෑ කියල හිතුවා. මට ඕන වුණේ නෑ ඔයාගෙ අම්මා ගැන ආයෙමත් මතක් කරගන්න. ඒත් ඔයා දන්නවා ඊට පස්සෙ සිද්ධ වෙච්ච දේ. මට ඔයා ගෙන්නා ගන්න සිද්ධ උණා. දැන් මට ඔයා හැම තිස්සෙම ඕන. පොලියානා, දැන්වත්...

ඔයා එනවද?''

''ඒත් මිස්ට පෙන්ඩල්ටන් මට... පොලී පුංචි අම්මා ඉන්නවා නෙ...''

පොලියානාගේ දෑස් කඳුලින් පිරී තිබිණ.

පෙන්ඩල්ටන් මහතා නොඉවසිලිමත් පෙනුමක් මවා ගත්තේය.

''එතකොට මට මොකද වෙන්නෙ? ඔයා හිතන්නෙ කොහොමද මම කිසිම දෙයක් ගැන සන්තෝස වෙයි කියලා, ඔයා නැතුව? ඇයි පොලියානා, ඔයා හම්බ වුණාට පස්සෙ තමයි... මට ජීවිතේ ගැන බාගයක් හරි සතුටු වෙන්න පුළුවං උණේ. මට ඔයා මගේම පුංචි දරුවෙක් කර ගන්න පුළුවන් නම්. මට ඕනෑම දෙයක් ගැන සන්තෝස වෙන්න පුළුවං. මම ඔයාව සන්තෝස කරන්න පුළුවන් තරං උත්සාහ කරන්නං මගෙ දරුවො. කාටවත් ඉෂ්ඨ කරන්න බැරි ප්‍රාර්ථනාවල් තියෙන්න ඕන නෑ. අන්තිම සතේ දක්වා, මගෙ ළඟ තියෙන ඔක්කොම සල්ලි ඔයාව සන්තෝසෙන් තියන්න වියදං වෙන්න ඕන....''

sinhalaebooks.com

පොලියානා තිගැස්සුණාය.

''ඇයි මිස්ට පෙන්ඩල්ටන්... ඔයා ඒවා ඉතුරු කළේ මිථ්‍යාදෘෂ්ටිකයන් වෙනුවෙන් නේද?.. ඒවා මට වියදං කරන්න මං ඉඩදුන්නොත්, ඒ ගොල්ලන්ට මොකද වෙන්නෙ?''

පෙන්ඩල්ටන් මහතාගේ මුහුණ රතු පැහැයකට හැරිණි. ඔහු කතා කරන්නට උත්සාහ කළ නමුත් පොලියානා දිගටම කතා කරගෙන යන්නට වූවාය.

''ඒ විතරක් නෙමේ. ඔයා වගේ ගොඩක් සල්ල තියෙන කෙනෙකුට, සන්තෝසෙන් ඉන්න මං වගේ කෙනෙක් ඕන නෑ. ඔයා අනිත් අයට දේවල් දීලා ඒ ගොල්ලො සතුටු කරනකොට

ඔයාට ඔයා ගැන සතුටු නොවී බැරි වෙනවා. ඇයි ඔයා මිසිස් ස්නෝටයි, මටයි අර ප්‍රිස්ම දුන්නා. නැන්සිගෙ උපන් දිනේට රත්තරන් පවුමක් දුන්නා. ඉතිං...''

''ඔව්... ඔව්, ඒවා ගැන ඒ හැටි හිතන්න එපා''යි ඔහු බාධා කළේය. ඔහුගේ මුහුණ හොඳටම, හොඳටම රතු පැහැ වී තිබුණි.

ඒ ගැන පුදුම වෙන්නට දෙයක් නැත. සමහර විටෙක ඒ ඉස්සර 'කිසිවෙකුටත් කිසිවක් නොදෙන' මිනිසෙකු හැටියට ජෝන් පෙන්ඩල්ටන් ප්‍රසිද්ධව සිටීම නිසා විය හැකියි.

''ඒවා ඔක්කොම විකාර. ඒවා මොනවද? ඒත් ඒ දේවල් එහෙම උණේ... එහෙම උණේ ඔයා නිසයි. ඒ දේවල් දුන්නෙ ඔයා. මම නෙමෙයි. ඔව් ඔයා තමයි ඒක කළේ'' යි ඔහු නැවත නැවතත් කීවේ අදහාගත නොහැකි ලෙස බලා සිටින පොලියානා ගේ තැතිගත් බැල්මට පිළිතුරක් ලෙසිනි. ''ඒකෙන් තව තවත් ඔප්පු වෙන්නෙ ඔයාව මට කොච්චර අවශ්‍යද කියන එක දරුවො...'' යි ඔහු කීවේය. ඔහුගේ කට හඬ මෘදු, ආයාචනාත්මක ස්වරයක් බවට පත්වෙමින් තිබිණි. ''මං කවදක හරි, කවදක හරි ඒ 'සන්තෝස වෙන සෙල්ලම' කරන්න නං ඔයාට ඇවිත් මාත් එක්ක ඒක කරන්න වෙනවා.

පොලියානා දුක්මුසු ලෙස නළල රැළි කර ගත්තාය. ''පොලී පුංචි අම්මා, මට ගොඩක් හොඳට සළකනවා...'' යි ඇය කියන්නට පටන් ගත් අතර, පෙන්ඩල්ටන් මහතා ඊට බාධා කළේය. ඔහුගේ මුහුණට අර පැරණි නොරුස්සන සුළු ස්වභාවය පැමිණෙමින් තිබිණි. හැමදාමත් ජෝන් පෙන්ඩල්ටන් ගේ ගතිගුණයක් ව තිබුණු නොඉවසිල්ල පාලනය කර ගන්නට මෙහිදී ඔහුට බැරි විය.

''ඔව්... ඇත්තටම එයා ඔයාට හොඳට සළකනවා තමයි. ඒත් මට සහතිකයි, එයාට ඔයාව ඕන නෑ, මට ඕන වෙන තරං.''

''ඇයි මිස්ට පෙන්ඩල්ටන් එයා සතුටු වෙනවා, මම දන්නවා...''

''සතුටු වෙනවා!'' යි බාධා කළ පෙන්ඩල්ටන් මහතා ගේ ඉවසීම දැන් හොඳටම නැතිවී ගොස් ය.

''ඕනෑ ඔට්ටුවක්. ඔය පොලී තෝනා කිසිම දෙයක් ගැන සතුටු වෙන්න දන්නෙ නෑ. ආ! එයා එයාගෙ රාජකාරිය නං කරයි. මං නොදන්නවායැ. එයා 'රාජකාරි' කරන ගෑනියෙක්. මට තියෙනවා එයාගෙ 'රාජකාරි' ගැන මීට කලින් අත්දැකීම්. අපි පහුගිය අවුරුදු පහළොව, විස්ස තිස්සෙ හොඳම යාලුවො වෙලා හිටපු නැති එක හැබෑව. ඒත් මං එයා ගැන දන්නවා. හැමෝම දන්නවා එයාගෙ හැටි. එයා ඔය 'සතුටු වෙන' ජාතියෙ කෙනෙක් නම් නෙවෙයි පොලියානා. එයා එහෙම වෙන්නෙ කොහොමද කියල දන්නෙවත් නෑ. ඔයා නිකමට එයා ගෙන් අහල බලන්න... මගේ ගෙදර නවතින්නද කියල. එයා එපා කියනවද බලන්න. අනේ දරුවො! මට ඔයාව කොයි තරං ඕනද?'' යි ඔහු බිඳුනු හඬින් කතාව නැවැත්තුවේය.

පොලියානා දිගු සුසුමක් හෙලමින් නැගී සිටියාය. ''හරි... මම එයාගෙන් අහන්නං...'' යි ඇය දුක්බර ලෙස කීවාය. ''ඇත්තටම මං අදහස් කළේ ඔයා එක්ක මෙහෙ නවතින්න මම කැමති නෑ කියන එක නෙමේ, මිස්ට පෙන්ඩල්ටන්. ඒත්...'' ඇය ඉතිරි අඩ ගිල ගත්තාය. මොහොතකට නිහැඬියාවක් පැතිරිණි. ඊට පසු ඇය ''මං සතුටුයි මං ඒක ඊයෙ එයාට කිව්වෙ නැති එක ගැන. ඒ මොකද මම හිතුවෙ එයාවත් ඔයාට ඕන කියලනේ...''

ජෝන් පෙන්ඩල්ටන් මඳ සිනාවක් පෑයේය.

''හොඳයි... ඔව් පොලියානා, ඔයා ඒක ඊයෙ කිව්වෙ නැත්තෙ ඒකයි කියල මමත් හිතුවා...''

''මම කිව්වෙ නෑ... ඩොක්ටර් ට ඇරෙන්න. ඇත්තටම එයා දැනගත්තට කමක් නැනෙ.''

''ඩොක්ටර්...'' යි ජෝන් පෙන්ඩල්ටන් හඬ නැගීය. ඔහු වහා හැරී ''ඩොක්ට චිල්ටන්.. නෙමෙයි.. නේද?'' යි කීවේය.

sinhalaebooks.com

''ඔව් එයා තමයි. එයා මාව හම්බ වෙන්න ඇවිත් ඔයාගෙ පණිවිඩේ ඊයෙ කියපු වෙලාවෙ තමයි මම ඒ කතාව කිව්වෙ....''

''හොඳයි, ඔක්කොම...'' යි මුනු මුනු ගෑ පෙන්ඩල්ටන් මහතා, පුටුව මතට ඇද වැටුනේය. ඊට පසු හදිසියේ ඇති වූ උනන්දුවකින් ඔහු කෙළින් වී ඉඳ ගත්තේය.

''එතකොට ඩොක්ට කිල්ටන් මොකද කිව්වෙ....'' යි ඔහු ඇසුවේය.

''ආ! මට ඒක නං මතක නෑ හරියටම. එයා කිව්වා, ඔයාට මාව හම්බවෙන්න ඕන ඇයි කියලා එයාටත් හිතා ගත්තැකි කියල...''

''ආ! ඇත්තද! එයා එහෙම කිව්වද?'' යි ජෝන් පෙන්ඩල්ටන් කීවේය. එහෙත් පොලියානා කල්පනා කළේ, එය කියන විට ඔහු අමුතු සිනහවක් පෑවේ ඇයිද කියායි.

# 21

# ප්‍රශ්නයක්

පොලියානා ජෝන් පෙන්ඩල්ටන් ගේ නිවසේ සිට හනික ගෙදර එන විට, මහා වැස්සක් කඩා හැලෙන්නට මෙන් අහස අඳුරු වී තිබිණ. මඟක් දුර එන විට ඇයට කුඩයකුත් රැගෙන ඉදිරියට එන නැන්සි හමු විය. එහෙත් ඒ වෙලාව වන විට, වැස්ස නොඑන බව කියමින් වැහි වළාකුළු ඈතට පාවී ගොස් තිබිණ.

sinhalaebooks.com

"උතුරු පැත්තට වහින්නයි යන්නෙ මගෙ හිතේ..." නැන්සි අහස දෙස විමසුම් ඇසින් බලමින් කීවාය. "මං නං කිව්වෙ ම මෙහාට දූත් වහින එකක් නෑ කියල. ඒත් පොලී මැඩම් තමයි කිව්වෙ කුඩේකුත් අරන් මගට එන්න කියල. එයා හරියට ඔයා ගැන වද වෙනවා..."

"ඇත්තට?" යි පොලියානා කීවද, ඇය වෙනත් කල්පනාවක ගැලී

අහස දෙස බලා උන්නාය.

"ඔයා චුට්ටක්වත් ඇහුවෙ නෑ මං කියපු එක" යි නැන්සි කණගාටුවෙන් කීවාය. මං කිව්වෙ ඔයාගෙ පුංචි අම්මා, ඔයා ගැන හරියට වද වෙනවා කියල..."

"ආ!" යි පොලියානා සුසුමක් හෙලුවාය. ඇයට එක්වරම පුංචි අම්මාගෙන් ඇසීමට බලාපොරොත්තුවෙන් සිටින ප්‍රශ්නය සිහියට නැගිණ. "මට සමාවෙන්න. මං එයාව බය කරන්න හිතුවෙ නෑ..."

"හොඳයි... මට සතුටුයි..."නොසිතූ විරූ ලෙස නැන්සි කීවාය. "මට සතුටුයි.. ඇත්තටම..."

පොලියානා දෑස් අයා ගත්තාය. "පුංචි අම්මා මා ගැන බයවුණ එකට ඔයා සතුටු වෙනවාද? ඇයි නැන්සි, ඒ, සෙල්ලම කරන හරි විදිහ නෙමෙයි! ඔය වගේ දේවල්වලට සතුටු වෙන එක!" යි ඇය විරුද්ධ වූවාය.

"ඒකෙ ඇති සෙල්ලමක් නෑ..." යි නැන්සි එකටෙක කීවාය. "මං එහෙම හිතුවෙ නෑ. ඔයාට තේරෙන්නෙ නැද්ද ළමයො, පොලී මැඩම් ඔයා ගැන වද වෙනවා කියන එකේ තේරුම...."

"ඒ කියන්නෙ.. එයා මං ගැන වද වෙනවා. වද වෙනවා කියන්නෙ.. හොඳ දෙයක් නෙමේ ඇත්තටම..." යි කියා සිටි පොලියානා "ඒකෙ වෙන තේරුමක් තියෙනවද?" යි ඇසුවාය.

නැන්සි හිස වැනුවාය.

"හොඳයි මං කියන්නං ඒ මොකද්ද කියල. ඒ කියන්නෙ අන්තිමේදී එයාට අනිත් අයට වගේ මනුස්සකං තේරෙනවා කියන එකයි. ඒ කියන්නෙ, එයා හැම තිස්සෙම එයාගෙ රාජකාරිය විතරක් කරල ඉන්න හදන්නෙ නෑ කියන එකයි."

"ඇයි නැන්සි" යි අන්ද මන්ද වෙමින් පොලියානා කීවාය.

''පොලී පුංචි අම්මා හැම තිස්සෙම කරන්නෙ එයාගෙ රාජකාරිය තමා. එයා 'රාජකාරි කරන' ගෑනියෙක්.'' පොලියානා නොදැනුවත්වම, මීට පැය බාගයකට කලින් ජෝන් පෙන්ඩල්ටන් කී වචන ප්‍රතිරාවය කළාය.

නැන්සි කට තද කරගෙන සිනාසුණාය.

''ඔයා හරි... එයා එහෙම තමයි. හැම වෙලාවෙම එහෙමයි, මං හිතන්නෙ. ඒත් ඔයා ආවට පස්සෙ ඉඳල, එයා ටිකක් වෙනස් වෙලා...''

පොලියානාගේ මුහුණ වෙනස් විය. ඇගේ ඇහි බැම කරදරකාරී බැල්මක් මවමින් රැළි ගැසිණ.

''අන්න, ඒක තමයි මං මේ ඔයාගෙන් අහන්න යන්නෙ නැන්සි''යි ඇය සුසුම් ලෑවාය.

''ඔයා හිතන්නෙ, පොලී පුංචි අම්මා මම මෙහේ ඉන්නවට කැමතියි කියලද? එයා මොනවහරි හිතයි ද, මම... මම... මෙහෙන් ගියොත්?''

sinhalaebooks.com

නැන්සි, කුඩා දැරියගේ කල්පනාවෙන් බරවූ මුහුණ දෙස ක්ෂණික බැල්මක් හෙලුවාය. ඇය මෙවැනි ප්‍රශ්නයකට පිළිතුරු දෙන්නට සිදු වේ යැයි සිතුවේ මීට බොහෝ කාලයකට ඉහතදී ය. ඒ ගැන සිතීම පවා ඇයට ඒ දවස්වල නම් බිය ගෙන දෙන්නක් විය. ඊට හේතුව, ඒ ප්‍රශ්නයට දෙන උත්තරය.. පොලියානා ගේ සිත නොරිදවා අවංකවම දෙන උත්තරය, කුමක් දැයි ඇය නොදැන සිටීමයි. ඒත් දැන්... දැන් නම් ඇයට ඒ ප්‍රශ්නයට නොබියව මුහුණ දිය හැකිය. හැන්දෑ වරුවේදී පොලී මෙනෙවිය, කුඩයක් රැගෙන මඟට යන්නට කීමෙන් ඇය පිළිබඳව අලුතින් සිතන්නට යමක් නැන්සි ගේ හිත තුළ ඉතිරිව තිබිණ. ඉතින් දැන් හැම තිස්සෙම ආදරය බලාපොරොත්තුවෙන් සිටින මේ කුඩා දැරියට සැනසීමක් ගෙන දෙන වචනයක් කියන්නට තමන්ට හැකි බව නැන්සිට හොඳටම

විස්වාසය.

''ඔයා මෙහෙ ඉන්නවාට කැමතිද! මෙහෙන් ගියොත් එයා දුක් වෙයිද!'' යි නැන්සි කුපිත වෙමින් කීවාය. ''මම මේ කිය කියා හිටියෙ විහිළු කතාවක් කියලද හිතුවෙ? අහස කලු කරනවා දැකපු ගමන් එයා මට කුඩයක් දීලා මඟට එන්න කිව්වෙ නැද්ද? ඔයාගෙ බඩු ඔක්කොම මට පාත තට්ටුවට ගේන්න කිව්වෙ, ඔයාට හොඳ, ලස්සන කාමරයක් ඕන වෙලා තිබුණු හින්ද නේද? ඇය මිස් පොලියානා, පොඩ්ඩක් හිතන්නකො, මුලදි එයා කොච්චර අකමැති...''

කැස්සක් ආ නිසා මෙහි ඉතිරි අඩ ගිලගන්නට නැන්සිට පුළුවන් විය.

''ඕවා මට ඇඟිලි ගහන්න පුළුවන් කාරණා නෙමේ.'' යි නැන්සි හුස්ම නාල්ලමින් ම කියාගෙන ගියාය. ''ඒ වගේ දේවල්වලින් තමයි, ඔයා කොච්චර එයාගෙ හිත මෙලෙක් කරලා තියෙනවාද කියල පේන්නෙ. අර පූසයි, බල්ලයි හදාගන්න ඉඩ දීපු එක, එයා මට කතා කරන විදිය... අනේ! තව කොච්චර දේවල් තියෙනවද ඒකට! ඇයි මිස් පොලියානා, ඔයා මෙහෙන් ගියොත්, එයා කොච්චර දුක් වෙයිද කියල කියන්න තව මොනවත් ඕනෑ නෑ නේද?'' යි නැන්සි උද්යෝගයෙන් කියා සිටියේ, ඇයට මීට මොහොතකට පෙර කියවෙන්නට ගිය නරක කතාව යටපත් කරන්නට මෙනි. ඒ වන විටත් ඇයට පොලියානාගේ මුහුණ ආලෝකමත් කරමින් නැගී ආ හදිසි ප්‍රීතිය පෙනී තිබුණේ නැත.

''අනේ නැන්සි, මට හරි සතුටුයි.. සතුටුයි.. සතුටුයි! ඔයා දන්නෙ නෑ, පොලී පුංචි අම්මාට මාව ඕනෑ කියලා දැන ගත්තාම මට කොච්චර සතුටුද කියලා.''

''හරියටම මම දැන් ම එයාව දාලා යන්න හදනවා වගේ...'' ඊට ටික වේලාවකට පසුව නිවෙසට ඇතුළු වී කාමරය වෙත යන

අතරේ පොලියානා කල්පනා කළාය.

''හැමදාම පොලී පුංචි අම්මා එක්ක ඉන්න මට ඕනෑ වෙලා තිබුණා කියන එක මං දැනගෙන හිටියා. ඒත් පොලී පුංචි අම්මට මාව ඕනෑ කියන එක අහන්න මට කොච්චර ඕනෑ වෙලා තිබුණද!''

ජෝන් පෙන්ඩල්ටන් ට ඇගේ තීරණය ගැන දැනුම් දීම ලෙහෙසි පහසු කටයුත්තක් නොවන වග පොලියානා දැන සිටියාය. ඇත්තෙන්ම ඒ කටයුත්තට ඇය බිය වූවාය. ඇය, ජෝන් පෙන්ඩල්ටන්ට ඉතා කැමතිව සිටි අතර ඔහු ඔහු ගැනම දුක්වෙන හැටි බලා ඉඳීමෙන් ඇගේ හද දුකින් බරවී තිබිණි. ඔහු මෙතරම් දුක්ඛිත අඩියකට ඇද දමා ඇති, ඒ තනිකඩ, දිගු ජීවිතය ගැන ඇත්තෙන්ම ඇය ඉතා කණගාටු වූවාය. ඇයට ඒ ගැන වැඩිපුරම තැවෙන්නට සිදු වුණේ, මෙතරම් දුක්බර ජීවිතයක් ඔහු ගෙවන්නේ ඇගේ අම්මා නිසාය යන හැඟීමෙනි. කෙදිනක හෝ ඔහුගේ ජීවිතයට යළි සැනසීම උදා වුවහොත් එදිනට ඒ සුවිසල් මන්දිරය, එහි නිහඬ කාමර, කුණු පිරුණු ගෙබිම සහ අවුල් වූ මේස සමඟ කොයි තරම් ප්‍රිය ජනක තැනක් බවට පත් වෙයිද කියා ඇය සිහින මැව්වාය. ඔහුගේ පාළු ජීවිතය ගැන සිතත්ම, ඇගේ හදවත රිදුම් දුන්නේය. ඇය පැතුවේ කෙදිනක හෝ කවුරුන් හෝ හමුවී... ඔන්න! මෙතැනදී ඇය ප්‍රීතියෙන් හඬක් පිට කරමින් උන් තැනින් නැගී සිටියේ ඇයට හදිසියේම කල්පනා වූ අදහස නිසාය.

ඊට පසු පුළුවන් වූ විගසම වාගේ, ඇය කඳු මුඳුනේ පිහිටි ජෝන් පෙන්ඩල්ටන් ගේ මන්දිරයට හනික ගියාය. අන්තිමට එහි අඳුරු පුස්තකාලයේ ඇය ඉදිරිපිට වූ අසුනක, හින්දෑරි දිගු අත් පුටු ඇඳි මත තබා ගෙන වාඩි ගෙන සිටින ජෝන් පෙන්ඩල්ටන් ඇය දුටුවාය. ඔහුගේ දෙපා අසල ඔහුගේ විශ්වාසවන්ත බල්ලා වැතිරී සිටියේය.

''හොඳයි පොලියානා, දූන් අර 'සතුටු වෙන සෙල්ලම' මාත් එක්ක කරනවාද, ජීවිතේ පුරාම?'' යි මුදු ලෙස ඔහු ඇසුවේය.

''ආ, ඔව්'' යි පොලියානා ප්‍රීතියෙන් කීවාය. ''ඔයාට හොඳටම සතුටු වෙන්න පුළුවන් විදියේ වැඩක් මම කල්පනා කළා. ඉතිං...''

''ඔයා එක්ක නෙ?'' යි ජෝන් පෙන්ඩල්ටන් ඇසුවේය. ඔහුගේ මුව සතුට හඟවන ඉරියව්වකට හැරෙමින් තිබිණ.

''න්...නෑ, ඒත්...''

''පොලියානා, ඔයාට බෑ කියන්න බෑ...!'' ඉතා හැඟීම් බර කට හඬකින් ඔහු බාධා කළේය.

''මට එහෙම කරන්න වෙනවා, මිස්ටර් පෙන්ඩල්ටන්, ඇත්තටම කරන්න වෙනවා. පොලී පුංචි අම්මා....''

''එයා ඔයාට... එන්න දෙන්න බෑ කිව්වද?''

''මම... මම. එයාගෙන් අහන්න ගියේ නෑ...'' යි කුඩා දැරිය දුක්මුසු ලෙස ගොත ගැසුවාය.

පොලියානා ඇගේ දෑස් ඉවතට හරවා ගත්තාය. ඇයට ඔහුගේ වේදනාබර, දුක්මුසු බැල්ම දරා ගත නොහැකිය.

''ඉතින් ඔයා එයාගෙන් ඇහුවෙවත් නෑ...!''

''මට එහෙම කරන්න බෑ... ඇත්තටම...'' යි පොලියානා අමාරුවෙන් වචන ගැට ගැසුවාය. ''ඔයා දන්නවාද, මම ඒක දැනගත්තෙ.. එයාගෙන් අහන්න යන්නෙ නැතුව. පොලී පුංචි අම්මට මාව ඕනෑ. ඉතිං මටත් ඕනෑ එයත් එක්ක නවතින්න...'' ඇය හිතට දිරිය ගෙන කියා සිටියාය. ''ඔයා දන්නෙ නෑ, එයා මට කොයිතරං හොඳට සළකනවද කියල. මට හිතෙනවා සමහර වෙලාවට එයා දැන් ගොඩක් දේවල් ගැන සතුටු වෙන්න පටන් අරන් කියල. ඔයා දන්නවානෙ, එයා කවදාවත් එහෙම හිටියෙ නෑ කියල. ඔයාම එහෙම කිව්වානෙ. අනේ, මිස්ටර් පෙන්ඩල්ටන්, මට නං දැන් පුංචි

අම්මාව දාලා එන්න බෑ....''

දිගු නිහැඬියාවක් පැතිර ගියේය. ගිනි උඳුනේ දර පිලිස්සෙන හඬින් පමණක් ඒ නිහඬ බව වරින් වර බිඳිණි. අන්තිමේදී, පෙන්ඩල්ටන් මහතා කතා කළේය.

''නෑ පොලියානා. මට තේරෙනවා. ඔයාට දැන් එයාව දාලා එන්න බෑ...'' යි ඔහු කීවේය.

''මම ඒ ගැන ඔයාගෙන් අහන්නෙ නෑ.. තවත්...'' අන්තිම වචනය ඔහු ඉතා සෙමින් කී අතර, එය හඬ නැගුණේ නැති තරම්ය. එහෙත් පොලියානාට එය ඇසිණි.

''අනේ, ඒත් ඔයා දන්නෙ නෑ ඉතිරි හරිය...'' යි ඇය ඉතා ඕනෑ කමින් ඔහුට කියා සිටියාය.

''ඔයාට ගොඩාක් සතුටු වෙන්න පුළුවන් දෙයක් තියෙනවා කරනවා නම්... ඇත්තටම එහෙම වැඩක් තියෙනවා...''

sinhalaebooks.com

''මට එහෙම දේවල් තියෙන්න බෑ පොලියානා....''

''ඇයි බැරි? ඔයාම කියලා තියෙනවා, ගෑනියෙකුගෙ අතයි හදවතයි ලැබුණොත් හරි ළමයෙක් හිටියොත් හරි තමයි 'ගෙදරක්' වෙන්නෙ කියල. ඉතින් මට එහෙම කරලා දෙන්න පුළුවනි.... ළමයෙක් හොයා දෙන්න. මම නෙමෙයි හොඳද? ඒත් වෙන කාව හරි...''

''හරියට මං ඔයා ඇරෙන්න වෙන කෙනෙක් බාර ගනී වගේ!'' යි පෙන්ඩල්ටන් මහතා කුපිත වෙමින් කීවේය.

''ඒත් ඔයා එහෙම කරයි. ඔයා කොච්චර කරුණාවන්ත ද හොඳද කියලා ඔයා ම දන්නකොට! ඇයි, හිතන්නකො ටිකක්. අර ඔයා දීපු ප්‍රිස්මයි, රත්තරන් ගැනයි, මිත්‍යාදෘෂ්ටිකයන් ට ඉතුරු කරපු

සේරම සල්ලි ගැනයි. ඉතිං...''

''පොලියානා!'' යි පෙන්ඩල්ටන් මහතා වියරුවෙන් මෙන් බාධා කළේය.

''ආයෙ කවදාවත් කතා නොකරන්නම අපි මේ විකාර කතා නවත්තලා දාමු. මම ඔයාට මේක කියන්න අනන්තවත් උත්සාහ කරලා ඇති. මං ගාව ඔය කියන මිත්‍යාදෘෂ්ටිකයන්ට දෙන්න සල්ලි නෑ. මම උන් වෙනුවෙන් සතයක් වත් දීලා නෑ ජීවිතේටම. ඔන්න!''

ඔහු හිස හරවා බැලුවේ ඔහු බලාපොරොත්තු වූ දෙය, එනම් පොලියානා ගේ බලාපොරොත්තු කඩවූ, දුක්බර දෑස්, බලා ගන්නටය. කොහොම නමුත් ඔහුගේ පුදුමයට මෙන් පොලියානා ගේ දෑස්වල කිසිම බලාපොරොත්තු කඩවීමක් හෝ දුකක් රැඳී තිබුණේ නැත.

''අනේ... අනේ!'' යි ඇය අත්පුඩි ගසමින් කෑ ගැවාය.

''මට හරිම සතුටුයි... ඒ කියන්නෙ...'' යි ඇය රතු වෙමින්, වහා නිවැරදි කරන්නට පටන් ගත්තාය.

''මම ඒකෙන් කියන්න අදහස් කළේ නෑ මං මිත්‍යාදෘෂ්ටිකයන්ට අනුකම්පා කරන්නෙ නෑ කියල. ඒත් අනිත් හැමෝටම ඉන්දියාවෙ පුංචි ළමයි ලොකු වෙනකොට, ඔයාට ඒ ගොල්ලො ලොකු නෑ කියල දැන ගත්ත එක ගැන සතුටු නොවී ඉන්න මට බෑ. ඉතිං මට හරි සතුටුයි, ඔයා ජිමී බීන්ව බාර ගන්න වැඩියෙන් කැමති වෙයි කියල හිතනකොට. දැන් මං දන්නවා ඔයා එයාව බාර ගන්නවා!''

''බාර ගන්න...කවුරු?''

''ජිමී බීන්'' එයා තමයි මං හොයලා දෙනවා කිව්ව 'ළමයා'. දන්නවද එයා හරි සතුටු වෙයි මේකට. මට එයාට ගිය සතියෙ කියන්න උණා, 'කාන්තා සරණ' සංගමේ කට්ටිය එයාව බාර ගන්න කැමති නෑ කියල. ඉතිං එයාගෙ හිත හරියට කැඩෙන්න ඇති. ඒත් දැන් එයා මේක ඇහුවාම... එයා හරි සතුටු වෙයි!''

''ඇත්තද? හොඳයි. මං නං සතුටු වෙන්නෙ නැතිවෙයි.'' යි පෙන්ඩල්ටන් මහතා කඩා පැන්නේය.

''පොලියානා මේක නං මහා විකාරයක්!''

''ඔයා ඔය කියන්නෙ... එයා බාර ගන්න කැමති නෑ කියන එක නෙමෙයි නේද?''

''ඇත්තටම ඒක තමයි!''

''ඒත් ඒවගේ ළමයෙක් ඉන්න එක කොයි තරං හොඳද?'' යි පොලියානා ගොත ගැසුවාය. ''ජිමී එක්ක ඉන්නකොට, ඔයාට පාළුවක් දැනෙන එකක් නෑ...'

''ඒකෙ නං දෙකක් නෑ තමා!'' යි කී පෙන්ඩල්ටන් මහතා. ''ඒත්... මං වැඩියෙන් කැමති තනියෙන් පාළුවෙන් ඉන්න...'' යි කීවේය.

sinhalaebooks.com

මෙහිදී පොලියානාට කෙදිනක හෝ නැන්සි ඇයට කී දෙයක් එක් වරම සිහියට නැගිණ. ඇය දුක්බර ලෙස හිස ඔසවා බැලුවාය.

''සමහර විට ඔයා හිතනවා ඇති පණ තියෙන, හොඳ පිරිමි ළමයෙක් තියා ගන්නවාට වඩා, අර පරණ, ඇටසැකිල්ලක් තියාගෙන ඉන්න එක හොඳයි කියලා. මම හිතන්නෙ එහෙම තමා...''

''ඇටසැකිල්ල!''

''ඔව්. නැන්සි කිව්වා, ඔයා එහෙම එකක් අල්මාරිය අස්සෙ දාගෙන ඉන්නවා කියල...''

''නෑ.. මොකක්?'' එක් වරම සිදු වී ඇති දේ කුමක්දැයි වටහා ගත් ඔහු, හිස පස්සට දමා හිනා වෙන්නට පටන් ගත්තේය. ඔහු

කොයිතරම් තදින් සිනාවෙන්නට පටන් ගත්තා දැයි කිවහොත්, හොඳටම කලබල වී උන් පොලියානාට කැගැසෙන්නට ගිය තරම්. අන්තිමට ඔහු සිනාව නවත්වා උන්නදුවෙන්, කෙළින් වී හරි බරි ගැහුණේය. එක් වරම ඔහුගේ මුහුණ බැරෑරුම් ස්වභාවයක් ගත්තේය.

''පොලියානා මං හිතන්නෙ ඔයා හරි. ඔයා හිතනවාටත් වඩා ඔයා හරි...'' යි ඔහු ශාන්ත හඬකින් කීවේය. ''ඇත්තටම මං දන්නවා පණ තියෙන හොඳ පුංචි පිරිමි ළමයෙකුට වඩා මගේ අල්මාරියෙ තියෙන ඇටසැකිල්ල හොඳ නෑ කියල. ප්‍රශ්නෙකට තියෙන්නෙ අපි හැම තිස්සෙම 'හුවමාරු' වලට කැමති නැති එක. අපි ස්වභාවයෙන්ම අපේ 'ඇටසැකිලි' තවමත් බදාගෙන ඉන්න ජාතියෙ මිනිස්සු. කොහොම නමුත්, ඔයා ඔය හොඳ පිරිමි ළමයා ගැන තව ටිකක් විස්තර කීවොත් හොඳයි....''

ඊට පසුව පොලියානා ඔහු ගැන විස්තර කියන්නට පටන් ගත්තාය.

සමහර විටෙක අර මහ සිනාවෙන් පසු හැම දෙයක් ම හොඳ අතට ඔහුට පෙනෙන්නට ඇත. එහෙමත් නැත්නම් ජිමී ගේ දුක්බර කතා පුවත, පොලියානාගේ පුංචි දෙතොල්වලින් ඉතා ඕනෑකමින් කියැවෙනු අසා, දැනටමත් පුදුමාකාර ලෙස මෘදු වී ඇති ඔහුගේ හදවත උණු වන්නට ඇත. ඒ සියලු සිද්ධි අවසානයේදී පොලියානා ආපසු ගෙදර ගියේ, ඊළඟ සෙනසුරාදා හවස් වරුවේ, ඒ විසල් මන්දිරයට පැමිණෙන ලෙස ජිමී බීන්ට කරනු ලැබූ ආරාධනයකුත් අතැතිවය.

''අනේ මට හරි සතුටුයි. මට හොඳටම විස්වාසයි ඔයා එයාට කැමති වෙයි.'' පෙන්ඩල්ටන් මහතාගෙන් සමුගන්නා විට, සුසුමක් හෙලමින් පොලියානා කීවාය. ''මට හුඟක්ම ඕනෑ කම තියෙන්නෙ ජිමී බීන්ට හොඳට සළකන මිනිස්සු ඉන්න ගෙදරක් හොයල දෙන්න...''

# 22

# අනුශාසනා සහ දර අටු

පොලියානා ජිමී බීන් ගැන ජෝන් පෙන්ඩල්ටන්ට කී හැන්දෑවරුවේ පෝල් ෆෝඩ් දේවගැති තැන පෙන්ඩල්ටන් වන රොදට ඇතුලු වූයේ, දෙවියන් වහන්සේ විසින් මවන ලද පරිසරයේ නිහඬ සුන්දරත්වය, මිනිසුන්ගේ කළකෝලාහලයෙන් බිඳී ඇති දැයි සැකයෙනි.

sinhalaebooks.com

එදින පෝල් ෆෝඩ් දේවගැතිතුමා ගේ හදවත දුකින් බරවී තිබිණ. පසුගිය වසරේ මාසයක් මාසයක් පාසාම, ඔහුට අයත් මීසමේ තත්වය හොඳටම නරක අතට හැරෙමින් තිබෙන්නේය. අන්තිමට බලන විට දැන් කොයි අතක හැරුණත් ඔහුට දකින්නට ලැබෙන්නේ අඬදබර වීම්, නැති තැන එකිනෙකාට දොස් පවරා ගැනීම්, කේලම් සහ ඊර්ෂ්‍යාව පමණි. ඔහු ඔවුන් සමග තර්ක කළේය. බැරි තැන ගණන් නොගෙන සිටියේය. එහෙත් මේ තත්වය නැති වේවායි ඔහු

හැමවිටම... අවංකවම දෙවියන් යැද ඉල්ලා සිටියේය. එහෙත් අද, ඉතා කණගාටුදායක ලෙස, මේ තත්වය හොඳ අතට නොව තවත් නරක අතටම හැරෙන බව අකමැත්තෙන් හෝ පිළිගැනීමට ඔහුට සිදු වී තිබේ.

ඔහුගේ පල්ලියේ උපස්ථායකවරුන් දෙදෙනෙකු කිසිම තේරුමක් නැති දෙයකට හිත් අමනාපකම් ඇති කරගෙනය. පල්ලියේ 'කාන්තා සරණ' සංගමයේ උද්යෝගීමත් සාමාජිකාවන් තිදෙනෙකු දැනටමත් සංගමයෙන් ඉල්ලා අස්වී ඇත. ඊට හේතුව පුංචි ඕපාදූපයක් දුර දිග ගොස්, එය සිත් තැවුල් ඇති කරන අපකීර්තියක් බවට පෙරළී ඇති හෙයිනි. එක්තරා තෝරාගත් ගායකයෙකුට ගායනා කිරීමට දුන් ගීතිකා ගණන මත, ඇති වූ හබය නිසාවෙන් පල්ලියේ ගීතිකා කණ්ඩායම විසිරී ගොසිනි. ක්‍රිස්තියානි සංගමයේ නිලධාරීන් දෙදෙනෙකු ප්‍රසිද්ධියේ විවේචනයට ලක්වීම නිසා, එම සංගමය තුළද නොසන්සුන්තාවයක් හටගෙනය. අන්තිමට ම සිදුවූ දෙය ඉරුදින දහම් පාසලේ ප්‍රධානියා ඇතුලු ගුරුවරුන් දෙදෙනෙකු ඉල්ලා අස්වී යාමය. මේ සියලු කරදරවලින් හෙම්බත් වූ පියනම, නිහඬ වනපෙතට වැදුණේ යාඥා කිරීමට හා හිත මදක් සන්සුන් කරගන්නටය.

කොළ පැහැති තුරු මුදුන්වලින් සැදුණු ආරුක්කුවක් යට වාඩිගත් පියනම, සිදු වී ඇති දෙය ගැන වඩා සාධාරණ ලෙස බලන්නට උත්සාහ කළේය. ඔහුගේ මනසට දැනුණේ මහා ඛේදවාචකයක් පැමිණ ඇති බවය. ඉක්මනින්ම යමක් කළ යුතුව තිබේ. දැනටමත් පල්ලියේ වැඩ කටයුතු සියල්ලම පාහේ ඇණහිටලා ය. ඉරුදින දේව මෙහෙයන්වලට, සති මැද යාඥා පන්තිවලට, ධර්ම දූත සේවාවන්වලට පමණක් නොව, පල්ලියේ සුහද හමුවීම්වලට පවා සහභාගී වන බැතිමතුන් ගණන එන්න එන්නම අඩු වෙමින් තිබේ. හදවතට එකඟව වැඩ කරන සේවකයන් කිහිප දෙනෙකු තවමත් පල්ලියේ ඉතිරිව සිටින බව ඇත්තය. එහෙත් ඔවුහු එකිනෙකාට තේරුම් ගත නොහැකි, වෙනස් අභිමතාර්ථ වෙනුවෙන් නැවතී සිටින අතර, හැම විටම තමන් වටා එල්ල වී ඇති විවේචනාත්මක දැස් සහ ඒ දෑස්වලින් දකින දේ කතා කරන්නට ලක ලෑස්ති වී

සිටින කටවල් ගැන නිරන්තර අවධානයෙන් සිටින බව පෙන්නුම් කරති.

මේ සියල්ලෙන්ම පූජ්‍ය පෝල් ෆෝඩ් පියනම තේරුම් ගත්තේ මේ තත්වය දිගටම පැවතුණොත් ඔහුට, පල්ලියට, නගරයට සහ ක්‍රිස්තියානි ධර්මයට පවා මෙහි එල විපාක විඳින්නට, වඩ වඩාත් විඳවන්නට සිදුවනු ඇති බවය.

පැහැදිලිවම මේ සඳහා යමක් කළ යුතුය, ඉක්මනින්ම. ඒත් ඒ කුමක්ද?

පියතුමා හෙමිහිට සාක්කුවෙන් යමක් එළියට ඇද්දේය. ඒ, ඔහු ඊළඟ ඉරුදින, පල්ලියේ පවත්වන්නට යන අනුශාසනාවේ සටහන් වගයකි. ඔහු නළල රැලි කරගෙන එදෙස බලා සිටියේය. ඊළඟට ඔහු හැඟීම් බර ලෙස හඬ නඟා, ඊළඟ ඉරු දින පවත්වන දෙසුමේ බයිබල් පාඨ කියවන්නට පටන් ගත්තේය.

''විනය ධරයෙනි, පරුසිවරුනි* කෛරාටිකයන් වූ ඔබට වන විපතක මහත! මන්ද ඔබ මිනිසුන් ගේ ඇස් හමුයෙහි ස්වර්ග රාජ්‍යයේ දොරටු වසන්නහුය, ඔබ ම ඇතුළු වන්නේ වත්, ඇතුළු වන්න සොයන අයට ඉඩ දෙන්නේ වත් නැත....''

''විනය ධරයෙනි, පරුසිවරුනි, කෛරාටිකයිනි, ඔබට වන විපතක මහත. මන්ද ඔබ බොරු පෙනුමට දිගින් දිගට දිගට ම යාඥා කරතත්, ඔබ වැන්දඹුවන්ගේ ගේ දොර කා දමති. ඔබට බරපතල දඬුවම් ලැබෙනු නිසැකය...

''විනය ධරයෙනි, පරුසිවරුනි, කෛරාටිකයිනි, ඔබට වන විපතක මහත! මන්ද ඔබ සුවඳතලා, ගත පුෂ්ප, සුදු දුරු යන මෙයින් දසයෙන් කොටස දෙන්නහුය. එහෙත් යුක්තියද, දයාවද, ඇදහිල්ලද

* පරුසිවරු - යුදෙව් විනය නීති සහ පැරණි සම්ප්‍රදායන් වචනාර්ථයෙන්ම ගෙන නොපිරිහෙලා ඉටු කළ බැතිමතුන් ය. ජේසුස් වහන්සේට විපක්ෂ වූවන් අතර මූලිකව ක්‍රියා කළේ මොවුන් ය.

යන ව්‍යවස්ථාවලියේ වඩා බරපතල කාරණා ඔබ පැහැර හරින්නාහුය. ඒවාත් පැහැර නොහැර, මේවාත් පිළිපැදිය යුතුව තිබුණි....''

එය නම් කටුක දෝෂාරෝපණයක් වීය. වනපෙතේ හරිත පැහැ තුරු මුදුන් සිසාරා, දේවගැතිතුමාගේ ගැඹුරු කටහඬ දෝංකාර දුන්නේය. වනයේ සිටි කුරුල්ලන්, ලේනුන් පවා ඒ අසා ගල් ගැසී නිහඬ වනු පෙනිණි. ඊළඟ ඉරුදින, පල්ලියේ පූජනීය නිහඬතාවය මැද මේ වදන් තම බැතිමතුන් ඉදිරියේ කියන විට කොහොමට තියේවිදැයි දූන් දේවගැති තුමාට හොඳටම පැහැදිලිය.

ඔහුගේ බැතිමතුන්..... ඔවුන් ඔහුගේ බැතිමතුන්ය. ඔහුට ඔවුන් වෙනුවෙන් එය කළ හැකිද? එය කිරීමට ඔහුට හයියක් තියේවිද?

එය භයංකාර දෝෂාරෝපණයකි, ඊට පසු එන ඔහුගේම වදන් නැතිවත්..... ඔහු දිගටම යාඥා කළේය. ඔහුට මඟ පෙන්වන ලෙස ඉල්ලමින්, අවකංවම ආයාචනා කොට දෙවියන් යැද්දේය. ඔහු බලාපොරොත්තුවෙන් සිටියේය. අනේ ඔහු කොයිතරම් අවංකව එය බලපොරොත්තු වූවාද, මේ ඛේදවාචකය හොඳ අතට හැරෙයි කියා. එහෙත් ඔහු යාඥා කරන්නේ - එයින් ගැලවීමේ හරි මාර්ගය දිගේ ද?

දේවගැති වරයා හෙමිහිට සටහන් කොළ ටික නවා, යළිත් සාක්කුවේ දා ගත්තේය. ඊට පසු වැළපීමකට සමාන සුසුමක් පිට කරමින්, ගස යට ඉඳගෙන මුහුණ දෑතින් වසා ගත්තේය.

මෙන්න මෙතැනදීය, පෙන්ඩල්ටන් නිවසේ සිට ආපසු එමින් සිටි පොලියානාට ඔහු හමු වූයේ. ඇය කැගසා ගෙනම ඔහු ළඟට දිව ගියාය.

''අයියෝ. අනේ ස්වාමී. ඔයාගෙ කකුල් එහෙම කැඩිලා, මොනවත් කරදරයක් උණේ නෑ නේද?'' යි ඇය හීල්ලුවාය.

දේවගැති තැන හනික මුහුණෙන් දෑත් ඉවත් කළේය. ඔහු සිනා

වෙන්නට නැත් කළේය.

"නෑ දරුවො... ඇත්තටම නෑ. මම මේ නිකං විවේක ගන්නවා...."

"ආ!" යි සුසුමක් හෙලූ පොලියානා, මඳක් පසුපසට වූවාය.

"එහෙනං කමක් නෑ. ඔයා දන්නවාද, මිස්ට පෙන්ඩල්ටන්ගෙත් කකුලක් කැඩිලා ඉන්නකොට තමා මට හම්බ වුණේ. ඒත් එයා බිම දිගා වෙලා හිටියෙ. ඔයා ඉඳගෙන නෙ ඉන්නෙ..."

"ඔව්. මම ඉඳගෙන තමයි ඉන්නෙ. දොස්තරලාට හදන්න තරං දෙයක් මගේ කැඩිලා නෑ...."

අන්තිම වචන කිහිපය ඔහු ඉතා හෙමිහිට කී නමුත්, එය පොලියානාට හොඳින් ඇසිණි. ඇගේ මුහුණ හදිසි වෙනස් කමකට ලක් විය. දෑස් අනුකම්පාවෙන් පිරී තිබිණ.

"මං දන්නවා, ඔයා අදහස් කරන දේ. මොකක් හරි ඔයාට වද දෙනවා නේද?. අපේ තාත්තාටත් ගොඩක් වෙලාවට ඔය වගේ දැනුණා. මං හිතන්නේ ස්වාමිලාට එහෙම වෙනවා ඇති... සාමාන්‍යයෙන්. ඔයා දන්නවානෙ, ඒ ගොල්ලො මත කොයිතරං කට්ටිය යැපෙනවාද?"

පෝල් ෆෝඩ් දේවගැති තැන මඳක් පුදුමයෙන් හැරී බැලුවේය.

"ඔයා ගේ තාත්තා, ස්වාමි කෙනෙක් ද පොලියානා...."

"ඔව්. ඔයා දන්නෙ නැද්ද? මං හිතුවෙ හැමෝම ඒ ගැන දන්නවා කියල. එයා බැන්දෙ මිස් පොලී හැරින්ටන්ගේ සහෝදරියක්. ඒ තමයි මගේ අම්මා..."

"ආ, මට තේරුනා. ඒත්, ඔයා දන්නවානෙ, මම මේ පළාතෙ ගොඩාක් කාලයක් හිටියෙ නැනෙ. ඉතිං මං ඔය පවුල්වල ඉතිහාසෙ දන්නෙ නෑ...."

"ඔව් ස්වාමි..." යි මදහසක් පාමින් පොලියානා කීවාය.

ඊට පසු දිගු නිහැඬියාවක් පැතිර ගියේය. ගස පාමුල හිඳගත් දේවගැතිවරයාට, පොලියානා සිටින සෙයක් අමතක වූ බව පෙනුණි. ඔහු සාක්කුවෙන් එළියට ඇදගත් කොල කිහිපයක් නැවත දිග හැරියේය. එහෙත් ඔහු ඒවායේ තිබෙන දේ කියවන බවක් පෙනුණේ නැත. ඔහු වෙන අතක් බලා සිටියේය. ඒ ඔහු සිටි තැනට මදක් නුදුරින් පොළව මත වැටුණු ගසක කොළයක් දෙසය. එය කොහෙත්ම ලස්සන කොළයක්ද නොවීය. එය දුඹුරු පාට, මැරී ගිය කොළයකි. දේවගැතිවරයා දෙස බලා සිටින පොලියානාට, ඔහු ගැන සියුම් දුකක් දැනිණ.

"අද... අද හරි හොඳ දවසක් නේද?" යි ඇය ඕනෑ කමින් කතාවට පිවිසියාය.

මොහොතක් යනතුරු ඊට පිළිතුරක් ලැබුණේ නැත. ඊට පසු ඇය දෙස බැලූ දේවගැති වරයා කතා කළේය.

"මොකක්ද? ආ....! ඔව්. අද හොඳ දවසක් තමා...."

"අද පොඩ්ඩක්වත් සීතල නෑ. ඔක්තෝබර් මාසෙ වෙලාත්..." ඔහු දෙස පරීක්ෂාකාරීව බලමින් පොලියානා තවදුරටත් බලාපොරොත්තු සහගතව කීවාය.

"මිස්ට පෙන්ඩල්ටන්ට නම් ගිනි උඳුනක් තියෙනවා. ඒත් එයා කියන්නෙ නම් ඒක ඕන නෑ කියලයි. ඒක තියෙන්නෙ නිකං ලස්සනට වගේලු. මම හරි කැමතියි ගින්දර දිහා බලාගෙන ඉන්න. ඔයා එහෙම නැද්ද?"

මෙවර එයට කොහෙත්ම පිළිතුරක් ලැබුණේ නැත. කතාව වෙනත් මඟකට හරවන්නට පෙර, පොලියානා ඉවසිල්ලෙන් පිළිතුරක් ලැබෙන තුරු බලා සිටියාය.

"ඔයා ස්වාමි කෙනෙක් වුණ එක ගැන කැමතිද?"

පෝල් ෆෝඩ් දේවගැති තැන මෙවර නම් හනික හිස ඔසොවා බැලුවේය.

"මම කැමතිද... ඒක නං මහ විකාර ප්‍රශ්නයක් නෙ! ඇයි ඔයා එහෙම ඇහුවෙ දරුවො?"

"නිකං... ඔයා ඉන්න විදිය දිහා බලලා. ඒක දකිනකොට මට මගෙ තාත්තාව මතක් උණා. එයත් සමහර වෙලාවට ඔහොම හිටියා..."

"ඇත්තට?" දේවගැති වරයාගේ කටහඬ බොහෝ ශාන්ත වූ අතර, ඔහුගේ දෑස් නැවතත් අර පොළව මත පතිත වූ මැරී ගිය කොළය දෙසට යොමුවී තිබිණි.

"ඔව්. මම ඔයාගෙන් ඇහුවා වගෙ එයාගෙනුත් අහන්න පුරුදු වෙලා හිටියා, එයා ස්වාමි කෙනෙක් වෙච්ච එක ගැන සතුටු වෙනවාද කියලා."

sinhalaebooks.com

ගස පාමුල හිඳගෙන සිටින දේවගැතිතුමා දුක්මුසු සිනහවක් පෑවේය.

"ඉතිං... එයා මොකද කිව්වෙ?"

"ආ! එයා නං හැම තිස්සෙම කිව්වෙ එයා සතුටුයි කියල තමයි. ඒත් ඒ කොච්චරවත් එයා කිව්ව දෙයක් තමා බයිබලේ තියෙන 'ප්‍රීතිමත් පාඨ' නැත්තං, එයා මොහොතකටවත් ඒ ගැන සතුටු වෙන එකක් නෑ කියල..."

"මොකක්?" පෝල් ෆෝඩ් දේවගැතිතුමා ගේ දෑස් වියළි කොළයෙන් මිදී විත් පොලියානා ගේ සතුටින් බරවූ කුඩා මුහුණ

මහ රැඳිණි.

"ඔව්. එහෙම තමයි තාත්තා ඒවට කිව්වෙ." යි ඇය හිනැහුණාය. "ඇත්තම කියනවා නං, බයිබලේ එහෙම නමක් දීලා නෑ. ඒත්, මං කිව්ව ඒ පාඨ හැම එකක්ම පටන් ගන්නෙ, 'දෙවියන් වහන්සේ ගැන ප්‍රීති වෙයල්ලා!', 'ප්‍රීතියෙන් ප්‍රමුදිත වීම', 'ප්‍රීතිය වෙනුවෙන් හඬ නැඟීම' වගේ කෑලිවලින්. තව ඒවගේ ගොඩක් ඒවා තියෙනවා. තාත්තා එක දවසක්, හොඳටම හිත නරක් කරගෙන හිටපු වෙලාවක ඒවා ගනං කළා. මුළු බයිබලේම එහෙම කෑලි අටසීයක් විතර තිබුණා..."

"අටසීයක්!"

"ඔව්. ඒ කියන්නෙ ප්‍රීතියෙන් ඉන්න, සතුටුවෙන්න කියන කෑලි හොඳද?, ඒ හින්දා තමයි තාත්තා ඒවට 'ප්‍රීතිමත් පාඨ' කියලා නම දැම්මෙ..."

"ආ!" දේවගැති තුමාගේ මුහුණ අමුතු විය. ඔහුගේ දෑස්, අත තිබූ සටහනේ අකුරු දෙසට බර වූයේය.

"විනයධරයෙනි, පරුසිවරුනි, කෛරාටිකයන් වූ ඔබට වන විපතක මහත...!"

"ඉතිං ඔයාගෙ තාත්තා...ඒ 'ප්‍රීතිමත් පාඨ' වලට ආසා වුණා!" යි ඔහු මිමිනුවේය.

"අනේ ඔව්..." යි පොලියානා හිස වැනුවාය.

"තාත්තට ඒවා ගණන් කරන්න කල්පනා වුණු පළවෙනි දවසෙම එයාට ලොකු සහනයක් දැනුනාලු. එයා කිව්වා, දෙවියන් වහන්සෙ අපට ප්‍රීතියෙන් ඉන්න, සතුටු වෙන්න කියලා අටසිය වාරයක් කියන්න කරදර වෙලා තියෙන්නෙ, අඩුම ගානේ ඒවායින් ටිකක් හරි අපි කරනවා දකින්න, උන්නාන්සේට ඕන වෙලා තියෙන්න

ඇනිලු. ඉතිං, තාත්තා නං එයා ගැනම ලැජ්ජා වුණා. හැම තිස්සෙම එහෙම නොහිටපු එක ගැන. අන්තිමට, ගොඩක් කරදර එන වෙලාවට ඒ පාඨ තමයි එයාට ලොකු සහනක් ගෙනාවෙ... අර 'තාත්තා සරණ' සංගමේ කට්ටිය රණ්ඩු වෙන වෙලාවට එහෙම. මං කිව්වෙ ඒ ගොල්ලන්ට මොකක් හරි දෙයක් ගැන එකඟ වෙන්න බැරි වුණු වෙලාවට එහෙම...'' යි පොලියානා වහා නිවැරදි කරමින් කියා සිටියාය. ''ඒ පාඨ හින්දා තමයි, අර සෙල්ලම ගැනත් තාත්තාට කල්පනා වුණේ. එයා මම ලවා තමයි ඉස්සරවෙලාම ඒක කෙරෙව්වෙ. කිහිලිකරු ආපු වෙලාවෙ. ඒත් එයා කිව්වා අර 'ප්‍රීතිමත් පාඨ' තමයි ඒක කරන්න එයාව පෙළඹෙව්වෙ කියල...''

''ඒ මොන සෙල්ලමක්ද?'' යි දේවගැති තුමා ඇසුවේය.

''හැම දේකම තියෙන, සතුටු වෙන්න පුළුවන් පැත්තක් ගැන හිතන එක. මං අර ඉස්සර වෙලා කිව්වෙ, මම ඒක පටන් ගත්තෙ කිහිලිකරුවලින්....' යි නැවත වතාවක් පොලියානා ඇගේ කතන්දරය කීමට පටන් ගත්තාය. මෙවර නම් දේවගැති තුමා ඇය කියන දේ අසා සිටියේ කරුණාවන්ත දෑස්වලින් සහ ඉතා ඕනෑකමින් අවබෝධ කරගන්නා දෙසවන්වලිනි.

sinhalaebooks.com

මඳ වේලාවකට පසුව දේවගැතිතුමා සහ පොලියානා අතින් අත අල්ලාගෙන කන්ද බැසයනු දක්නට ලැබිණි. පොලියානාගේ මුහුණ ප්‍රීතියෙන් ඉපිලෙමින් තිබිණි. පොලියානා කා සමඟ හෝ කතා බහ කිරීමට බෙහෙවින් ඇලුම් කළාය. දැනට ටික වේලාවකට ඉහතදීත් ඇය කතා කර කර සිටින අතරේ, සෙල්ලම ගැනත්, ඇගේ තාත්තා ගැනත්, බටහිර පිහිටි නිවෙසක ඈ ගත කළ ජීවිතය ගැනත් බොහෝ දේ දැන ගන්නට දේවගැති තුමාට ඕනෑ වූ බව පෙනුණි.

කඳු පාමුල දී ඔවුහු සමුගෙන දෙපසට බෙදී ගියහ. පොලියානා එක් පාරක් දිගේ ඇවිද ගිය අතර, දේවගැති තුමා තනිවම වෙනත් පාරක් දිගේ ඇවිද ගියේය.

එදා හවස තන්තෝරු කාමරයට වැදුණු දේවගැති තුමා ඉඳගෙන

කල්පනා කරමින් සිටියේය. ඔහු පසෙක වූ මේසයක් මත ඔහුගේ අනුශාසනාවල සටහන් පිරුණු කොළ කිහිපයක් තිබිණි. ඔහුගේ දෑතට සිරවුණු පෑන යට, හිස් කොළ ගොඩක් තිබුණු අතර, ඔහු ලබන සතියේ කරන්නට යන අනුශාසනාව පිළිබඳ සටහන් ලියන්නට යන්නේ ඒවායේය. එහෙත් දේවගැති තුමා සිතමින් සිටියේ ඔහු ලියූ දේ ගැනවත්, ලියන්නට යන දේ ගැනවත් නොවේ. ඔහු ගේ සිතිවිලි දුර ඈත කුඩා බටහිර නගරයක සිටි දුප්පත්, ලෙඩ ගානේ පසුවූ, දුකින් තැවෙන, සිතින් තනිවූ දේවගැතිවරයෙකු වෙත පියඹා ගොස් තිබිණි. ඒ සියල්ල තිබියදීත් බයිබලය වෙත ම නැඹුරු වෙමින්, කොපමණ වතාවක් ඔහුගේ දෙවියන් සහ විමුක්ති දායකයානන් ඔහුට 'ප්‍රීතියෙන් සහ සතුටින්' සිටින්නට යැයි කීවාදැයි කියා ඔහු සිතූ හැටිත් පෝල් ෆෝඩ් දේවගැති තුමා සිතින් මවා ගන්නට උත්සාහ කළේය.

මද වේලාවකට පසුව, දිගු සුසුමක් හෙළීමෙන් පසුව, පොල් ෆෝඩ් දේවැගතිතතුමා බටහිර නගරයෙන් මිදී විත් සිතිවිලි දෑහැනෙන් අවදි වූයේය. ඊට පසු ඔහු අත යට තිබුණු කොළ කිහිපය හරි ගස්සා ලියන්නට පටන් ගත්තේය. ''මතෙව් අංක විසි තුන, 13-14 සහ 23' යි ඔහු ලිවේය. ඊට පසු නොඉවසිලිමත් පෙනුමක් මවා ගත් ඔහු පෑන පසෙක තබා, විනාඩි කිහිපයකට කලින් ඔහුගේ බිරිය විසින් මේසය මත තබනු ලැබූ සඟරාවක් දෙසට ඇදුණේය. එය පෙරළා බැලූ ඔහුගේ විඩාබර දෑස් පහත සඳහන් වචන හමුවෙන තුරු එහි වාක්‍ය ඛණ්ඩ දිගේ ඇදී ගියේය.

''එක් තාත්තා කෙනෙක් දවසක් සිය පුතාට මෙසේ කීවේය. ඔහුගේ පුතා වූ ටොම්, එදා උදෑසන අම්මා ගේ දර අටුව පිරවීම ප්‍රතික්ෂේප කොට තිබුණේය. 'ටොම් මට විස්වාසයි, නුඹ ගිහින් අම්මාට දර ටිකක් ගෙනැවිත් දීමෙන් සතුටු වෙන බව' යි තාත්තා කීවේය. ඒ ඇසූ ටොම් වචනයක්වත් නොදොඩා පිටව ගියේය. ඒ ඇයි? ඒ ඔහුගේ පියාණන් ඉතා සරළව ඔහු හරි දේ ඉටු කරන බවට තමන් බලාපොරොත්තු වෙන බව පෙන්නූ හෙයිනි. එහෙම නැතිව ඔහු මෙසේ කීවාය යැයි සිතමු: ''ටොම් නුඹ අම්මාට පැවසූ දේ මට ඇසුණා. මම නුඹ ගැන ලැජ්ජා වෙනවා. දැන්මම ගිහින් දර අටුව

පුරවාපන්...'' ටොම් ගැන සැළකුවහොත්, ඒ දරටුව තවමත් හිස් ව පවතින බව මට සහතිකය...''

දේවගැතිවරයා දිගටම කියාගෙන යන්නට වූයේය. මෙතන ඇති වචනයකුත්, අතන ඇති වාක්‍යයකුත්, වෙනත් තැනක ඇති වාක්‍ය ඛණ්ඩයකුත් වශයෙන් ඔහු කියවාගෙන ගියේය.

''පිරිමින්ටත් ගැහැනුන්ටත් අවශ්‍ය වන්නේ දිරි ගැන්වීමයි. ස්වභාවයෙන්ම ඔවුන් තුළ පිහිටන ප්‍රතිවිරෝධී බලයන්, දූර්වල නොකොට ඒවා ශක්තිමත් කළ යුතුයි... හැම විටම මිනිසකු තුළ ඇති වැරදි පැතීම හරහා අවුස්සන්නේ නැතිව, ඔවුන් තුළ ඇති ගුණධර්ම පිළිබඳවද ඔවුන්ට කියා දිය යුතුයි. ඔහුගේ නරක ගතිගුණ අතරින් ඔහු එළියට අදින්න. ඔහුගේ හොඳ පැත්ත හැම විටම ඔසොවා තබන්න. ඉතා නිර්භීත ලෙස ක්‍රියා කොට ජය ලැබිය හැකි ඔහුගේ හැබෑ ස්වරූපය ඔසොවා තබන්න. ඉතා හොඳ, අනෙක් අයට උදව් කරන, බලාපොරොත්තු සහගත චරිතයක බලපෑමෙන් මුළු නගරයක් ම අනෙක් පස හරවා මහා විප්ලවයක් කළ හැකිය. මිනිස්සු සැම විටම ඔවුන් ගේ සිත් තුළත්, හදවත් තුළත් ඇති සිතිවිලි පිටතට විහිදුවති. යම් කෙනෙකු ඉතා කරුණාවන්ත වී, අනුන්ට උපකාර කිරීමට ලොල් වන්නේද, වැඩි කල් යාමට මත්තෙන් ඔහුගේ අසල්වැසියන් ද ඒ ආකාරයට සිතන්නට පෙළඹෙනු ඇත. එහෙත් ඔහු නිතරම බැණ අඬගසන, කෝපයෙන් සිටින, අනෙක් අයට විවේචනය කරන කෙනෙකු නම් ඔහුගේ අසල් වැසියන් පොලියත් සමඟම කෝපයට කෝපයෙන්ම පිළිවදන් දෙනු ඇත. ඔබ කරා ළඟාවනු ඇත්තේද නරකමය. එහෙත් ඔබ හොඳ දේ සොයා යන බව දන්නා විට ඔබ කරා හොඳ දේම ළඟා වනු ඇත. ඔබේ පුතුයා වන ටොම්ට, දර අටුව පුරවා ඔහු සතුටු වන ආකාරය ඔබ දන්නා බව අඟවන්න. අනතුරුව ඔහු දෙස මුල පටන්ම සුපරීක්ෂාකාරීව, සැලකිල්ලෙන් බලා සිටින්න...''

sinhalaebooks.com

දේවගැතිතුමා කියවමින් සිටි ලිපිය පහත දමා හිස එසවූයේය. මොහොතක් ගත වූ පසුව, නැගී සිටි ඔහු පටු කාමරයේ එහාටත්, මෙහාටත්... එහාටත් මෙහාටත් ඇවිදිනු පෙනුණි. අනතුරුව, ටික

වේලාවක් ගතවූ පසුව, දිගු සුසුමක් හෙලූ ඔහු මේසය ඉදිරිපස වූ පුටුවක හිඳ ගත්තේය.

''දෙවියන් වහන්සේ මට මඟ පෙන්වන සේක්වා...! මම ඒක කරන්නයි යන්නේ...'' යි ඔහු මෘදු ලෙස හඬ නැගුවේය. ''මම මගේ ටොම්ලාට කියනවා, ඔවුන් දර අටු පුරවා සතුටු වෙන බව මම දන්නා වග. මම ඔවුන්ට කරන්නට වැඩ පවරනවා. එයින් ඔවුන් ලබන සතුට කොයිතරම් ඉහළ ද කියනවා නම් එතකොට අනුන්ගේ දර අටු දෙස බලන්නටවත් ඔවුන්ට වේලා නැති වේවි!'' ඉතින් ඔහුගේ අනුශසනා සටහන් ලියූ කොළ කිහිපය අතට ගත් දේවගැති තුමා ඒවා කුඩා කැබලිවලට ඉරා දැමුවේය. අනතුරුව ඒවා ඉවතට විසි කළේය. අන්තිමේදී ඔහුගේ පුටුවේ එක් පැත්තක 'නුඹලාට වන විපතක මහත!' ලියූ කොළ කැබැල්ලත්, අනෙක් පස 'විනයධරයෙනි, පරුසිරුවනි' ලියූ කොළ කැබැල්ලත් වැටී තිබුණි. ඒ අතර 'මතෙව්, අංක විසිතුන 13-14 සහ 23' පාඨය හරහා ඉරක් ඇඳීමෙන් පසුව, ඔහුගේ පෑන ඉදිරියේ තිබූ සුමුදු, සුදු කොලයක් හරහා ඇදී යමින් තිබිණි.

ඊළඟ ඉරු දින පෝල් ෆෝඩ් දේවගැතිතුමාගේ අනුශාසනාව ඉතා සිත් ඇදගන්නා සුලු වූ අතර, රිදී සීනුවක් මෙන් රැව්පිළිරැව් දුන් ඔහුගේ කටහඬ හැම මිනිසෙකුම, හැම ගැහැණියකම අසා සිටින්නට ඇත. ඒ අනුශාසනාවට පාදක වූ පාඨය වූයේ, පොලියානා ගේ බැබළෙන පාඨ අට සීයයෙන් එකකි.

''දැමිටුනි,* හිමිතුමන් කෙරේ ප්‍රීති වී උදම් අනන්න. අවංක සිත් ඇති සියල්ලෙනි, ප්‍රීති ඝෝෂා පවත්වන්න.''

* ධර්මිෂ්ට වූ සිත් ඇත්තෙනි

# 23

# අනතුරක්

ස්නෝ මහත්මියගේ ඉල්ලීම පරිදි, දවසක් පොලියානා දොස්තර කිල්ටන් ගේ බෙහෙත් සාප්පුවට ගියාය. ඒ, ස්නෝ මහත්මියට අමතක වූ බෙහෙතක නමක් අසාගෙන එනු පිණිසය. පොලියානා කිසි දවසකවත් දැක නැති දොස්තර කිල්ටන් ගේ බෙහෙත් සාප්පුව ඇතුළත බලා ගැනීමට එය කදිම අවස්ථාවක් විය.

sinhalaebooks.com

''මම කවදාවත් ඔයා ඉන්න තැනට ඇවිත් නෑ. මේ ඔයාගෙ ගෙදර, එහෙම නේද?'' යි ඇය ඇසුවේ, ඉතා ඕනෑ කමින් වටපිට බලමිනි.

දොස්තර මහතා දුක්මුසු සිනහවක් පෑයේය.

''ඔව්. ඒක මේ වගේ තමයි.'' ඔහු පිළිතුරු දුන්නේ කඩදාසියක

යමක් ලියමිනි. ''ඒත් මේක නං ගෙයක් කියන්න බැරි තැනක් පොලියානා. මෙහෙ තියෙන්නෙ කාමර විතරයි. එච්චරයි. මේක ගෙයක් නෙමේ...''

පොලියානා කල්පනාකාරී ලෙස හිස සැලුවාය. ඇගේ දෑස් දුක්බර අවබෝධයකින් දිදුලමින් තිබිණ.

''මං දන්නවා ගෙදරක් වෙන්නෙ ගෑනියෙකුගෙ අතයි, හදවතයි ලැබුණාම හරි, ළමයෙක් හිටියොත් හරි තමා...'' යි ඇය කීවාය.

''ආ!'' දොස්තර මහතා එක්වරම හැරී බැලුවේය.

''මිස්ට පෙන්ඩල්ටන් තමා මට කිව්වෙ...'' යි පොලියානා යළිත් වරක් හිස සැලුවාය. ''ගෑනියෙකුගෙ අතයි හදවතයි ලැබීමයි, ළමයෙක් ඉන්න එකයි ගැන... ඇයි... ඩොක්ට කිල්ටන් ඔයා නෝනා කෙනෙකුගේ අතයි හදවතයි ඉල්ලන්නෙ නැත්තෙ? එහෙම නැත්තං ඔයාට ජිමී බීන්ව බාර ගන්න පුළුවන්... මිස්ට පෙන්ඩල්ටන්ට එයාව ඕනෑ නැත්තං...''

දොස්තර මහතා සිනාසුණේය.

''ඉතිං, මිස්ට පෙන්ඩල්ටන් කියනවා ගෙදරක් වෙන්න නං නෝනා කෙනෙකුගේ අතයි හදවතයි ලැබෙන්න ඕන කියලා. එහෙමද?'' යි ඔහු දෙගිඩියාවෙන් යුතුව අසා සිටියේය.

''ඔව්. එයා කියනවා එයාට තියෙන්නෙ නිකං බංගලාවක් විතරයි කියලා. ඇයි ඔයා එහෙම කරන්නෙ නැත්තෙ ඩොක්ට කිල්ටන්?''

''මම එහෙම කරන්නෙ නැත්තෙ....? මොකක්ද?'' යි දොස්තර මහතා නැවතත් මේසය දෙසට හැරෙමින් කීවේය.

''නෝනා කෙනෙකුගේ අතයි හදවතයි ලබාගන්නෙ නැත්තෙ.

අනේ... මට අමතක වුණානෙ...'' යි කී පොලියානාගේ මුහුණ වේදනාබර වී ය. ''මං හිතන්නෙ මේක ඔයාටත් කිව්වොත් හොඳයි. මිස්ට පෙන්ඩල්ටන් අවුරුදු ගාණක් තිස්සේ ආදරේ කරලා තියෙන්නෙ පොලී පුංචි අම්මට නෙමෙයි, ඉතිං අපිට එහෙ නවතින්න යන්න වෙන්නෙත් නෑ. ඔයා දන්නවාද, ඒ තමයි... ඒත් මට වැරැද්දක් උණා. ඔයා මේක කාටවත් කියන්නෙ නෑ නේද?'' යි ඇය කලබල වෙමින් කී දේ හමාර කළාය.

''නෑ. මම කාටවත් කියන්නෙ නෑ පොලියානා'' යි දොස්තර මහතා තරමක් අමුතු විදියට පිළිතුරු දුන්නේය.

''ආ! එහෙනං කමක් නෑ'' යි පොලියානා සැනසුම් සුසුමක් හෙලුවාය. ''ඔයා දන්නවද, ඔයා තමයි මම මේක කිව්ව එකම එක්කෙනා. මං හිතුවා, මේක ඔයාට කිව්වා කියලා දැනගත්තාම මිස්ට පෙන්ඩල්ටන් හිත නරක් කර ගනී කියල.''

''එයා එහෙම හිතයිද?'' දොස්තර මහතා දෙතොල් තද කර ගත්තේය.

sinhalaebooks.com

''ඔව්. ඇත්තටම එයා කැමති නැති වෙයි මේක ගොඩක් දෙනෙක් දැනගන්නවට. අනික මං ඉස්සරවෙලා කියපු දේ බොරුවක්. ඒත් ඇයි ඔයත් නෝනා කෙනෙකුගේ අතයි හදවතයි ඉල්ලන්නෙ නැත්තෙ ඩොක්ට කිල්ටන්?''

මොහොතක නිහැඬියාවක් පැතිරිණි. ඊට පසු දුක් මුසු ස්වරයකින් දොස්තර මහතා කතා කළේය. ''ඉල්ලුව පමණට ඒවා ලැබෙන්නෙ නෑ දරුවෝ...''

පොලියානා කල්පනාකාරී ලෙස නළල රැලි කර ගත්තාය.

''ඒත් මට හිතෙන්නෙ නං, ඔයා ඒවා ලබා ගන්න පුළුවං...'' යි ඇය තර්ක කළාය. එය නම් කදිම ඉච්චා බසක් මෙන් පෙනීම වළක්වන්නට බැරිය.

''බොහොම ස්තුතියි.'' එය අසා ඇහි බැම උඩට ඔසවමින්, දොස්තර මහතා මහ හඬින් හිනැහුණේය. ඊට පසු නැවත වතාවක් දුක්බරව ''මට හිතෙන්නෙ සමහර කාන්තාවෝ හරිහමන්...ආත්ම විස්වාසයක් නැති අය. අඩුම තරමෙ ඒ ගොල්ලො... ඒ ගොල්ලො කිසිම අනුග්‍රහයක් දක්වන්නෙවත් නැනෙ...'' යි ඔහු කීවේය.

පොලියානා නැවතත් නළල රැලි කර ගත්තාය. ඊට පසු ඇගේ දෑස් විස්මයෙන් විසල් විය.

''ඩොක්ට කිල්ටන්, ඔයා ඒකෙන් අදහස් කරන්නෙ නෑ නේද... ඔයා මිස්ට පෙන්ඩල්ටන් වගේ කාගෙ හරි අතකුයි, හදවතකුයි ලැබෙනකම් බලා ඉඳලා, අන්තිමට ඒවා ලැබුණෙ නෑ කියලා. එහෙමද?''

දොස්තර මහතා හනි නැඟී සිටියේය.

''ඔන්න, ඔන්න පොලියානා, ඔය දේවල් අහක දාමු. අනික් මිනිස්සුන්ගෙ කරදරවලින් ඔයාගේ ඔය පුංචි ඔලුව නරක් කරගන්න එපා. මම දැන් බලාපොරොත්තු වෙනවා, ඔයා මේකත් අරන් ඉක්මනටම මිසිස් ස්නෝ ළඟට දුවයි කියල. මම බේතක නමයි, ඒක ගන්න විදියයි ගැන මේ කොලේ ලියලා තියෙනවා. තවත් මොනවා හරි ඕනෑද?''

'' නෑ ඩොක්ට. බොහොම ස්තුතියි සර්...'' ඈය සන්සුන් ලෙස මිමිණුවේ ආපසු හැරී දොර වෙත යමිනි. පටු සාලාව දිගේ යන ගමන් ඈය එක්වරම ඇති වූ ප්‍රීතියකින් මෙසේ කීවාය:

''කොහොම හරි මට සතුටුයි, ඔයාට ලබා ගන්න බැරිවුණේ මගේ අම්ම ගේ කැමැත්ත නෙවෙයි නිසා, ඩොක්ට කිල්ටන්. ආයුබෝවන්!''

* * * *

ඒ අනතුර සිදු වුණේ ඔක්තෝබර මාසයේ අන්තිම දවසේය. පොලියානා පාසල ඇරී ගෙදර එනවිට පාර පැන තිබුණේ, වේගයෙන් පැමිනුණ මෝටර් රථයකට සෑහෙන තරම් දුරක් තිබියදීය.

එහෙත් එය සිදුවිය. සිදු වූදේ ගැන පැහැදිලි කරන්නට ඊට පසු කිසි කෙනෙකුට පුළුවන් කමක් තිබුණේ නැත. එය සිදුවූයේ ඇයිද කියාවත්, වරද කා අත දැයි කියන්නටවත්, කිසි කෙනෙකු සිටියේ නැත. කොහොම නමුත් නිවෙසට රැගෙන යනු ලැබූ පොලියානා සවස පහ වෙන විට, ඇගේ ආදරණීය කුඩා කාමරය ඇතුලේ තුවාල ලැබ, සිහිසුන් ව දුබල ව වැතිර සිටියාය. එතැන සුදුමැලි මුහුණෙන් සිටි පොලී අම්මාත්, කඳුලු සලමින් සිටි නැන්සිත් එකතු වී ඇගේ ඇඳුම් ගලවා ඉවත් කොට ඇඳේ දිගා කළ අතර, දුරකථන ඇමතුමකින් හදිසියේ කැඳවනු ලැබූ දොස්තර චොරන්, ගමේ සිට මෝටර් රථයකින් පැමිණෙමින් සිටියේය.

''එයාගේ පුංචි අම්මාගේ මූණ දිහා තවත් බලන්න ඕන නෑ....'' යි නැන්සි ගෙවත්තේ සිටි ටොම් වෙත ගොස් කඳුලු සැලුවාය. ඇය කාමරයෙන් පිටතට ආවේ දොස්තර මහතා පැමිණ ලෙඩා බලන්නට පටන් ගත් විටය. ''එයාගෙ පුංචි අම්මගේ මූණ දිහා තවත් බලන්න ඕන නෑ, එයාට වද දෙන්නෙ එයාගෙ 'රාජකාරිය' තෙමෙයි කියල තේරුං ගන්න. රාජකාරිය ගැන විතරක් හිතනවා නම් එයාගෙ අත් ඔය හැටි වෙව්ලන්න විදියක් නෑ. ඇස් දෙකෙන් මාරයා ආපස්සට අදිනවා වගේ බැල්මක් පේන්න විදියක් නෑ. එයා රාජකාරිය ගැන විතරක් හිතනවා නම් එහෙම වෙන්න බෑ ටොම් මාමෙ, එහෙම වෙන්න බෑ.

''එයාට.. ගොඩක් තුවාලද?'' යි ඇසූ මහලු ටොම් ගේ කටහඬ වෙව්ලුවේය.

''ඒක කියන්න බෑ...'' යි නැන්සි කඳුලු සැලුවාය.

''එයා සුදුමැලි වෙලා වැතිරිලා ඉන්නවා. සමහර විට නරක දෙයක් වෙන්නත් ඉඩ තියෙනවා. ඒත් පොලී නෝනා නං කියන්නෙ

එහෙම දෙයක් වෙන්නෙ නෑ කියල. එයාට හොඳ දැනීමක් තියෙනවනෙ අනික් අයට වඩා. එයා දිගටම ලෙඩාගෙ නාඩි බැලුවා. හුස්ම වැටෙනවාද කියලත් බැලුවා...''

''එයාට වෙච්ච දේ ගැන මොකවත්ම කියන්න බැරිද හැබෑටම....?'' ටොම් ගේ මුහුණ මහත් කම්පාවකින් පිරිණි.

නැන්සි මදක් නිසොල්මන්ව සිටියාය.

''මට හිතෙන්නෙ මොනවා හරි දෙයක් උනා කියල හිතා ගන්න එක හොඳයි, ටොම් මාමෙ. ඔය කාර් කට්ටට නං හෙන වැදිච්චාවෙ. ටිකක් හිතන්න අසරණ ළමයා හප්පාගෙන ගියා කිව්වාම. ඔය ගඳ ගහන යකඩ කෑලිවලට මං කොහොමටත් කැමති නෑ. අම්මපා නෑ...''

''ඒ දැරිවිගෙ තුවාලෙ තියෙන්නෙ කොහේද?''

''මං දන්නෙ නෑ, මං දන්නෙ නෑ...'' යි නැන්සි වැළපුණාය. ''ඔලුවෙ තියෙන්නෙ නං පුංචි කැපුමක් විතරයි. ඒක නං එච්චර බරපතල නෑ. කොහොමටත් නෑ. පොලී මැඩම් බයවෙලා ඉන්නෙ එයාගෙ 'ඇතුළාන්තෙ' තුවාල වෙලා ඇති කියල...''

මහලු ටොම්ගේ දෑස්වලට දුබල දීප්තියක් ආවේය.

''මං හිතන්නෙ එයා කියන්නෙ 'ඇඟ ඇතුළෙ තුවාල' කියන එක වෙන්ඩෝනැ.'' යි ඔහු වියළි හඬකින් කීවේය. ''හරි... එහෙම උනාමයි කියමු. හැබැට ඔය කාර් කටුවට හෙන හත ම වදින්ඩෝනැ. පොලී නෝනා කියපු වචනෙ උඹට හරි හැටි තේරුන් නෑ නේද?''

''ආ... වෙන්ඩැති මං දන්නෙ නෑ. මං දන්නෙ නෑ...'' යි හිස සෙලවූ නැන්සි දිගටම වැළපුණාය. ඇය යන්නට හැරී - ''මට දොස්තර යනකං මෙතන හිටගෙන ඉන්නත් බෑ වගේ. මට හිතෙන්නෙ මට පිඟන් හෝදන්නත් තියෙනවා. මෙච්චර කල් කරපු

ලොකුම හේදිල්ල වගේ තමා මට ඒක දැනෙන්නෙ. අනේ හැබෑටම!'' යි ලතෝනි දුන් ඇය අසරණ ලෙස දෑත් මිරිකා ගත්තාය.

දොස්තර මහතා පිටව ගියාට පසුවත් ටොම් සමඟ කියන්නට දෙයක් නැන්සිට තිබුණේ නැති තරම්ය. පොලියානාගේ ඇට කිසිවක් බිඳී නොතිබුණු අතර, ඔලුවේ වූ කැපුම ද ඒ තරම් බරපතල වූයේ නැත. එහෙත් දොස්තර මහතා බැරෑරුම් මුහුණක් මවාගෙන, හිස සෙමින් දෙපසට වැනුවේය. ඔහු කීවේ කාලයට ඉඩදී බලා සිටිය යුතු බවයි. ඔහු පිටත්ව ගියාට පසු පොලී මෙනෙවිය හිටියාටත් වඩා සුදුමැලිව, මුහුන බෙරි කරගෙන සිටියාය. ඒ වන විට ලෙඩාට සම්පූර්ණයෙන්ම සිහිය ඇවිත් තිබුණේ නැත. එහෙත් ඇය බලාපොරොත්තු වූ ආකාරයටම, පහසුවෙන් විවේකී නින්දක සිටින බව පෙනුණි. පළපුරුදු හෙදියක එදා රාත්‍රියේ පැමිණීමට නියමිතව තිබිණි. එපමණය. කඳුලු සලමින් ඒ අසල සිටි නැන්සි ආපසු මුළුතැන් ගෙට ගියාය.

පසුදා පෙරවරුවේ, කොයියම් හෝ වේලාවක පියවි සිහියට පැමිණි පොලියානා, දෑස් හැර බලා, ඇය කොහේ සිටින්නේ දැයි තේරුම් ගත්තාය.

sinhalaebooks.com

''අනේ, පොලී පුංචි අම්මෙ, මොකද මේ වෙලා තියෙන්නෙ. දැං දවල් නේද? ඇයි මං නැගිට්ටෙ නැත්තෙ...'' යි ඇය කෑ ගැසුවාය. ''අනේ පුංචි අම්මෙ, ඇයි මට නැගිටින්න බැරි?'' යි වැළපුණ ඇය නැගිටීමට දුබල උත්සාහයක යෙදී, ආපසු කොට්ටය මතට වැටුණාය.

''නෑ වස්තුවේ! තාම නැගිටින්න හදන්න එපා. තව පොඩ්ඩක් ඔහොම ඉන්නකො...'' ඇගේ පුංචි අම්මා හනික, එහෙත් ඉතා ශාන්ත ලෙස ඇය අස්වැසුවාය.

''ඒත් මොකද වෙලා තියෙන්නෙ කියන්නකෝ. මට ඇයි නැගිටින්න බැරි...''

පොලී මෙනෙවිය ගේ දෑස්, පොලියානා නෙත නොගැටෙන

මානයක රැඳී උන්, සුදු තොප්පියක් දමා ගත් කාන්තාව වෙත හැරිණි. ඒ දෑස්වල ඉතා දුක්බර ප්‍රශ්නයක් ලියැවී තිබිණි.

තරුණ කාන්තාව හිස සැලුවාය.

''එයාට කියන්න.'' ඇගේ දෙතොල් සෙලවිණි.

''ඔයාට තුවාල වෙලා වස්තුවේ, ඊයෙ කාර් එකකට හැප්පිලා. ඒත් දැං ඒකට කමක් නෑ. පුංචි අම්මට ඕන ඔයා හොඳට විවේක අරන්, ආයෙත් නිදාගන්නවා දකින්න....'' පොලී මෙනෙවිය කීවාය.

''තුවාල වෙලා? ආ... ඔව් නේන්නං මම... දිව්වා...'' යි කී පොලියානා ගේ දෑස් අඳුරු විය. ඇය නළල වෙත අත යැව්වාය. ''ඇයි මේ වෙලුම් පටි. අනේ එතන රිදෙනවා!''

''ඔව් වස්තුවේ, ඒක ගැන හිතන්න එපා. දැං ටිකක් විවේක ගන්න...''

''ඒත් පුංචි අම්මෙ, මට හරි අමුත්තක් දැනෙනවා.. මොකක් හරි නරක දෙයක් වෙලා වගේ. මගෙ කකුල්වලට හරි අමුත්තක් දැනෙනවා. ඒවාට මොනවත්ම දැනෙන්නෙ නැතෙ....''

හෙදියගේ මුහුණ දෙස ආයාචනාත්මක බැල්මක් හෙලූ පොලී මෙනෙවිය පසුපසට ගොස්, ඉවත හැරුණාය. හෙදිය ඉක්මන් ගමනින් ඉදිරියට ආවාය.

''මං හිතනවා, මට කතා කරන්න ඔයා ඉඩ දෙයි කියල....'' යි ඇය ප්‍රීතිමත් හඬකින් කතාව පටන් ගත්තාය. මට විශ්වාසයි අපි අඳුනාගන්න මේ හොඳම වෙලාව කියල. දැං මම කවුද කියල ඔයාට අඳුන්නලා දෙන්නං. මම තමයි මිස් හන්ට්. මම ආවෙ ඔයාගෙ පුංචි අම්මට, ඔයාව බලාගන්න උදව් වෙන්නයි. ඉතිං මම ඔයාගෙං ඉල්ලන්න යන පළවේනි දේ තමයි, මේ පුංචි සුදුපාට බේත් පෙති ටික බොන්න කියන එක...''

පොලියානා ගේ දෑස් තරමක් නොසන්සුන් වූ බවක් පෙන්වීය.

''ඒත් මාව බලාගන්න කවුරුත් ඕන නෑ... ඒ කියන්නෙ ගොඩක් දවස් මාව බලාගන්න වෙන එකක් නෑ. මට නැගිටින්න ඕනෑ. ඔයා දන්නවානෙ, මම ඉස්කොලෙ යනවා කියල. මට හෙට ඉස්කෝලෙ යන්න බැරිද?''

පොලී මෙනෙවිය සිටගෙන සිටි ජනේලය අසලින් තද කර ගෙන සිටි හැඬුමක් එළියට පැන්නේය.

''හෙට...'' හෙදිය දීප්තිමත් ලෙස සිනාවෙමින් කීවාය. ''හොඳයි... මට එච්චර ඉක්මනට නං ඔයාව එළියට යවන්න බැරි වෙයි, මිස් පොලියානා. ඒත් ඉස්සර වෙලා මේ පෙති ටික බීල හිටින්නකෝ, මං වෙනුවෙන්. අපි ඊට පස්සෙ බලමු මොකද කරන්නෙ කියල...''

''හා හොඳයි...'' පොලියානා මඳ සැකයෙන් යුතුව එකඟ වූවාය. ''ඒත් අනිද්දාට නං මම ඉස්කෝලෙ යන්න ම වෙනවා. එදාට තමයි විභාගෙ පටන් ගන්නෙ...''

ඇය ඊට මොහොතකට පසු, යළිත් කතා කළාය. ඇය පාසල ගැනත්, මෝටර් රථය ගැනත්, ඇගේ ඔලුව කොයිතරම් රිදෙනවාද යන්න ගැනත් කතා කළාය. ඒත් ඉතා ඉක්මනින් අර ගිලින ලද පෙති කිහිපයේ ආනුභාවයෙන් ඇගේ කට හඬ දුබල වී ගොස්, ඇය තද නින්දකට පිවිසියාය.

# 24

# ජෝන් පෙන්ඩල්ටන්

පොලියානාට 'හෙට' වත් 'අනිද්දා' වත් පාසල් යන්නට ලැබුණේ නැත. හදිසියේ ම සිහිය ආ විටෙක, ඇගේ මුවෙන් පිටවන අතොරක් නැති ප්‍රශ්න හැරෙන්නට, පොලියානට සිදුවී ඇති දෙය ගැන තේරුමක් තිබුණේම නැත. සතියක් පමණ ගතවී, ඇගේ උණ ගතිය අඩුවී, වේදනාව නැතිවී ගොස්, සම්පූර්ණයෙන් ආපසු සිහිය ලැබෙන තෙක්ම, සිදුවී ඇති දෙය ගැන ඇයට කොහෙත් ම තේරුමක් තිබුණේ නැත. ඊට පසු සිදුවී ඇත්තේ කුමක් දැයි නැවත වතාවක් ඇයට විස්තර කරනු ලැබීය.

"ඉතිං ඒක හින්දයි මට මෙච්චර රිදෙන්නෙ. මට වෙන ලෙඩක් හැදිලා නෑ!" යි ඇය අන්තිමේදී සුසුම් හෙලුවාය. "හොඳයි, මට ඒක ගැන සතුටුයි."

"ස... සතුටුයි, ඔයා?" යි ඇඳ පසෙකින් හිඳ සිටි ඇගේ පුංචි

අම්මා හීල්ලුවා ය.

''ඔව්. මම කැමතියි මිසිස් ස්නෝට වගේ ජීවිත කාලෙම තියෙන ලෙඩක් හැදෙන්නෙ නැතුව, මිස්ට පෙන්ඩල්ටන්ට වගේ කකුලක් කැඩෙන එකට. කැඩිච්ච කකුල් ඉක්මනට හොඳ වෙනවානෙ. අර වගේ නෙමෙයි.''

පොලී මෙනෙවිය...පොලියානාගේ කකුල් කැඩී ඇති බවක්, කොහොමටවත් නොකී පොලී මෙනෙවිය...හදිසියේම උන් තැනින් නැගිට කාමරයේ තිබූ කුඩා කණ්ණාඩි මේසය වෙත ගියාය. ඇය ඒ මත තබා තිබූ දේ අහුලා, නැවති කිසිම අරමුණක් නැති තාලෙකට ආපසු තබන්නට වූවාය. එය ඇගේ සුපුරුදු විලාසයට වඩා වෙනස් විය. ඒ කොහොම වෙතත් ඇගේ මුහුණ නම් අරමුණක් නැති විලාසයක් කොහොමටත් නොපෙන්නූ අතර, එය හොඳටම සුදුමැලිවී එල්ලා වැටිණි. පොලියානා ඇඳේ දිගාවී, ජනේලය අසළ එල්ලා ඇති ප්‍රිස්ම කෑල්ලකින් නික්මෙන නානාප්‍රකාර පාටැති පටි, සීලිම මත වැටී රඟ දෙනු බලා සිටියාය.

''මට හැදිල තියෙන්නෙ වසූරිය නෙමෙයි හින්ද මට සතුටුයි'' යි ඇය ප්‍රීතිමත් හඬකින් මුමුනන්නට වූවාය.

sinhalaebooks.com

''ඒක හැදුනාම, මූණෙ දුඹුරු ලප තියෙනවට වඩා අන්තයි. මට හැදිල තියෙන්නෙ කක්කල් කැස්ස නෙමෙයි හින්දාත් මට සතුටුයි. මට ඒක හැදිලා තියෙනවා. අම්මෝ! මම විඳපු වදයක්. ඇපෙන්ඩිසයිටිස් හරි සරම්ප හරි මට හැදුනෙ නැති එකටත් මට සතුටුයි. මොකද ඒක බෝවෙනවා නෙ... මං කිව්වෙ සරම්ප. අනික ඒවා හැදුනොත් මට මෙහෙ ඉන්න වෙන්නෙත් නෑ....''

''මට පේන්නෙ... ඔයා ගොඩක් දේවල් ගැන සතුටු වෙනවා. මගේ වස්තුවේ...''යි ගොත ගැසූ පොලී පුංචි අම්මා ඇගේ අත ගෙල දෙසට යැව්වාය.

පොලියානා මුදු සිනහවක් පෑවාය.

"ඔව්. අර දේදුන්න දිහා බලාගෙන ඉන්නකොට, මේ මුලු කාලෙ තිස්සෙම, ඒ වගෙ ගොඩක් දේවල් ගැන කල්පනා වුණා. මම දේදුනුවලට කැමතියි. මට හරි සතුටුයි මිස්ට පෙන්ඩල්ටන් අර ප්‍රිස්ම කෑලි ටික මට දීපු එකට! මට සන්තෝස හිතෙනවා, මම තවම කියපු නැති දෙයක් ගැනත්. මට හරියටම තේරෙන්නෙ නෑ. ඒත් මට ගොඩක්ම සතුටුයි මේ වගේ දෙයක් මට වෙච්ච එකට...."

"පොලියානා!"

පොලියානා නැවත වතාවක් මුදු ලෙස සිනාසුනාය. ඇය ඇගේ දීප්තිමත් දෑස්, ඇගේ පුංචි අම්මා වෙත හැරවූවාය.

"හොඳයි... ඔයා දන්නවාද, මට තුවාල වෙච්ච දවසෙ ඉඳන්ම, ඔයා කවදාවත් නැති විදියට මට ගොඩාක් සැරයක් 'වස්තුවේ' කියලා කතා කළා. මම හරි කැමතියි.... මගේම කියල කෙනෙක් මට 'වස්තුවේ' කියල කියනවාට. 'කාන්තා සරණ ' සංගමේ සමහර අයත් මට එහෙම කතා කරලා තියෙනවා. ඇත්තටම ඒක හරිම හොඳයි. ඒත් ඔයා වගේ, ඒගොල්ලො මගේම අය නොවෙන නිසා ඒක ඒතරං හිතට වැදුණෙ නෑ. අනේ පුංචි අම්මෙ. ඔයා මගේම වෙච්ච එක ගැන මං කොයි තරං සතුටුද?"

පොලී පුංචි අම්මාගෙන් ඊට උත්තරයක් ලැබුණේ නැත. ඇගේ අත නැවත වතාවක් ගෙල මත රැඳී තිබිණි. දෑස කඳුළින් පිරී තිබේ. ඉතින් ඇය ආපසු හැරී කාමයෙන් පිටවී යනු පිණිස දොර වෙත ගියාය. එවිට හෙදිය කාමරය තුළට පැමිණෙමින් සිටියාය.

එදා හැන්දෑ වරුවේ, අශ්වයා ගේ සැඳෑල පිරිසිදු කරමින් පිදුරු මඩුවේ සිටි මහලු ටොම් වෙත නැන්සි දිව ගියාය. ඇගේ දෑස් පුදුමයෙන් වියරු වැටී තිබුණු තරම්.

"ටොම් මාමෙ, ටොම් මාමෙ, ටිකක් හිතන්න බලන්න මොකද්ද මේ වෙන්න යන්නෙ කියල..." යි ඇය හති දැමුවාය. "ඔයාට ඒක තව අවුරුදු දාහක් ගියත් හිතාගන්න බෑ.... ඔයාට බෑ..."

''එහෙනං ඒක නොහිතා ඉන්න එක හොඳා...''

ටොම් ගණනකට නැතිව උත්තර දුන්නේය. ''මං තව අවුරුදු දහයක්වත් ඉඳීද කියලා විස්වාසයක් නෑ නෙව. ඉතිං උඹ ම ඒක කියන එක හොඳා...''

''එහෙනං මේ අහගන්න. ඔයා හිතන්නෙ අපේ නෝනා මහත්තයා එක්ක දූන් සාලෙ ඉන්නෙ කවුරුයි කියලද?'' මහලු ටොම් හිස දෙපසට වැනුවේය.

''මට කියන්ඩ බෑ...'' යි ඔහු කීවේය.

''ඔන්න එහෙනං අහගන්න. මම කියන්නයි යන්නෙ. ඒ පෙන්ඩල්ටන් මහත්තයා!''

''හෝ! හැබෑට. උඹ විහිලු කරනවද කෙල්ලෙ?''

''නෑ මාමෙ. මේ ඇත්තමයි. එයා කිහිලි කරුවලින් ආවම ඇතුළට එක්කගෙන ගියෙත් මම ම යි. එයා ආපු කරත්තෙ අස්ස ජෝඩුව ආං දොර ළඟ ඉන්නවා. අද නං එයා අර හොස්ස ළඟින් මැස්සෙක්වත් යන්න බැරි, කා එක්කවත් කතා කරන්නෙ නැති කෙනා වගේ නෙමෙයි. පොඩ්ඩක් හිතන්නකො ටොම් මාමෙ, එයා අපේ මැඩම්ට කතා කරන්න ආවැයි කිව්වම....''

''ඇයි, මොකක්දෑ ඒකෙ වැරැද්ද?'' යි ටොම් මදක් නුරුස්නා ස්වභාවයෙන් කීවේය.

''හරියට නොදන්නවා වගේ කතා කරන හැටි!'' යි නැන්සි සම්මචලයෙන් කීවාය.

''ඈ!''

''අනේ, ඔය තරං නොත්න බබෙක් වෙන්න එපා'' යි කී

නැන්සිගේ හඬෙහි ගැබ්වී තිබුණේ අවඥාවකි.

''ඔයා තමා මේ කිසි තේරුමක් නැති දෙයක් පස්සෙ මාව පන්නන්න හැදුවෙ...''

''මොකද්දෑ ඒකෙ තේරුම.''

නැන්සි පිදුරු මඩුවේ දොර අස්සෙන් බංගලාව දෙස බලා, තව අඩියක් ටොම් වෙත කිට්ටු වූවාය.

''මේ අහන්න. ඔයා ම නේද මුලින් මට කිව්වෙ අපේ පොලී නෝනට ආදරවන්තයෙක් හිටියැයි කියලා. ඉතිං එක දවසක් මම දෙකයි, දෙකයි එකතු කරලා හතරක් හදන්න ගියාම ඒක පහක් උණා!''

උදාසීන පෙනුමක් මවාගත් ටොම්, ඉවත හැරී වැඩෙහි යෙදෙන්නට පටන්ගත්තේය.

''මාත් එක්ක කතා කරනවා නං, කියන කෙහෙල්මලක් දන්න බාසාවෙන් කියපං. '' යි ඔහු කීවේය. ''මට ඔය ඉලක්කං කතා තේරෙන්නෙ නෑ....''

නැන්සි හයියෙන් සිනාසුනාය.

''හොඳයි අපි මෙහෙම කියමුකො.'' නැන්සි පැහැදිලි කරන්නට පටන් ගත්තාය. ''ඔයා කියපු දේකින් මට හිතුණා, පොලී නෝනයි, පෙන්ඩල්ටන් මහත්තයායි ආදරවන්තයො වෙලා හිටියා කියලා.''

''පෙන්ඩල්ටන් මහත්තයා'' මහලු ටොම් කෙලින් වූයේය.

''ඔව්. ඒත් මම දැං දන්නවා එහෙම නෑ කියලා. පෙන්ඩල්ටන් මහත්තයා කැමැත්තෙං හිටියෙ අර අසරණ ළමයාගෙ අම්මාටලු. ඒ හින්දා තමයි ඒ ළමයාව එයාට ඕනෑ වෙලා තියෙන්නෙත්. ආ, ඒ

හරිය ඕනෑ නෑ....'' යි ඇය හනික කීවේ පොලියානාට වූ පොරොන්දුව මතක්වී මෙනි. පෙන්ඩල්ටන් මහතා තමන් ඔහු සමග නවතින්නට එනු ඇතැයි බලාපොරොත්තුවෙන් සිටි බව කිසිවෙකුටත් නොකියන ලෙස පොලියනා ඇගෙන් ඉල්ලා තිබුණි. ''හොඳයි... මම පෙන්ඩල්ටන් ගැන එක එක අයගෙන් අහල බැලුවා. ඒත් මම හොයා ගත් විදියට නම්, පොලි නෝනයි එයයි අතර අවුරුදු ගාණක ඉඳලා කිසිම හිතවත් කමක් තිබිලා නෑ. පොලී නෝනා අවුරුදු දහඅටේ... විස්සෙ විතර කාලෙ ඒ දෙන්නගේ නම් දෙක ඈඳලා, මොකද්දෝ කට කතාවක් පැතිරිලා තිබුණලු. ඉතිං ඒ හින්දා පොලී නෝනට එයාව පේන්න බැරිලු....''

''හැබෑව. මටත් මතකයි ඕක...'' යි මහලු ටොම් හිස සැලුවේය. ''ඕක සිද්ද උණේ, ජෙනී නෝනා ඔය මහත්තයාට පිටුපාලා, වෙන හාදයෙක් එක්ක ගියාට අවුරුදු තුනකට හෝ හතරකට පස්සෙං පහු තමා. පොලී නෝනා ඕක දැනගෙන හිටියා. ඉතිං ඒ ඇත්ති පෙන්ඩල්ටන් මහත්තයා ගැන හැබෑවටම දුක් උණා. ඒ හින්දා වෙන්ඩැති එයැයි ඒ මහත්තයා ගෙ හිත හදන්ඩ උත්සාහ කොළේ. මං හිතන්නෙ එයැයි ඕනෑවටත් වැඩියෙන් එහෙම කොරන්ඩ ගියා කියලයි. ඒකට හේතුව පොලී නෝනට අර ජෙනී නෝනා ඇරන් ගිය ස්වාමි හාදයාව පෙන්නන්ඩ බැරි වෙච්ච එක. ඉතිං ඔය කාලෙ තමා ඔය කට කතා හෙම පැතිරුණේ. මිනිස්සු කීවේ පොලී නෝනා ඔය මහත්තයා පස්සෙං ගියා කියලා නොවැ....''

''මිනිහෙක් පස්සෙං ගියා!'' නැන්සි විස්මය පළ කළාය.

''මං දන්නවා එහෙම නොවෙන විත්තිය. ඒත් මිනිස්සු කීවේ එහෙම තමා.''යි මහලු ටොම් කීවේය.

''කොයි තරං හිත හයිය දූරිවියක් උණත්, ඒ කයි කතන්දරවලට ඔරොත්තු දෙන්නෙ නෑ. ඊට පස්සෙ තමා ඔන්න එයාගෙම ආදරවන්තයා ඇවිත්, ඔය අවුල් සේරෝම හදාගත්තෙ. ඊට පස්සෙං පහු නං එයැයි හිටියෙ බෙල්ලෙක් කටුව ඇතුළට වැදුණා වගේ තමා. හරියට හූනියමක් කොළා වගේ කා එක්කවත් ආස්සරේ

කෙරුවෙ නෑ නොවැ. එයැයි ගෙ හිත බොහොම තපුරු උණා මගෙ හිතේ...."

"ඔව් මං දන්නවා. මං ඕවා අහලා තියෙනවා..." යි නැන්සි එකතු කළාය.

"ඔය හින්දම තමා අපේ දොර ළඟදි පෙන්ඩල්ටන් මහත්තයා දකිනකොට මට සිහිය එළවාගන්න බැරි උණේ. අවුරුදු ගාණක් තිස්සෙ වචනයක් වත් කතා නොකරපු මිනිස්සුනෙ. ඒත් මං එයාට ඇතුළට එන්න කියලා අඬගහලා ගිහිං නෝනාටත් කිව්වා..."

"'මොනවද නෝනා කිව්වෙ එතකොට?" මහලු ටොම් හුස්ම අල්ලා ගනිමින් කීවේය.

"මුකුත් නෑ...මුලදී නම් එයා හිටිය තැනම හෙල්ලෙන්නෙවත් නැතුව එහෙමම හිටියා. ඒ කොච්චරද කියනවා නං මං හිතුවා මම කියපු දේ එයාට ඇහුණේ නෑ කියලත්. මම ආයෙම සැරයක් ඒක කියන්න යනකොට එයා බොහොම සාන්තව "මං ඉක්මනට පහළට එනවා කියල පෙන්ඩල්ටන් මහත්තයාට කියන්න' කියලා කිව්වා. ඉතිං මම පහළට ඇවිත් පණිවිඩේ කිව්වා. ඊට පස්සෙ තමා ඔයාට කියන්න ආවෙ..." යි කියා හමාර කළ නැන්සි, බංගලාව දෙසට තවත් බැල්මක් හෙලුවාය.

"හ්ම්." හඬක් පිට කළ ටොම්, නැවත වතාවක් වැඩෙහි යෙදෙන්නට පටන්ගත්තේය.

හැරින්ටන් බංගලාවේ ඇතුලු සාලයේ හිඳගෙන සිටි පෙන්ඩල්ටන් මහතාට, පොලී මෙනෙවිය එනතුරු වැඩි වේලා බලා සිටින්නට සිදුවුණේ නැත. ඇය එන බව හඟවන අඩි ශබ්දයක් ඇසිණ. ඔහු නැගී සිටින්නට හදන විටම, ඇය ඊට විරුද්ධත්වය හඟවන බැල්මක් හෙලුවාය. කොහොම නමුත් ඇය අතට අත නුදුන් අතර, මුහුණෙන් හැඟීම් විරහිත, ස්වභාවයක් පළ කළා ය.

"මං ආවෙ පොලියානාට කොහොමද කියලා දැන ගන්න..." ඔහු එක්වරම මදක් දැඩි ලෙස කතාව පටන්ගත්තේය.

"ස්තූතියි ආවට. එයාගෙ තත්වෙ එහෙමම තමා..." පොලී මෙනෙවිය කීවාය.

"ඒ වුණාට... ඔයා මට කියන්නෙ නැද්ද එයාගෙ තත්වෙ ගැන?" ඔහුගේ කටහඬ මෙවර මදක් වෙව්ලුවේය.

පොලී මෙනෙවියගේ මුහුණ හරහා ක්ෂණික වේදනාවක් ඇදී යනු පෙනුණි.

"මට බැහැ.එහෙම කියන්න පුළුවන් උනා නං හොඳයි මට හිතෙන විදියට..."

"ඔයා ඔය කියන්නෙ... ඒ ගැන දන්නෙ නෑ කියලද?"

"ඔව්..."

sinhalaebooks.com

"ඒත්... දොස්තර"

"ඩොක්ට වොරන් අන්දුන් කුන්දුන් වෙලයි ඉන්නෙ. දැං එයා නිව්යෝක්වල ඉන්න විශේෂඥ දොස්තර කෙනෙක් එක්ක ලියුං ගනුදෙනු කරනවා. ඒ ගොල්ලො එකතුවෙලා මොකක් හරි නිගමනයක් ගනී...."

"ඒත්...ඒත්... එයාගෙ තුවාල වෙලා තියෙන්නෙ කොහෙ කියලද ඔයා හිතන්නෙ?"

"ඔලුවෙ පොඩි තැලුමක් තියෙනවා. තැලීම් දෙක තුනක් එක්ක. මං හිතන්නෙ කොඳු ඇට පෙළට වෙච්ච හානියක් හින්දා උකුලෙන් පහළ පණ නැතුව ගිහින්"

පෙන්ඩල්ටන් මහතාගේ මුවින් හඬක් පිට විය. ඊට පසු කෙටි නිහඬතාවයක් පැතිරිණ. ඊළඟට ඔහු හනික මෙසේ ඇසුවේය:

''පොලියානා කොහොම ද ඒක තේරුං අරන් ඉන්නෙ...''

''එයාට තේරෙන්නෙ නෑ.. කොහොමටවත් මොනවද වෙලා තියෙන්නෙ කියලා. මට ඒක එයාට කියන්නත් බෑ...''

''ඒත් එයා දැනගන්න ඕන... මොනවා හරි...''

පොලී මෙනෙවිය ගේ අත කර වෙත ඇදී ගොස්, පසුකාලීනව බොහෝ තැන්හිදී ඇය වෙතින් පළවූ පෙනුම මෙහිදීත් දිස්වන්නට විය.

''ඔව්. එයා දන්නවා එයාට හෙලවෙන්න බෑ කියලා. ඒත් එයා හිතන්නෙම එයාගෙ කකුල් දෙකේ ඇට කැඩිලා කියලයි. එයා කියනවා මිසිස් ස්නෝට වගේ හැමදාම තියෙන ලෙඩක් හැදෙන්නෙ නැතුව, ඔයාගෙ වගේ කකුල කැඩිච්ච එක හොඳලු. කැඩිච්ච කකුල හොඳ කරන්න පුළුවන් උනාට, අර වගේ ලෙඩ හොඳ කරන්න බැරිලු. මේ සිද්ධිය වෙච්ච දවසෙ ඉඳං එයා ඔය වගේ කතා තමයි කියන්නෙ. ඒවා අහනකොට මට හිතෙන්නෙ මං මැරෙනවා නං හොඳයි කියලයි...''

කඳුලින් පිරුනු දෑසේ අඳුරු පටලය අතරින් වුවද පෙන්ඩල්ටන් මහතා ඔහු ඉදිරියේ වූ මුහුනේ, හැඟීම්වලින් මිරිකී ගිය පෙනුම දක්කේය. ඉබේටම ඔහුට එදා අන්තිම වරටත් තමන් සමග නවතින්නට එන්නැයි කී විට, පොලියානා කී වචන සිහි විය.

''අනේ... මට දැන් පොලී පුංචි අම්මාව දාලා එන්න බෑ...''

ඒ කල්පනාව නිසා, ඔහුට කටහඬ පාලනය කරගන්නට පුලුවන් වූ විගසම වාගේ, ඉතා මෘදු ලෙස මෙසේ අසන්නට සිත්විය:

"මිස් හැරින්ටන්, ඔයා දන්නවාද දන්නෙ නෑ මං කොයි තරං උත්සාහ කළාද කියල පොලියානාව මගේ ළඟ නවත්තගන්න..."

"ඔයා එක්ක! පොලියානා!"

ඈ එය කී ස්වරය නිසා, පෙන්ඩල්ටන් මහතා තරමක අපහසුතාවයකට පත් වුණේය. එහෙත් ඉන් නොසැලුණු ඔහුගේ කටහඬ, නැවත වතාවක් කතා කරන්නට පටන් ගත් විටත් ඉතා තැන්පත් වූයේය.

"ඔව්. මට ඕනෑ වුණා එයාව නීතියෙන් අරන් හදාගන්න. ඔයාට තේරුණාද?...මගේ බූදලේ උරුමක්කාරයා වෙන විදියට..."

ඔහු ඉදිරිපස පුටුවේ වාඩි වී සිටි පොලී මෙනෙවිය මදක් සැහැල්ලු පෙනුමකට ආවාය. හදිසියේම ඇයට එසේ වුවහොත් පොලියානාට උදාවන්නට යන දීප්තිමත් අනාගතය ගැන කල්පනා විය. මේ මිනිසාගේ ධනවත්කම සහ වංශවත්කම ගැනත්, මිල මුදලේ වටිනාකම ගැනත් තේරුම් ගැනීමට තරම් සුදුසු වයසක පොලියානා සිටින්නේ දැයි ඇය සිතුවාය.

sinhalaebooks.com

"මම පොලියානාට ගොඩාක් කැමතියි" පෙන්ඩල්ටන් මහතා කියාගෙන ගියේය. "මම එයාට කැමති, එයා ගෙ විදියටයි, එයාගෙ අම්මා නිසයි කියන කාරණා දෙකම උඩ. අවුරුදු විසිපහක් තිස්සේ කාටවත් නොදී හිටපු ආදරේ පොලියානාට දෙන්න මං ලෑස්තියි...."

"ආදරය" ඒ ඇසූ පොලී මෙනෙවියටත් තමන් මේ දැරියට සළකන්නේ ඇයිද යන වග කල්පනා විය. එදා උදෑසන පොලියානා මිමිනූ වචන ද ඇයට ඉබේටම සිහියට නැගෙන්නට වන. "මගේම කියලා කෙනෙක් 'වස්තුවේ' කියලා කතාකරනවාට මං ආසයි." ඉතින් අවුරුදු විසි පහක් තිස්සේ කිසිවකුට ගන්නට බැරි වූ ආදරයක් ලැබී තිබෙන්නේ ඒ තරම් ආදරය ඉල්ලා සිටින දැරියකටය. ආදරය කෙරෙහි ආකර්ෂණය වීමට තරම් ලොකු වයසකට දූන් ඇය පැමිණ සිටී! හදවත කඩාගෙන වැටෙන්නට යද්දී, පොලී මෙනෙවිය එය

තේරුම් ගත්තාය. ඒ කඩාවැටෙන හදවතින් වුවද ඇය වෙනත් දෙයක් ද තේරුම් ගත්තාය. ඒ, පොලියානා නොමැතිව ගතකරන්නට යන ඇගේ ඉදිරි ජීවිතයේ පාළුව ගැනය.

''ඉතිං?'' යි ඇය ඇසුවාය. ඒ ස්වරයේ තියුණු බව අතරින් විහිදුණු හැඟීම් මිරිකා ගැනීම පිළිබඳ තේරුම්ගත් පෙන්ඩල්ටන් මහතා දුක්මුසු ලෙස සිනාසුණේය.

''ඒත් එයා එන්නෙ නැතිවෙයි.'' ඔහු පිළිතුරු දුන්නේය.

''ඇයි?''

''එයා ඔයාව දාලා එන එකක් නෑ. එයා කිව්වා ඔයා ගොඩාක් හොඳට එයාට සළකනවා කියලා. එයාට ඕනෑ වුණා ඔයත් එක්ක ඉන්න. එයා කිව්වා, ඔයාට එයාව ඕනෑ කියලා හිතෙනවලු...'' යි නැගී සිටිමින් ඔහු කීවේය.

ඔහු පොලී මෙනෙවිය දෙස බැලුවේ නැත. ඔහු කෙළින්ම දොර දෙස බලාගෙන ම ගමන් කළේය. එහෙත් එක් වරම ඔහුට පිටුපසින් හනික ඇදී එන අඩි ශබ්දයක් ඇසිණ. පිටුපස හැරී බැලූ ඔහුට, අතට අත දෙනු පිණිස තමන් වෙත දිගු වී ඇති අතක් පෙනිණි.

''අර විශේෂඥ දොස්තර ආවම... පොලියානා ගැන ඉස්තීරෙට ම දෙයක් දැන ගන්න පුළුවං වෙයි. මං ඔයාට ඒක දැනගන්න සළස්වන්නම්'' යි වෙව්ලන කටහඬක් ඇසිණ. පොලියානා බලන්න ආවට ස්තූතියි. එයා ගොඩාක් සතුටුවෙයි. ''ආයුබෝවන්!''

# 25

# බලාපොරොත්තුවෙන් සිටීමේ ක්‍රීඩාව

හැරින්ටන් බංගලාවට පෙන්ඩල්ටන් මහතා ඇවිත් ගියායින් පසු දවසක, පොලී මෙනෙවිය විශේෂඥ දොස්තර කෙනෙකුට පොලියානා පෙන්වීම පිණිස කටයුතු සූදානම් කළාය.

sinhalaebooks.com

''පොලියානා, වස්තුවේ...'' යි ඇය මුදු ලෙස කතාවට බැස්සාය. ''අපි තීරණය කළා. ඩොක්ට චොරන් ඇරෙන්න වෙන දොස්තර කෙනෙකුටත් ඔයාව පෙන්නුවොත් හොඳයි කියලා. තවත් දොස්තර කෙනෙකුට ඔයාව ඉක්මනට ම හොඳ කර ගන්න, පුළුවන් අලුත් බේතක් ගැන කිව්වැකිනෙ...''

පොලියානා ගේ මුහුනට ප්‍රීතිමත් ආලෝකයක් වැටිණි.

''ඩොක්ට කිල්ටන්! අනේ පුංචි අම්මෙ, මට හරි සතුටුයි ඩොක්ට

කිල්ටන් ගෙන් බෙහෙත් ගන්න. මට නම් හැම වෙලාවෙම එයාව ඕනෑ වුණා. ඒත් මං හිතුවෙ ඔයා එයාට කැමති නැතුව ඇති කියල... අර සන් පාලර් එකේදී එයා ඔයාව දැක්ක දවසෙ ඉඳං. ඔයා දන්නවනෙ, ඒ හින්දා ඒ ගැන මුකුත්ම කියන්න කැමති වුණේ නෑ මම. ඒත් දැන් නම් මට හරි සතුටුයි ඔයාටත් එයාව ඕන වෙච්ච එක ගැන...''

පොලී මෙනෙවියගේ මුහුණ සුදුමැලි විය. ඊළඟට රත් පැහැයට හැරුණු එය නැවතත් සුදුමැලි විය. ඊට පසු උත්තර දෙන්නට පටන් ගත් ඇය ඉතා පැහැදිලිව ම තමන් ඉතා සැහැල්ලුවෙන් සහ සතුටින් කතා කරන බව පෙන්වන්නට උත්සාහ කළාය.

''අනේ නෑ දරුවෝ. මම ඩොක්ට කිල්ටන් ගැන නෙමෙයි කියන්න හැදුවෙ. ඒ අලුත් දොස්තර කෙනෙක්.... නිව්යෝර්කවල ඉන්න හරිම ප්‍රසිද්ධ දොස්තර කෙනෙක්. එයා ගොඩාක් දේවල් දන්නවා... ඔයාගෙ වගේ තුවාලයක් උනාම මොකද කරන්නෙ කියලා...''

පොලියානා ගේ මුහුණ එල්ලා වැටිණ.

''මට හිතෙන්නෙ නං එයා ඩොක්ට කිල්ටන් දන්න දේවල්වලින් බාගයක් වත් දන්නෙ නෑ කියලා....''

''ආනේ... එහෙම හිතන්න එපා.එයා ගොඩක් දන්නවා. මට විශ්වාසයි, වස්තුවේ..''

''ඒත් මිස්ට පෙන්ඩල්ටන් ගෙ කැඩිච්ච කකුල හොඳ කළේ ඩොක්ට කිල්ටන් නෙ. පුංචි අම්මෙ, ඔයාට... ඔයාට කමක් නැත්නම්, මම නං කැමති ඩොක්ට කිල්ටන් එනවා නං. ඇත්තමයි මං කැමතියි....''

පොලී මෙනෙවිය මහත් පීඩනයකට ලක්වෙනු පෙනුණි. මොහොතක් පමණ ඇය කොහොමටවත් කතා කළේ නැත. ඊට

පසු ඇය මෘදු ලෙස කතා කරන්නට පටන් ගත්තේ, ඇගේ පැරැණි දූඩි ගති ස්වභාවය මදක් ඉස්මතුවන පරිදිය.

''මං ඒකට කැමති නෑ පොලියානා. කොහොමටවත් නෑ. මම ඕනෑ දෙයක්.. ඕනෑම දෙයක් ඔයා වෙනුවෙන් කරන්නං වස්තුවේ. ඒත් මම...දූන්ම ඔයාට කියන්න බැරි හේතු නිසා, මම කැමති නෑ මේ සිද්ධියට ඩොක්ට කිල්ටන්ව ගාවා ගන්න. මාව විස්වාස කරන්න. හෙට නිව්යෝර්ක්වල ඉඳන් එන ඒ දොස්තර තරං හොඳට ඩොක්ට කිල්ටන්ට ඔයාට මේ තියෙන ආබාදෙ ගැන දූනගන්න විදියක් නෑ...''

පොලියානා තවමත් කිසි දෙයක් තේරුම් ගත නොහැකිව මෙන් බලා සිටියාය.

''ඒත් පොලී පුංචි අම්මෙ... ඔයා ඩොක්ට කිල්ටන් ට කැමති නං...''

''මොකක්, පොලියානා?'' පොලී පුංචි අම්මාගේ හඬ මෙවර වඩාත් තියුණු වී ය. ඒ මදිවාට ඇගේ දෙකම්මුල් ද රෝස පැහැයට හැරී තිබිණි.

sinhalaebooks.com

''මං කියන්න ගියේ, ඔයා අනිත් කෙනාට නැතුව ඩොක්ට කිල්ටන්ට කැමති උනා නං...'' යි පොලියානා සුසුම්ලමින් කීවාය. ''මට හිතෙන හැටියට එයා කරන හොඳ වැඩවලත් මොකක් හරි වෙනසක් වේවි. ඉතිං මම නම් එයාට හරි කැමතී.''

මේ මොහොතේ හෙදිය කාමරයට ඇතුලු වූවාය. එක්වරම උන් තැනින් නැඟී සිටි පොලී පුංචි අම්මාගේ මුහුණේ සැනසුම් සහගත බැල්මක් රැඳී තිබිණි..

''මට ගොඩක් කණගාටුයි පොලියානා''යි ඇය මදක් තදින් කියා සිටියාය.''මං හිතන්නෙ මේ වෙලාවෙ තීරණ ගන්න ඔයා මට ඉඩ දෙයි. ඇරත් ඒක දූනටමත් ලෑස්ති කරලයි තියෙන්නෙ.

නිව්යෝර්ක්වල ඉඳලා එන දොස්තර හෙට මෙහාට එයි....''

එහෙත් ඊළඟ දවසේ ''නිව්යෝර්ක් දොස්තර' ආවේ නැත. අන්තිම මොහොතේදී තමන් අසනීප වී ඇති බැවින් පැමිණිය නොහැකි බව දන්වා දොස්තර මහතා විසින් එවන ලද ටෙලිග්‍රෑමක් ලැබිණි. මේ නිසා නැවත වතාවක් පොලියානට දොස්තර කිල්ටන් ගෙන්වන ලෙස ඉල්ලමින් කංකෙදිරි ගාන්නට අවස්ථාව ලැබිණි. ''දූං ඒක හරි ලේසිනෙ'' ඇය කියන්නට වූවාය.

ඒත් පෙර ලෙසම පොලී පුංචි අම්මා හිස දෙපසට වනා, ''නෑ වස්තුවේ...'' යි තීරණාත්මක ලෙස කීවාය. ඒ ස්වරයේ තවමත්, තමන්ගේ ආදරණීය පොලියානා වෙනුවෙන් මේ ලෝකයේ ඇති ඕනෑම දෙයක් කරන බවට ද සහතිකයක් විය.

බලාපොරොත්තුවෙන් සිටි දවස් එකිනෙක ගෙවී යද්දී පොලී පුංචි අම්මා පොලියානා සතුටු කළ හැකි හැම දේම (දොස්තර පිළිබඳ කාරණාව හැරෙන්නට) ඉටු කරමින් සිටින බව පෙනී ගියේය.

''මට නං මේක විස්වාස කරන්නත් බෑ. ඔයාට එහෙම දෙයක් මා ලවා කරවන්නත් බෑ...''යි නැන්සි එක්තරා උදෑසනක ටොම් හා කීවාය. ''දූං දවසෙ එක මිනිත්තුවක් වත් නෑ පොලී මැඩම් අර අසරණ ළමයා ළඟ කැරකි කැරකි, මොනවා හරි එයාට ඕන දෙයක් කරල නොදෙන. මීට සතියකට උඩදී නං අර ෆලෆීවයි බ්ලෆීවයි උඩ තට්ටුව අහලකටවත් ගේන්න දුන්නෙ නැති කෙනා ඔන්න දූං ඕන හැටියෙ පූසොයි, බල්ලොයි ඇඳටම ගෙනත් දීලා මිස් පොලියානාව සතුටු කරවන්න....!''

''එයාට කරන්න වෙන කිසිම දෙයක් නැත්තං, අඩු ගානෙ අර කාමරේ එල්ලලා තියෙන වීදුරු කෑලි ටික හරි එහාට මෙහාට කරකවනවා, ඒවාට ඉර අව්ව වැටිලා දේදුන්නක් හැදෙනවා බලන්න. අර ළමයා ඒකට කියන්නෙ ''දේදුනු නැටුම' කියලා නෙ. මේ වත්තෙන් කඩලා කාමරේ තියලා තියෙන මල් පොකුරු ඇරුණාම, දූන් තුන් සැරයක්ම තිමති වටුමට යවලා අලුත්ම අලුත් මල් ගෙන්නා ගත්තා.

මිස් පොලියානාගේ කාමරේ තියන්න. තව දවසක් මම දැක්කා එයා ඇඳ උඩ උඳගෙන ඉන්න කොට අර නර්ස් නෝනා එයාට කොණ්ඩ මොස්තරයක් දානවා. මිස් පොලියානා ඒක කරන්න උපදෙස් දිදී, බොහොම සන්තෝසෙන් ඒ දිහා බලාගෙන ඉන්නවා. ඔන්න, දැන් මිස් පොලියානාව සතුටු කරන්න කියලා පොලී නෝනා හැමදාම ඔය විදියට කොණ්ඩෙ දාගෙන නොහිටියොත් තමා පුදුමෙ.!''

මහලු ටොම් හිකි හකි ගෑවේය.

''මට හිතෙන්නෙ නං, නළලට උඩින් කොණ්ඩ කැරලි හෙම වැටුණම පොලී නෝනාගේ පෙනුම නරක් වෙන්ඩ බෑ...'' යි ඔහු නැන්සි දෙස පරීක්ෂාකාරී ලෙස බලමින් කීවේය.

''ඇත්තටම එයාගෙ පෙනුම නරක නෑ තමා'' යි නැන්සි මදක් කුපිත වෙමින් කීවාය.''ඒත් දැං එයාට ටිකක් මනුස්ස පෙනුමක් ඇවිත්. එයා නං ඇත්තටම...''

''හා...බලාගෙනයි නැන්සියේ..'' යි බාධා කළ මහලු මිනිසා, ඈ දෙස බලා විරිත්තුවේය. ''උඹට මතක ඇතිනෙ දවසක්දා මම පොලී නෝනා ලස්සනයි කියන කොට උඹ කියපු දේ...''

නැන්සි දෙවුර හැකිලුවාය.

''ආ! ඇත්තටම එයා එච්චර ලස්සන නෑ තමා. මං මේ කියන්න ගියේ, මිස් පොලියානා එයාව ඔය තරං හැඩ වැඩ කරලා ගත්තාම, ඉස්සර හිටපු පොලී නෝනා වගේ නෙමෙයි මට පේන්නෙ කියලයි.''

''මං උඹට කිව්වෙ...'' යි මහලු ටොම් හිස සැලුවේය. ''මං කිව්වෙ එයාට ඒ හැටි වයසක් නෑ කියලා...''

නැන්සි හයියෙන් සිනාසුණාය.

''මිස් පොලියානා එන්න කලින් නං ඒ වගක් පෙනුණෙ නෑ

එයාගෙ. ඒක නෙමෙයි කියන්නකො ටොම් මාමෙ, කව්ද එයාගෙ ආදරවන්තයා වෙලා හිටියෙ? මට තාම හොයාගන්න බැරි වුණානෙ."

"බැරි වුණාද?" යි ටොම් ඇසුවේ මුහුණ තරමක් අමුතු කර ගනිමිනි. "හොඳා එහෙනං ඒක මගෙං හොයා ගන්ඩත් බැරි වෙයි..."

"අනේ ටොම් මාමෙ, එහෙම කියන්න එපා. කියන්නකෝ..." යි නැන්සි ආයාචනා කොට සිටියාය. "ඔයා දන්නවානෙ, මට ඔයා ඇරෙන්න ඔය වගේ දේවල් අහගන්න මෙහෙ කවුරුත් නැති විත්තිය."

"වෙන්ඩැ, ඒත් එක්කෙනෙක් නං ඉන්නවා. ඒත් එයැයි උත්තර දෙන්නෙ නැතිවෙයි ඕවට..." යි මහලු ටොම් විරිත්තුවේය. ඊට පසු එක්වරම වාගේ ඔහුගේ දෑසේ දීප්තිය නැතිවී ගියේය. "අර ගෑනු දරුවට කොහොම දැන්..."

නැන්සි ඔලුව දෙපසට වැනුවාය. ඇගේ මුහුන ද කණගාටුවෙන් පිරී තිබිණ.

"වෙනසක් නෑ මාමෙ. තවමත් එහෙමම තමා. මට විතරක් නෙමෙයි... හැමෝටම පේන්නෙ එහෙමයි. එයා හැම තිස්සෙම ඇඳේ දිගාවෙලා නිදාගන්නවා. සමහර වෙලාවට කතා කරනවා. එහෙම නැත්තං ඉර බැහැපු එක ගැන හරි, හඳ පෑව්ව එක ගැන හරි සතුටු වෙන්න හදනවා. ඒක බලාගෙන ඉන්නකොට හිත කඩා වැටෙන්න තරං දුකයි."

"මං දන්නවා... ඔය අර 'සෙල්ලම' නෙව. අනේ ඔය හොඳ හිතට දෙයියන්ගෙ ආසිර්වාදෙ ලැබෙන්ඩ ඕනෑ..." යි හිස සැලූ ටොම් වේගයෙන් ඇසිපිය ගැසුවේය.

"එයා එහෙනං ඔයාටත් ඒ සෙල්ලම ගැන කිව්වා?"

"හපෝයි ඔව්. දැං ගෙඩාක් කාලෙකට ඉස්සර නෙව ඕක මාත් එක්ක කීවෙ..."යි කී මහලු ටොම් මදක් පැකිලෙමින් සිට නැවත

කතාව කරගෙන ගියේය. ඔහුගේ දතොල් වෙව්ලන්නට පටන් ගත්තේය.

"මං දවසක් දා මගේ මේ පිටේ තියෙන කුදේ ගැන කිය කියා කං කෙඳිරි ගගා උන්නා. ඉතිං ඒක අහලා ඔය දූරිවි කිව්වෙ මොනවා කියලද උඹ හිතන්නෙ?"

"මට හිතා ගන්න බෑ. ඒක ගැන නං සතුටු වෙන්න පුළුවන් කිසිම දෙයක් එයාට හොයා ගන්න පුළුවන් උණා කියලා මං හිතන්නෙ නෑ..."

"මොකදෑ නැත්තෙ. ඒ දූරිවි කිව්වා නෙව මට සන්තෝස වෙන්න පුළුවං විදියක්. මගේ කුදේ හන්දා වත්තෙ පිටියෙ උදළු ගානකොට හෙම, මට හිතලා මතලා නැමෙන්ඩ ඕනැ නැතිලු. ඒ මොකෝ, නිකං හිටින කොටත් බාගෙට නැමිලා නෙව මං ඉන්නෙ...."

නැන්සි දුක්මුසු සිනාවක් පෑවාය.

sinhalaebooks.com

"බලාගෙන යනකොට පුදුම වෙන්නත් දෙයක් නෑ තමා. එයා මොනවා හරි හේතුවක් සොයා ගන්නවානෙ. අපි ඒක මුල හිටන් ම සෙල්ලං කළා, ඒ දවස්වල ඒක කරන්න එයාට කිසි කෙනෙක් හිටියෙ නෑනෙ. එයාට පොලී නෝනවත් ඒකට හවුල් කරගන්න ඕන වුණාට..."

"පොලී නෝනා....!"

නැන්සි කට තදකරගෙන සිනා වුණාය.

"මං හිතන්නෙ එයා ගැන මගේ හිතේ තියෙන හැඟීමට වඩා නරක යමක් ඔයා ළඟ තියෙන්න බෑ...."

ටොම්ට තරහ ගිය බව පෙනිණි.

"මට කල්පනා උනේ ඒක එයාට කොයි තරං පුදුම දෙයක් වෙයිද කියල විතරයි..." යි ටොම් උදාර ලීලාවෙන් විස්තර කළේය.

"හොඳයි. ඉස්සර නං එහෙම වෙන්ඩ ඉඩ තිබුණා." නැන්සි එකවෙක කීවාය."ඒත් දැං තත්වෙ නං ඊට වඩා වෙනස්. ඒත් මට නං විස්වාසයි, වෙන කාටත් වඩා පොලී නෝනා ඕකට කැමති වෙයි කියලා. සමහර විට එයා තනියෙං උණත් ඒක කරන්න බැරි නෑ...!"

"ඒත් ඒ දැරිවි ඔය ගැන නෝනා එක්ක කියලා තියෙනවද කවදක හරි? මට හිතෙන හැටියට නං එයා හැමෝටම ඒක ගැන කියල තියෙනවා. ඔය අනතුර වෙච්ච දවසෙ ඉඳං හැමෝම ඔය ගැන කතා වෙනවා මට ඇහුණා..." යි ටොම් කීවේය.

"ඒත් එයා පොලී නෝනාට නං කියල නෑ..." යි නැන්සි කීවාය. "මීට ගොඩක් කාලෙකට ඉස්සරිං දවසක මිස් පොලියානා මාත් එක්ක කිව්වා එයාට පුංචි අම්මා එක්ක මේ ගැන කතා කරන්න බෑ කියලා...ඒ මොකද ඒක එයාගෙ තාත්තා හදාපු සෙල්ලමක් නිසා, ඒක කියනවා නං තාත්තා ගැනත් කියන්නම වෙනවාලු. ඒත් පොලී නෝනා කැමති නැලු, පොලියානා මිස්ගේ තාත්තා ගැන කතා කරන්න. ඉතිං ඒ හන්දා සෙල්ලම ගැන එයා පුංචි අම්මා එක්ක කවදාවත් කතා කළේ නෑ."

"හැබැව, හැබැව..." මහලු මිනිසා හිස සොලවමින් පිළිතුරු දුන්නේය.

"මේ බංගලාවෙ ඇත්තො ඔය ස්වාමි හාදයා ගැන බොහොම හිත තරක් කරගෙනයි උන්නෙ, ජෙනී නෝනාව ඇරන් ගියා කියලා. පොලී නෝනා බඩපිස්සි වෙච්චි, ජෙනී නෝනාට බොහෝම ආදරෙං උන්නා. ඉතිං ඒ ඇත්තිට කවදාකවත් අර ස්වාමි හාදයාට සමාව දෙන්න බෑ නෙව. හැබැව..... හැබැව ඒක නං හැබෑම අවුලක් තමා..." යි සුසුම් හෙලූ ඔහු ආපිට හැරුණේය.

''ඇත්ත. හැම තැනම... හැම තැනම, එහෙම තමා...'' යි සුසුමක් හෙලූ නැන්සි ද මුළුතැන් ගෙය වෙත යනු පිණිස ආපසු හැරුණාය.

කිසිකෙනෙකුට ඒ බලාපොරොත්තු දල්වාගෙන සිටි දවස් ගෙවා දැමීම ලෙහෙසි පහසු කාරියක් වූයේ නැත. හෙදිය ඉතා ප්‍රීතියෙන් සිටින බව පෙන්නීමට උත්සාහ කළත් ඇගේ දෑස හැම විටම කරදරකාරී ස්වභාවයකින් පිරී තිබිණි. දොස්තර මහතාද පැහැදිලිවම හිත කලබලයෙන් සහ නොඉවසිල්ලකින් සිටින බව පෙනුණි. පොලී මෙනෙවිය වැඩිපුර කතාබහ නොකළාය. එහෙත් ඇගේ මුහුණ අසළ රැඳී තිබුණු රැලි ගැසුණු හිසකේවලින් පවා, ගෙල අසළ රැඳී තිබුණු රේන්දයකින් පවා, ඇය දවසින් දවස වඩ වඩාත් කෙට්ටු වී සුදුමැලි වන බව සඟවන්නට බැරි විය. පොලියානා ගැන කියනවා නම්, ඇය බල්ලා සුරතල් කළාය. පූසාගේ සිනිඳු හිස අත ගෑවාය. ඇය වෙත ගෙනෙන මල් පොකුරු දෙස බලා සතුටු වූවාය. ඇය වෙත එවන පළතුරු වර්ග සහ ජෙලි වර්ග කෑවාය. ඇය ආදරයෙන් මතක් කොට, ඇගේ මිතුරන් විසින් එවන ලද පණිවුඩවලට ප්‍රීතිමත් උත්තර යැව්වාය. එහෙත් ඇය දවසින් දවස වඩ වඩාත් කෙට්ටු වී, සුදුමැලි වීම වළක්වනු බැරි විය. ඇඳ උඩ සිට ඉතා දුක්බර ලෙස එහාටත් මෙහාටත් හැසිරවෙන ඇගේ කුඩා දෑත්වලින් කියැවුණේ, කාලයක් ඉතා දඟකාර ලෙස දුවපැන ඇවිදිමින් සිටි කුඩා දෙපා යුවලක්, අද බිලැන්කට්ටුව තුළට වී නිසල වීමේ දුක්මුසු කතාවයි.

සෙල්ලම ගැන කියනවා නම් පොලියානා මේ දිනවල නැන්සි සමඟ නිතරම කියමින් සිටින්නේ ඇයට නැවත පාසල් යන්නට ලැබෙනවා නම් ඇය කොතරම් සතුටට පත්වෙයිද, නැවතත් ස්නෝ මහත්මිය බලන්නට යාමෙන්, පෙන්ඩල්ටන් මහතාගෙන් කැඳවීමක් ලැබ එහි යාමෙන්, දොස්තර කිල්ටන්ගේ අශ්ව කරත්තයේ සවාරි යාමෙන් ඇය කොයිතරම් සතුටට පත්වෙයිද කියායි. එහෙත් ඒ සියල්ලම වර්තමානයට නොව අනාගතයට භාර දිය යුතු ඒවා බව ඇය තේරුම් ගත් බවක් නොපෙනුණි. එහෙත් නැන්සිට එය තේරී තිබුණු අතර, තනිවුණ හැමවිටෙකම පාහේ ඇය එය සිහිකරමින් කඳුලු සැලුවාය.

# 26

# බාගෙට අරුණු දොර

බලපොරොත්තුවෙන් සිටි දවසට හරියටම සතියකට පසු දොස්තර මීඩ්, විශේෂඥ වෛද්‍යවරයා පැමිණියේය. ඔහු උසැති, පළල් උරහිස් සහිත, කරුණාවන්ත ඇස් ඇති, ප්‍රසන්න සිනහවක් මුවේ රඳවාගෙන උන් අයෙකි. ඔහු දුටුවනම පොලියානා ඔහුට ඉතා කැමති වූවා, මෙසේ කීවාය:

''ඔයා හරියට මගේ දොස්තර වගේමයි, දන්නවාද?'' ඇය සුහද ලීලාවෙන් කියා සිටියාය.

''ඔයාගෙ දොස්තර?'' දොස්තර මීඩ් පුදුමයට පත්වී හෙදිය සමඟ තරමක් ඈතින් කතා කරමින් සිටි දොස්තර චොරන් දෙස බැලුවේය. දොස්තර චොරන් කුඩා සිරුරැති, දුඹුරු පාට ඇස් සහ දුඹුරු පැහැ උඩු රැවුලක් ඇත්තෙකි.

''ආ! ඒ මගේ දොස්තර නෙමෙයි'' යි පොලියානා මදහසක් පෑවේ දොස්තර මීඩ්ගේ අදහස හැඳිනගෙනය. ''ඩොක්ට චොරන් තමයි පොලී පුංචි අම්මගේ දොස්තර. මගේ එක්කෙනා ඩොක්ට කිල්ටන්...''

''ආ... හා...'' යි අමුතු ස්වරයකින් කී දොස්තර මීඩ් පොලී මෙනෙවිය දෙස බැලුවේය. ඒ අසා ලජ්ජාවෙන් රතු වූ පොලී මෙනෙවිය හනික ආපසු හැරුණාය.

''ඔව්...'' යි මදක් පැකිලෙමින් කී පොලියානා, නැවතත් ඇගේ සුපුරුදු අවංකභාවයෙන් යුතුව කතාව කරගෙන ගියාය. ''ඔයා දන්නවද, මට නං හැමතිස්සෙම ඕනෑ වුණේ ඩොක්ට කිල්ටන්ව. ඒත් පොලී පුංචි අම්මට ඔයාව ඕනෑ වුණා. එයා කිව්වා ඔයා ඩොක්ට කිල්ටන්ට වඩා මගෙ කැඩිච්ච කකුල් හොඳ කරන විදිය ගැන දන්නවා කියලා. ඉතිං ඇත්තටම ඔයා එහෙම නං, මට ඒක ගැන හරි සතුටුයි. ඔයත් එහෙම නේද?''

දොස්තරගේ මුහුනේ හදිසි වෙනසක් ඇඳී ගිය අතර පොලියානාට එය කුමක්දැයි කියවා ගන්නට බැරිවිය.

''අපි ඒක කාලෙට බාර දෙමු දරුවෝ...'' ඔහු මුදු ලෙස කීවේය. ඊට පසු ඔහු බැරෑරුම් මුහුනෙන්, ඒ වෙලාවේ ඇඳ ළඟට ආ දොස්තර චොරන් දෙස බැලීය.

* * * * *

හැම දෙනම කීවේ එය කරන ලද්දේ පූසා විසින් බවය. ඇත්තටම ෆ්ලෆී පූසා පොලියානාගේ කාමරයේ අගුල් නොදමා තිබූ දොරෙන් හොම්බ නොදමන්නට කිසිම සද්දයක් නැතිව දොර ඇරී, අඩවල් වී තිබෙන්නේ නැත. දොර එසේ බාගෙට ඇරුණේ නැත්නම් පොලියානාට පුංචි අම්මා කී වචන ඇසෙන්නේද නැත.

කාමරයෙන් පහත සාලාවේ දොස්තරවරුන් දෙදෙනාත්,

හෙදියත්, පොලී පුංචි අම්මාත් හිටගෙන කතාකරමින් උන්හ. ඇරුණු දොර අස්සෙන් පොලී පුංචි අම්මාගේ තියුණු, දුක්බර හඬගෑම ඇසුණේ, හරියටම ෆ්ලෆී පුරු පුරු ගාමින් පොලියානාගේ ඇඳට පනිනවාත් සමඟය.

"ඒක නං වෙන්න බෑ ඩොක්ට. ඒක නං වෙන්න බෑ. ඔයා ඔය කියන්න හදන්නේ ඒ ළමයාටආයි කවදාවත් ඇවිදින්න බැරිවෙයි කියලද?"

ඒ කලබැගෑනිය ඇති වූයේ ඊට පසුවය. නිදන කාමරයේ සිටි පොලියානා පළමුවෙන්ම "පුංචි අම්මේ...පුංචි අම්මේ" කියමින් කෑගෑවාය. ඊට පසු පොලී මෙනෙවිය කාමරයේ දොර බාගෙට ඇරී, ඈය කී වචන පොලියානාට ඇසුණු වග දැනගත් අතර සිහින් කෙඳිරිල්ලක් සමඟ, ඇගේ ජීවිතයේ පළමු වතාවට ක්ලාන්ත වී බිම ඇද වැටුණාය.

හෙදිය "එයාට ඇහුණා" යි කියමින් ඇරුණු දොර වෙතට පැන්නාය. දොස්තරවරු දෙදෙන පොලී මෙනෙවිය සමඟ නැවතුනහ. දොස්තර මීඩ්ට නවතින්නට සිදු වූයේ... ඔහු පොලී මෙනෙවිය ඇද වැටෙන්නට යන විට අල්ලා ගත් හෙයිනි. දොස්තර චොරන් අසරණව බලා සිටියේය. නැවත වරක් පොලියානා ගේ හඬගෑම ඇසී, හෙදිය දොර වසා දැමූ පසුවය, දොස්තරවරුන් දෙදෙනට පියවි සිහිය එළවාගෙන දොස්තර මීඩ් ගේ දෑතේ රැඳී උන් කාන්තාව නැවතත් සිහිගැන්වීමට ක්‍රියාත්මක විය හැකි වූයේ.

පොලියානාගේ කාමරයේදී හෙදියට දකින්නට ලැබුණේ ඉතා කලබලයට පත්වූ සුදුමැලි මුහුණක් ඇතිව සිටි දැරිය ගේ අවධානය දිනා ගැනීමට තැත් කරමින් ඇඳ අසල පුරු පුරු ගාන අලු පාට පූසි පැටවෙකි.

"අනේ මිසී කරුණාකරලා. මට පොලී පුංචි අම්මව ඕනෑ. එයාට එන්න කියන්න ඉක්මනට. අනේ කරුණාකරල..."

දොර හොඳටම වැසූ හෙදිය ඉක්මන් ගමනින් ඉදිරියට ආවාය. ඇගේ මුහුනද හොඳටම මලානික වී තිබිණි.

''එයාට... එයාට දැන්ම එන්න බෑ දරුවො. එයා තව ටිකකින් ඒවි. ඇයි මොකද? ඔයාට ඒක... මට කියන්න බැරිද?''

පොලියානා හිස දෙපසට වැනුවාය.

''මට දැනගන්න ඕනෑ එයා දැන් ටිකකට කලින් මොනවද කිව්වෙ කියලා. ඔයාට ඒක ඇහුණද? මට පුංචි අම්මා එක්ක කතා කරන්න ඕනෑ. එයා මොකක්දෝ කිව්වා. මට ඕනෑ, එයා ලව්වා ඒක ඇත්ත නෙමෙයි, කොහොමටවත් ඇත්ත නෙමෙයි කියලා අහන්න....''

හෙදිය කතාකරන්නට උත්සහ කළාය. එහෙත් වචන පිට වුණේ නැත. ඇගේ මුහුණේ ඇඳුණු යම් හැඟීමක් පොලියානාගේ දෑස් තවත් බියපත් කළේය.

''අනේ මිසී, ඔයාට එයා කියපු දේ ඇහුණද? ඒක ඇත්තද? අනේ ඒක ඇත්තද? ඒ කියන්නෙ මට ආයෙමත් ඇවිදින්න බෑ කියන එක නෙමේ නේද?''

sinhalaebooks.com

''ඔන්න ඔන්න දරුවො... ඔහොම කියන්න එපා! '' යි කී හෙදියගේ හුස්ම හිරවෙන්නට යන්නාක් මෙන් පෙනුණි. ''සමහරවිට ඒ දොස්තර හරියට දන්නෙ නැතුව ඇති. සමහර විට එයාට වැරදිලා වෙන්නත් පුළුවන්. ඔය වගේ ගොඩක් දේවල් වෙන්න පුළුවන්. තේරුණාද?

'''ඒත් පොලී පුංචි අම්මා කිව්වෙ එයා හුඟක් දේවල් දන්නවැයි කියලා! එයා කිව්වා ඒ දොස්තර අනික් හැමෝටම වඩා මගේ වගේ... මගේ වගේ කැඩිච්ච කකුල් ගැන දන්නවා කියලා!''

''ඔව් ඔව් මට තේරෙනවා දරුවෝ. ඒත් ඔය කොයි දොස්තරටත් සමහර වෙලාවට වැරදීම් වෙනවා. දැං පොඩ්ඩක්වත්... පොඩ්ඩක්වත්

ඒක ගැන හිතනන්න එපා. කරුණාකරලා ඒ ගැන හිතන්න එපා වස්තුවේ!''

පොලියානා ඇගේ දෑත් විදහා ගත්තාය.

''ඒත් මට ඒ ගැන නොහිතා ඉන්න බෑ'' යි ඇය කඳුළු සැලුවාය. ''එහෙම වෙනකොට කොයි තරං දේවල් හිතෙනවාද? ඇයි මිසී, එතකොට මං ඉස්කෝලෙ යන්නෙ කොහොමද? මිස්ට පෙන්ඩල්ටන්ව, මිසිස් ස්නෝව හරි... වෙන ඕනෑම කෙනෙක්ව හරි බලන්න යන්නෙ කොහොමද?''යි හුස්මක් අල්ලාගත් ඇය, උමතුවෙන් මෙන් මොහොතක් හඬා වැටුණාය. එක්වරම හැඬුම නවතා දෑමූ ඇය හිස ඔසවා බලන විට, දෑස්වල අලුත් භීතියක් ලියැවී තිබිණ. ''ඇයි මිසී, මට ඇවිදින්න බැරි උණොත් මීට පස්සෙ මං කිසි දෙයක් ගැන සන්තෝස වෙන්නෙ කොහොමද?''

හන්ට් මෙනෙවිය ''සෙල්ලම'' ගැන කිසිවක් නොදත්තාය. එහෙත් දුන් නම් පොලියානා මදකට හෝ නිහඬ කරවිය යුතු බව ඇය දත්තාය. ඇගේ හිතේ තිබුණු කැළඹීමත්, වේදනාවත් හැරෙන්නට ඇගේ දෑත් ද පණ නැතිව ඇත්තාක් මෙන් හැඟුණි. ඉතින් ඇය 'නිහඬ කරවන බෙහෙත්' සමඟ ඇඳ අසළ හිට ගත්තාය.

''ඔන්න, ඔන්න දරුවො, ඔය ඔක්කොම නවත්තලා මේක බීලා හිටින්නකෝ...'' යි ඇය පොලියානා අස්වැසුවාය. ''අපි හොඳට විවේක ගත්තට පස්සෙ අපට ම පෙනෙයි ඊළඟට මොනවද කරන්න ඕනෑ කියලා. ඔය හැම දේම අපට පේන තරං නරක නෑ දරුවෝ. ගොඩක් වෙලාවට එහෙමයි... හොඳද?'' කීකරු ලෙස බෙහෙත කටට දමාගත් පොලියානා, හන්ට් මෙනෙවිය අතර තිබූ වීදුරුව ගෙන වතුර බීවාය.

''මම දන්නව. තාත්තා ඉන්නකොටත් ඔය වගේ දේවල් කිව්වා...''පොලියානා වචන පැටලැවිණි.

ඇගේ දෑස කඳුලින් පිරී ගියේය. ''එයා කිව්වා හැම දෙයකම

මොකක් හරි නරක පැත්තකුත් තියෙනවා කියලා. ඒත් මට හිතෙන්නෙ, එයා කවදාවත් ඇවිදින්න බැරි වෙන එක ගැන හිතන්න නැතුව ඇති. ඒකෙ, ඊට වඩා නරක් වෙන්න පුළුවන් පැත්තකුත් තව ඉතුරු වෙලා තියෙනවාද...? ඔයාට එහෙම හිතෙනවාද?''

හන්ට් මෙනෙවිය ඊට පිළිතුරු දුන්නේ නැත. ඊට පසු කතා කළ හැකි දෙයක් වෙතැයි ඇයට ද සිතුණේ නැත.

sinhalaebooks.com
සිංහල EBOOKS
සිංහල නවකතා 1000කට අධික ප්‍රමාණයක් නොමිලේ
Ebook ආකාරයෙන් කියවන්න...
දැන්ම www.sinhalaebooks.com වෙත පිවිසෙන්න..

# 27

# හමුවීම් දෙකක්

දොස්තර මීඩ් ගේ රෝග විනිශ්චය ගැන පෙන්ඩල්ටන් මහතාට දැනුම් දෙන්නට ගියේ නැන්සිය. පෙන්ඩල්ටන් මහතාට ඒ පිළිබඳව දැනුම් දෙනවා යැයි, තමන් වූ පොරොන්දුව ගැන පොලී මෙනෙවියට අමතක වී තිබුණේ නැත. ඒ සඳහා තමන් එහි යාම ගැනවත්, ලියුමක් ලිවීම ගැනවත් ඇයට සිතිය හැකි වූයේ නැත. ඉතින් ඇය ඒ කාරිය ඉටු කිරීම පිණිස නැන්සි ව පිටත් කළාය.

වෙනදා නම් මේ අබිරහස් නිවෙසත් එහි හිමිකරුවාත් දැක ගැනීමට ලැබෙන මෙවැනි අනර්ඝ අවස්ථාවක දී නැන්සි ප්‍රීතියෙන් උදම් වනු නිසැකය. එහෙත් අද නම් ඇගේ හදවත දුකින් පිරී තිබුණු බැවින් ප්‍රීතියක් ගැන සිතීමටවත් බැරි විය. ඇත්තටම කියනවා නම්, පෙන්ඩල්ටන් බංගලාවට පැමිණ, පෙන්ඩල්ටන් මහතා එනතුරු බලා සිටින අතරේ ඇය වට පිට බැලුවේත් නැති තරම්ය.

''මම නැන්සි... සර්...'' යි ඇය ආලින්දයට පැමිණ පුදුමයෙන් ඇය දෙස බැලූ පෙන්ඩල්ටන් මහතා ගෞරවයෙන් ඇමතුවාය.

''හැරින්ටන් නෝනා මාව එව්වෙ මිස් පොලියානා ගැන විස්තරයක් ඔබතුමාට දන්වන්න...''

''හොඳයි?''

හැම හැඟීමක් ම එකට කැටි වූ ඒ කෙටි වදන තුළ කොයි තරම් වික්ෂිප්ත බවක් ගැබ් වූවාදැයි නැන්සි හොඳටම තේරුම් ගත්තාය.

''එයාට හොඳ නෑ, මිස්ට පෙන්ඩල්ටන්...'' යි කී ඇගේ හුස්ම හිර වෙන්නට යන්නාක් මෙන් පෙනුණි.

''ඔයා අදහස් කරන්නෙ නෑ නේද...'' යි නැවතුණු ඔහු ඉතා දුක්බර ලෙස ඇගේ හිස නැමෙනු දුටුවේය.

''ඔව් සර්, දොස්තර කියනවා. එයාට ආයෙමත්, කවදාකවත් ඇවිදින්න බැරි වෙයිලු...''

sinhalaebooks.com

මොහොතක් ගතවන තුරු කාමරයේ දැඩි නිහඬතාවයක් රජ කළේය. ඊළඟට කතා කරන්නට පටන් ගත් පෙන්ඩල්ටන් මහතාගේ කටහඬ වෙව්ලන්නට පත් ගත්තේය.

''අනේ අසරණ දරුවා...අනේ අසරණ දරුවා....''

නැන්සි ඔහු දෙස බලා සිට, එක්වරම දෙනෙත බිමට හරවා ගත්තාය. ජෝන් පෙන්ඩල්ටන් නම් වූ නපුරු, තද හිතැති මිනිසාගෙන් එවැනි ප්‍රතිචාරයක් නැන්සි බලාපොරොත්තු වූයේ නැත. මොහොතක් ගතවූ පසුව ඔහු යළිත් කතා කළේය. තවමත් ඔහුගේ හඬ පහත්, වෙව්ලන සුළු ස්වරයක් ගත්තේය.

''ලෝකෙ මේ තරං නපුරුද - මගේ පුංචි ප්‍රිස්මෙට, ආයෙ

කවදාවත් ඉර එළියෙ නටන්න ඉඩ දෙන්නෙ නැති තරං...!''

ඊට පසු නැවතත් නිහඬතාවයකි. ඉන් අනතුරුව, පෙන්ඩල්ටන් මහතා එකවරම මෙසේ ඇසුවේය.

''එයා තවම මේක ගැන දන්නෙ නැතුව ඇති නේද? එහෙමද?''

''එයා දන්නවා.... සර්...'' යි නැන්සි කඳුලු සැලුවාය. ''ඒක තමයි ලොකුම ප්‍රශ්නෙ වුණේ. එයා ඒක දැනගත්තා.... අම්මපා අර බළලාට හෙන වැදෙන්න ඕන...! මට සමාවෙන්න සර්...'' යි නැන්සි හනික සමාව ගත්තාය. ''ඔය බළලා දොර අස්සෙන් හොම්බ දාලා දොර ඇරලා තිබ්බ්ච නිසයි, ඒගොල්ලො ඒක කතා වෙනවා එයාට ඇහුණෙ....''

''අනේ අසරණ ළමයා!'' යි පෙන්ඩල්ටන් මහතා නැවත සුසුමක් හෙලුවේය.

''ඔව් සර්... දැන් ඒ ළමයාව දැක්කොත් එහෙම තමා හිතෙන්නෙ...'' යි කී නැන්සි ගේ හුස්ම නැවත වතාවක් හිර වෙන්නට ගියේය. ''ඕක දැන ගත්තාට පස්සෙ මම ඒ ළමයව දෙපාරකට වැඩියෙන් දැක්කෙ නෑ. ඒත් ඒ දෙපාරම මට හිත වාවන්නෙ නැතුව ගියා. එයාට මේ හැම දෙයක්ම පුරුදු දේවල් නෙමේ. එයා දැං හැම තිස්සෙම හිතන්නෙ, එයාට ඉදිරියෙදි කරන්න බැරිවෙන දේවල්. ඒක ගැන එයාට දුකයි... වැඩියෙන්ම එයාට සතුටු වෙන්න බැරි වෙන නිසා. මං හිතන්නෙ ඔයා දන්න නැතුව ඇති එයාගෙ ''සෙල්ලම ගැන...'' යි සමාව අයදින ස්වරයකින් නැන්සි නැවතුණාය.

''ඔය කියන්නෙ අර 'සතුටු වෙන සෙල්ලම' වෙන්නැති'' යි පෙන්ඩල්ටන් මහතා කීවේය. ''එයා ඒ ගැන මට කියලා තියෙනවා නෙ...''

''අනේ ඇත්තද? දැන් බලාගෙන යනකොට එයා හැමෝටම වගේ ඒක ගැන කියලා. ඒත් ඔයාට පේනවා නෙ. දැන් එයාට..

එයාට... ඒක කරන්න බැනෙ. ඒක තමා එයාට තියෙන ලොකුම දුක. එයා කියනවා ඇවිදින්න බැරි වෙන එක ගැන නම්.. සතුටු වෙන්න පුළුවන් එක දෙයක්.. එකම එක දෙයක් වත් හිතා ගන්න බැරිලු.''

''එයා එහෙම හිතන්නෙ මොනවාටද?'' යි කෝපයට පත් හඬකින් පෙන්ඩල්ටන් මහතා ඇසුවේය.

නැන්සි නොසන්සුන් හැඟීමකින් මදක් පසෙකට වූවාය.

''ඒ විදියට හිතන්න පටන් ගත්ත දවසෙ ඉඳලා... මටත් එහෙම හිතෙනවා සර්. එයාට ඒ වගේ දෙයක් මතක් කරගන්න පුළුවන් උණොත් හිතට සහනයක් ලැබෙයි. ඉතිං මමත්, එහෙම දෙයක් මතක් කරලා දෙන්න උත්සාහ කළා...''

''මතක් කරලා දෙන්න? මොනවද?'' ජෝන් පෙන්ඩල්ටන් ගේ ස්වයර තවමත් කෝපාන්විත, නොඉවසිලිමත් එකක් වූයේය.

sinhalaebooks.com

''එයා ඒ සෙල්ලම ගැන අනිත් අයට... ස්නෝ නෝනටයි, අනිත් අයටයි... කියලා දුන්න හැටි ගැන. ඒගොල්ලන්ට කරන්න කියලා එයා කියපු දේවල් ගැන. ඒත් ඒ අසරණ ළමයා අඬනවා විතරමයි. එයාගෙ තත්වෙ ඊට වඩා වෙනස්ලු. ජීවිත කාලෙටම නැති වෙච්ච දේවල් ගැන සතුටු වෙන්න කියලා කියන එක ලේසියි ලු. ඒත් තමන් ම ඒ තත්වෙට පත් උණාම, එහෙම හිතන්න අමාරුයිලු. එයා කියනවා, එයා හැම තිස්සෙම හිතන්න හදනවාලු, අනිත් අයට මේ වගේ දෙයක් නොවෙච්චි එක ගැන එයා සතුටු වෙනවා කියලා. ඒත් ඒ හැම තිස්සෙම, තමන්ට ආයෙ කවදාවත් ඇවිදින්න බැරි වෙන එක ගැන විතරමලු එයාට හිතෙන්නෙ...''

නැන්සි නැවතුණාය. එහෙත් පෙන්ඩල්ටන් මහතා කතා කළේ නැත. ඔහු දෑතින් දෑස වසා ගෙන හිඳගෙන සිටියේය.

''ඉතිං මං ඊළඟට... ඒ සෙල්ලම කරන්න අමාරු වෙන තරමට

ඒකෙ විනෝදෙත් වැඩී කියලා. එයා කියපු දේවල් ගැන මතක් කරන්න හැදුවා.'' නැවතත් කතාව පටන් ගත් නැන්සි දුබල හඬින් කීවාය. ''ඒත් එයා කියනවා, ඒක හොඳටම අමාරු උණාමත් එහෙම හිතන්න බැරිලු. මම දැන් යන්නං සර්.'' යි කී ඇය හනික ආපසු හැරුණාය.

දොර අසළ දී පැකිලෙමින් ආපසු හැරුණු ඇය, බයාදු ස්වරයකින් මෙසේ ඇසුවාය:

''මං හිතන්නෙ මට එයාට කියන්න බැරිවෙයි නේද ඔබතුමා ජිම් බීන්ව බලන්න ගියා කියලා...''

''ඔයාට එහෙම කියන්න බෑනෙ.. මම ජිමී බීන්ව දකින්නෙවත් නැතුව...'' කී පෙන්ඩල්ටන් මහතා ටික වේලාවකට පසුව ''ඇයි?'' යි ඇසුවේය.

''මුකුත් නෑ සර්.. මේ.. කිව්වම මොකෝ, ඔය ගැනත් එයා හිතනවා හරියට. ඒ ළමයව ඔබතුමා ළඟට එක්කර ගෙන එන්න බැරිවෙච්චි එක ගැන එයාට දුකයි. එයා එක දවසක් ඒ ළමයාට මෙහෙ එන්න කතා කරාලු. ඒත් එදා ඒ ළමය මෙහෙ එන්න ඒ තරං කැමති බවක් පෙන්නලා නෑ. ඉතිං පොලියානා මිස් බය වුණාලු එදා ඒ ළමයා මෙහෙ ඇවිත් නරක විදියට හැසිරුණොත් ඔබතුමා ජිමී හොඳ 'ළමයෙක් ලැබීමක්' කියලා හිතන්නෙ නැති වෙයි කියලා. ඒකෙ තේරුම මොකද්ද කියලා ඔබතුමා දන්නවා ඇති මගෙ හිතේ.. ඒත් මම නං දන්නෙ නැහැ සර්..''

''ඔව් මට තේරුණා... එයා අදහස් කරපු දේ...''

''එහෙනං හොඳයි සර්. එයාට දැන් ඕනෑ වෙලා තියෙන්නෙ ආයෙමත් ඒ ළමයාව මෙහාට එක්කරගෙන ඇවිත් ඒ කොයි තරං හොඳ ළමයෙක්ද කියල ඔබතුමාට පෙන්නන්න. ඒත් දැං එයාට ඒක කරන්න බෑනෙ. අනේ අම්මපා... අර කාර් කට්ටට හෙන හතම වදින්න ඕනෑ. මට සමාවෙන්න සර්. ආයුබෝවන්!'' යි කී නැන්සි

හනිකට එතැනින් ඉවත්ව ගෙදර යන්නට පිටත් වූවාය.

නිව්යෝර්ක් නුවරින් පැමිණි ප්‍රසිද්ධ දොස්තර මහතෙකු, පොලියානා විටියර් පරීක්ෂා කොට, ඇයට නැවත කිසිදාක ඇවිදින්නට බැරි වේ යැයි කී ආරංචිය, වැඩි කල් නොගොස්ම බෙල්ඩින්ග්ස්විල් නගරය පුරාම පැතිර ගියේය. ඒ ආරංචියත් සමගම මුළු නගරයම, කිසිදා නොවූ විරූ ආකාරයට මහත් කැළඹීමකට පත් විය. මේ කාලය වන විට, නගරයේ විසූ හැම දෙනම මුහුණේ දුඹුරු පාට ලප ඇති, නිතරම, කාටත් සිනහවකින් සංග්‍රහ කරන ළමයා, පොලියානා විටියර් බව හැඳිනුවෝය. එපමණක් නොව ඇගේ 'සෙල්ලම' ගැනත් හැම දෙනාම දැන සිටියහ. වෙනදා මග තොටදී හමුවූ ඒ සිනහමුසු මුහුණ යළි දකින්නට නොලැබෙන බව.. එදිනෙදා දින චරියාවේ ඕනෑම දෙයක් ගැන සතුටු වෙන්න යැයි කියන, ප්‍රීතිමත් කටහඬ යළිත් නොඇසෙන බව... කිසිවෙකුට අදහා ගන්නට බැරි විය. ඇත්තටම එය නම් කිසිදා විශ්වාස කළ නොහැකි, කිසිදා සිදුවිය නොහැකි.. මහා නපුරු දෙයක් බව කාටත් හැඟුණි.

මුළුතැන් ගෙවල්වලත්, විසිත්ත කාමරවලත්, වැටවල් අයිනේත් රැස්වූ ගැහැනු ඒ පිළිබඳව කඳුලු සළමින් කතා කළෝය. වීදි කෙළවරත්, කඩපිල් ගානේත් රැස්වූ පිරිමි... දුක කඳුලුවලින් පිට නොකොට.. ඒ ගැන කතා කළෝය. මුණ ගැහෙන කවරෙකු හෝ සමඟ, පොලියානා දැන් ඒ සෙල්ලම නොකරන බවත්, ඇයට කිසිදාක නැවත කිසිම දෙයක් ගැන සතුටු විය නොහැකි බවත් කියන නැන්සි ගේ දුක්බර කතාව ඇසූ හැම දෙනාගේම දුක තවත් වැඩිවූවා මිස අඩු වූයේ නම් නැත.

පොලියානා ගේ මිතුරන්ට ද දැනුණේ එහෙමය. ඉතින් හැරින්ටන් බංගලාවේ ස්වාමි දුවටද, පොලියානා වෙනුවෙන් ගලා ආ පණිවුඩ සියල්ලටම උත්තර දෙන්නට සිදුවූයේ, ඇයම පුදුමයට පත් කරවමිනි. ඇය දන්නා හඳුනන මිනිසුන් ගෙන්ද, ඇය නාඳුනන මිනිසුන් ගෙන්ද, ගැහැනුන් ගෙන්ද, පිරිමින් ගෙන්ද, ළමයින් ගෙන්ද, පොලියානා හඳුනනවා යැයි පොලී මෙතෙක් කිසිදාක නොසිතූ පුද්ගලයන් ගෙන්ද එක විට පණිවුඩ ගලා ආවේය.

සමහරු පැමිණ ඔහේ හිඳගෙන මිනිත්තු පහක් හෝ දහයක් රැඳී සිටියහ. සමහරු ගෙනා තොප්පි හෝ අත්බෑග අල්ලාගෙන, බරාඳයේ පිය ගැට පෙළ මත රැඳී සිටියහ. සමහරු අවංකවම කඳුලු සැලූහ. සමහරු ඉතා නොසන්සුන්ව, සුසුම් හෙලූහ. එහෙත් හැම දෙනම ඇයට කුමක් හෝ හිත හැදෙන පණිවුඩයක් රැගෙන ආහ. පසු කාලයකදී පොලී මෙනෙවියගේ හැසිරීම් වෙනස් කරවන්නට පවා සමත් වූයේ ඒ පණිවුඩයි.

පළමුවෙන්ම ආවේ ජෝන් පෙන්ඩල්ටන් මහතාය. ඔහු එදින ආවේ කිහිලිකරුවලිනි.

''ඔයාට මං කියන්න ඕන නැනෙ, මම මේක අහලා කොච්චර කම්පා උණාද කියලා.'' යි ඔහු එක වරම කතාවට බැස්සේය. ''ඒත්... මේකට කරන්න පුලුවන් කිසිම දෙයක් නැද්ද?''

පොලී මෙනෙවිය බලාපෙරොත්තු විරහිත බැල්මකින් සිටියාය.

''ඇත්තටම අපි නිකං ඉන්නෙ නෑ. මෙච්චර කල් අපි කරන්න පුළුවං හැම දේම කරමිනුයි ඉන්නෙ. ඩොක්ට මීඩ් මේකට කරන්න බේත් වගයක් නියම කරලා තියෙනවා. සමහර විට ඒවාට හරි යයි. බෙහෙත් ටික ඩොක්ට චොරන් අරන් එයි ඇත්තටම. ඒත් ඩොක්ට මීඩ් නං කියන්නෙ... අපිට බලාපොරොත්තු තියා ගන්න බැරි වෙයි කියලමයි..''

ජෝන් පෙන්ඩල්ටන් පුටුවේ හිඳගත් සැනින්ම වාගේ යලිත් නැගිට්ටේය. ඔහුගේ මූහුන සුදුමැලි වී, දෙතොල් එකිනෙක තදවී තිබුණි. පොලී මෙනෙවිය, ඔහු දෙස බලා තේරුම් ගත්තේ, තවදුරටත් ඔහුට තමන් ඉදිරියේ සිටින්නට නොහැකි බවය. දොර අසළට ගිය ඔහු ආපිට හැරුණේය.

''මට පණිවුඩයක් තියෙනවා පොලියානාට කියන්න...'' ඔහු කීවේය. ''කරුණාකරලා එයාට කියනවාද, මම ජිමී බීන් හම්බ වෙන්න ගියා කියලා. අනික මම ඒ ළමයාව හදා ගන්න යනවා කියලාත්

කියන්න. මේක අහලා එයා සතුටු වෙයි කියලා, මම හිතන බවත් එයාට කියන්න.''

මොහොතකට, පොලී මෙනෙවියට ඇගේ ආත්ම සංයමය නැති වී ගියේය. ''ඔයා ජිමී බීන්ව හදා ගන්න යනවා!'' යි ඇය විස්මයෙන් කට ඇර ගත්තාය.

පෙන්ඩල්ටන් මහතා මදක් නිකට එසවූයේය.

''ඔව්. මම හිතනවා පොලියානා මේක තේරුං ගනී කියලා. ඔයා එයාට කියන්න මම හදන්නේ ඒකෙන් එයාව සතුටු කරවන්න කියලා...''

''ඇයි එහෙම නොවෙන්නෙ... ඔව් ඇත්තටම කියන්නං....'' යි පොලී මෙනෙවිය ගොත ගැසුවාය.

''ස්තුතියි'' හිස නැමූ ජෝන් පෙන්ඩල්ටන් මහතා යන්නට ගියේය.

sinhalaebooks.com

ගෙයි මැද සිටගත් පොලී මෙනෙවිය, පිටුපා යන පෙන්ඩල්ටන් මහතා දෙස බලා ගත් වනම සිටියාය. ඇය සිටියේ පුදුමයෙන් ගල් ගැසිලාය! ඇයට දූන් ඇසූ දේ ගැන හිතා ගන්නටත් බැරිය. ජෝන් පෙන්ඩල්ටන්, අර තරම් වංශවත්, කිසිවෙකුට හිස නොනමන, රළු, මසුරෙක් යැයි ප්‍රසිද්ධ, ඉතා ආත්මාර්ථකාමියෙකු යැයි ප්‍රසිද්ධ, ජෝන් පෙන්ඩල්ටන්, කුඩා පිරිමි ළමයෙකු... ඒ තරම් පුංචි ළමයෙකු හදා ගන්නට යනවා?

පුදුමයෙන් ගල් ගැසුණු මූහුණක් සහිත පොලී මෙනෙවිය උඩ තට්ටුවට නැග පොලියානා ගේ කාමරයට ඇතුළු වූවාය.

''පොලියානා, මිස්ට පෙන්ඩල්ටන් ගෙන් පණිවිඩයක් තියෙනවා. එයා කිව්වා, එයා ජිමී බීන්ව හදා ගන්න යනවා කියලා. එයා හිතනවාලු, ඒක ඇහුවම ඔයා සතුටු වෙයි කියලා....''

"සතුටු... සතුටු....! අනේ අහන්නත් දෙයක්ද, මං කොයි තරං සතුටුද ඒකට! අනේ පුංචි අම්මේ.. මට කොයි තරං ඕන වෙලා තිබුණද, ජිමී ට ඉන්න තැනක් හොයලා දෙන්න... එයාට දූං හම්බ වෙන්න යන තැන කොයි තරං හොඳද... අතික මිස්ට පෙන්ඩල්ටන් ගැනත් මට හරි සතුටුයි. එයාට දැන් "ළමයෙක් ලැබීම" කියන එක හරි ගියානෙ.."

"මොකක්....?"

පොලියානා දුක්බර ලෙස රත් පැහැ වූවාය. තමන් හදා වඩා ගැනීමට, පෙන්ඩල්ටන් මහතා ගේ හිතේ තිබූ කැමැත්ත ගැන, පොලී පුංචි අම්මා සමඟ තමන් කිසි දවසක කතා කර නැති බව, පොලියානාට මතක් වූයේ දැන් ය. ඉතින් ඇත්තටම කියනවා නම් දැන් පවා ඒ ගැන ඇයට කීමට.. එක මොහොතකට වත් ඇය.. ඇගේ ආදරණීය පුංචි අම්මා හැර දමා යාමට සිතූ බව කීමට කොහොමටවත් කැමති නොවූවාය.

"ළමයෙක් ලැබීම..." යි පොලියානා ගොත ගසන්නට වූවාය. "ඔයා දන්නවද.. මිස්ට පෙන්ඩල්ටන් දවසක්දා මට කිව්වා බංගලාවක් ගෙදරක් වෙන්නෙ ගෑනු කෙනෙක්ගෙ අතයි හදවතයි ලැබුණොත් හරි ළමයෙක් ලැබුණොත් හරි කියලා. ඉතිං දැන් එයාට ඒක... "ළමයෙක් ලැබීම" කියන එක හරි ගියානෙ..."

"ආ! මට තේරුණා..." යි ඉතා ශාන්තව කී පොලී මෙනෙවියට පොලියානා තේරුම් ගත්තාටත් වැඩි යමක් තේරුම් ගැනීමට හැකි විය. පෙන්ඩල්ටන් මහතා ඒ පාළු බංගලාව ගෙදරක් කිරීමට, පොලියානා ගෙන් 'ළමයෙක් ලැබීමේ ' කාරිය ඉටු කරවා ගන්නට උත්සාහ කළ විට පොලියානා කොයි තරම් ලොකු පීඩනයකට ලක්වී සිටින්නට ඇති දැයි දැන් ඇයට සිතා ගන්නට පුළුවන. "මට තේරුණා..." යි කියමින් කතාව හමාර කළ ඇය ගේ දෑස හදිසියේ මතුවූ කඳුලුවලින් බරවී තිබිණ.

පොලියානා, ඇගේ පුංචි අම්මා තව තවත් හරස් ප්‍රශ්න අසතැයි

බිය වූවා. පෙන්ඩල්ටන් මහතා ගෙන් වෙන අතකට කතාව හරවන්නට සිතුවාය. ''ඩෝකට කිල්ටනුත් එහෙම කිව්වා... දන්නවද? ගෑනු කෙනෙක්ගෙ අතයි හදවතයි හරි ළමයෙක් හරි ලැබෙන්න හරි ඕනෑ ගෙදරක් වෙන්න නම් කියලා...'' යි ඇය කීවාය.

පොලී මෙනෙවිය හනික හැරී බැලුවාය.

''ඩොක්ට කිල්ටන්!.... ඔයා කොහොමද දන්නෙ ඒක...?''

''එයා මට එහෙම කිව්වා. එයා එහෙම කිව්වෙ, එයා ජීවත් වෙන්නෙ ගෙදරක නෙමෙයි, කාමරවල කියලා කියන කොට. එයාටත් තියෙන්නෙ ගෙදරක් නෙමේ...''

පොලී මෙනෙවිය ඊට පිළිතුරු දුන්නේ නැත. ඇය ජනේලයෙන් පිටත බලා සිටියාය.

''ඉතිං මම එයාගෙන් ඇහුවා.. ඇයි එයා නෝනා කෙනෙකුගේ අතයි හදවතයි අරගෙන 'ගෙදරක්' හදා ගන්නෙ නැත්තෙ කියලා...''

sinhalabooks.com

''පොලියානා!'' පොලී මෙනෙවිය ආපසු හැරී තියුණු බැල්මක් හෙළුවාය. ඇගේ කම්මුල් හදිසියේම රත් පැහැ වී තිබිණි.

''මම එහෙම ඇහුවා. එතකොට එයා ගොඩාක් දුකෙන් ඉන්නව වගෙයි පෙනුණෙ...''

''එයා මොනවද කිව්වෙ?'' පොලී මෙනෙවිය ඒ ප්‍රශ්නය ඇසුවේ, එවැනි දෙයක් නොඅසන ලෙස ඇගේ හිතෙන්ම එල්ල වූ පීඩනය නොසළකා හරිමිනි.

''මිනිත්තුවක් විතර යන කං එයා කිසි දෙයක් කිව්වෙ නෑ. ඊට පස්සෙ හෙමිහිට එයා කිව්වා, ඒව ඉල්ලන තරමට ලැබෙන්නෙ නෑ කියලා...''

ඊළඟට කෙටි නිහඬතාවයකි. පොලී මෙනෙවිය ගේ දෑස් නැවතත් ජනේලයෙන් පිටතට යොමු වී තිබිණ. ඇගේ දෙකම්මුල් කවදාවත් නැති ආකාරයට රෝස පැහැ වෙලාය!

පොලියානා සුසුමක් හෙලුවාය.

"එයාට දං කවුරු හරි ඕනෑ. මං දන්නවා. අනේ මම නං හිතන්නෙම එයාට හොඳ කෙනෙක් ලැබෙන්න ඕනෑ කියලා..."

"ඔයා කොහොමද ඒක දන්නෙ.. පොලියානා...."

"ඒ මොකද, ඊට පස්සෙ එක දවසක එයා මෙහෙම දේකුත් කිව්වා. එදත් එයා ඒක කිව්වෙ හරිම හෙමින්. ඒත් මට ඒක ඇහුණා. එයා කිව්වා, එක ගෑනු කෙනෙක් ගේ අතයි, හදවතයි එයාට ලැබෙනවා නං, මුලු ලෝකෙම උණත් අතාරින්න ලෑස්තිය කියලා. ඇයි පුංචි අම්මෙ? මොකද?"

පොලී පුංචි අම්මා හනික එතැනින් නැගිට ජනේලය අසළට ගොස් තිබුණාය.

"මුකුත් නෑ වස්තුවේ. මම මේ ප්‍රිස්ම කෑල්ල ටිකක් එහාට මෙහාට කරනවා..." යි පොලී පුංචි අම්මා කීවද දෑන් නම් ඇගේ මුහුණ හොඳටම රත් පැහැ ගැන්වී තිබිණි.

# 28

# සෙල්ලම සහ එහි ක්‍රීඩකයෝ

දෙවැනි වරට ජෝන් පෙන්ඩල්ටන් මහතා හැරින්ටන් බංගලාවට ඇවිත් ගියායින් පසුව එහි ආවේ මිලී ස්නෝ ය. ඇය කෙදිනකවත් හැරින්ටන් බංගලාවට ඇවිත් තිබුණේ නැත. හැන්දෑ වරුවක එහි පැමිණි ඇය, පොලී මෙනෙවිය සාලාවට ඇතුලු වන විට ලජ්ජාවෙන් රතු වී, බෙහෙවින් කලබලයට පත්ව සිටියාය.

sinhalaebooks.com

''මං ආවෙ.. අර පුංචි ගෑනු ළමයා ගෙ තොරතුරු අහන්න...'' යි ඇය ගොත ගැසුවාය.

''කොයි තරං හොඳද ආව එක. ඒත් එයාට තාමත් එහෙමමයි. ඔයාගෙ අම්මට කොහොමද?'' යි පොලී මෙනෙවිය තෙහෙට්ටුවට පත් හඬකින් කීවාය.

''ඒක තමයි මං මේ කියන්න ආවෙ... ඔයාට පුළුවන්ද මිස්

පොලියානාට කියන්න...'' යි හනික කී මිලී, හුස්ම නාල්ලාම, එකකට එකක් නොගැලපෙන දේවල් රාශියක්ම කියාගෙන යන්නට වූවාය.

''අපිට හිතෙන්නෙ නං ඒක හරිම... භයානක දෙයක්. හොඳටම භයානක දෙයක්, මේ පුංචි දරුවාට ආයෙමත් ඇවිදින්න ලැබෙන්නෙ නෑ කියන එක. එයා අපට, අපේ අම්මට... ගොඩක් උදව් කළා. ඔයා දන්නවා ඇතිනෙ, අර සෙල්ලම කරන්න උගන්නලා. ඉතිං අපට දැන ගන්න ලැබුණා එයාට ආයෙමත් ඒ සෙල්ලම කරන්න ලැබෙන්නෙ නෑ කියලා.. අනේ අසරණ ළමයා! ඇත්තටම එයාට ඒක කරන්න පුළුවන් විදියක්.. ඔය තත්වෙ ඉන්දැද්දි.. මට නං පේන්නෙ නෑ. ඒත් අපිට එයා කියපු දේවල් මතක් උණාම, අපි හිතුවා එයා අපට කරපු උදව් ගැන එයා දන්නවා නං, එයාට ඒක කොයි තරං උදව්වක් වෙයිද කියලා. ඒ කියන්නෙ අර සෙල්ලම කරන්න. එතකොට එයාට සතුටු වෙන්න පුළුවන් නෙ.... මං අහන්නෙ පොඩ්ඩක් හරි සතුටු වෙන්න....'' යි කී මිලී අසරණ ලෙස නැවතුණාය. ඇය, පොලී මෙනෙවිය කතා කරන තුරු බලා සිටින බව පෙනුණි.

පොලී මෙනෙවිය හිඳගෙන, ආචාරශීලී ලෙස කී හැම දේම අසා සිටියත්, අගේ දෑසේ ලියැවී තිබුණේ මහා ප්‍රහේළිකාවකි. ඒ කී දේවල්වලින් ඇයට තේරුණේ බාගයක් පමණි. ඇය මේ වන විට සිතමින් සිටියේ මිලී ස්නෝ තරමක් අමුතු බව තමන් දැන සිටියත් ඇයට මේ තරම් පිස්සු බව තමන් නොදත්තේ ඇයිද කියායි. එසේ නොසිතා, වෙන කිසිම විදියකින් මේ තරම් එකකට එකක් නොගැලපෙන, යාං හැල්ලක් ඇය කීවේ ඇයි ද කියා සිතා ගන්නට බැරිය. නිහඬතාවය එළඹුණු පසු ඇය ශාන්ත ලෙස මෙසේ කීවාය:

''මං හිතන්නෙ නෑ ඔයා කියපු දේවල් මට තේරුනා කියල මිලී. ඇත්තටම, ඔයාට මොනවද කියන්න ඕනෑ, පොලියානට?''

''ඔව්. ඒක තමයි. මට ඕනෑ එයාට කියන්න'' යි මිලී ඉතා කලබලයෙන් පිළිතුරු දුන්නාය. ''එයා අපට කරපු දේවල් ගැන මතක් කරන්න. ඇත්තටම එයා සමහර දේවල් ගැන දන්නවා. අපේ ගෙදරට ආව ගිය නිසා. එයා දන්නවා අපේ අම්මා වෙනස් වෙන්න

පටන් ගත්තේ කොහොමද කියලා. ඒත් මට කියන්න ඕනෑ අම්මා විතරක් නෙමෙයි මම උණත් දැන් කොයි තරං වෙනස් වෙලාද කියලා. මමත් වෙනස් වුණා. දැන් මං ටික ටික.. ඒ සෙල්ලම... කරන්න පුරුදු වෙනවා...''

පොලී මෙනෙවිය රවා ගත්තාය. ඇය මිලී ස්නෝගෙන් මේ 'සෙල්ලමේ කතාන්දරය' කුමක්දැයි අසන්නට ගියත් ඊට ඉඩ ලැබුණේ නැත. මිලී නැවතත් කලබලයෙන් කතා කරගෙන යන්නට වූවාය.

''ඔයා දන්නවානෙ.. අම්මට කලින් කිසිම දෙයක හොඳක් පෙනුණෙ නෑ. එයාට හැම වෙලේම තියෙන දේට වඩා වෙනස් දෙයක් ඕන වුණා. ඒත් ඇත්තටම එයා හිටපු තත්වෙ හැටියට... ඒ ගැන එයාට දොස් කියන්නත් බෑ. ඒත් දැන් එයා මට ජනෙල් අරින්න දෙනවා. ගොඩක් දේවල් ගැන උනන්දු වෙනවා. එයාගෙ පෙනුම ගැන... එයාගෙ නිදන ඇඳුම ගැන පවා. එයා දැං පොඩි පොඩි දේවල් ගොතන්නත් පටන් අරන්. එයා පොළටයි, ඉස්පිරිතාලෙටයි ගෙනියන්න රේන්දයි, පුංචි ඇයන්ගෙ බ්ලැන්කට්ටුයි ගොතනවා. ඉතින් ඒ දේවල් කරන්න පුළුවන් කියලා හිතලා එයා හරියට සතුටු වෙනවා.

sinhalaebooks.com

මේ ඔක්කොම මිස් පොලියානාගේ වැඩ.. එයා අපේ අම්මට කියලා තිබුණා, අත් දෙකේ හයිය තියෙන එක ගැන සතුටු වෙන්න කියලා. ඉතිං අම්මා කල්පනා කළා, එයා ඒකෙන් වැඩක් ගන්නෙ නැත්තෙ ඇයි කියලා. එයා ගොතන්නට පටන් ගත්තෙ ඊට පස්සෙ. ඔයාට හිතා ගන්නවත් බැරිවෙයි දැන් අම්මගේ කාමරේ කොයි තරං වෙනස් ද කියලා. රතුපාට, නිල්පාට, කහපාට ලොම් රෙදිවලිනුයි, මිස් පොලියානා දුන්න ප්‍රිස්ම එල්ලපු ජනේලයි... ඇත්තටම දැන් නං කාට වුණත් යන්න ආසා හිතෙන කාමරයක්. ඔයිට කලින් නම් ඒක ඇතුලට යන්නත් බය හිතෙනවා. ඒක අඳුරු, මූසල කාමරයක් වෙලයි තිබුණෙ. අම්මත් හිටියෙ හරිම කණගාටුවෙන්...''

''ඉතිං, අපිට කියන්න ඕනෑ, ඒ දේවල් එහෙම වුණේ මිස් පොලියානා ගේ උදව්වෙන් කියලා, ඉතිං කරුණාකරලා එයාට කියන්න පුළුවන්ද, එයා වගේ කෙනෙක් අඳුනාගන්න ලැබිච්ච එක

ගැන අපි සතුටු වෙනවා කියලා. එයා මේ බව දැන ගත්තොත්, චුට්ටක් හරි සතුටු වෙයි නෙ. ඉතිං එච්චරයි....'' මිලී සුසුමක් හෙලා, හනික සිට ගත්තාය.

''ඔයා එයාට කියනවා නේද?''

''මොකද නැත්තෙ. මං කියන්නං...'' යි මුනු මුනු ගෑ පොලී මෙනෙවිය සිත සිතා හිටියේ ඒ හැල්ලෙන් කොයි තරම් ප්‍රමාණයක් පොලියානට කීම සඳහා මතක තබා ගත හැකිද යන්නයි.

ජෝන් පෙන්ඩල්ටන් මහතා ගේ සහ මිලී ස්නෝ ගේ පැමිණීම ආරම්භයක් පමණි. ඊට පසු හැමවිටම වාගේ ඒ ආකාරයේ පණිවුඩ ගලා ආවේය. ඒ හැම පණිවුඩයක් ම පොලී මෙනෙවියට අමුතු වූ අතර ඇය වඩ වඩා ප්‍රහේලිකාවකට මැදි වූවාය.

එක් දවසක් එහි ආවේ වැන්දඹුවක වූ බෙන්ටන්ය. පොලී මෙනෙවිය ඇයව හොඳින් දන්නා මුත් දැනඇඳුනුම්කමක් ඇති කරගෙන තිබුණේ නැත. ඇය දැන සිටියේ බෙන්ටන් යනු නිතරම කලු ඇඳුමෙන් සිටින, නගරයේ සිටි හැම දෙනාටම වඩා දුකෙන් ජීවත් වූ තැනැත්තියක් ලෙසය. කොහොම නමුත් අද නම් ඇය ගෙල අසළ ලා නිල්පාට පීත්ත පටියක් බැඳ ගෙන සිටියාය. ඇගේ දෑසේ කඳුළු පිරී තිබුණි. අනතුරෙහි භයානක කම ගැනත්, එයින් සිදු වූ දේ ගැන ඇයට ඇති වී තිබෙන කණගාටුව ගැනත් කතා කරන්නට වූ ඇය පොලියානා මුන ගැසිය හැකිදැයි විමසූවාය.

පොලී මෙනෙවිය හිස දෙපසට වැනුවාය.

''මට කණගාටුයි. තාම එයා කාවවත් මුන ගැහෙන්නෙ නෑ. තව ටික දවසකින් පුළුවන් වෙයි... සමහර විට...''

බෙන්ටන් මහත්මිය කඳුළු පිසදාගෙන, නැගිට යන්නට හැරුණාය. සාලයේ දොර අසළට ගිය විට, ආපසු හැරුණු ඇය හනික ආපසු ආවාය.

"මිස් හැරින්ටන්, ඔයාට පුළුවන් නේද එයාට මේ පණිවිඩේ කියන්න..." ඇය ගොත ගැසුවාය.

"ඇත්තටම ඔව් මිසිස් බෙන්ටන්. මං සතුටුයි එහෙම කරන්න..."

තවමත් බෙන්ටන් මහත්මිය පැකිලෙන බව පෙනුණි. ඊට පසු ඇය කතා කළාය.

"කරුණාකරලා... එයාට කියනවාද, මම මෙහෙම එකක් අඳිනවා කියලා..." යි කී ඇය, ගෙල අසල රැඳී තිබුණු පීත්ත පටිය දෙසට අත යැව්වාය. ඊට පසු පොලී මෙනෙවිය අතිශය පුදුමයට පත් කරමින් ඇය මේ ටිකත් ඊටම එකතු කළාය."ඔය දරුවා දං කාලෙක ඉඳන් මට කියන්නෙ, පාට ඇඳුමක් අඳින්න කියල. ඉතිං මම මෙහෙම දේකින් ඒක පටන් ගත්තා කියලා දැනගත්තාම, එයා සතුටුවෙයි. එයා කිව්වා ෆ්‍රෙඩී උනත් මං එහෙම ඇන්දොත් ආසා වෙයි කියලා. ඔයා දන්නවානෙ. මට දැන් ඉන්න එකම වස්තුව ෆ්‍රෙඩී තමා. අනිත් අය හැමෝම..." බෙන්ටන් මහත්මිය කතාව නවතා, හිස දෙපසට සොළවා ආපිට හැරුණාය."ඔයා එහෙම කියන්නකෝ. මිස් පොලියානා ඒක තෙරුං ගනී...." යි කී ඇය එළියට ගොස් දොර වැසුවාය.

sinhalaebooks.com

එදිනටම, ටික වේලාවකට පසුව පොලී මෙනෙවිය කොහෙත්ම නොදන්නා තැනැත්තියක් ද ආවාය. ඇය වැන්දඹුවක යැයි සිතිය හැකි අන්දමේ ඇඳුම් ඇඳ සිටියාය. පොලී මෙනෙවිය සිතමින් සිටියේ මේ තැනැත්තිය පොලියානා හඳුනන්නේ කෙලෙසද කියාය. ඒ කාන්තාව කී හැටියට ඇගේ නම 'මාර්බෙල්' ය.

"මම නම් ඔයාට අමුත්තෙක්.. ඇත්තටම." ඇය එක්වරම කීවාය. ඒත් ඔයාගෙ පුංචි ලේලි, පොලියානාට නං මං අමුත්තෙක් නෙමේ. මම ගිම්හාන කාලෙම වටුමෙ හෝටලේ නැවතිලයි ඉන්නෙ. ඉතිං හැමදාම මගෙ සරීර සනීපෙට ටිකක් ඇවිදින්න යනවා. පොලියානා මට හම්බ වුණේ එහෙම යනකොට තමා. අනේ... කොයිතරං හොඳ ළමයෙක් ද! මං කැමතියි ඔයාට කියන්න, එයා මට කරපු දේවල්

ගැන. මම මෙහාට ආපු දවස්වල හරිම දුකින් හිටියෙ. ඒත් එයාගෙ ලස්සන මූණයි, දඟකාර වැඩයි දැකලා මට අවුරුදු ගාණකට කලින් නැතිවුණු මගේ ම දුව මතක් උණා. මම මේ වෙච්චි දේ ගැන අහලා හරියට කම්පා උණා. ආයෙමත් කවදාකවත් ඇවිදින්න බැරි නිසා එයා ගොඩක් කණගාටුවෙන් ඇති... තව දුරටත් එයාට සතුටු වෙන්න බැරි නිසා. අනේ අසරණ දරුවා! මං ඒකයි මේ බලන්න ආවේ''

''ඔයා ගොඩක් කරුණාවන්තයි.'' පොලී මෙනෙවිය සිහින් හඬින් කීවාය.

''ඒත්... ඔයා තමයි මට කරුණාවන්ත වෙන්න ඕනෑ....'' යි මාර්බෙල් මහත්මිය කීවාය. ''ඔයාට පුළුවන් නේද මගෙ පණිවිඩේ එයාට කියන්න ?''

''ඇත්තටම ඔව්...''

''එහෙනං එයාට කියන්න මිසිස් මාබෙල් දැන් සතුටින් ඉන්නවා කියලා. ඔව්... මම දන්නවා ඒක ටිකක් අමුතුයි, ඔයාට තේරෙන්නෙ නැතුව ඇති. ඒත්... මට සමාවෙන්න ඕනෑ, මට ඊට වඩා පැහැදිලි කරන්න බෑ. '' ඇයගේ මුහුණට දුක්මුසු පෙනුමක් පැමිණි අතර, දෑසේ තිබුණු ප්‍රීතිමත් බවද නැතිවී ගියේය. ''පොලියානා ඒකෙ තේරුම දන්නවා. ඉතිං... මට මේක එයාට කියන්නම ඕනෑ. බොහොම ස්තුතියි. අනික මට සමාවෙන්න ඕනෑ... මං මෙහෙම ආපු එක කරදරයක් වුණා නං..''

ඇය පිටත්ව යන විට එසේ කීවාය.

සිදුවූ හැම දෙයක් ගැනම හොඳටම කුතුහලයෙන් සිටි පොලී මෙනෙවිය, හනික උඩ තට්ටුවට නැග, පොලියානාගේ කාමරයට ඇතුළු වූවාය.

''පොලියානා ඔයා දන්නවද මිසිස් මාබෙල් කියල කෙනෙක්?''

"අනේ ඔව්. මං එයාට හරි කැමතියි. එයා ඉන්නෙ ටවුමෙ තියෙන හෝටලේ. එයා අසනීපෙන්, දුකෙන් ඉන්න කෙනෙක් නිසා, සමහර දවස්වල ඇවිදින්නත් යනවා. ගොඩක් දවස්වල අපි එකට යනවා... මං කිව්වෙ අපි එහෙම කරන්න පුරුදු වෙලා හිටියා...!" පොලියානාගේ කටහඬ දුබල වීය. ලොකු කඳුළු කැට දෙකක් දෙකම්මුල් දිගේ පෙරී ආවේය.

පොලී මෙනෙවිය ඉක්මනින් උගුර පෑදුවාය.

"හොඳයි... ඔන්න එයත් මෙහෙ ආවා දරුවෝ. එයා ඔයාට පණිවිඩයක් ගෙනාවා. ඒත් ඒකෙ තේරුම මට කිව්වෙ නෑ. එයා කිව්වෙ 'මිසිස් මාර්බෙල් දූන් සන්තෝසෙන් ඉන්නවා' කියලා විතරමයි"

පොලියානා අත්පුඩියක් ගැසුවාය.

"එයා එහෙම කිව්වද.. ඇත්තටම? අනේ මට හරිම සතුටුයි!"

sinhalaebooks.com

"ඒත් පොලියානා, මොකද්ද ඒකෙ තේරුම?"

"ඇයි, ඒක තමයි සෙල්ලම.. ඉතිං..." පොලියානා මදකට නැවතී ඇඟිලි දෙතොල් මත තැබුවාය.

"මොන සෙල්ලමක්ද?"

"ම්... මුකුත් නෑ පුංචි අම්මෙ. ඒක ගැන.. ඒක ගැන මට කියන්න බෑ. එතකොට මම කතා කරන්න අකමැති දේවල් ගැනත් කියන්න වෙනවා..."

ඒ ගැන වැඩි දුරටත් විමසීමට පොලී මෙනෙවිය සිතූ නමුත්, කුඩා ගැහැනු දරුවාගේ පීඩනයට ලක්වූ මුහුණ දුටුවිට එළියට එන්නට ආ වචන මුව ඇතුළේම සිරවී ගියේය.

මාර්බෙල් මහත්මිය පැමිණ නොබෝ දිනකින්ම, මේ හරස් පද ප්‍රහේළිකාවේ උපරිමය පැමිණියේ ය. එය පැමිණියේ අසාමාන්‍ය අන්දමට කම්මුල් රෝස පැහැ ගැන්වුණු, තඹ පාට හිසකේ ඇති කාන්තාවක සමඟය. ඇය අඩි උස පාවහන් පැළැඳි, ලාබ ආභරණ පැළැඳි, තරුණ කාන්තාවකි. එපමණක්ද නොව නගරයේ බොහෝ ප්‍රසිද්ධියට පත්ව සිටි, පොලී මෙනෙවිය හොඳින් හඳුනන තරුණ කාන්තාවකි. පොලී මෙනෙවිය, හැරින්ටන් බංගලාවට පැමිණ සිටි ඇය මුණ ගැසුණේ හිතේ තිබුණු කේන්තියත්, පුදුමයත් සමගය.

පොලී මෙනෙවිය ඇයට අතට අත දීමෙන් වැළකී සිටියාය. සාලයට ඇතුළු වී ඒ කාන්තාව දකින විටම ඇය මදක් ආපස්සට ඇදුනාය.

කාන්තාව එක්වරම නැගී සිටියාය. ඇගේ දෑස් හැඬීමෙන් රතුපැහැ ගැන්වී තිබිණි. මදක් ගරු සරු නැති විලාසයෙන් ඇය මොහොතකට හෝ පොලියානා මුණගැසිය හැකි දැයි විමසා සිටියාය.

පොලී මෙනෙවිය එසේ කළ නොහැකි යැයි කීවාය. ඇය කතා කරන්නට පටන් ගත්තේ හොඳටම තියුණු ස්වරයකිනි. එහෙත් මේ කාන්තාවගේ දෑසේ ලියැවී තිබුණු මොකද්දෝ බැගෑපත් බැල්මක් හේතුවෙන් ඇය, මෙතෙක් කිසිවකුට පොලියානා මුණ ගැසීමට ඉඩ දී නැතැයි ශාන්තව කියා සිටියාය.

කාන්තාව මදක් පැකිලෙමින් සිට, ඊට පසු තරමක් ඉක්මනින් කතා කරගෙන යන්නට වූවා, තරමක් ගරු සරු නැති විලාසයෙන් නිකට ඔසවා ගත්තාය.

"මගේ නම මිසිස් ජේසන්... මිසිස් ටොම් ජේසන්, මම හිතනවා... මේ ටවුමෙ ඉන්න අනික් හොඳ මිනිස්සු වගේ... ඔයා මං ගැන අහලා ඇති කියලා. මං ගැන, ඔයා අහල තියෙන කතා ඇත්ත නොවෙන්නත් පුළුවන්. ඒත් ඒකට කමක් නෑ. මම මේ පුංචි ගෑනු ළමයා නිසයි ආවෙ. මට දැන ගන්න ලැබුණා, එයාට ආයෙමත් ඇවිදින්න බැරි වෙන කතාවකුත්. ඒක ඇහුවාම මට හිතුණා, මගේ

මේ තියෙන වැඩකට නැති හොඳ කකුල් දෙක එයාට ලැබෙනවා නං කියලා. මට අවුරුදු සීයකින් වත් කරන්න බැරි හොඳ දේවල් එයා පැයකින් එහාට මෙහාට ඇවිදලා කරයි. ඒත් දැන් ඒකට කමක් නෑ. මට පෙනිලා තියෙන විදියට නං කකුල් උණාත්, ඒකෙන් උපරිම ප්‍රයෝජනේ ගන්ඩ පුළුවං අයට නෙමේ ලැබෙන්නෙ.'' මදකට නැවතුණු ඇය, උගුර පාදාගෙන නැවතත් කතාව පටන් ගත්තාය. එහෙත් ඇගේ හඬ තවමත් බැරෑඩි වී තිබුණි.

''මගේ හිතේ ඔයා දන්නෙ නැතුවත් ඇති. ඒත් මේ ළමයා කොයි තරං හොඳ දේවල් කරලා තියෙනවද? අපි ඉන්නෙ අර පෙන්ඩල්ටන් කන්දට යන පාර අයිනෙ. එයා එතනින් නිතරම යනවා එනවා. ඒ විතරක් නෙමේ එයා අපේ ගෙදරට ඇවිත් මගේ ළමයි එක්ක සෙල්ලං කරලා මාත් එක්කත් කතා බහ කරලා යනවා. මගේ මනුස්සයා එක්කත් සමහර වෙලාවට කතා කරනවා... එයා ගෙදර හිටියොත්. ඇත්තටම එයා ඒක කළේ කැමැත්තෙං. අපිව ආස්සරේ කරන්නත් එයා කැමති උණා. එයා දන්නෙ නෑ, මගේ හිතේ එයා වගේ අය, අපි වගේ අය හම්බ වෙන්න එන්නෙ නෑ. එහෙම එනවා උණත්, මිස් හැරින්ටන්... මගේ ජාතියෙ අය බොහොම අඩුයි...'' ඇය එකතු කළේ, හදිසියේ ඇති වූ කර්කශ හඬකිනි.

''ඒක එහෙම වෙච්චාවෙ. එයා අපේ ගෙදර ආවා. ඇවිත් අපට තරකක් කළේ නෑ. එයා කළේ හොඳක්... ගොඩාක් හොඳ දෙයක්. අපි ගැන එයාට දැන ගන්න ඕනෑ වුණත්, මම හිතන්නෙ නං, එයා ඒවා දැන නොගන්න එක හොඳයි. ඒ මොකෝ, එයා සමහර දේවල් ගැන දැන ගත්තොත්... මම කොහොමටවත් එයා ඒවා දැනගන්නවට කැමති නෑ....''

ඉතිං මට කියන්න ඕන මෙච්චරයි. මේ අවුරුද්දෙ අපිට ගොඩක් පැතිවලින් ප්‍රශ්න ආවා. අපි හොඳටම කලකිරිලයි හිටියෙ... මගෙ මනුස්සයයි මමයි. ඕන දේකට ඔට්ටු වෙලායි අපි හිටියෙත්. දෙන්නම දික්කසාද වෙන්න ඔන්න මෙන්න කියලා හිටපු වෙලාවෙ... ළමයි ටික ... හොඳයි, ඇත්තටම අපි දැනගෙන හිටියෙ නෑ උන්ට මොකද කරන්නෙ කියලා. ඔන්න ඔය අතරේ තමා, මේ දූරිවිගෙ අනතුර

වෙලා, එයාට ආයෙමත් ඇවිදින්න බැරිවෙලා ඉන්නව කියල දැන ගත්තෙ. ඉතිං අපිට මතක් උණා, එයා අපේ ගෙදරට ඇවිත්, ළමයි එක්ක සෙල්ලං කරලා, හිනාවෙලා... සතුටින් හිටපු හැටි. එයා හැම තිස්සෙම, හැම දෙයක් ගැනම සතුටු වුණා. ඔන්න දවසක් දා එයා අපට ඒ 'සෙල්ලම' ගැන කියලා, ඒක අපි ලවා කරවන්න හැදුවා.

''ඒත් අපට ආරංචි උණා දැන් එයා ජීවිතේ ගැන බොහොම දුකෙන්, කලකිරීමෙන් ඉන්නවා කියලා..... ආයෙමත් ඒ සෙල්ලම කරන්න බැරි වෙන එක ගැන හිතලා. ඒක තමයි මම අද ආවෙ එයාට කියන්න... අපි ඔක්කොමලා එකතු වෙලා ඒ සෙල්ලම කරන්න යනවා කියලා... එතකොට එයා ටිකක් හරි සතුටු වෙයිනෙ. මම දන්නවා එයාට මේක අහලා සන්තෝස හිතෙයි. ඒ මොකද අපි කියපු සමහර දේවල් අහලා... එයා ඒ දවස්වල දුක් උණා. මේ සෙල්ලම නිසා අපිට හොඳක් වෙන විදිය ගැන මට තවම කියන්න බෑ. ඒත් මට හිතෙනවා එහෙම වෙයි කියලා. කොහොම හරි... අපි හදන්නේ උත්සාහ කරලා බලන්න... ඒ මොකද එයාට ඒක අපි ලවා කරවන්න ඕනෑ වුණානෙ. ඉතිං ඔයාට මේක කියන්න පුළුවන් නේද එයාට?''

''හා.... මම කියන්නං.'' මලානික ස්වරයෙන්, පොලී මෙනෙවිය පොරොන්දු වූවාය. ඊට පසු හදිසියේ ඇති වූ ආවේගයකින් මෙන්, ඇය ඉදිරියට ගොස් අතට අත දුන්නාය. ''ආවාට ස්තුතියි.... මිසිස් පේසන්....'' යි ඇය කීවාය.

පේසන් මහත්මියගේ මුහුණ තරමක් ආචාරශීලී ඉරියව්වකට පැමිණියේය. දෙතොල් වෙව්ලන බව පැහැදිලිව ම පෙනුණි. ඉතා පහත් ස්වරයෙන් කුමක්දෝ මිමිනූ ඇය. විදහාගත් අත ආපස්සට ගෙන, ආපිට හැරී, ගෙයින් පිටතට දිව ගියාය.

මුළුතැන්ගෙට ඇතුලු වී දොර යාන්තමට වැසූ පොලී මෙනෙවිය, නැන්සිට කතා කළාය.

''නැන්සි!''

එහි තිබුණේ තියුණු ස්වරයකි.

පසුගිය දවස් කීපයේදී සිදුවුණු, තේරුම් ගත නොහැකි සිද්ධි දාමය, එදා හැන්දෑ වරුවේ සිදු වූ මේ අරුම පුදුම සිද්ධිත් සමඟ, උපරිමයකට පත්ව ඇති බව හැඟුණි. පොලී මෙනෙවියට දැනුණේ නම් දැන් රතු ඉර පැන ඇති බවය. පොලියානාගේ අනතුර සිදු වූ දාට පසුව, ඇගේ නෝනා මහත්මිය මේ තරම් තදින් කතා කරනු නැන්සි ඇසූ පළමු වතාව ද මෙයයි.

''නැන්සි හැබෑටම මොකක්ද මේකෙ තේරුම? මුළු ටවුමෙම ඉන්න මිනිස්සු මෙහෙට ඇවිත් මොකද්දෝ සෙල්ලමක් ගැන කියනවානේ. කරුණාකරලා මට කියනවාද, මේකට පොලියානා ගේ තියෙන සම්බන්දෙ මොකද්ද කියලා. මිලී ස්නෝගෙ ඉඳං, ටොම් පේසන් ගෙ ගෑනි වෙනකං, හැමෝම කියන්නෙ, මොකද්දෝ සෙල්ලමක් ගැන. මට පේන හැටියට දැන් ටවුමෙ ඉන්න බාගයක්ම එක්කො තිල්පාට පීත්ත පටි ගැට ගහනවා. එහෙම නැත්තං පවුලෙ අඬදබර නවත්තනවා. එහෙමත් නැත්තං, කවදාවත් කැමති වෙලා නැති දේකට, කැමති වෙන්න ඉගෙන ගන්නවා. ඔක්කොමටම හපන්, ඒවා එහෙම වෙන්නෙ පොලියානා හන්දාලු. මං මේ ළමයගෙන් ඔය ගැන අහගන්න හැදුවා. ඒත් මට හිතෙන්නෙ ඒ ළමයාට කියන්න බැරි මොකක් හරි තියෙනවා වගේ. කොහොමටත්, මේ වෙලාවෙ ඔය අනං මනං අහලා එයාගෙ හිත කළබල කරන්න මං කැමති නෑ. ඒත් මං එක දෙයක් අල්ලා ගත්තා, ඊයෙ රෑ එයා කියපු දේකින්. මට හිතෙන හැටියට ඔයත් මේකට සම්බන්දයි. කියමු බලන්න මොකද්ද මේ හතර බීරි කතාවෙ තේරුම?''

පොලී මෙනෙවිය පුදුමයට පත් කරවමින් නැන්සිට එක් වරම හැඬුම් ආවේය.

''ඒ කියන්නෙ පහුගිය ජූනි මාසෙ ඉඳං ම, මුළු ටවුමම සන්තෝස කර කර හිටපු මේ අසරණ ළමයාව දැං සන්තෝස කරන්න හදන්නෙ අතික් මිනිස්සු!''

"සතුටු වෙන්න.... මොකක් ගැනද?"

"නිකං ම සන්තෝස වෙන්න. ඒක තමා සෙල්ලම."

පොලී මෙනෙවිය පයක් පොළොවේ හැප්පුවාය.

"ඔන්න.... ඔන්න.... දැං ඔයත් අනික් හැමෝම වගේ අර හතර බීරි කතාව කියනවා. මං අහන්නෙ නැන්සි, මොකද්ද ඔය සෙල්ලම කියලා...."

නැන්සි මුහුණ එසෙව්වාය. ඇය ඇගේ නෝනා මහත්මිය දෙස කෙළින්ම බලන්නට වූවාය.

"මං කෙළින්ම කියන්නං මැඩම්. ඒ මිස් පොලියානා ගේ තාත්තා කියලා දුන්නු සෙල්ලමක්. එක දවසක් එයාට බෝනික්කෙක් ඕනෑ වෙලා තියෙද්දි, මිෂනරි තෑගි පෙට්ටිවල තිබුණෙ කිහිලිකරු දෙකක්ලු. බෝනික්කෙක් ඕනෑ කියල අඬන එක ඕනෑ ළමයෙක් ගෙ හැටි නෙ. ඉතිං තාත්තා එතකොට කිව්වලු, ඕනෑම දේක සන්තෝස වෙන්න පුළුවං පැත්තකුත් තියෙනවැයි කියලා. ඊට පස්සෙ එයා කිහිලි කරු දෙකක් හම්බ වෙච්චි එක ගැන සතුටු වුණාලු...."

"සතුටු උණා.... කිහිලිකරු ගැන...." පොලී මෙනෙවියට ඇඬෙන්නට ආ අතර එය හිර කරගත් ඇයට මතක් වුණේ උඩ තට්ටුවේ, ඇඳක් මත අසරණව වැතිර සිටින පුංචි දෙපා ගැනය.

"ඔව් මැඩම්. ඒක එහෙම තමයි. මිස් පොලියානා උණත් ඉස්සර වෙලා හිතුවලු ඒක කරන්න පුළුවන්ද කියලා. ඒත් තාත්තා කිව්වලු.... කිහිලිකරු දෙකක් තමන්ට ඕනෑ නෑ කියලා හිතලා.... සතුටු වෙන්න කියලා."

"අනේ...." පොලී මෙනෙවිය හඬක් නැගුවාය.

"ඉතිං ඊට පස්සෙ, එයා ඒක සෙල්ලමක් කර ගත්තා. ඒ

කියන්නෙ, හැම දේකම තියෙන මොකක් හරි සතුටු වෙන්න පුළුවන් පැත්තක් හොයන එක. ඉතිං එයා කියනවා හැමෝටම ඒක කරන්න පුළුවන්ලු. කිහිලිකරු දෙකක් ඕන වෙන්නෙ නෑ කියලා සතුටු වෙන කොට, බෝනික්කෙක් ලැබුණෙ නෑ කියන එක අමතක වෙනවාලු. ඒ සෙල්ලමට කියන්නෙ 'නිකංම සතුටු වෙන්න' කියලා. ඔය සෙල්ලම තමා මැඩම්, එයා එදා ඉඳංම කරන්නෙ.''

''ඒත්.... කොහොමද.... කොහොමද....'' පොලී මෙනෙවිය සිය අදහස ප්‍රකාශ කරගත නොහී, නැවතී සිටියාය.

''මැඩම්ට පුදුමයි නේද මැඩම්, ඒක එච්චර හිත් ගන්න සෙල්ලමක් උණේ කොහොමද කියලා'' යි නැන්සි පොලී මෙනෙවියට කියා ගන්නට බැරි වූ දේ අනුමානයෙන් කීවේ, පොලියානා මෙන්ම මහත් වූ උන්නඳුවකිනි. ''එයා අපේ අම්මටයි, ගෙදර අයටයි කොයි තරං දේවල් කරලා තියෙනවාද? එයා මාත් එක්ක දෙසැරයක් ඒ ගොල්ලො බලන්න ආවා. එයා මාවත් සන්තෝස කළා. ගොඩක් දේවල් ගැන. පුංචි දේවල් ගැන... ලොකු දේවල් ගැන. ඉතිං අපි හැමෝටම ඒකෙන් ලොකු සැහැල්ලුවක් ලැබුණා. ඒක මැඩම්ට තේරෙන්න මං පුංචි කතාවක් කියන්නං. මං 'නැන්සි' කියන නමට කොහොමටවත් කැමති නෑ. ඉතිං මම ඒක මිස් පොලියානාට කිව්වම, එයා කිව්වා මට 'හෙෆිසිබා' වගේ නමක් නොතිබුණු එක ගැන සන්තෝස වෙන්න කියලා. ඊළඟට සඳුදා උදේ වරුවට මං කොහෙත්ම කැමති නෑ. මට හොඳටම එපා වෙනවා සඳුදා උදේ නැගිට්ටාම. ඉතිං, ඒක ගැනත් සතුටු වෙන්න පුළුවන් විදියක් එයා මට කිව්වා....''

''සතුටු වෙන්න.... සඳුදා උදේ වරුව ගැන.''

නැන්සි සිනාසුණාය.

''මං දන්නවා... ඒක ටිකක් පිස්සු කතාවක් වගේ තමා. ඒත් මට ඒක ටිකක් විස්තර කරන්න දෙන්නකො. මේ පුංචි ළමයා, මම සඳුදා උදේ වරුවට කැමති නෑ කියලා දැනගත්තා. ඊට පස්සෙ

දවසක් මට කියපි මෙහෙම. ''කොහොම හරි කමක් නෑ... නැන්සි, ඔයාට සඳුදා ගැන, සතියෙ අනික් හැම දවසකටම වඩා සන්තෝස වෙන්න පුළුවන් නෙ. ඒ මොකද, තවත් සඳුදා දවසක් එනකල්, තව සතියක්ම ඉස්සරහට තියෙනවා නෙ... සඳුදා උදේ වෙනකොට...'' ඉතිං ඕක මට හැමදාම සඳුදම උදේට මතක් උනා. මතක් වෙන ගානෙ මට හරි හිනා. ඒක ඇත්තටම ලොකු සහනයක් උණා. ඉතිං ඒ කියන්නෙ, ඒ සෙල්ලම මට හොඳට වැඩ කළා කියන එක... ඇත්තටම ඒක එහෙමයි...''

''ඒත් ඇයි එයා... ඕක මට කිව්වෙ නැත්තෙ?'' යි කී පොලී මෙනෙවියට වචන පැටලැවිණ. ''ඇත්තටම ඇයි එයා ඒක හංගන්න හැදුවෙ... මං ඔච්චර අහලාත්...''

නැන්සි මදක් පැකිලුණාය.

''මට සමාවෙන්න මැඩම්. ඔයා කියලා තිබුණානෙ තාත්තා ගැන වචනයක්වත් කතා කරන්න එපා කියලා.ඒකයි එයා ඕක නොකීවෙ. ඒක එයාගෙ තාත්තාගේ සෙල්ලමක් නෙ...''

පොලී මෙනෙවිය තොල හපා ගත්තාය.

''ඔක්කොටම කලින් එයාට ඕනෑ වුණේ මැඩම් එක්ක මේක කියන්න...'' යි නැන්සි මදක් පැකිලෙමින් කියාගෙන යන්නට වූවාය. ''එයාට ඒ සෙල්ලම කරන්න කවුරු හරි ඕනෑ වුණා. ඉතිං ඒ හින්දා තමයි මං එක්ක පටන් ගත්තෙ... එයා ගෙ තනියට.''

''එතකොට... මේ... අනිත් අය...'' පොලී මෙනෙවියගේ කටහඬ වෙව්ලන්නට විය.

''ආ! මං හිතන්නෙ හැමෝම ඒක ගැන දන්නවා. මම යන යන හැම තැනින්ම ඇහෙන්නෙ... හැමෝම ඒක කරන්න පටන් අරන් කියලා. මං හිතන්නෙ, මිස් පොලියානා ඒක ගොඩක් දෙනෙකුට කියන්න ඇති. ඊට පස්සෙ ඒ ගොල්ලො අනිත් අයට කියන්න ඇති.

ඕක නිකංම පැතිරෙනවනෙ. අනික මේ ළමයා හැමෝම එක්ක හිනාවෙලා, හොඳින් කතා බහ කරලා ඉන්නවානෙ. ඉතිං, කාගෙන්වත් ඕක හංගන්න බැරි වෙන්න ඇති. දැං එයාට අනතුර උණාට පස්සෙ හැමෝම එයා ගැන දුක්වෙනවා. වැඩියෙන්ම දුක් වෙන්නෙ, එයාට සිද්ද වෙච්චි දේ ගැන කොහෙත්ම සන්තෝස වෙන්න බැරි හින්දා. ඉතිං, ඔය ඒ ගොල්ලො ඇවිත් කියන්නෙ, පොලියානා මිස් නිසා ඒ ගොල්ලො කොයි තරං සන්තෝස වෙන්න ඉගෙන ගත්තද කියල. ඒකෙන්, මේ දරුවාට මොකක් හරි සහනයක් ලැබෙයි කියලයි එයාලා හිතනවා ඇත්තේ. මැඩම්ට දැන් තේරෙනවානෙ, එයාට හැම වෙලේම ඕන වුණේ හැමෝම එයා එක්ක මේ සෙල්ලම කරනවා දකින්න.''

''හොඳයි... අද ඉඳන් තව කෙනෙක් ඒක කරයි...'' යි පොලී මෙනෙවිය, ආපිට හැරී මුළුතැන්ගෙයි දොරින් ඉක්මනින් පිටව ගියාය.

ඇය පිටුපා යන දෙස නැන්සි මවිතයෙන් බලා උන්නාය.

sinhalaebooks.com

''අම්මේ... මට නං දැං ඕන දෙයක්.. ඕන දෙයක් විස්වාස කරන්ඩ පුළුවං වෙයි..'' යි තමන්ටම කියා ගත් ඇය ''දැන් නං එයාට මාව මට්ටු කරන්න කොහොටමවත් බෑ! මගෙ හිතේ. අනේ... පොලී නෝනටත් ගිය කලක්!''

ටික වේලාවකට පසුව, පොලියානා ගේ කාමරයේදී හෙදිය ඉවත්ව ගිය පසුව පොලී මෙනෙවිය, පොලියානා සමඟ තනි වූවාය.

''ඔයාව බලන්න අද තවත් කෙනෙක් ආවා. වස්තුවේ...'' යි නොසැලෙන හඬක් පවත්වාගෙන යාමට උත්සාහ කරමින්, පොලී මෙනෙවිය කීවාය. ''ඔයාට මතකද මිසිස් ජේසන් ව.''

''මිසිස් ජේසන්! මොකද නැත්තෙ! එයා ඉන්නෙ මිස්ට පෙන්ඩල්ටන් ගෙ දිහාට යන පාරෙමයි. එයාට හරි හුරතල් පුංචි ගෑනු ළමයෙක් ඉන්නවා, අවුරුදු තුනක විතර. තව පිරිමි ළමයෙකුත්

ඉන්නවා අවුරුදු පහක විතර. මිසිස් ජේසන් හොඳටම හොඳයි. එයාගෙ මහත්තයත් එහෙමයි. එකම වැරැද්ද ඒ ගොල්ලො තම තමං කොච්චර හොඳද කියල නොදන්න එක විතරයි. සමහර වෙලාවට එයාලා රණ්ඩුත් වෙනවා - මං කියන්නෙ එකට එක කියා ගන්නවා. අනික ඒ ගොල්ලො දුප්පත් ලු... කියන විදියට නං එහෙමයි. ඇත්තටම එයාලට තෑගි පෙට්ටි හම්බ වෙන්නෙත් නෑනෙ... එයාගෙ මහත්තයා ස්වාමි කෙනෙක් නෙමයිනෙ. හරියට අපට.. හොඳයි, එයා එහෙම නෑ...''

පොලියානා ගේ කම්මුල් රෝස පැහැ වෙන්නට ආ අතර, ඇගේ පුංචි අම්මාගේ මුහුණෙන්ද ඒ වෙනස දකිය හැකි විය.

''ඒ උණාට... එයා කොච්චර දුප්පත් කිව්වත්, සමහර වෙලාවට ලස්සන ඇඳුම් අඳිනවා...'' යි යමක් මතක් කරගත් පොලියානා ඉක්මනින් කියාගෙන ගියාය. ''අනික එයාට පුදුම තරං ලස්සන මුද්දක් තියෙනවා, දියමන්ති, මැණික් එහෙම ඔබ්බපු. එයා කියනවා, එයා හිතාගෙන ඉන්නේ ඒ මුද්ද ගලවලා වීසි කරලා, දික්කසාදයක්ද මොකද්ද ගන්නලු. මොකද්ද දික්කසාදෙ කියන්නෙ පුංචි අම්මෙ? මට හිතෙන විදියට නං ඒක ඒ තරං හොඳ දෙයක් වෙන්න බෑ. ඒ මොකද ඒක ගැන එයා කතා කරන්නෙ එච්චර සන්තෝසෙන් නෙමෙයි. ඉතිං එයා කියනවා, එහෙම දෙයක් උණොත් එයාලා එතන ඉන්නෙ නැතිලු. ඒ කියන්නෙ එයාගෙ මහත්තයයි, සමහර විට ළමයිනුයි එතනින් වෙන කොහාටද යනවලු. මට හිතෙන්නෙ නං, ඒ ගොල්ලන්ට කොච්චර වෙන මුදු තිබුණත්, ඒ මුද්ද තියාගෙන ඉන්නයි තියෙන්නෙ. ඔයා එහෙම හිතන්නෙ නැද්ද පුංචි අම්මෙ? ඇත්තටම මොකද්ද දික්කසාදෙ කියන්නෙ?''

'' ඒ මොකක් උනත් ඒ ගොල්ලො දැං එතනින් යන එකක් නෑ දරුවො..'' පොලී මෙනෙවිය හනික කීවාය. ''ඒ ගොල්ලො එතනම, එකට ඉන්නවාලු...''

''අනේ.. මට හරි සතුටුයි! එතකොට ඒ ගොල්ලො ඒ ගෙදරම ඉඳියි මම ගිහින්... අනේ දෙයියනේ!'' යි ඉතා දුක්බර ලෙස

පොලියානා හඬා වැටෙන්නට වූවාය. ''පුංචි අම්මෙ... ඇයි මට අමතක වෙන්නෙ... මගේ කකුල්වලින් තවත් ඇවිදින්න බෑ කියලා. මට කවදාවත්... කවමදාවත් ආයි අර කන්ද උඩට නැගලා මිස්ට පෙන්ඩල්ටන් හම්බ වෙන්න බැහැ කියලා අමතක වෙන්නෙ ඇයි?''

''ඔන්න... ඔන්න නවත්තන්න ඕක...'' යි ඇගේ පුංචි අම්මා ඇය අස් වැසුවාය. ''ඔයාට කවද හරි අස්ස කරත්තෙන් එහෙ යන්න බැරියැ. ඒත් මේක අහන්නකෝ. මම හොඳ හරිය තාම කිව්වෙ නෑ. මිසිස් ජේසන්ට ඕන වුනා ඔයාට කියන්න ඒ ගොල්ලො...ඒ ගොල්ලො ඔක්කොමලා එකතු වෙලා , ඔයාට ඕන වුණු විදියට ඒ සෙල්ලම කරන්න යනවා කියලා.''

පොලියානා කඳුලු අතරින් සිනාසුණාය.

''ඒ ගොල්ලො එහෙම කරනවද? ඒගොල්ලො එහෙම කරනවාද? ඇත්තටම? අනේ... මට හරි සතුටුයි ඒකට...''

''ඔව්... එයා හිතුවා ඔයා ඔහොම කියයි කියලා. එයා ඒක කිව්වෙ ඔයා... සතුටු කරවන්න පොලියානා....''

sinhalaebooks.com

පොලියානා හනික හිස ඔසවා බැලුවාය.

''පුංචි අම්මෙ ඔයා... ඔයා කතා කරන්නෙ ඒක ගැන දන්නවා වගේ... ඔයා ඒ සෙල්ලම ගැන දන්නවද පුංචි අම්මෙ?''

''ඔව් වස්තුවේ.'' පොලී මෙනෙවිය ඇගේ කටහඬ ප්‍රීතිමත් ස්වරයක් බවට හැරවීමට ලොකු උත්සාහයක් ගත්තාය.

''නැන්සි මට කිව්වා. මං හිතන්නෙ ඒක හරි අපූරු සෙල්ලමක්. අද ඉඳන්... ඔයත් එක්ක... මමත් ඒ සෙල්ලම කරනවා...''

''අනේ.. පුංචි අම්මෙ.. ඔයා? මට හරි සතුටුයි!'' ඔයා දන්නවද... මට ඔය කාටවත් වඩා, ඒක ඔයා කරනවා දකින්නයි ඕන වුණේ...

හැම තිස්සෙම...''

පොලී පුංචි අම්මා දිගු හුස්මක් ගත්තාය. මෙවර නම් නොසැලී කතා කිරීම තරමක් අමාරු කාරියක් වීය. එහෙත් ඇය එය කළාය.

''අනේ... මට හරිම සතුටුයි.'' පොලියානා කෑ ගැවාය. ඊට පසු හදිසියේම පුදුමාකාර ලෙස ඇගේ මුහුණ ආලෝකමත් විය. ''ඇයි පුංචි අම්මෙ.. දැන් ඇත්තටම මට සතුටු වෙන්න පුළුවන් දෙයක් තියෙනවානේ, මට සතුටු වෙන්න පුළුවන් මට කකුල් දෙකක් තිබිච්ච එක ගැන. නැත්තං ඔය තරං හරියක් කරන්න බෑනෙ...''

සිංහල EBOOKS

සිංහල නවකතා 1000කට අධික ප්‍රමාණයක් නොමිලේ
Ebook ආකාරයෙන් කියවන්න...
දැන්ම www.sinhalaebooks.com වෙත පිවිසෙන්න..

# 29

# ඇරුණු ජනේලය

ශීත ඍතුවේ කෙටි දවස් එකින් එක ගෙවී යන්නට විය. එහෙත් පොලියානාට නම් ඒවා කෙටි දවස් වූයේ නැත. ඒවා ඉතා දිගු වූ අතර ඇතැම් විට වේදනාකාරී වූයේය. කොහොම නමුත් මේ දිනවල එන ඕනෑම දෙයකට සතුටින් මුහුණ දීමට පොලියානා අදිටන් කරගෙන තිබුණි. දූන් පොලී පුංචි අම්මා පවා ඒ සෙල්ලම කරන විට, ඇය නොකර හිඳින්නේ කෙසේ ද? දූන් පොලී පුංචි අම්මාත් සතුටු විය හැකි බොහෝ දේවල් සොයා ගත්තීය! එක දවසක් හිම කුණාටුවකට අතරමං වූ ළමයින් දෙදෙනාගේ කතාව ද සොයා ගත්තේ ඈ ය. ඒ වීදි දරුවන් දෙදෙන, හිම කුණාටුවෙන් බේරුණේ, සුළඟට ගැලවී විසිවුණු දොරක් යට ගුලිවී සිටිමිනි. ඉතින් ඔවුහු දෙදෙන, එහෙමවත් පිහිටක් නැති, දුප්පත් මිනිසුන් ගැන සිතා, සැනසුණෝය. ඊළඟ කතාවත් ගෙනාවේ පොලී පුංචි අම්මාය. ඒ, දත් දෙකක් පමණක් ඇති, ඉතා මහලු කාන්තාවක්, ඒ ගැන සිතා සැනසුන හැටි ගැන කියැවෙන කතාවකි!

පොලියානා දූන්, ස්නෝ මහත්මිය මෙන් පාට පාට ලොම් නූලෙන් ඉතා ලස්සන ගෙත්තම් කළාය. ඉතිං.... ස්නෝ මහත්මියට වාගේම, ඇයටද දෑතේ හයිය ඉතිරිවී තිබීම ගැන සතුටු වන්නට හැකිවිය.

පොලියානා ඉඳහිට ඇගේ මිතුරන් හමු වූවාය. ඇය හමු නොවූ අයගෙන් ඉතා ආදරණීය පණිවුඩ ගලා ආවේය. ඒ හැම වතාවකම ඔවුන් ඇයට අලුතින් සිතිය හැකි යමක් රැගෙන ආ අතර, ඇත්තටම පොලියානාටද කල්පනා කිරීමට අලුත් අලුත් දේ ඕනෑ වී තිබුණි.

ජෝන් පෙන්ඩල්ටන් මහතා වරක් ඇය හමුවට ආ අතර ජිමී බීන් දෙවරක් ආවේය. පෙන්ඩල්ටන් මහතා පොලියානාට කීවේ ජිමී කොයි තරම් හොඳ, කොයි තරම් පිළිවෙළකට වැඩ කටයුතු කරගෙන සිටින ළමයෙක්ද කියායි. ජිමී ද ඇයට කීවේ ඔහුට හමුවූයේ කොයිතරම් ඉහළ පැළැන්තියේ නිවෙසක් ද කියාත්, පෙන්ඩල්ටන් මහතා කොයි තරම් අගේට තම පවුලේ කෙනෙකු මෙන් දූනෙනවාද කියාත් ය. දෙදෙනම, මේ හැමදෙයක්ම වූයේ පොලියානා නිසා බව කියන්නටද අමතක නොකළහ.

''ඒක අහලා මට තවත් සතුටුයි. ඒවා එහෙම උණේ මගෙ කකුල් දෙක තිබුණු නිසානෙ...'' යි පොලියානා පොලී පුංචි අම්මා සමඟ පසුව කීවාය.

ශීත සෘතුව ගෙවී ගොස් වසන්තය ආවේය. පොලියානාගේ තත්වය දෙස බලාගෙන සිටි අයට, එතෙක් කල් ඇයට කරන ලද ප්‍රතිකර්මවලින් ලැබී ඇත්තේ ඉතා සුළු හොඳක් බව පෙනුණි. දූන් නම් හැමදෙනාටම... දොස්තර මීඩ් ගේ බරපතලම සැකය, එනම් පොලියානාට කෙදිනකවත් ඇවිදින්නට නොහැකි වන බව, හැබෑවක් මෙන් පෙනෙන්නට විය.

බෙල්ඩින්ග්ස්විල් නගරයද පොලියානා අමතක කළේ නැත. බෙල්ඩින්ග්සවිල් නගරයේ සිටි එක් පුද්ගලයෙකු නම්, ලෙඩ ඇඳේ සිටි පොලියානා ගැන දිනපතාම ගලා ආ ප්‍රවෘත්තිවලට ඇහුම්කන්

දෙමින් හිත කලබලයෙන් සහ කළකිරීමෙන් යුතුව සිටියේය. දිනෙන් දින ගෙවී යත්ම, ලැබෙන ආරංචි හොඳ අතට නොව තවත් නරක අතට හැරෙමින් තිබෙන විට, හැමදාමත් තිබුණු හිතේ කැළඹීමට අමතර යමක්, ඔහුගේ මුහුණෙන්ද දිස්වන්නට විය. එනම් බලාපොරොත්තු සුන්වීම අතරින් ම නැගී උන්, නොසැලෙන අධිෂ්ඨානයක්ද පළමු හැඟීම යටපත් කරන්නට සටන් වදිමින් සිටියේය. අන්තිමේදී අර අධිෂ්ඨානය ජයගත්තේය. ඊට පසුව පෙන්ඩල්ටන් මහතාගේ පුදුමයකට මෙන්, එක්තරා සෙනසුරාදා දවසක දොස්තර තෝමස් කිල්ටන් ඔහු හමුවන්නට ආවේය.

''පෙන්ඩල්ටන්'' දොස්තර මහතා එක්වරම කතාවට බැස්සේය. ''මං ඔයාව හම්බවෙන්න ආවෙ, මේ ටවුමෙ ඉන්න අනික් හැමෝටම වඩා පොලි හැරින්ටන් ගෙයි මගෙයි සම්බන්දෙ ගැන දන්නෙ ඔයා නිසා...''

ජෝන් පෙන්ඩල්ටන් පොලී හැරින්ටන් සහ තෝමස් කිල්ටන් අතර තිබූ සබඳකම ගැන යමක් දැන සිටි නමුත් එය මේ හිතවතුන් දෙදෙන අතර අවුරුදු පහළොවක් තිස්සේ කතාබහ නොවූ කාරණාවකි.

sinhalaebooks.com

''ඔව්'' ඔහු කීවේ පුළුවන් තරම් තම කටහඬ කණගාටුදායක ස්වරයකට හැරවීමට මහන්සි ගනිමිනි. එය කුතුහලයෙන් පිරුණු එකක් නොවීමට ඔහු හැකි තරම් වග බලා ගත්තේය. එහෙත් වැඩි වේලා නොගොස්, කණගාටු වීමට තරම් හේතුවක් නැති බව පෙන්ඩල්ටන් මහතාට තේරුම් ගියේය. ඊට හේතුව දොස්තර කිල්ටන් කියන්නට පැමිණි කාරණය ගැන මහත් උනන්දුවෙන් කතා කරන්නට පටන් ගැනීමය.

''පෙන්ටල්ටන්, මට අර ළමයාව බලන්න ඕනෑ. මට එයාව ටිකක් පරීක්ෂා කරන්න හිතෙනවා. ඒක කරන්නම ඕනෑ...''

''ඉතිං ...ඔයාට ඒක කරන්න බැරිද?''

''බැරිද? මට?... පෙන්ඩල්ටන්, ඔහේ දන්නවානෙ, මම ඔය වහලෙ යටට ගිහින් නෑ දැං අවුරුදු පහළොවකින් විතර. ඔහේ දන්නෙ නෑ. මම ඒක කියන්නං. හැරින්ටන් නෝනා මට කියලා තියෙනවා කවදක හරි ඒ ගෙදරට එන්න කියල එයා මගෙන් ඉල්ලුවොත්, ඒ කියන්නෙ එයා මගෙන් සමාව ගන්නවා කියන එකයි, ඉතිං එහෙම වුණොත් ඊට පස්සෙ, එයා මාව බඳිනවා කියලා. සමහරවිට ඔහේ හිතයි, එයා මට දැං එන්න කියයි කියලා. ඒත් මම නං හිතන්නෙ නෑ.''

''ඒත් එයාගෙන් කැඳවීමක් නැතුව...ඔහේට එහෙ යන්න බැරිද?''

දොස්තර මහතා රවා බැලුවේය. ''බොහොම අමාරුයි ඒක කරන්න. මටත් ආත්ම ගෞරවයක් තියෙනවනේ...''

''ඉතිං.. ඔය හැටි ඕක ගැන හිත හිතා ඉන්න වෙලේ ඔය ආඩම්බරේ ටිකක් පැත්තකින් තියලා, ආයෙ සමාදාන උණොත් මොකද?''

''සමාදාන වෙන්න!'' දොස්තර මහතා කෝපයෙන් විමසුවේය. ''මම කතාකරන්නෙ එහෙම දෙයක් ගැන නෙමේ. ඒ ගැන හිතනවා නං, මම මෙතෙන ඉඳන් ඒ ගෙදරට දණ ගාගෙන හරි... ඔලුවෙන් හිටගෙන හරි යන්නං, කාට හරි හොඳක් වෙනවා නං. මම මේ කියන්නේ මගේ වෘත්තීය ගරුත්වය ගැන. මේක ලෙඩක් සම්බන්ධ දෙයක්. මම දොස්තර කෙනෙක්. ඉතිං මට ඒ ගෙදරට ගිහින් කියන්න පුළුවන්ද 'අනේ මට බෙහෙත් කරන්න දෙන්න' කියලා?''

''ඒක නෙමෙයි කිල්ටන්, මොකද්ද ඇත්තට උඹලා දෙන්නා අතර වෙච්චි හබේ....?'' යි පෙන්ඩල්ටන් මහතා ඇසීය. දොස්තර මහතා නොඉවසිලිමත් පෙනුමක් මවාගනිමින් උන් තැනින් නැගිට්ටේය.

''මොකද්ද හබේ....? දෙන්නෙක් වෙන් වුණාට පස්සෙ අයෙ මොනවා අහනවාද?'' යි කී ඔහු දත් සපමින් කාමරය හරහා

ඇවිදින්නට වූයේය. ''මොකක් හරි මෝඩ පහේ රණ්ඩුවක්. එක්කෝ කාමරේක දිග පළල හරි, ගඟක ගැඹුර වගේ දෙයක් උණත් ඒකට ඇති. එහෙම දෙයක් වුණාට පස්සෙ අවුරුදු ගාණක් දුක් විඳින කොට තමා ඒක කොයි තරම් මෝඩ වැඩක්ද කියලා හිතෙන්නෙ. මම ගැන කියනවා නං, මට හිතෙන්නෙ අපි අතර එහෙම රණ්ඩුවක් උණේ නෑ කියලා. අපි ඒක අමතක කරමුකෝ! පෙන්ඩල්ටන්. මට අර ළමයව බලන්න ඕනෙමයි. මේක ජීවිතයත් මරණයත් දෙකින් එකක් තෝරාගැනීමක්. මේකෙ තේරුම... අවංකවම මම විස්වාස කරන විදියට, දහයෙන් නවයක සම්භාවිතාවක් තියෙනවා පොලියානා විටියර්ට ආයෙමත් ඇවිදින්න පුළුවන් වෙන්න.''

ඉතා හැඟීම් බරව, පැහැදිලිව කියන ලද ඒ වචන කිහිපය, ජෝන් පෙන්ඩල්ටන් ගේ පුටුව එහායින් තිබූ ඇරුණු ජනේලය වෙත විහිදෙන්නට ප්‍රමාණවත් හඬකින් යුතු වී ය. ජනේලයෙන් එහා පැත්තේ පොළොවේ දණ ගසා ගෙන උන්, කුඩා පිරිමි ළමයෙකුගේ කන් දෙකට ඒවා ඉතා හොඳින් ඇසී තිබිණි.

එදා සෙනසුරාදා උදෑසන, ජිමී බීන් මල් පාත්තිවල කොළ පාට අංකුර මතු වී තිබේදැයි බලන්නට එහි ගිය අතර ඔහු ඒ අසළ වැඩ කරමින් සිටින අතරේ එය ඇසූ වනම වාඩි වී, දෑස් දෙකන් අයාගෙන උන්නේය.

sinhalaebooks.com

''ඇවිදින්න! පොලියානා!'' ජෝන් පෙන්ඩල්ටන් කියමින් සිටියේය. ''මොකද්ද ඒකෙ තේරුම...''

''මං එයාගෙ ගෙදර ඉඳන් හැතැප්මක් ඈතින් ඉඳලා උණත්, අහපු දේවල්වල හැටියට එයාගෙ සිද්දිය හරියට මගෙ කොලේජ් එකේ හිටපු යාලුවෙකුට බෙහෙත් කරන්න ලැබිච්ච ලෙඩෙකුට සමානයි. මගේ යාලුවා ඒ ලෙඩාව හොඳ කළා. අවුරුදු ගාණක ඉඳලා එයා මේ වගේ දේවල් ගැන විශේෂ අධ්‍යයනයක් කරනවා. මං එයා එක්ක සම්බන්ධ වෙලා, මේ ගැන ටිකක් ඉගෙනගෙනත් තියෙනවා. මට අහන්න ලැබිච්ච දේවල්වල හැටියට... ඒත් ඔක්කොටම කලින් මං මේ ළමයා බලන්න එපැයි!''

ජෝන් පෙන්ඩල්ටන් පුටුවේ හරි බරි ගැහී වාඩි වුණේය.

"ඔහේට එයාව බලන්නම වෙනවා! බැරිද අර ඩොක්ට වොරන් හරහා ඔය පණිවුඩේ කියවන්න...."

දොස්තර කිල්ටන් ඔලුව දෙපසට වැනුවේය.

"ඒක කරන්න බැරිවෙයි මගෙ හිතේ. වොරන් උණත් කාටවත් සවුත්තු වෙන්න කැමති මිනිහෙක් නෙවී, එයාම මට කිව්වා, ඉස්සරවෙලාම පොලී හැරින්ටන්ට එයා කිව්වලු මාව ගෙන්නන්න කියලා. ඒත් පොලී කිව්වලු ඒක කොහොමටවත් කරන්න බෑ කියලා. ඉතිං, මිනිහා ඕක ආයෙමත් අහන්න යන එකක් නෑ, මට ඔය ළමයා බලන්න තියෙන්නෙ කොච්චර ලොකු උවමනාවක් ද කියලා දන්නවා උණත්. අනික පස්සෙ කාලෙක වොරන්ගේ ලෙඩ්ඩු සමහරක් මං ළඟටත් ආවා. ඉතිං, ඔය හින්දත් මට එයාට මේක කියන්න බැරි වෙනවා. පෙන්ඩල්ටන්, කොහොම හරි මට මේ ළමයා බලන්න ම ඕන. පොඩ්ඩක් හිතලා බලනවා, ඒක කරන්න පුළුවන් උණොත් ඒ ළමයට වෙන සෙතේ ගැන..."

"ඇත්ත, ඒත් ටිකක් හිතලා බලනවා. තමුසෙට ඒක කරන්න බැරි වුණොත් වෙන දේ.....! " යි ජෝන් පෙන්ඩල්ටන් එකටෙක කීවේය.

"ඒත් ඒ සේරටම කලින් මං කොහොමද එහෙම කරන්නෙ ඒ ළමයගේ පුංචි අම්මා කෙළින්ම ඇවිත් මගෙන් එහෙම කරන්න කියලා ඉල්ලන්නෙ නැතුව. ඒක කවදාවත් වෙන දෙයක් නෙමේ....!"

"එයාට ඔයාගෙන් අහන්නම වෙන විදියට වැඩ සළස්වන්න ඕන..."

"කොහොමද?"

"මං දන්නෙනෑ...."

''නෑ... මට හිතෙන විදියට ඔහේවත්.. වෙන කවුරුවත් ඒක දන්නෙ නෑ. පොලී හරිම ආඩම්බරෙන් වගේම හරිම තරහින් ඇත්තෙ මගෙන් අහන්න. දන් අවුරුදු ගාණක් ගත වෙලා උණත් එදා එයා කියපු දේ තාමත් වළංගු වෙනවා, එහෙම කළොත්. ඒත් ටිකක් හිතලා බලනවා, ජීවිත කාලෙම කාලකණ්නි වෙන්න යන අර අසරණ ළමයා ගැන. අපේ මේ තියෙන ආත්ම ගරුත්වයයි, වෘත්තීය සම්ප්‍රදායයි වගේ තේරුම් නැති අරක මේක නිසා, ඒ ළමයා ඒ කරදරෙන් ගලවාගන්න මගෙ අතේ තියෙන අවස්ථාව නැති කරගන්න පුලුවන්ද? මම..''

ඔහු කියන්නට ගිය දෙය නොකියා, දැත් කලිසම් සාක්කුවල ඔබාගෙන කාමරයේ එහාටත් මෙහාටත් බර අඩි තබමින් කෝපාන්විතව ඇවිද්දේය.

''ඒත්.... පොලීට මේක කොයි විදියකින් හරි ඒත්තු ගැන්නුවොත්....'' යි පෙන්ඩල්ටන් මහතා ඔහු දිරිමත් කළේය.

''ඔව්, ඉතිං කවුද ඒක කරන්නෙ?'' යි එක්වරම හැරී බැලූ දොස්තර මහතා ඇසුවේය.

''මං දන්නේ නෑ. මං දන්නෙ නෑ...''යි පෙන්ඩල්ටන් මහතා දුක්බර ලෙස සුසුම්ලෑවේය.

ජනේලයෙන් එහා පැත්තේ සිටි ජිමී බීන් එක්වරම කැළඹුණේය. මේ වෙනතෙක් ඔහු හුස්ම නාල්ලා ම, සංවාදයේ හැම වචනයක්ම ඕනෑ කමින් අසා සිටියේය. ''ඇයි හත්වලාමේ...ඒක මං දන්නවා''යි ඔහු සිහින් හඬින් කෙඳිරුවේය.''මට පුළුවන්නෙ ගිහින් ඒක කරන්න....''

ඉතින් ජිමී බීන් හෙමින් සැරේ එතැනින් නැගිට, ගේ වටෙන් ගොස්, ඔහුට හැකි තරම් වේගයකින් පෙන්ඩල්ටන් කන්දෙන් පහළට දුවන්නට විය.

# 30

# ජිමී පෙරමුණ ගනී

''ජිමී බීන් ඇවිත්. එයාට මැඩම්ව මුණ ගැහෙන්න ඕනලු.'' දොරකඩ සිටි නැන්සි දනුම් දුන්නාය.

''මාව.'' යි කී පොලී මෙනෙවිය පුදුමයට පත්ව සිටියාය.

''ඔයාට හොඳටම විස්වාසද එයාට මුණ ගැහෙන්න ඕන පොලියානාව නෙමෙයි කියල. එයාට ඕන නම් පුළුවන් පොලියානා මුණ ගැහෙන්න ටික වෙලාවකට...''

''ඔව් මැඩම්. මං එයාට කිව්වා එහෙම. ඒත් එයා කියනවා මැඩම්ව හම්බ වෙන්නලු ඕන...''

''හොඳයි. මං පහළට එන්නං....''පොලී මෙනෙවිය

තෙහෙට්ටුවට පත් විලාසයෙන් පුටුවෙන් නැංගාය.

විසිත්ත කාමරයේදී ඇයට හමුවූයේ විසල් කරගත් දෑසින් හා රතු වූ මුහුනින් යුතුව සිටි පිළිඹි ළමයෙකි. ඇය දුටු වනම ඔහු කතා කරන්නට පටන් ගත්තේය.

"මැඩම්, මං මේ කතාකරන්න යන දේ එච්චර හොඳ එකක් නෙවෙන්න පුළුවං. ඒත් මට මෙහෙම නොකියා ඉන්ඩ බෑ. මේ කතා කරන්නෙ පොලියානා වෙනුවෙං. මං එයා වෙනුවෙන් ගිනි අඟුරු උඩින් උනත් ඇවිදින්නං, ඔයාට මේ වගේ කතා කරන්ඩ එන්නං. ඒ වගේ ඕන දේකට මං ලෑස්තී, ඕනම වෙලාවක. මං හිතන්නෙ ඔයා වුණත් එහෙම කරයි, එයාව ආයෙමත් ඇවිද්දවන්න පුළුවං විදියක් තියෙනවා නං. මං මෙහාට ආවෙ ඔයාට කියන්ඩ, ගරුත්වයයි, සම්ප්‍ර... සම්ප්‍ර.. මන්දා මොකක් හරි කියමු. ඒ වගේ දේවල් නිසා, පොලියානාට ඇවිදින්න පුළුවන් වෙන එක නැති වෙනවා. ඔයා මේක තේරුං ගත්තොත්, මම දන්නවා ඔයා ඩොක්ටර් චිල්ටන්ට මෙහාට එන්ඩ කියයි...."

sinhalaebooks.com

"මො...කක්?" යි බාධා කළ පොලී මෙනෙවියගේ මුහුණේ තිබූ පුදුම සහගත බැල්ම, කෝපාන්විත බැල්මකට මාරු විය.

බලාපොරොත්තු සුන්වූ ලෙස ජිමී සුසුම් ලෑවේය.

"ඔන්න... මට ඕනෑ වුණේ නෑ ඔයාව තරහ ගස්සවන්ඩ. ඒක තමයි මම මුලදීම කියන්න පටන්ගත්තෙ එයාව ආපහු ඇවිද්දවන එක ගැන. මං හිතුවා ඔයාට ඒක ඇහුණා කියලා..."

"ජිමී, මොනවද හැබෑටම ඔයා මේ කියවන්නෙ...?"

ජිමී නැවතත් සුසුමක් හෙලුවේය.

"ඒක තමයි. මම මේ ඒක ඔයාට විස්තර කරන්න යන්නේ..."

''ඉතිං, එහෙනං කියන්න. ඒත් මුල ඉඳං පටන්ගන්න. අනික කියන හැමදේම මට තේරුණාද කියල හිතන්න. කලින් සැරේ වගේ එක පාරටම කතාවෙ මැදට පැනලා, හැම දෙයක්ම අවුල් කරගන්න එපා!''

ජිමී තීරණාත්මක ලෙස දෙතොල් තෙමා ගත්තේය.

''හොඳයි. මුල ඉඳං ම කියනවා නං ඩොක්ට කිල්ටන් අද මිස්ට පෙන්ඩල්ටන් හම්බවෙන්න ඇවිත්, පුස්තකාලෙ ඉඳං කතා කර කර හිටියා. ඔයාට ඒක තේරුණාද?''

''ඔව් ජිමී...''පොලී මෙනෙවියගේ හඬ මෙවර වඩා දුබලවී තිබුණි.

''හොඳයි. ඉතිං එතන ජනේලෙ ඇරලයි තිබුණෙ. ඒකට පහළින් තිබුණු පාත්තියෙ මං මල් හිටව හිටවා හිටියෙ. එතකොට ඒ ගොල්ලන් ගේ කතාව මට ඇහුණා...''

''අනේ ජිමී! ඔයා අහගෙන හිටියා නේද?''

''මේක මං ගැනවත්. මං අහගෙන හිටපු එක ගැනවත් කතාවක් නෙමේ...''යි ජිමී කීවේය. ''මම ඒක අහගෙන හිටපු එක ගැන මට සතුටුයි. ඔයාටත් එහෙම හිතෙයි මේක කියලා ඉවර වුණාම. ඒක පොලියානාට ආයෙමත් ඇවිදින්න පුළුවං වෙන විදියක් ගැනයි...''

''ජිමී...මොනවද ඔයා මේ කියන්නෙ...' පොලී මෙනෙවිය ඉතා ඕනෑ කමින්, ඉදිරියට නැමෙමින් ඇසුවාය.

''ඉන්නකො. මං කියන්නං.'' යි ජිමී උනන්දුවෙන් කීවේය.

''ඩොක්ට කිල්ටන් දන්නවලු පොලියානාව හොඳ කරන්න පුළුවං දොස්තර කෙනෙක්. එයා හිතනවා එහෙම කරන්න පුළුවං වෙයි කියල. ඒත් එයාට ඉස්තීරෙටම එහෙම කියන්න බැරිලු,

පොලියානාව බලන කල්. ඩොක්ට කිල්ටන් ට පොලියානා බලන්ඩ හොඳටම ඕන වෙලා.

පොලී මෙනෙවියගේ කම්මුල් හොඳටම රත් පැහැවිය.

''ඒත් ජිමී මට බැහැ. මට ඒක කරන්න විදියක් නෑ. ඒ මොකක් නිසාද මටම තේරෙන්නෙ නෑ...'' පොලී මෙනෙවිය අසරණව ඇගේ ඇඟිලි අඹරවමින් සිටියාය.

''ඔව්.... ඒක තමයි මං මෙහෙ ආවෙ ඔයාට කියන්න. එතකොට ඔයාට තේරෙයිනෙ...'' යි ජිමී ඉතා ඕනෑ කමින් කීවේය. ''ඒගොල්ලො කතා වුණා මොකද්දෙ හේතුවක් හින්දා... මට හරියටම ඒක තේරුණේ නෑ.... ඔයා ඩොක්ට කිල්ටන්ට මෙහෙ එන්න කියන එකක් නැලු. ඔයා කියන්නෙ නැතුව, ඩොක්ට කිල්ටන්ට ගරුත්වයයි... වුර්තී....සම්... මන්දා ඔන්න ඔය වගේ මොකද්දෙ හින්දයි මෙහේ එන්න බැරිලු. ඒ ගොල්ලො කතා වෙනවා මේක ඔයාට කියා දෙන්න පුළුවන් කාවවත් ඒගොල්ලො දන්නෙ නැහැලු. ඉතිං ඕක එළියෙ ඉඳං අහගෙන හිටපු මට හිතුණා 'හත්වලාමෙ.. ඇයි මට ඒක කරන්න බැරි' කියලා. ඉතිං මම ආවා. මං හිතන්නෙ ඔයාට තේරෙන්න ඇති.''

''ඔව්. ඒත් ජිමී. දොස්තර ගැන නම්...'' පොලී මෙනෙවිය හිතේ කැළඹීමෙන් යුතුව අසා සිටියාය.

''කව්ද ඒ දොස්තර? එයා මොන වගේ කෙනෙක්ද? ඔයාට විස්වාසද එයාට පුළුවන් කියලා පොලියානාව හොඳ කරන්න....''

''මං දන්නෙ නෑ එයා කව්ද කියලා. එයාලා ඒක කතා වුණේ නෑ. ඩොක්ට කිල්ටන් තමයි එයා දන්නෙ. එයා හිතන විදයට, ඔය කියන දොස්තර පොලියානා වගේ කෙනෙක් හොඳ කරලා තියෙනවා. කොහොම උනත් ඒ ගොල්ලො කරදර වෙන්නෙ ඒ ගැන නෙමෙයි. ඔයා ගැනයි ඒ ගොල්ලො හිතන්නෙ. ඒ මොකද ඔයා ඩොක්ට කිල්ටන් ට පොලියානා බලන්න ඉඩ දෙන්නෙ නැති

වෙයි කියලයි... එයාලට බය. ඉතිං කියන්න...ඔයා එයාට එන්න දෙනවා නේද...? දැන් ඔයාට තේරෙනවා නෙ...''

පොලී මෙනෙවිය ඔලුව දෙපසට වැනුවාය. ඇගේ හුස්ම වැටීමේ වේගය ඉහළ නගින්නට විය. කැළඹීමෙන් යුතුව ඇය දෙස බලා සිටි ජිමීට හැඟුණේ, ඇය අඬන්නට ආසන්න බවය. එහෙත් ඇය හඬා වැටුණේ නැත. මොහොතක් ගතවූ පසුව, ඇය බිඳුණු හඬකින් කතා කළාය.

''හොඳයි... මං ඩොක්ට කිල්ටන්ට පොලියානා බලන්න දෙන්නං. දැං ඉක්මං කරලා ගෙදර දුවන්න ජිමී. මට ඩොක්ට චොරන් එක්ක කතා කරන්න ඕනෑ. දැං ටිකකට කලින් එයා එනවා මං දැක්කා...''

ටික වේලාවකට පසුව මහත් කැළඹීමට පත්ව, රතු වූ මුහුණෙන් යුතු පොලී මෙනෙවිය මුණගැසුණු දොස්තර චොරන්, ඇය දැක පුදුමයට පත් වූයේය. ඇය එක හුස්මට කී දේ අසා දොස්තර චොරන් නවත් පුදුමයට පත් වූයේය.

''ඩොක්ට චොරන්, ඔයා එක දවසක් ඩොක්ට කිල්ටන්ව ගෙන්නන්න අහනකොට මම කිව්වානෙ එපැයි කියලා. ඊට පස්සෙ මං ඒ ගැන තව ටිකක් කල්පනා කළා. මං දැං බලාපොරොත්තු වෙනවා, ඔයා ඩොක්ට කිල්ටන්ට එන්න කියයි කියලා. ඒත්... කරුණාකරලා එක පාරටම එයාගෙන් අහන්න එපා හොඳද? ස්තූතියි...''

# 31

# අලුත් බාප්පා කෙනෙක්

ඊළඟ දවසේ දොස්තර වොරන් පොලියානා ගේ කාමරයට ඇතුලු වන විට ඇය, ප්‍රිස්මයෙන් නික්මුණු නොයෙක් පාට සීලිමට වැටී රඟ දෙනු බලා සිටියාය. දොස්තර වොරන් සමඟ, ඊට පිටුපසින් උසැති, පළල් උරහිස් ඇති කෙනෙකු ද ඇතුලට එනු ඇය දුටුවාය.

sinhalaebooks.com

''ඩොක්ට කිල්ටන්! අනේ ඩොක්ට කිල්ටන්. ඔයාව දකින්න ලැබුණු එක කොයි තරං හොඳද!'' යි පොලියානා කෑගෑවාය. ඒ ප්‍රීතිමත් හඬගෑම අසා, කාමරයේ රැඳුණු කිහිප දෙනෙකු ගේ ම දෑස් උණුකඳුලින් බර වන්නට ඇත.

''ඇත්තටම... පොලී පුංචි අම්මට ඕන නැති උණත්...''

''ඒකට කමක් නෑ වස්තුවේ. ඒ ගැන කරදර වෙන්න එපා...''

මහත් කැළඹීමෙන් සිටි පොලී මෙනෙවිය ඉදිරියට පැමිණ ඇය අස්වැසුවාය.

''මම ඩෝකට කිල්ටන්ට කිව්වා... ඩොක්ට වොරන් එක්ක අද උදේ ඇවිත් ඔයාව බලන්න කියලා...''

''අනේ.. එහෙනං ඔයා එයාට එන්න කිව්වා.'' පොලියානා තෘප්තිමත් විලාසයෙන් කෙඳිරි ගෑවාය.

''ඔව් වස්තුවේ. මම එයාට එන්න කිව්වා. ඒ කියන්නෙ...'' එහෙත් ඉතිරි අඩ කීමට ඇය ප්‍රමාද වූවා වැඩිය. දොස්තර කිල්ටන්ගේ දෑසට කාන්දුවූ ප්‍රීතිය සඟවන්නට බැරි වූ අතර පොලී මෙනෙවිය එය දුටුවාය. කම්මුල් ඉතා රෝස පැහැ ගන්වාගෙන ඇය හනික කාමරයෙන් එළියට ගියාය.

ජනේලය අසළ දොස්තර වොරන් සහ හෙදිය ලොකු කතා බහකට එක්වී උන්හ. දොස්තර කිල්ටන් පොලියානාගේ දෑතින්ම අල්ලා ගත්තේය.

''දරුවෝ, මං හිතන්නෙ ඔයා අද කළේ, මෙච්චර කල් කරපු හොඳටම සන්තෝස වෙන්න පුළුවන් වැඩවලින් එකක්...'' ඔහුගේ හඬ හැඟීම් බර වී, වෙව්ලන්නට වී ය.

ගොම්මන් කළුවර වැටෙද්දී ඉතා පුදුමාකාර ලෙස චංචල වූ, ඉතා පුදුමාකාර ලෙස වෙනස් වූ පොලී පුංචි අම්මා පොලියානා ගේ ඇඳ අසළ පෙනී සිටියාය. හෙදිය සිටියේ රාත්‍රී භෝජනය ගනිමිනි. ඉතින් ඔවුන්ට කාමරයේ රිසි පරිදි කතා කරන්නට හැකි විය.

''පොලියානා වස්තුවේ. මම හැමෝටම කලින් මේක ඔයාට කියන්නයි ආවෙ. මම කවදක හරි ඩොක්ට කිල්ටන්, ඔයාගෙ බාප්පා කරවනවා. ඉතිං ඒක උණේ ඔයා නිසා. අනේ පොලියානා, මට හරිම සතුටුයි. මට හරිම සතුටුයි රත්තරං...''

පොලියානා අත්පුඩි ගසන්නට ලැහැස්ති වූවාය. එහෙත් පළමුවරට ඇගේ පොඩි අත්ල එකට එක ගැටෙන්නට පෙර, ඇය නැවතී මෙසේ කීවාය:

"පුංචි අම්මෙ...පුංචි අම්මෙ...එහෙනං ඒ ඔයාගෙ අතයි හදවතයි ද මෙච්චර කාලයක් එයාට ඕනෑ වෙලා තිබුණෙ? ඒ ඔයා තමයි. මම දන්නවා ඒ ඔයා තමයි! ඒක තමයි අද උදේ එයා කිව්වෙ, මෙතෙක් කරල තියෙන වැඩවලින් හොඳටම සන්තෝස හිතෙන වැඩේ, මම දූන් කරලයි ඉන්නෙ කියල. මට හරිම සතුටුයි. ඇයි පුංචි අම්මෙ, මට තේරෙන්නෙ නෑ. ඒත් මට කොයි තරං සතුටුද කියනවා නම්... දූං මගේ කකුල් දෙකට මොනවා උණත් කමක් නෑ..."

පොලී පුංචි අම්මා ඉකියක් සිර කර ගත්තාය.

"කවදහරි ඒකත් හරි යයි...වස්තුවේ..."

sinhalaebooks.com

ඒත් පොලී පුංචි අම්මා එතැනින් නැවතුණේ නැත. ඇය දොස්තර කිල්ටන් තමන්ගේ හදවත කොයි තරම් ලොකු බලාපොරොත්තුවකින් පුරවා ඇති දැයි කියන්නට ද පසුබට නොවූවාය. ඉතින් ඊට පසු ඇය මෙසේ කී අතර ඇත්තෙන්ම එය පොලියානා ගේ සිතට හොඳට පුදුමයක් වී ය.

"පොලියානා, ඊළඟ සතියේ ඔයා ගමනක් යනවා. ඔයා හොඳ සැප පහසුවට හදපු ඇඳක තියලා වාහනේකින් ලොකු දොස්තර මහත්තයෙක් ළඟට එක්ක යන්නයි හදන්නෙ. ඔයා වගේ අයටම බෙහෙත් කරන, අපේ ගෙදර ඉදං ගොඩාක් ඈතින් ඉන්න කෙනෙක් එයා. එයා ඩොක්ට කිල්ටන් ගේ හොඳ යාලුවෙක්. අපි එහාට ගිහින් බලමු එයාට ඔයා වෙනුවෙන් කරන්න පුළුවන් මොනවද කියලා..."

# 32

# පොලියානාගෙන් ලියුමක්

*ආදරණීය පොලී පුංචි අම්මා සහ ටොම් බාප්පා වෙත,*

*අනේ, මට පුළුවන්.... මට පුළුවන්... මට පුළුවන් ඇවිදින්න! මම අද උදේ මගෙ ඇඳ ළඟ ඉඳන් ජනේලෙ ගාවට ඇවිද්දා. හරියටම අඩි හයක්! ආයමත් කකුල්වලින් හිටගන්න පුළුවන් වෙච්ච එක කොයි තරං හොඳද!*

*දොස්තරලා හැමෝම මගෙ වටේ ඉඳගෙන හිනාවෙවී බලාගෙන හිටියා. ඒගොල්ලන්ගෙ පිටිපස්සට වෙලා හිටපු නර්ස්ලා ඇඬුවා. ගිය සතියෙ, පළවෙනි පාරට ඇවිද්ද ගෑනු කෙනෙක් ඇවිත් දොරෙන් එබිලා බලාගෙන හිටියා. ඊළඟ මාසෙ වෙනකොට ඇවිදින්න පුළුවන් වෙයි කියලා හිතන ලෙඩෙකුටත් මම ඇවිදිනවා බලන්න එන්න කියලා ආරාධනා කරලා තිබුණා. ඉතිං එයත් ඇවිත්, මගෙ නර්ස්*

ගේ ඇඳේ වාඩිවෙලා ඉඳගෙන, මම ඇවිදිනකොට අත්පුඩි ගැහුවා. අයි ගානේ, බිම හෝදන කළු ටිලී පවා ජනේලෙන් එබිලා බලාගෙන ඉදලා. අඬලා ඉවරවෙලා කතා කරන්න පුළුවං වෙච්ච හැටියෙ "රත්තරං ළමයා...." කිව්වා.

මට නං තේරෙන්නෙ නෑ ඇයි එයාලා ඇඬුවෙ කියලා. මට නං ඕන වුණා සිංදුවක් කියලා. කෑගහලා මහ හයියෙන් බෙරිහන් දෙන්න. අනේ... අනේ.... ටිකක් හිතන්නකෝ, මට පුළුවන් ඇවිදින්න... ඇවිදන්න.. ඇවිදන්න! මට දැන් හිත හදාගත්තෑකි, මෙහාට ඇවිත් මාස දහයක්ම ඉන්න වෙච්ච එක ගැන. අනික මට මඟුල් ගෙදර මඟ ඇරුණෙත් නෑනෙ පුංචි අම්මෙ... ඇත්තටම ඔයාට බැරිද මෙහාට ඇවිත් මගෙ ඇඳ ළඟ කසාද බඳින්න. එතකොට මට ඔයාව බලාගන්න පුළුවන්නෙ. ඔයා හැම වෙලේම හොඳටම සන්තෝස වෙන්න පුළුවන් දේවල් ගැන හිතනවානෙ.

sinhalaebooks.com

ඒ ගොල්ලො කියන්නෙ නං, ඉක්මනටම මට ගෙදර යන්න පුළුවන් කියලා. මට හිතෙනවා, මට මෙහෙ ඉඳන් ගෙදරටම ඇවිදින්න ඇත්නම් කියලා. මම එහෙම කරනවා. මම නම් හිතන්නෙ නෑ මම ආයෙමත් කවදාකවත් වාහනේක ගමන් යයි කියලා. පයින් ඇවිදින එක කොයි තරං හොඳද! අනේ... මට හරිම සතුටුයි. මට හැම දෙයක් ගැනම සතුටුයි. මම සතුටු වෙනවා, මොහොතකට හරි මට කකුල්වලින් ඇවිදින්න බැරිවෙච්ච එකට. එහෙම නැත්තං කවදාවත්, කවදාවත් කකුල් කියන්නේ කොයි තරං අපූරු දෙයක්ද කියලා තේරෙන එකක් නෑ. මම හෙට අඩි අටක් ඇවිදන්නයි යන්නේ.

හැමදෙනාටම ගොඩාක් ආදරය සමඟ,
පොලියානා.